අර්ථ විග්‍රහයන් සහිත වන්දනා හා පිරිත් පොත.

කඨිනම් පාලි පාඨමාලාවට සහභාගීවන ශිෂ්‍යයනට නොමිලේ බෙදාදීම සඳහාය.

මෙම පරිවර්ථනය "පාලි හුරුව" පාඨමාලාවට අදාල ලෙස, පාලි භාෂාව පිලිබඳ සරල හුරුවක් ලබාදීම සඳහා සිදුකර ඇත. මෙහි සන්ධි සමාස පදයන් වෙන්කිරීම පාලි ව්‍යාකරනානුකූලව සිදුකර නොමැත. එමනිසා මෙම පරිවර්ථනය කිසිදු විභාගයකට භාවිතාකල නොහැක. මෙය ශ්‍රාස්ත්‍රීය නිබන්ධනයක් ලෙස නොසලකන්න

පාඨමාලාව පොත් තුනකින් සැකසීඇත.

1. පාලි හුරුව පොත
2. පාලි හුරුව කියවීම් පොත
3. පාලිහුරුව වන්දනා පොත

පටිගත පාඩම් මාලාව

පූජ්‍ය බළංගොඩ ඤාණවිහාරි හිමි.

පිං කැමතියෝ මෙම පොත් තුන මුද්‍රණයකර නොමිලේ බෙදා දෙත්වා !!!

සිල් ඉල්ලීමේ හා පූජා පැවැත්වීම	5
විවිධ බුද්ධ වන්දනා ක්‍රම	13
ධර්ම වන්දනාව	34
සංඝ වන්දනාව	35
ඡත්තමානවක ගාථා	37
චුද්දස බුද්ධ ඤාණ වන්දනාව	38
අටලොස් බුද්ධ ඥාණ වන්දනාව	39
සත් සැත්තෑ ඤාණ වන්දනාව	41
සතර මහා සංවේග ස්ථාන	44
සුගතයන් වහන්සේගේ අවවාදය	46
පටිච්චසමුප්පාද ධර්මය	47
බුද්ධානුස්සති භාවනාව	49
මෛත්‍රී භාවනාව	52
අශුභ භාවනාව	55
මරණානුස්සති භාවනාව	57
නිතර සිහිකිරීමට	59
ධාතු හා චෛත්‍ය වන්දනා	61
බෝධි වන්දනා	63
මංගල සූත්‍රය	70
රතන සූත්‍රය	74
මෙත්ත සූත්‍රය	82
ජය මංගල ගාථා	86
මහා ජයමංගල ගාථා	90
ඇනවුම් පිරිත	96
අටවිසි පිරිත	98
අංගුලිමාල පිරිත	101
ජය පිරිත	102
චූල ජිනපඤ්ජරය	105
වට්ටක පිරිත	108
ආටානාටිය පිරිත	110
නරසීහ ගාථා	112
පුණ්‍යානුමෝදනා හා ප්‍රාර්ථනා ගාථා	115
ප්‍රත්‍යවෙක්ෂාව	123
බුද්ධවර්ෂ කීම	127

★ පාලි උච්චාරණය

පාලියේදී "එ" "ඔ" යන අකුරු දෙක සිංහල භාෂාවේ "ඒ" "ඕ" මෙන් දීර්ඝව ඇද කියනු ලැබේ. නමුත් "එ" "ඔ" යන අකුරු දෙක බැඳි අකුරකට හෝ අල් අකුරකට හෝ මුලින් ඇති විට නොඇද කියනු ලැබේ. (මෙම පොතේ බොහෝ අවස්ථාවල දීර්ඝව කියයුතු තැන්වල අල් අකුරු දක්වා ඇත. එසේ නොමැති තැන්වලදී මෙම නීතිය භාවිතා කලයුතුය.)

★ බැඳි අකුරකට මුලින් ඇති "ෙ" කොම්බුව බැඳි අකුරේ දෙවන අකුර සඳහාය.

ධම්මෝ → ධම්මෝ　　　　අස්සෝ → අස්සෝ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

➔නමෝ (නමස්කාරය වේවා!) තස්ස (ඒ) භගවතෝ (භාග්‍යවත්) අරහතෝ (අර්හත්) සම්මා සම්බුද්ධස්ස (සම්මා සම්බුදු රජාණන් වහන්සේට)
☞ ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!!

<u>සිල් ඉල්ලීමේ වාක්‍යය</u>

ඕකාස! අංහ භන්තේ තිසරණේන සද්ධිං ආජීවඅට්ඨමක සීලං/ අට්ඨංගුපෝසථ සීලං/ ගහට්ඨදස සීලං ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ, අනුකම්පං උපාදාය. දුතියම්පි ඕකාස! අහං භන්තේ, ... තතියම්පි ඕකාස! අහං භන්තේ, ...

➔ ඕකාස! (අවසරයි) අංහ (මම) භන්තේ (ස්වාමීනි) තිසරණේන සද්ධිං (තිසරණ සමග) ආජීවඅට්ඨමක සීලං ධම්මං (ආජීව අට්ඨමක සීලය)/ අට්ඨංගුපෝසථ සීලං ධම්මං (අට්ටාංග උපෝසථ සීලය)/ ගහට්ඨ දස සීලං ධම්මං (ගිහි දස සිල්) යාචාමි (අයදිමි). අනුග්ගහං කත්වා (අනුග්‍රහකර) සීලං (සිල්) දේථ (දෙනුමැනවි) මේ (මට) භන්තේ(ස්වාමීනි), අනුකම්පං (අනුකම්පාව) උපාදාය (මුල්කරගෙන). දුතියම්පි (දෙවන වරද) ඕකාස! (අවසරයි) අංහ (මම) භන්තේ (ස්වාමීනි), ... තතියම්පි (තෙවන වරද) ඕකාස! (අවසරයි) අංහ (මම) භන්තේ (ස්වාමීනි), ...

☞ අවසරයි ස්වාමීනි! මම තිසරණ සමග ආජීව අට්ඨමක සීලය/ අට්ටාංග උපෝසථ සීලය/ ගිහි දස සිල් අයදිමි. ස්වාමීනි අනුකම්පාවෙන් අනුග්‍රහකර මට සිල් දෙනුමැනවි. දෙවන වරද අවසරයි ස්වාමීනි! මම ...... තෙවන වරද අවසරයි ස්වාමීනි! මම .....

<u>ආරාධනා ගාථා</u>

යාවතා භගවා ලොකේ - තිට්ඨෙය්‍යා තව සාසනං
තාවතා පතිගන්හාතු - පූජා ලෝකානුකම්පයා

භගවා යාවතා තව සාසනං ලොකේ තිට්ඨෙය්‍යා, තාවතා ලෝකානුකම්පයා පූජා පතිගන්හාතු.#
➔ භගවා (භාග්‍යවතුන් වහන්ස!) යාවතා (යම්තාක් කල්) තව (ඔබගේ) සාසනං (සාසනය) ලොකේ (ලොව) තිට්ඨෙය්‍යා (පවතී ද) තාවතා (ඒතාක්) ලෝකානුකම්පයා (ලෝක සත්ත්වයාට අනුකම්පාවෙන්) පූජා (පූජාවන්) පතිගන්හාතු (පිළිගන්නා සේක්වා!)

☞භාග්‍යවතුන් වහන්ස! ඔබගේ ශාසනය ලොව පවතින තුරු ලෝක සත්ත්වයාට අනුකම්පාවෙන් සියලු පූජාවන් පිළිගන්නා සේක්වා!

නිවේදයාමි සම්බුද්ධං වීතරාගං මහා මුනිං
නිමන්තයාමි සුගතං ලෝකජෙට්ඨං නරාසභං

සම්බුද්ධං වීතරාගං මහා මුනිං නිවේදයාමි, නරාසභං ලෝකජෙට්ඨං සුගතං නිමන්තයාමි

➔ සම්බුද්ධං (සම්බුද්ධවූ) වීතරාගං (වීතරාගී) මහා මුනිං (මහා මුනින්ද්‍රයන් වහන්සේට) නිවේදයාමි (දැනුම්දෙමි), නරාසභං (මිනිසුන්ට උතුම්වූ) ලෝකජෙට්ඨං (ලෝකයේ ජ්‍යේෂ්ඨවූ) සුගතං (සුගතයන් වහන්සේට) නිමන්තයාමි (ආරාධනා කරන්නෙමි.)
☞ සම්බුද්ධවූ වීතරාගී මහා මුනින්ද්‍රයන් වහන්සේට දැනුම්දෙමි, මිනිසුන්ට උතුම්වූ ලෝකයේ ජ්‍යේෂ්ඨවූ සුගතයන් වහන්සේට ආරාධනා කරන්නෙමි.

පහන් පූජාව
ගන්ධතෙලප්ප දිත්තේන - දීපේන තම ධංසිනා
තිලොක දීපං සම්බුද්ධං -පූජයාමී තමොනුදං

#ගන්ධතෙලප්පදිත්තේන තම ධංසිනා දීපේන තිලොක දීපං තමොනුදං සම්බුද්ධං පූජයාමී #
➔ ගන්ධතෙල (සුවඳ තෙලින්) පදිත්තේන (දැල්වූ) තම (අඳුර) ධංසිනා (දුරලන්නා වූ) දීපේන(පහනින්) තිලොක(තුන්ලොවට) දීපං(පහනක් වූ) තමොනුදං(මෝහාන්ධකාරය දුරලූ) සම්බුද්ධං(බුදුරජාණන් වහන්සේ) පූජයාමී(පුදමි.)
☞සුවඳ තෙලින් දැල්වූ, අඳුර දුරලන්නා වූ මේ පහනින්, තුන්ලොවට පහනක් වූ මෝහාන්ධකාරය දුරලූ බුදුරජාණන් වහන්සේ පුදමි.

තිලෝක මහිතං සම්බුද්ධං දීපේන පූජයාමහං
තේන ධම්මේන සංසාරේ චක්ඛු සුජ්ඣතු සබ්බදා

තිලෝක මහිතං සම්බුද්ධං දීපේන [පූජයාමි+අහං] පූජයාමහං තේන ධම්මේන සංසාරේ චක්ඛු **සුජ්ඣතු** සබ්බදා#
➔ තිලෝක (තුන්ලොවින්ම) මහිතං (පූජා සත්කාර ලැබූ) සම්බුද්ධං (බුදුරජාණණ් වහන්සේට) අහං (මම) දීපේන (පහනින්) පූජයාමි (පුදමි), තේන ධම්මේන (ඒ කුසල ධර්මයෙන්) සබ්බදා (සැමදා) සංසාරේ (සසරෙහි) චක්ඛු **සුජ්ඣතු** (මනා ඇස් ඇත්තෙක් වේවා/ප්‍රඥාවන්තයෙක් වේවා)
☞ තුන්ලොවින්ම පූජා සත්කාර ලැබූ බුදුරජාණණ් වහන්සේට මම මේ පහනින් පුදමි, ඒ කුසල ධර්මයෙන් සැමදා සසරෙහි මනා ඇස් ඇත්තෙක් වේවා/ප්‍රඥාවන්තයෙක් වේවා

වේනෙය්‍යා හදයේ මෝහං තමොක්ඛන්ධ විනෝදකං
දීපේනේත්තේන පූජේමි පඤ්ඤා දීපධරං ජිනං

වේනෙය්‍යා හදයේ මෝහං [තමෝ+ඛන්ධ] තමොක්ඛන්ධ විනෝදකං පඤ්ඤා දීපධරං ජිනං [දීපේන+එතේන] දීපේනේත්තේන පූජේමි
➔ වේනෙය්‍යා (හික්මවිය හැක්කන්ගේ) හදයේ (හදෙහි) මෝහං (මෝහ/අවිද්‍යා) [තමෝ+ඛන්ධ] තමොක්ඛන්ධ (අන්දකාර සමූහය) විනෝදකං (දුරුකරන්නාවූ) පඤ්ඤා (ප්‍රඥාව නැමති) දීපධරං (පහන දරන) ජිනං (පස්මරුන් දිනූ ජිනයන් වහන්සේව) එතේන දීපේන (මේ පහනින්) පූජේමි (පුදන්නෙමි).
☞ හික්මවිය හැක්කන්ගේ හදෙහි මෝහ අන්දකාර සමූහය දුරුකරන්නාවූ ප්‍රඥාව නැමති පහන දරන පස්මරුන් දිනූ ජිනයන් වහන්සේව මේ පහනින් පුදන්නෙමි.

ඉමිනා පුඤ්ඤකම්මේන පඤ්ඤවා සීලවා සදා
භාවිත්වාන ලභේ සීඝං ධම්මචක්ඛුං අනුත්තරං.

ඉමිනා පුඤ්ඤකම්මේන සදා පඤ්ඤවා සීලවා භාවිත්වාන, අනුත්තරං ධම්මචක්ඛුං සීඝං ලභේ

➔ ඉමිනා (මේ) පුඤ්ඤකම්මේන (පින්කමින්) සදා (සැමදා) පඤ්ඤවා (ප්‍රඥාවන්තයෙක්) සීලවා (සිල්වතෙක්) භාවිත්වාන (වී), අනුත්තරං (අනුත්තර) ධම්මචක්ඛුං (ධර්ම ඇස නම්වූ අරිහත් මාරග ඥානය) සීඝං (වහා) ලභේ (ලබම්වා!)
☞ මේ පින්කමින් සැමදා ප්‍රඥාවන්තයෙක් සිල්වතෙක් වී අනුත්තර ධර්ම ඇස නම්වූ අරිහත් මාරග ඥානය වහා ලබම්වා!

කපුරු පූජාව
ඝනසාරප්ප දිත්තේන - දීපේන තම ධංසිනා
තිලොක දීපං සම්බුද්ධං -පූජයාමී තමොනුදං

ඝනසාරප්ප දිත්තේන තම ධංසිනා දීපේන තිලොක දීපං තමොනුදං සම්බුද්ධං පූජයාමී
➔ ඝනසාර (කපුරු තෙලින්) පදිත්තේන(දැල්වූ) තම(අඳුර) ධංසිනා(දුරලන්නා වූ) දීපේන(පහනින්) තිලොක(තුන්ලොවට) දීපං(පහනක් වූ) තමොනුදං(මෝහාන්ධකාරය දුරලූ) සම්බුද්ධං(බුදුරජාණන් වහන්සේ) පූජයාමී(පුදමි.)
☞කපුරු තෙලින් දැල්වූ, අඳුර දුරලන්නා වූ මේ පහනින්, තුන්ලොවට පහනක් වූ මෝහාන්ධකාරය දුරලූ බුදුරජාණන් වහන්සේ පුදමි.

සුවඳ පූජාව
සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනං
සුගන්ධිනාහං ගන්ධෙන - පූජයාමි තථාගතං

සුගන්ධි-කාය [සුගන්ධි]වදනං අනන්ත ගුණ සුගන්ධිනා ගන්ධිනං තථාගතං අහං ගන්ධෙන පූජයාමි # [සුගන්ධිනාහං = සුගන්ධිනා + අහං]
➔ සුගන්ධි-කාය(සුවඳවත් කයක්) [සුගන්ධිං]වදනං (සුවඳවත් වදන්) අනන්ත ගුණ(අනන්ත වූ ගුණ) සුගන්ධිනා(සුවඳින්) ගන්ධිනං(සුවඳවත් වූ) තථාගතං(තථාගතයන් වහන්සේව) අහං(මම) ගන්ධෙන(සුවඳින්) පූජයාමි(පුදමි.)
☞සුවඳවත් කයක් හා සුවඳවත් වදන් ඇති අනන්ත වූ ගුණ සුවඳින් සුවඳවත් වූ තථාගතයන් වහන්සේව, මම සුවඳින් පුදමි.

පැන් පූජාව
සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං
පාණීයමේතං භගවා -පතිගණ්හාතු <u>මුත්තම.</u>

<u>උත්තම</u> භගවා! සුගන්ධං සීතලං කප්පං පසන්න මධුරං සුභං
ඒතං පාණීයං පතිගණ්හාතු. # [පාණීයමේතං = පාණීයං + ඒතං]
➔ උත්තම භගවා! (උතුම් භාග්‍යවතුන් වහන්ස !) සුගන්ධං(සුවඳවත් වූද) සීතලං(සිසිල් වූද) කප්පං(කැප වූද) පසන්න(ප්‍රසන්න වූද) මධුරං(මිහිරි) සුභං(පිවිතුරු) ඒතං(මේ) පාණීයං(පැන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා !)
☞උතුම් භාග්‍යවතුන් වහන්ස ! සුවදින් සුවඳවත් වූද ,සිසිල් වූද,කැප වූද, ප්‍රසන්න වූද, මිහිරි ,පිවිතුරු මේ පැන් පිළිගන්නා සේක්වා !

ධම්මෝදකේන සත්තානං පාපමලං විසෝධකං
පානීයේනාභිපූජේමි ,ලෝකනාථං දයාලයං
 # [ධම්ම+උදකේන] ධම්මෝදකේන සත්තානං පාපමලං විසෝධකං, දයාලයං ලෝකනාථං [පානීයේන + අභිපූජේමි] පානීයේනාභිපූජේමි #

➔ ධම්මෝදකේන (ධර්මය නැමැති ජලයෙන්) සත්තානං (සත්ත්වයන්ගේ) පාපමලං (කෙලෙස් කහට) විසෝධකං (සෝදා හරින්නා වූ), දයාලයං (කරුණාවට වාසස්ථානය වූ) ලෝකනාථං (ලෝක නාථවූ මහාකාරුණිකයන් වහන්සේට) පානීයේන (පැන්) අභිපූජේමි (පූජා කරමි)
☞ ධර්මය නැමැති ජලයෙන් සත්ත්වයන්ගේ කෙලෙස් කහට සෝදා හරින්නා වූ කරුණාවට වාසස්ථානය වූ ලෝක නාථවූ මහාකාරුණිකයන් වහන්සේට මේ පැන් පූජා කරමි.පූජා වේවා.

කිරිතේ පූජාව
අධිවාසෙතු නෝ භන්තේ - පණීතං ඛීරපානකං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම.

භන්තෙ! නො පණීතං ඛීරපානකං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.
➔ භන්තෙ(ස්වාමීනි!) නො(අපගේ) පණීතං(ප්‍රණීත) ඛීරපානකං (කිරිතේපානය) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ ප්‍රණීත කිරිතේපානය පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

ගිලන්පස පූජාව
අධිවාසෙතු නෝ භන්තේ - ගිලාන පච්චයං ඉමං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

භන්තෙ! නො ඉමං ගිලානපච්චයං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.
➔ භන්තෙ (ස්වාමීනි!) නො(අපගේ) ඉමං(මේ) ගිලානපච්චයං (ගිලන්පස) අධිවාසෙතු (පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ ගිලන්පස පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

අධිවාසෙතු නෝ භන්තේ - පානකං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

භන්තේ! නෝ පරිකප්පිතං පානකං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.
➔ භන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) පානකං (පානය) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය (අනුකම්පාවෙන්) පතිගණ්හාතු (පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ පානය පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

ආහාර පූජාව
අධිවාසෙතු නෝ භන්තේ - භෝජනං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

භන්තේ! නෝ පරිකප්පිතං භෝජනං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.

➔ හන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) භෝජනං (භෝජනය/ආහාර) අධිවාසෙතු (පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය (අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ භෝජනය/ආහාර පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

සද්ධම්මාමත දානේන - සුඛාපෙන්තං බහුජ්ජනං
මහාකාරුණිකං බුද්ධං - පූජේමි ආහාරෙනහං.

[සද්ධම්ම+අමත] සද්ධම්මාමත දානේන, බහුජ්ජනං සුඛාපෙන්තං මහාකාරුණිකං බුද්ධං, පූජේමි [ආහාරෙන+අහං] ආහාරෙනහං
➔ සද්ධම්ම අමත (ශ්‍රී සද්ධර්මය නැමැති අමෘතය) දානේන (දීමෙන්), බහුජ්ජනං (බොහෝ ජනයා) සුඛාපෙන්තං (සැපවත් කරවන්නාවූ) මහාකාරුණිකං (මහා කාරුණික වූ) බුද්ධං (බුදුරජාණන් වහන්සේට), අහං (මම) ආහාරෙන (ආහාර) පූජේමි (පූජා කරමි)
☞ ශ්‍රී සද්ධර්මය නැමැති අමෘතය දීමෙන් බොහෝ ජනයා සැපවත් කරවන්නාවූ මහා කාරුණික වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට ප්‍රණීත වූ මේ ආහාරය පූජා කරමි . පූජා වේවා.

ව්‍යඤ්ජන පූජාව
අධිවාසෙතු නෝ හන්තේ - ව්‍යඤ්ජනං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

හන්තේ! නෝ පරිකප්පිතං ව්‍යඤ්ජනං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.
➔ හන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) ව්‍යඤ්ජනං (ව්‍යඤ්ජන) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ ව්‍යඤ්ජනය පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

කිරිපැණි පූජාව
අධිවාසෙතු නෝ හන්තේ - දධිපාණං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

හන්තේ! නෝ පරිකප්පිතං දධිපාණං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු
➔ හන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) දධිපාණං (කිරිපැණි) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ කිරිපැණි පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

කැඳ පූජාව
අධිවාසෙතු නෝ හන්තේ - තරලං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම
හන්තේ! නෝ පරිකප්පිතං තරලං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.

➔ භන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) තරලං (කැඳ) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ කැඳ පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

දැහැත් පූජාව
අධිවාසෙතු නෝ භන්තේ - තාම්බූලං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

භන්තේ! නෝ පරිකප්පිතං තාම්බූලං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.
➔ භන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) තාම්බූලං (දැහැත්) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ දැහැත් පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

යථාවාදී තථාකාරී - දම්මවාදී මහායසෝ
තාම්බූලං පතිගණ්හාතු - සත්ථා ලෝකේ අනුත්තරෝ

යථාවාදී තථාකාරී, දම්මවාදී මහායසෝ, ලෝකේ අනුත්තරෝ සත්ථා තාම්බූලං පතිගණ්හාතු
➔ යථාවාදී (යම් ආකාරයකට කියයිද) තථාකාරී (ඒ ආකාරයෙන්ම කරන්නාවූ), දම්මවාදී (පරම ගම්භීර චතුස්සත්‍ය ධර්මය ප්‍රකාශ කරන්නා වූ) මහායසෝ(මහත් යසස් ඇත්තා වූ), ලෝකේ (ලොකයෙහි) අනුත්තරෝ (සැමටම උතුම් වූ) සත්ථා (ශස්තෲන් වහන්ස) තාම්බූලං (දැහැත්) පතිගණ්හාතු (පිළිගෙන වදාරණ සේක්වා.)
☞කියනදේ කරන්නාවූ පරම ගම්භීර චතුස්සත්‍ය ධර්මය ප්‍රකාශ කරන්නා වූ මහත් යසස් ඇත්තා වූ ලොකයෙහි සැමටම උතුම් වූ ශස්තෲන් වහන්ස දැහැත් පිළිගෙන වදාරණ සේක්වා.

අටපිරිකර පූජාව
අධිවාසෙතු නෝ භන්තේ - අට්ඨපරික්කාරං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

භන්තේ! නෝ පරිකප්පිතං අට්ඨපරික්කාරං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.
➔ භන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) අට්ඨපරික්කාරං (අටපිරිකර) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ අටපිරිකර පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

සිවු පූජාව
අධිවාසෙතු නෝ භන්තේ - චීවරං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම
භන්තේ! නෝ පරිකප්පිතං චීවරං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.

➔ හන්තේ (ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) චීවරං (සිවුර) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ සිවුර පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

බෙහෙත් පූජාව
අධිවාසෙතු නෝ හන්තේ - භේසජ්ජං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

හන්තේ! නෝ පරිකප්පිතං භේසජ්ජං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.
➔ හන්තේ(ස්වාමීනි!) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) භේසජ්ජං (බෙහෙත) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ බෙහෙත් පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

සියලු පිරිකර පූජාව
අධිවාසෙතු නෝ හන්තේ - සබ්බපරික්ඛාරං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

හන්තේ! නෝ පරිකප්පිතං සබ්බපරික්ඛාරං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.

➔ හන්තේ(ස්වාමීනි !) නෝ(අපගේ) පරිකප්පිතං(කැපවූ) සබ්බපරික්ඛාරං (සියලු පිරිකර) අධිවාසෙතු(පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය(අනුකම්පාවෙන්) පතිගණ්හාතු(පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සකස් කල මේ කැපවූ සියලු පිරිකර පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

සියලුදේ එකවර පූජා කිරීම
අධිවාසෙතු නෝ හන්තේ - සබ්බං සද්ධාය පූජිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

හන්තේ! නෝ සද්ධාය පූජිතං සබ්බං අධිවාසෙතු, උත්තම! අනුකම්පං උපාදාය පතිගණ්හාතු.

➔ හන්තේ(ස්වාමීනි !) නෝ (අපගේ) සද්ධාය (සද්ධාවෙන්) පූජිතං සබ්බං (පූජාකලාවූ සියල්ල) අධිවාසෙතු (පිළිගන්නා සේක්වා), උත්තම (උත්තමයන් වහන්ස!) අනුකම්පං උපාදාය (අනුකම්පාවෙන්) පතිගණ්හාතු (පිළිගන්නා සේක්වා)
☞ස්වාමීනි ! අප විසින් සද්ධාවෙන් පූජාකලාවූ මේ සියල්ල පිළිගන්නා සේක්වා! උත්තමයන් වහන්ස! අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා

මල් පූජාව
වණ්ණ ගන්ධ ගුණොපේතං - ඒතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දස්ස - සිරීපාද සරොරුහෙ

වණ්ණ ගන්ධ ගුණං උපපේතං ඒතං කුසුම සන්තතිං මුනින්දස්ස සිරිපාද සරොරුහෙ පූජයාමි
[ගුණොපේතං = ගුණං + උපපේතං]
➔ වණ්ණ (වර්ණ) ගන්ධ (සුගන්ධ) ගුණොපේතං [ගුණං+ උපපේතං] (ගුණයෙන් යුක්ත වූ) ඒතං (මේ) කුසුම (මල්) සන්තතිං (සමූහය) මුනින්දස්ස (මුනින්ද්‍රයන් වහන්සේගේ) සිරිපාද (ශ්‍රී පාද) සරොරුහෙ (පියුමෙහි/පද්මයෙහි) පූජයාමි(පූජා කරමි.)
☞මනා වර්ණ සුගන්ධ ගුණයෙන් යුත් මේ මල් සමූහය
මුනින්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී පාද පියුමෙහි/පද්මයෙහි පූජා කරමි.

පූජේමි බුද්ධං කුසුමේන නේන
පුඤ්ඤේන <u>මෙතෙන</u> ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදං මේ
කායො තථා යාති විනාස භාවං

[අහං] නේන කුසුමේන බුද්ධං පූජේමි, <u>ඒතෙන</u> පුඤ්ඤේන මොක්ඛං ලභාමි, යථා ඉදං පුප්ඵං මිලායාති තථා මේ කායො විනාස භාවං යාති.
➔ [අහං=මම] නේන(මේ) කුසුමේන(මලින්) බුද්ධං (බුදුන්) පූජේමි(පුදමි), <u>ඒතෙන(මේ)</u> පුඤ්ඤේන(පිනෙන්) මොක්ඛං(නිවන්) ලභාමි(ලබම්වා!), යථා(යමසේ) ඉදං(මේ) පුප්ඵං(මල) මිලායාති(මැලවී යයිද) තථා(එලෙසම) මේ(මගේ) කායො(කය) විනාසභාවං (විනාශ බාවයට) යාති(යන්නේය).
☞මම මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදන්නෙමි. මේ පිනෙන් නිවන් ලබම්වා! මේ මල මැලවෙන්නාසේ මාගේ සිරුරද විනාශයට පත්වන්නේය.

අනන්තගුණ වණ්ණස්ස - සුද්ධ සීල සුගන්ධිනෝ
පූජේමි ලෝකනාථස්ස - පුප්ඵමේතං මනෝරමං

අනන්තගුණ වණ්ණස්ස සුද්ධ සීල සුගන්ධිනෝ ලෝකනාථස්ස මනෝරමං [පුප්ඵං+ඒතං] පුප්ඵමේතං පූජේමි#
➔ අනන්තගුණ (අනන්ත ගුණ) වණ්ණස්ස (වර්ණනා ඇත්තා වූ) සුද්ධ (පිවිතුරු වූ) සීල (සිල්) සුගන්ධිනෝ (සුවඳ ඇත්තා වූ) ලෝකනාථස්ස (ලොකනාථයන් වහන්සේට) මනෝරමං (මනරම්) ඒතං පුප්ඵං (මේ මල්) පූජේමි (පූජා කරමි)
☞ අනන්ත ගුණවර්ණනා ඇත්තා වූ පිවිතුරු වූ සිල් සුවඳ ඇත්තා වූ ලොකනාථයන් වහන්සේට මේ මනරම් මල් පූජා කරමි.පූජාවේවා.

ඉමිනා පුඤ්ඤ කම්මේන- භවිත්වා සීලවා සදා
පප්පෝමි පරමං සන්තිං -නිබ්බානං බුද්ධ වණ්ණිතං

ඉමිනා පුඤ්ඤ කම්මේන සදා සීලවා භවිත්වා, බුද්ධ වණ්ණිතං පරමං සන්තිං නිබ්බානං පප්පෝමි
➔ ඉමිනා (මේ) පුඤ්ඤ කම්මේන (පින් කමින්) සදා (සැමදා) සීලවා (සීලවන්තයෙක්) භවිත්වා (වී), බුද්ධ වණ්ණිතං (බුදුරදුන් විසින් වර්ණනා කරණ ලද) පරමං සන්තිං (පරම ශාන්තිය වූ) නිබ්බානං (නිවනට) පප්පෝමි (පැමිණෙම්වා!)

☞ මේ පින් බෙලෙන් මම සැමදා සීලවන්තයෙක් වී බුදුරදුන් විසින් වර්ණනා කරණ ලද පරම ශාන්තිය වූ නිවනට පැමිණෙම්වා!

a නිරෝධ සමාපත්තිතෝ වුට්ඨහිත්වා විය නිසින්නං භගවන්තං අරහන්තං සම්මා සම්බුද්ධං ඉමිනා පුප්ඵෙන පූජේමි පූජේමි පූජේමි.
b අයං පුප්ඵ පූජා බුද්ධ පච්චේක බුද්ධ අග්ග සාවක මහා සාවක අරහන්තාදීනං සභාව සීලං අහම්පි තේසං අනුවත්තකෝ හෝමි.
c ඉදං පුප්ඵං ඉදානි වණ්ණේනපි සුවණ්ණං ගන්ධෙනපි සුගන්ධං සණ්ඨානේනපි සුසණ්ඨානං, ඛිප්පමේව දුබ්බණ්නං දුග්ගන්ධං දුස්සන්ඨාණං අනිච්චතං පාපුණිස්සති. ඒවමේව ඛෝ සබ්බේ සංඛාරා අනිච්චා සබ්බේ සංඛාරා දුක්ඛා සබ්බේ ධම්මා අනත්තාති.

➔a නිරෝධ සමාපත්තිතෝ (නිරොධ සමාපත්තියෙන්) වුට්ඨහිත්වා (නැගී) විය (වැනි/මෙන්/වැනිවූ) නිසින්නං (වැඩ සිටින) භගවන්තං (භාග්‍යවත්) අරහන්තං (අර්හත්) සම්මා සම්බුද්ධං (සම්මා සම්බුදුරාජාණන් වහන්සේට) ඉමිනා (මේ) පුප්ඵෙන (මලින්) පූජේමි (පුදමි) පූජේමි (පුදමි) පූජේමි (පුදමි).
b අයං(මේ) පුප්ඵ(මල්) පූජා(පූජාව) බුද්ධ(බුදු) පච්චේක බුද්ධ(පසේ බුදු) අග්ග සාවක(අග්‍ර ශ්‍රාවක) මහා සාවක (මහා ශ්‍රාවක) අරහන්තාදීනං [අරහන්තා+ආදීනං] (රහතන් වහන්සේලා ආදීන්ගේ) සභාව සීලං (ස්වභාව චාරිත්‍රයකි) අහම්පි [අහං+අපි] (මම-ත්) තේසං(උන්වහන්සේලා) අනුවත්තකෝ (අනුවපවතින්නෙක්/ අනුවර්ථනය වන්නෙක්) හෝමි(වෙමි)
c ඉදං(මේ) පුප්ඵං(මල) ඉදානි(දැන්) වණ්ණේන-පි (වර්ණයෙන්-ද) සුවණ්ණං (මනා වර්ණ ඇත්තේය) ගන්ධෙන-පි (සුවඳින්-ද) සුගන්ධං(මිහිරි සුවඳ ඇත්තේය) සණ්ඨානේන-පි (හැඩයෙන්-ද) සුසණ්ඨානං (මනහර හැඩයක් ඇත්තේය), ඛිප්පමේව [ඛිප්පං+ඒව] (වහාම/මොහොතකින්ම) දුබ්බණ්නං (දුර්වර්ණයටද) දුග්ගන්ධං (දුර්ගන්ධයටද) දුස්සන්ඨාණං (අවහැඩයකට) අනිච්චතං (අනිත්‍යභාවයටද) පාපුණිස්සති (පත්වන්නේය/ පැමිණෙන්නේය) ඒවමේව (එපරිද්දේම) ඛෝ (වනාහි) සබ්බේ (සියලු) සංඛාරා (සංස්කාරයෝ) අනිච්චා (අනිත්‍යය) සබ්බේ (සියලු) සංඛාරා (සංස්කාරයෝ) දුක්ඛා (දුක්ය) සබ්බේ (සියලු) ධම්මා(ධර්මයෝ) අනත්තාති (අනාත්මය)

☞a. නිරොධ සමාපත්තියෙන් නැගී වැඩ සිටිනවා වැනිවූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරාජාණන් වහන්සේට මේ මලින් පූජා කරමි. පූජා කරමි පූජා කරමි.
b. මේ මල් පූජාව බුදු පසේ බුදු අග්‍ර ශ්‍රාවක මහා ශ්‍රාවක රහතන් වහන්සේලා ආදී උතුමන්ගේ ස්වභාව චාරිත්‍රයකි. මමද උන්වහන්සේලා අනුවපවතින්නෙක්/අනුවර්ථනය වන්නෙක් වෙමි.
c. දැන් මේල වර්ණයෙන්ද මනා වර්ණ ඇත්තේය. සුවඳන්ද මිහිරි සුවඳ ඇත්තේය. හැඩයෙන්ද මනහර හැඩයක් ඇත්තේය.එහෙත් තව මොහොතකින් දුර්වර්ණයටද, දුර්ගන්ධයටද, අවහැඩයකට, අනිත්‍යභාවයටද පත්වන්නේය. එපරිද්දේම සියලු සංස්කාරයෝ අනිත්‍යය, සියලු සංස්කාරයෝ දුක්ය, සියලු ධර්මයො අනාත්මය.

<u>බුද්ධ වන්දනා ක්‍රම</u>

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිස ධම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවාති.

➔ සෝ(ඒ) භගවා(භාග්‍යවතුන් වහන්සේ) ඉතිපි(මෙසේද/මේ මේ කරුණින්ද [උත්තම වූ සේක]) [කුමන කුමන කරුණින්ද යත්]

අරහං(සියලු පූජාවන් ලැබීමට සුදුසු බවින් උත්තම වූ සේක) සම්මා සම්බුද්ධෝ (සියලු ධර්ම තමා විසින්ම මනාලෙස අවබෝධ කලහෙයින්ද උත්තම වූ සේක) විජ්ජාචරණ සම්පන්නෝ (ත්‍රී විද්‍යා අෂ්ඨ විද්‍යා පසලොස් චරණ ධර්මයන්ගෙන් සම්පන්න වූ හෙයින් ද උත්තම වූ සේක) සුගතෝ(මනා ගමනින් බුදුබවට වැඩමකල හෙයින් ද උත්තම වූ සේක) ලෝකවිදූ (තුන්ලොව අවබෝකල හෙයින්ද උත්තම වූ සේක) අනුත්තරෝ (තමාට වඩා ගුණයෙන් වැඩි කෙනෙක් ලොවෙහි නැති බැවින්ද උත්තම වූ සේක) පුරිසධම්ම සාරථී (දමණය කලයුතු පුරුෂයන් දමනයකරණ හෙයින්ද උත්තම වූ සේක) සත්ථා දේව මනුස්සානං (සියලු දෙවි මිනිසුන්ට මෙලොව පරලොව නිවන් සැප පිණිස අනුශාසනාකරන ශාස්තෲන් හෙයින් ද උත්තම වූ සේක) බුද්ධෝ (අන්අයටද ධර්මය අවබෝධ කරවන හෙයින් ද උත්තම වූ සේක) භගවා (සියලු භාග්‍යයන්ගෙන් පිරිපුණ් හෙයින් ද උත්තම වූ සේක)

☞ ඒ භාග්‍යවතුන් වහන්සේ, මේ මේ කරුණින්ද උත්තම වූ සේක, කුමන කුමන කරුණින්ද යත්, සියලු පූජාවන් ලැබීමට සුදුසු බවින් උත්තම වූ සේක, සියලු ධර්ම තමා විසින්ම මනාලෙස අවබෝධ කලහෙයින්ද උත්තම වූ සේක, ත්‍රී විද්‍යා අෂ්ඨ විද්‍යා පසලොස් චරණ ධර්මයන්ගෙන් සම්පන්න වූ හෙයින් ද උත්තම වූ සේක, මනා ගමනින් බුදුබවට වැඩමකල හෙයින් ද උත්තම වූ සේක, තුන්ලොව අවබෝකල හෙයින්ද උත්තම වූ සේක, තමාට වඩා ගුණයෙන් වැඩි කෙනෙක් ලොවෙහි නැති බැවින්ද උත්තම වූ සේක, දමණය කලයුතු පුරුෂයන් දමනයකරණ හෙයින්ද උත්තම වූ සේක, සියලු දෙවි මිනිසුන්ට මෙලොව පරලොව නිවන් සැප පිණිස අනුශාසනාකරන ශාස්තෲන් හෙයින් ද උත්තම වූ සේක, අන්අයටද ධර්මය අවබෝධ කරවන හෙයින් ද උත්තම වූ සේක, සියලු භාග්‍යයන්ගෙන් පිරිපුණ් හෙයින් ද උත්තම වූ සේක.

★මය්හං භගවා අරහං, අරහං වත මය්හං භගවා, තං අරහන්තං භගවන්තං සිරසා නමාමි. මය්හං අරහතෝ භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං භන්තේ භගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) අරහං (අරහං නම් වනසේක), අරහං(අරහං නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) අරහන්තං(අරහං නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) අරහතෝ(අරහං නම් වූ) භගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) භන්තේ(ස්වාමීනි) භගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ අරහං නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ අරහං නම් වනසේක, ඒ අරහං නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ අරහං නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං භගවා සම්මා සම්බුද්ධෝ, සම්මා සම්බුද්ධෝ වත මය්හං භගවා, තං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි. මය්හං සම්මා සම්බුද්ධස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං භන්තේ භගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) සම්මා සම්බුද්ධෝ (සම්මා සම්බුද්ධ නම් වනසේක), සම්මා සම්බුද්ධෝ (සම්මා සම්බුද්ධ නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) සම්මා සම්බුද්ධං (සම්මා සම්බුද්ධ නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) සම්මා සම්බුද්ධස්ස (සම්මා සම්බුද්ධ නම් වූ)

භගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) භන්තේ(ස්වාමීනි) භගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ නම් වනසේක, ඒ සම්මා සම්බුද්ධ නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ සම්මා සම්බුද්ධ නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං භගවා විජ්ජාචරණ සම්පන්නෝ, විජ්ජාචරණ සම්පන්නෝ වත මය්හං භගවා, තං විජ්ජාචරණ සම්පන්නං භගවන්තං සිරසා නමාමි. මය්හං විජ්ජාචරණ සම්පන්නස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං භන්තේ භගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) විජ්ජාචරණ සම්පන්නෝ (විජ්ජාචරණ සම්පන්න නම් වනසේක), විජ්ජාචරණ සම්පන්නෝ (විජ්ජාචරණ සම්පන්න නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) විජ්ජාචරණ සම්පන්නං (විජ්ජාචරණ සම්පන්න නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) විජ්ජාචරණ සම්පන්නස්ස (විජ්ජාචරණ සම්පන්න නම් වූ) භගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) භන්තේ(ස්වාමීනි) භගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නම් වනසේක, ඒ විජ්ජාචරණ සම්පන්න නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ විජ්ජාචරණ සම්පන්න නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං භගවා සුගතෝ, සුගතෝ වත මය්හං භගවා, තං සුගතං භගවන්තං සිරසා නමාමි. මය්හං සුගතස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං භන්තේ භගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) සුගතෝ (සුගත නම් වනසේක), සුගතෝ (සුගත නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) සුගතං (සුගත නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) සුගතස්ස (සුගත නම් වූ) භගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) භන්තේ(ස්වාමීනි) භගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ සුගත නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ සුගත නම් වනසේක, ඒ සුගත නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ සුගත නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං භගවා ලෝකවිදූ, ලෝකවිදූ වත මය්හං භගවා, තං ලෝකවිදූං භගවන්තං සිරසා නමාමි. මය්හං ලෝකවිදූනෝ භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං භන්තේ භගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) ලෝකවිදූ (ලෝකවිදූ නම් වනසේක), ලෝකවිදූ (ලෝකවිදූ නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) ලෝකවිදූං (ලෝකවිදූ නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) ලෝකවිදූනෝ (ලෝකවිදූ නම් වූ) භගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) භන්තේ(ස්වාමීනි) භගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ ලෝකවිදූ නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ ලෝකවිදූ නම් වනසේක, ඒ ලෝකවිදූ නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ ලෝකවිදූ නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං භගවා අනුත්තරෝ පුරිසධම්ම සාරථී, අනුත්තරෝ පුරිසධම්ම සාරථී වත මය්හං භගවා, තං අනුත්තරෝ පුරිසධම්ම සාරථිං භගවන්තං සිරසා නමාමි. මය්හං අනුත්තරෝ පුරිසධම්ම සාරථිනෝ භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං භන්තේ භගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) අනුත්තරෝ පුරිසධම්ම සාරථී (අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වනසේක), අනුත්තරෝ පුරිසධම්ම සාරථී (අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) අනුත්තරෝ පුරිසධම්ම සාරථිං (අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) අනුත්තරෝ පුරිසධම්ම සාරථිනෝ (අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වූ) භගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) භන්තේ(ස්වාමීනි) භගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වනසේක, ඒ අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ අනුත්තරෝ පුරිසධම්ම සාරථී නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං භගවා සත්ථා දේව-මනුස්සානං, සත්ථා දේව-මනුස්සානං වත මය්හං භගවා, තං සත්ථාරං දේව-මනුස්සානං භගවන්තං සිරසා නමාමි. මය්හං සත්ථුනෝ දේව-මනුස්සානං භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං භන්තේ භගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) සත්ථා දේව-මනුස්සානං (සත්ථා දේව-මනුස්සානං නම් වනසේක), සත්ථා දේව-මනුස්සානං (සත්ථා දේව-මනුස්සානං නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) සත්ථාරං දේව-මනුස්සානං (සත්ථා දේව-මනුස්සානං නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට)

සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) සත්ථුනෝ දේව-මනුස්සානං (සත්ථා දේව-මනුස්සානං නම් වූ) හගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) හන්තේ(ස්වාමීනි) හගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ සත්ථා දේව-මනුස්සානං නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ සත්ථා දේව-මනුස්සානං නම් වනසේක, ඒ සත්ථා දේව-මනුස්සානං නම් වූ භාග්යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ සත්ථා දේව-මනුස්සානං නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං හගවා බුද්ධෝ, බුද්ධෝ වත මය්හං හගවා, තං බුද්ධං හගවන්තං සිරසා නමාමි. මය්හං බුද්ධස්ස හගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං හන්තේ හගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) හගවා (භාග්‍යවතුන් වහන්සේ) බුද්ධෝ (බුද්ධ නම් වනසේක), බුද්ධෝ (බුද්ධ නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) හගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) බුද්ධං (බුද්ධ නම් වූ) හගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) බුද්ධස්ස (බුද්ධ නම් වූ) හගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) හන්තේ(ස්වාමීනි) හගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ බුද්ධ නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ බුද්ධ නම් වනසේක, ඒ බුද්ධ නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ බුද්ධ නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං හගවා හගවා, හගවා වත මය්හං හගවා, තං හගවන්තං හගවන්තං සිරසා නමාමි. මය්හං හගවතෝ හගවතෝ අත්තානං පරිච්චජාමි. තාරේතු මං හන්තේ හගවා සංසාරම්හා

➔ මය්හං(මගේ) හගවා (භාග්‍යවතුන් වහන්සේ) හගවා (හගවා නම් වනසේක), හගවා (හගවා නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) හගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) හගවන්තං(හගවා නම් වූ) හගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා [නමාමි+අහං] නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) හගවතෝ(හගවා නම් වූ) හගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) හන්තේ(ස්වාමීනි) හගවා(භාග්‍යවතුන් වහන්සේ) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සේ හගවා නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ හගවා නම් වනසේක, ඒ හගවා නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ හගවා නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★ උපාලි සූත්‍රයෙන් (මජ්ඣිම නිකාය)

‘‘ධීරස්ස විගතමෝහස්ස, පභින්නඛීලස්ස විජිතවිජයස්ස
අනීඝස්ස සුසමචිත්තස්ස, වුද්ධසීලස්ස සාධුපඤ්ඤස්ස
වෙස්සන්තරස්ස විමලස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

☞ ඒ ධීර නම්වූ විගතමෝහ නම්වූ, පභින්නඛීල නම්වූ විජිතවිජය නම්වූ අනීඝ නම්වූ සුසමචිත්ත නම්වූ, වුද්ධසීල නම්වූ සාධුපඤ්ඤ නම්වූ වෙස්සන්තර නම්වූ විමල නම්වූ භාග්‍යවතුන් වහන්සේගේ සාවකයෙක් වෙමි.

‘‘අකථංකථිස්ස තුසිතස්ස, වන්තලෝකාමිසස්ස මුදිතස්ස;
කතසමණස්ස මනුජස්ස, අන්තිමසාරීරස්ස නරස්ස;
අනෝපමස්ස විරජස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

‘‘අසංසයස්ස කුසලස්ස, වෙනයිකස්ස සාරථිවරස්ස;
අනුත්තරස්ස රුචිරධම්මස්ස, නික්කඞ්ඛස්ස පභාසකරස්ස
මානච්ඡිදස්ස වීරස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

‘‘නිසභස්ස අප්පමෙය්‍යස්ස, ගම්භීරස්ස මෝනපත්තස්ස;
ඛෙමඞ්කරස්ස වෙදස්ස, ධම්මට්ඨස්ස සංවුතත්තස්ස;
සඞ්ගාතිගස්ස මුත්තස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

‘‘නාගස්ස පන්තසෙනස්ස, ඛීණසංයෝජනස්ස මුත්තස්ස;
පටිමන්තකස්ස ධෝනස්ස, පන්නධජස්ස වීතරාගස්ස;
දන්තස්ස නිප්පපඤ්චස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

‘‘ඉසිසත්තමස්ස අකුහස්ස, තෙවිජ්ජස්ස බ්‍රහ්මපත්තස්ස;
නහාතකස්ස පදකස්ස, පස්සද්ධස්ස විදිතවෙදස්ස;
පුරින්දදස්ස සක්කස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

‘‘අරියස්ස භාවිතත්තස්ස, පත්තිපත්තස්ස වෙය්‍යාකරණස්ස;
සතිමතෝ විපස්සිස්ස, අනභිනතස්ස නො අපනතස්ස;
අනෙජස්ස වසිප්පත්තස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි

සම්මග්ගතස්ස ඣායිස්ස, අනනුගතන්තරස්ස සුද්ධස්ස;
අසිතස්ස අප්පභීනස්ස, පවිවිත්තස්ස අග්ගප්පත්තස්ස;
තිණ්ණස්ස තාරයන්තස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

‘‘සන්තස්ස භූරිපඤ්ඤස්ස, මහාපඤ්ඤස්ස වීතලෝභස්ස;
තථාගතස්ස සුගතස්ස, අප්පටිපුග්ගලස්ස අසමස්ස;
විසාරදස්ස නිපුණස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මි.

‘‘තණ්හච්ඡිදස්ස බුද්ධස්ස, වීතධූමස්ස අනුපලිත්තස්ස;
ආහුනෙය්‍යස්ස යක්ඛස්ස, උත්තමපුග්ගලස්ස අතුලස්ස;
මහතෝ යසග්ගපත්තස්ස, භගවතෝ තස්ස සාවකෝහමස්මී’’.

★මය්හං භගවා ධීරෝ, ධීරෝ වත මය්හං භගවා, තං ධිරං භගවන්තං සිරසා නමාමි. මය්හං ධීරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ධීරෝ භගවා තාරේතු මං සංසාරම්හා

➔ මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) ධීරෝ (මහා නුවණ ඇතිහෙයින් ධීර නම් වනසේක), ධීරෝ (මහා නුවණ ඇතිහෙයින් ධීර නම් වනසේක) වත(ඒකාන්තයෙන්) මය්හං(මගේ) භගවා (භාග්‍යවතුන් වහන්සේ), තං(ඒ) ධීරං (ධීර නම් වූ) භගවන්තං(භාග්‍යවතුන් වහන්සේට) සිරසා නමාමි (මාගේ නමස්කාරෙය වේවා!). මය්හං(මාගේ) ධීරස්ස (ධීර නම් වූ) භගවතෝ(භාග්‍යවතුන් වහන්සේට) අත්තානං([මාගේ] ජීවිතය) පරිච්චජාමි (පූජාකරමි). ධීරෝ (ධීර නම්වූ) භගවා(භාග්‍යවතුන් වහන්සේ) තාරේතු (එතෙරකරන සේක්වා) මං(මා) සංසාරම්හා (සංසාරයෙන්)

☞ මගේ භාග්‍යවතුන් වහන්සෙ මහා නුවණ ඇතිහෙයින් ධීර නම් වනසේක, ඒකාන්තයෙන් මගේ භාග්‍යවතුන් වහන්සේ ධීර නම් වනසේක, ඒ ධීර නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරෙය වේවා! මාගේ ධීර නම් වූ භාග්‍යවතුන් වහන්සේට මාගේ ජීවිතය පූජාකරමි. ධීර නම්වූ භාග්‍යවතුන් වහන්ස! මා සංසාරයෙන් එතෙරකරන සේක්වා.

★මය්හං භගවා පභින්නඛීලෝ, පභින්නඛීලෝ වත මය්හං භගවා, තං පභින්නඛීලං භගවන්තං සිරසා නමාමි. මය්හං පභින්නඛීලස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පභින්නඛීලෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ පභින්නඛීලෝ = කෙලෙස් හුල් බිඳලූහෙයින් පභින්නඛීල නම්වන සේක.

★මය්හං භගවා අනීඝෝ, අනීඝෝ වත මය්හං භගවා, තං අනීඝං භගවන්තං සිරසා නමාමි. මය්හං අනීඝස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අනීඝෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ අනීඝෝ = කෙලෙස්දුක් නැතිහෙයින් අනීඝ නම්වන සේක.

★මය්හං භගවා විජිතවිජයෝ, විජිතවිජයෝ වත මය්හං භගවා, තං විජිතවිජයං භගවන්තං සිරසා නමාමි. මය්හං විජිතවිජයස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. විජිතවිජයෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **විජිතවිජයෝ** = කෙලෙස් සතුරන් දිණූහෙයින් **විජිතවිජය** නම්වන සේක.

★මය්හං භගවා සුසමචිත්තෝ, සුසමචිත්තෝ වත මය්හං භගවා, තං සුසමචිත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං සුසමචිත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සුසමචිත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **සුසමචිත්තෝ** = සැමට සමසිත් ඇතිහෙයින් **සුසමචිත්ත** නම්වන සේක.

★මය්හං භගවා වුද්ධසිලෝ, වුද්ධසිලෝ වත මය්හං භගවා, තං වුද්ධසිලං භගවන්තං සිරසා නමාමි. මය්හං වුද්ධසිලස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වුද්ධසිලෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ වුද්ධසිලෝ = වැඩුනු සිල්ගුණ ඇතිහෙයින් වුද්ධසිල නම්වන සේක.

★මය්හං භගවා සාදුපඤ්ඤෝ, සාදුපඤ්ඤෝ වත මය්හං භගවා, තං සාදුපඤ්ඤං භගවන්තං සිරසා නමාමි. මය්හං සාදුපඤ්ඤස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සාදුපඤ්ඤෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **සාදුපඤ්ඤෝ** = සොඳුරු ප්‍රඥා ඇතිහෙයින් සාදුපඤ්ඤ නම්වන සේක.

★**මය්හං භගවා වෙස්සන්තරෝ, වෙස්සන්තරෝ වත මය්හං භගවා, තං වෙස්සන්තරං භගවන්තං සිරසා නමාමි. මය්හං වෙස්සන්තරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වෙස්සන්තරෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **වෙස්සන්තරෝ** = කෙලෙසුන්ගෙන් එතරවූහෙයින් **වෙස්සන්තර** නම්වන සේක.

★**මය්හං භගවා විමලෝ, විමලෝ වත මය්හං භගවා, තං විමලං භගවන්තං සිරසා නමාමි. මය්හං විමලස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. විමලෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **විමලෝ** = රාගාදී කෙලෙසුන්ගෙන් නිර්මලවූ හෙයින් **විමල** නම්වන සේක.

★**මය්හං භගවා අකථංකථී, අකථංකථී වත මය්හං භගවා, තං අකථංකථිං භගවන්තං සිරසා නමාමි. මය්හං අකථංකථිස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අකථංකථී භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **අකථංකථී** = කිසිතැනක සැකයක් නැතිහෙයින් **අකථංකථී** නම්වන සේක.

★**මය්හං භගවා තුසිතෝ, තුසිතෝ වත මය්හං භගවා, තං තුසිතං භගවන්තං සිරසා නමාමි. මය්හං තුසිතස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තුසිතෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **තුසිතෝ** = සතුටුසිත් ඇතිහෙයින් **තුසිත** නම්වන සේක.

★**මය්හං භගවා වන්තලෝකාමිසෝ, වන්තලෝකාමිසෝ වත මය්හං භගවා, තං වන්තලෝකාමිසං භගවන්තං සිරසා නමාමි. මය්හං වන්තලෝකාමිසස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වන්තලෝකාමිසෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **වන්තලෝකාමිසෝ** = සියලු කාමආසාවන් බැහැරකලහෙයින් **වන්තලෝකාමිස** නම්වන සේක.

★**මය්හං භගවා මුදිතෝ, මුදිතෝ වත මය්හං භගවා, තං මුදිතං භගවන්තං සිරසා නමාමි. මය්හං මුදිතස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මුදිතෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **මුදිතෝ** = මුදිතා ගුණයෙන් යුතුහෙයින් **මුදිත** නම්වන සේක.

★**මය්හං භගවා කතසමණෝ, කතසමණෝ වත මය්හං භගවා, තං කතසමණං භගවන්තං සිරසා නමාමි. මය්හං කතසමණස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. කතසමණෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **කතසමණෝ** = සියලු ශ්‍රමණ ගුණයන්ට පැමිණිහෙයින් **කතසමණ** නම්වන සේක.

★**මය්හං භගවා මනුජෝ, මනුජෝ වත මය්හං භගවා, තං මනුජං භගවන්තං සිරසා නමාමි. මය්හං මනුජස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මනුජෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **මනුජෝ** = සියලු මිනිසුන්ට උත්තමවූහෙයින් **මනුජ** නම්වන සේක.

★**මය්හං භගවා අන්තිමසාරී, අන්තිමසාරී වත මය්හං භගවා, තං අන්තිමසාරිං භගවන්තං සිරසා නමාමි. මය්හං අන්තිමසාරිස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අන්තිමසාරී භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **අන්තිමසාරී** = අවසන් සිරුර දරනහෙයින් **අන්තිමසාරී** නම්වන සේක.

★**මය්හං භගවා නරෝ, නරෝ වත මය්හං භගවා, තං නරං භගවන්තං සිරසා නමාමි. මය්හං නරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. නරෝ භගවා තාරේතු මං සංසාරම්හා**

☞ **නරෝ** = උතුම් මිනිසෙක් හෙයින් **නර** නම්වන සේක.

★මය්හං භගවා අනෝපමෝ, අනෝපමෝ වත මය්හං භගවා, තං අනෝපමං භගවන්තං සිරසා නමාමි. මය්හං අනෝපමස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අනෝපමෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **අනෝපමෝ** = උපමාකලහැක්කෙක් නැතිහෙයින් **අනෝපම** නම්වන සේක.

★මය්හං භගවා විරජෝ, විරජෝ වත මය්හං භගවා, තං විරජං භගවන්තං සිරසා නමාමි. මය්හං විරජස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. විරජෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **විරජෝ** = කෙලෙස් දූහුලි නැතිහෙයින් විරජ නම්වන සේක.

★මය්හං භගවා අසංසයෝ, අසංසයෝ වත මය්හං භගවා, තං අසංසයං භගවන්තං සිරසා නමාමි. මය්හං අසංසයස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අසංසයෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **අසංසයෝ** = සැකසංකා නැතිහෙයින් **අසංසය** නම්වන සේක.

★මය්හං භගවා කුලෝ, කුලෝ වත මය්හං භගවා, තං කුලං භගවන්තං සිරසා නමාමි. මය්හං කුලස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. කුලෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **කුලෝ** = කුලවත්බවින් උතුම් හෙයින් කුල නම්වන සේක.

★මය්හං භගවා වේනයිකෝ, වේනයිකෝ වත මය්හං භගවා, තං වේනයිකං භගවන්තං සිරසා නමාමි. මය්හං වේනයිකස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වේනයිකෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **වේනයිකෝ** = සියලු සතුන් හික්මවන හෙයින **වේනයික** නම්වන සේක.

★මය්හං භගවා සාරථීවරෝ, සාරථීවරෝ වත මය්හං භගවා, තං සාරථීවරං භගවන්තං සිරසා නමාමි. මය්හං සාරථීවරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සාරථීවරෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **සාරථීවරෝ** = සසරෙන් එතරකරවන උතුම් රථාචාර්යවරයා බැවින් **සාරථීවර** නම්වන සේක.

★මය්හං භගවා අනුත්තරො, අනුත්තරො වත මය්හං භගවා, තං අනුත්තරං භගවන්තං සිරසා නමාමි. මය්හං අනුත්තරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අනුත්තරො භගවා තාරේතු මං සංසාරම්හා

☞ **අනුත්තරො** = සියලු සතුන්ට උත්තමහෙයින **අනුත්තර** නම්වන සේක.

★මය්හං භගවා රුචිරධම්මෝ, රුචිරධම්මෝ වත මය්හං භගවා, තං රුචිරධම්මං භගවන්තං සිරසා නමාමි. මය්හං රුචිරධම්මස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. රුචිරධම්මෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **රුචිරධම්මෝ** = පිරිසිදු දහම් ඇතිහෙයින **රුචිරධම්ම** නම්වන සේක.

★මය්හං භගවා නික්කඞ්ඛෝ, නික්කඞ්ඛෝ වත මය්හං භගවා, තං නික්කඞ්ඛං භගවන්තං සිරසා නමාමි. මය්හං නික්කඞ්ඛස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. නික්කඞ්ඛෝ භගවා තාරේතු මං සංසාරම්හා

☞ **නික්කඞ්ඛෝ** = සැකසංකා නැතිහෙයින් **නික්කඞ්ඛ** නම්වන සේක.

★මය්හං භගවා පභාසකරෝ, පභාසකරෝ වත මය්හං භගවා, තං පභාසකරං භගවන්තං සිරසා නමාමි. මය්හං පභාසකරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පභාසකරෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **පභාසකරෝ** = නුවණින් මුලුලොව එළියකරනාහෙයින් **පභාසකර** නම්වන සේක.

★මය්හං භගවා මානච්ඡිදෝ, මානච්ඡිදෝ වත මය්හං භගවා, තං මානච්ඡිදං භගවන්තං සිරසා නමාමි. මය්හං මානච්ඡිදස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මානච්ඡිදෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **මානච්ඡිදෝ** = මානය සිදලූහෙයින් **මානච්ඡිද** නම්වන සේක.

★මය්හං භගවා මහාවිරෝ, මහාවීරෝ වත මය්හං භගවා, තං මහාවීරං භගවන්තං සිරසා නමාමි. මය්හං මහාවීරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මහාවිරෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ මහාවීරෝ = මහාවීර ගුණඇතිහෙයින් මහාවීර නම්වන සේක.

★මය්හං භගවා නිසභෝ, නිසභෝ වත මය්හං භගවා, තං නිසභං භගවන්තං සිරසා නමාමි. මය්හං නිසභස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. නිසභෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **නිසභෝ** = අසම ගුණඇතිහෙයින් **නිසභ** නම්වන සේක.

★මය්හං භගවා අප්පමෙය්‍යෝ, අප්පමෙය්‍යෝ වත මය්හං භගවා, තං අප්පමෙය්‍යං භගවන්තං සිරසා නමාමි. මය්හං අප්පමෙය්‍යස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අප්පමෙය්‍යෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අප්පමෙය්‍යෝ** = මැනිය නොහැකි ගුණඇතිහෙයින් **අප්පමෙය්‍ය** නම්වන සේක.

★මය්හං භගවා ගම්භීරෝ, ගම්භීරෝ වත මය්හං භගවා, තං ගම්භීරං භගවන්තං සිරසා නමාමි. මය්හං ගම්භීරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ගම්භීරෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **ගම්භීරෝ** = ගැඹුරු ගුණඇතිහෙයින් **ගම්භීර** නම්වන සේක.

★මය්හං භගවා මෝනපත්තෝ, මෝනපත්තෝ වත මය්හං භගවා, තං මෝනපත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං මෝනපත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මෝනපත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **මෝනපත්තෝ** = උතුම් නුවණට පැමිණිහෙයින් **මෝනපත්ත** නම්වන සේක.

★මය්හං භගවා ඛේමඞ්කරෝ, ඛේමඞ්කරෝ වත මය්හං භගවා, තං ඛේමඞ්කරං භගවන්තං සිරසා නමාමි. මය්හං ඛේමඞ්කරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ඛේමඞ්කරෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **ඛේමඞ්කරෝ** = උතුම් නිවන සාදාදෙන-හෙයින් **ඛේමඞ්කර** නම්වන සේක.

★මය්හං භගවා වේදෝ, වේදෝ වත මය්හං භගවා, තං වේදං භගවන්තං සිරසා නමාමි. මය්හං වේදස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වේදෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **වේදෝ** = උතුම් නුවණ ඇතිහෙයින් **වේද** නම්වන සේක.

★**මය්හං භගවා ධම්මට්ඨෝ, ධම්මට්ඨෝ වත මය්හං භගවා, තං ධම්මට්ඨං භගවන්තං සිරසා නමාමි. මය්හං ධම්මට්ඨස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ධම්මට්ඨෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **ධම්මට්ඨෝ** = උතුම් දහමෙහි සිටිනබැවින් **ධම්මට්ඨ** නම්වන සේක.

★**මය්හං භගවා සංවුතත්තෝ, සංවුතත්තෝ වත මය්හං භගවා, තං සංවුතත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං සංවුතත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සංවුතත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **සංවුතත්තෝ** = සන්සුන් ඉඳුරන් ඇතිහෙයින් **සංවුතත්ත** නම්වන සේක.

★**මය්හං භගවා සඞ්ඝාතිගෝ, සඞ්ඝාතිගෝ වත මය්හං භගවා, තං සඞ්ඝාතිගං භගවන්තං සිරසා නමාමි. මය්හං සඞ්ඝාතිගස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සඞ්ඝාතිගෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **සඞ්ඝාතිගෝ** = කෙලෙස් සංග්‍රාම දිනූහෙයින් **සඞ්ඝාතිග** නම්වන සේක.

★**මය්හං භගවා මුත්තෝ, මුත්තෝ වත මය්හං භගවා, තං මුත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං මුත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මුත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **මුත්තෝ** = දුකින් මිදුනුහෙයින් **මුත්ත** නම්වන සේක.

★**මය්හං භගවා නාගෝ, නාගෝ වත මය්හං භගවා, තං නාගං භගවන්තං සිරසා නමාමි. මය්හං නාගස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. නාගෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **නාගෝ** = මහාඇත්රජෙක් හෙයින් **නාග** නම්වන සේක.

★**මය්හං භගවා පන්තසේනෝ, පන්තසේනෝ වත මය්හං භගවා, තං පන්තසේනං භගවන්තං සිරසා නමාමි. මය්හං පන්තසේනස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පන්තසේනෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **පන්තසේනෝ** = මහාවනයේ වසනාහෙයින් **පන්තසේන** නම්වන සේක.

★**මය්හං භගවා ඛීනසංයෝජනෝ, ඛීනසංයෝජනෝ වත මය්හං භගවා, තං ඛීනසංයෝජනං භගවන්තං සිරසා නමාමි. මය්හං ඛීනසංයෝජනස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ඛීනසංයෝජනෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **ඛීනසංයෝජනෝ** = සසරබැඳුම් බිඳලූහෙයින් **ඛීනසංයෝජන** නම්වන සේක.

★**මය්හං භගවා පටිමන්තකෝ, පටිමන්තකෝ වත මය්හං භගවා, තං පටිමන්තකං භගවන්තං සිරසා නමාමි. මය්හං පටිමන්තකස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පටිමන්තකෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **පටිමන්තකෝ** = නුවණින් යුතු කථාබහ ඇතිහෙයින් **පටිමන්තක** නම්වන සේක.

★**මය්හං භගවා ධෝනෝ, ධෝනෝ වත මය්හං භගවා, තං ධෝනං භගවන්තං සිරසා නමාමි. මය්හං ධෝනස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ධෝනෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **ධෝනෝ** = කෙලෙස් සෝදාහරින නුවණ ඇතිහෙයින් **ධෝන** නම්වන සේක.

★**මය්හං භගවා පන්නධජෝ, පන්නධජෝ වත මය්හං භගවා, තං පන්නධජං භගවන්තං සිරසා නමාමි. මය්හං පන්නධජස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පන්නධජෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **පන්නධජෝ** = මානධජ බිඳලූහෙයින් **පන්නධජ** නම්වන සේක.

★**මය්හං භගවා වීතරාගෝ, වීතරාගෝ වත මය්හං භගවා, තං වීතරාගං භගවන්තං සිරසා නමාමි. මය්හං වීතරාගස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වීතරාගෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **වීතරාගෝ** = දුරුකල රාගයන් ඇතිහෙයින් **වීතරාග** නම්වන සේක.

★**මය්හං භගවා දන්තෝ, දන්තෝ වත මය්හං භගවා, තං දන්තං භගවන්තං සිරසා නමාමි. මය්හං දන්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. දන්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **දන්තෝ** = කෙලෙස් දමනයක-හෙයින් **දන්ත** නම්වන සේක.

★**මය්හං භගවා නිප්පපඤ්චෝ, නිප්පපඤ්චෝ වත මය්හං භගවා, තං නිප්පපඤ්චං භගවන්තං සිරසා නමාමි. මය්හං නිප්පපඤ්චස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. නිප්පපඤ්චෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **නිප්පපඤ්චෝ** = රාගාදී කෙලෙසුන්ගෙන් වෙන්වූහෙයින් **නිප්පපඤ්ච** නම්වන සේක.

★**මය්හං භගවා ඉසිසත්තමෝ, ඉසිසත්තමෝ වත මය්හං භගවා, තං ඉසිසත්තමං භගවන්තං සිරසා නමාමි. මය්හං ඉසිසත්තමස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ඉසිසත්තමෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **ඉසිසත්තමෝ** = සත්බුදුවරුන් අතරේ සත්වන මහාඍෂිවරයා බැවින් **ඉසිසත්තම** නම්වන සේක.

★**මය්හං භගවා අකූහකෝ, අකූහකෝ වත මය්හං භගවා, තං අකූහකං භගවන්තං සිරසා නමාමි. මය්හං අකූහකස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අකූහකෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **අකූහකෝ** = කුහක ගති නැතිහෙයින් **අකූහක** නම්වන සේක.

★**මය්හං භගවා තේවිජ්ජෝ, තේවිජ්ජෝ වත මය්හං භගවා, තං තේවිජ්ජං භගවන්තං සිරසා නමාමි. මය්හං තේවිජ්ජස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තේවිජ්ජෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **තේවිජ්ජෝ** = ශ්‍රේෂ්ඨ ත්‍රිවිද්‍යාවන්ගෙන් සමන්විතහෙයින් **තේවිජ්ජ** නම්වන සේක.

★**මය්හං භගවා බ්‍රහ්මපත්තෝ, බ්‍රහ්මපත්තෝ වත මය්හං භගවා, තං බ්‍රහ්මපත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං බ්‍රහ්මපත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. බ්‍රහ්මපත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **බ්‍රහ්මපත්තෝ** = ශ්‍රේෂ්ඨත්වයට පත්වූහෙයින් **බ්‍රහ්මපත්ත** නම්වන සේක.

★**මය්හං භගවා නහාතකෝ, නහාතකෝ වත මය්හං භගවා, තං නහාතකං භගවන්තං සිරසා නමාමි. මය්හං නහාතකස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. නහාතකෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **නහාතකෝ** = සියලු කෙලෙස් සෝදාහල-හෙයින් **නහාතක** නම්වන සේක.

★මය්හං භගවා පදකෝ, පදකෝ වත මය්හං භගවා, තං පදකං භගවන්තං සිරසා නමාමි. මය්හං පදකස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පදකෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **පදකෝ** = දහම්දෙසීමෙහි දක්ෂබැවින් **පදක** නම්වන සේක.

★මය්හං භගවා පස්සද්ධෝ, පස්සද්ධෝ වත මය්හං භගවා, තං පස්සද්ධං භගවන්තං සිරසා නමාමි. මය්හං පස්සද්ධස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පස්සද්ධෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **පස්සද්ධෝ** = සංසිඳුනු සිතක් බැවින් **පස්සද්ධ** නම්වන සේක.

★මය්හං භගවා විදිතවේදෝ, විදිතවේදෝ වත මය්හං භගවා, තං විදිතවේදං භගවන්තං සිරසා නමාමි. මය්හං විදිතවේදස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. විදිතවේදෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **විදිතවේදෝ** = මහානුවණ ලැබූහෙයින් **විදිතවේද** නම්වන සේක.

★මය්හං භගවා පුරින්දදෝ, පුරින්දදෝ වත මය්හං භගවා, තං පුරින්දදං භගවන්තං සිරසා නමාමි. මය්හං පුරින්දදස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පුරින්දදෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **පුරින්දදෝ** = පළමුව දහම් බෙදාදුන්හෙයින් **පුරින්දද** නම්වන සේක.

★මය්හං භගවා සක්කෝ, සක්කෝ වත මය්හං භගවා, තං සක්කං භගවන්තං සිරසා නමාමි. මය්හං සක්කස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සක්කෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **සක්කෝ** = සියලුදේහි දක්ෂබැවින් **සක්ක** නම්වන සේක.

★මය්හං භගවා අරියෝ, අරියෝ වත මය්හං භගවා, තං අරියං භගවන්තං සිරසා නමාමි. මය්හං අරියස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අරියෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අරියෝ** = උතුම් ආර්යබාවයට පැමිණිහෙයින් **අරිය** නම්වන සේක.

★මය්හං භගවා භාවිතත්තෝ, භාවිතත්තෝ වත මය්හං භගවා, තං භාවිතත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං භාවිතත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. භාවිතත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **භාවිතත්තෝ** = ගුණයෙන් වඩනලද සිත් ඇතිහෙයින් **භාවිතත්ත** නම්වන සේක.

★මය්හං භගවා පත්තිපත්තෝ, පත්තිපත්තෝ වත මය්හං භගවා, තං පත්තිපත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං පත්තිපත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පත්තිපත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **පත්තිපත්තෝ** = සියලු ගුණයන්ට පැමිණිහෙයින් **පත්තිපත්ත** නම්වන සේක.

★මය්හං භගවා වෙය්‍යාකරණෝ, වෙය්‍යාකරණෝ වත මය්හං භගවා, තං වෙය්‍යාකරණං භගවන්තං සිරසා නමාමි. මය්හං වෙය්‍යාකරණස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වෙය්‍යාකරණෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **වෙය්‍යාකරණෝ** = දහම් මැනවින් බෙදාදැක්වූහෙයින් **වෙය්‍යාකරණ** නම්වන සේක.

★මය්හං භගවා සතිමා, සතිමා වත මය්හං භගවා, තං සතිමන්තං භගවන්තං සිරසා නමාමි. මය්හං සතිමතෝ භගවතෝ අත්තානං පරිච්චජාමි. සතිමා භගවා තාරේතු මං සංසාරම්හා

☞ **සතිමා** = මනා සිහිනුවණින් යුතුහෙයින් **සතිමා** නම්වන සේක.

★ මය්හං භගවා විපස්සී, විපස්සී වත මය්හං භගවා, තං විපස්සිං භගවන්තං සිරසා නමාමි. මය්හං විපස්සිස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. විපස්සී භගවා තාරේතු මං සංසාරම්හා
☞ **විපස්සී** = නුවණින් ලොව දකිනාහෙයින් **විපස්සී** නම්වන සේක.

★ මය්හං භගවා අනභිනතෝ, අනභිනතෝ වත මය්හං භගවා, තං අනභිනතං භගවන්තං සිරසා නමාමි. මය්හං අනභිනතස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අනභිනතෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අනභිනතෝ** = කෙලෙස් හමුවේ නොනැමෙන හෙයින් **අනභිනත** නම්වන සේක.

★ මය්හං භගවා අනේජෝ, අනේජෝ වත මය්හං භගවා, තං අනේජං භගවන්තං සිරසා නමාමි. මය්හං අනේජස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අනේජෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අනේජෝ** = රාග ගිනි දුරලූහෙයින් **අනේජ** නම්වන සේක.

★ මය්හං භගවා වසිප්පත්තෝ, වසිප්පත්තෝ වත මය්හං භගවා, තං වසිප්පත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං වසිප්පත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වසිප්පත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **වසිප්පත්තෝ** = ලොව සියලුදේ තම වසඟයේ පවත්වනහෙයින් **වසිප්පත්ත** නම්වන සේක.

★ මය්හං භගවා සම්මග්ගතෝ, සම්මග්ගතෝ වත මය්හං භගවා, තං සම්මග්ගතං භගවන්තං සිරසා නමාමි. මය්හං සම්මග්ගතස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සම්මග්ගතෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **සම්මග්ගතෝ** = මනාලෙස ශ්‍රේෂ්ඨත්වයට වැඩියහෙයින් **සම්මග්ගත** නම්වන සේක.

★ මය්හං භගවා ඣායී, ඣායී වත මය්හං භගවා, තං ඣායිං භගවන්තං සිරසා නමාමි. මය්හං ඣායනෝ භගවතෝ අත්තානං පරිච්චජාමි. ඣායී භගවා තාරේතු මං සංසාරම්හා
☞ **ඣායී** = කෙලෙස් දවාලූ-හෙයින් **ඣායී** නම්වන සේක.

★ මය්හං භගවා අනනුගතන්තරෝ, අනනුගතන්තරෝ වත මය්හං භගවා, තං අනනුගතන්තරං භගවන්තං සිරසා නමාමි. මය්හං අනනුගතන්තරස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අනනුගතන්තරෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අනනුගතන්තරෝ** = කෙලෙස්හා එක්නොවන-හෙයින් **අනනුගතන්තර** නම්වන සේක.

★ මය්හං භගවා සුද්ධෝ, සුද්ධෝ වත මය්හං භගවා, තං සුද්ධං භගවන්තං සිරසා නමාමි. මය්හං සුද්ධස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සුද්ධෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **සුද්ධෝ** = අතිපාරිශුද්ධ හෙයින් **සුද්ධ** නම්වන සේක.

★ මය්හං භගවා අසිතෝ, අසිතෝ වත මය්හං භගවා, තං අසිතං භගවන්තං සිරසා නමාමි. මය්හං අසිතස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අසිතෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අසිතෝ** = ලොවේ නොබැඳුනු-හෙයින් **අසිත** නම්වන සේක.

★ **මය්හං භගවා අප්පහීනෝ, අප්පහීනෝ වත මය්හං භගවා, තං අප්පහීනං භගවන්තං සිරසා නමාමි. මය්හං අප්පහීනස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අප්පහීනෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **අප්පහීනෝ** = කිසිකලක හීන නොවන ගුණඇතිහෙයින් **අප්පහීන** නම්වන සේක.

★ **මය්හං භගවා පවිවිත්තෝ, පවිවිත්තෝ වත මය්හං භගවා, තං පවිවිත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං පවිවිත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. පවිවිත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **පවිවිත්තෝ** = හුදකලාවේ ඇලුණු-හෙයින් **පවිවිත්ත** නම්වන සේක.

★ **මය්හං භගවා අග්ගප්පත්තෝ, අග්ගප්පත්තෝ වත මය්හං භගවා, තං අග්ගප්පත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං අග්ගප්පත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අග්ගප්පත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **අග්ගප්පත්තෝ** = ලොවේ අග්‍රබවට පැමිණිහෙයින් **අග්ගප්පත්ත** නම්වන සේක.

★ **මය්හං භගවා තිණ්ණෝ, තිණ්ණෝ වත මය්හං භගවා, තං තිණ්ණං භගවන්තං සිරසා නමාමි. මය්හං තිණ්ණස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තිණ්ණෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **තිණ්ණෝ** = සසරින් එතෙරට වැඩිය-හෙයින් **තිණ්ණ** නම්වන සේක.

★ **මය්හං භගවා තාරයන්තෝ, තාරයන්තෝ වත මය්හං භගවා, තං තාරයන්තං භගවන්තං සිරසා නමාමි. මය්හං තාරයන්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තාරයන්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **තාරයන්තෝ** = ලෝසතුන් දුකෙන් එතරකරවන-හෙයින් **තාරයන්ත** නම්වන සේක.

★ **මය්හං භගවා සන්තෝ, සන්තෝ වත මය්හං භගවා, තං සන්තං භගවන්තං සිරසා නමාමි. මය්හං සන්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. සන්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **සන්තෝ** = අතිශයින් ශාන්ත බැවින් **සන්ත** නම්වන සේක.

★ **මය්හං භගවා භූරිපඤ්ඤෝ, භූරිපඤ්ඤෝ වත මය්හං භගවා, තං භූරිපඤ්ඤං භගවන්තං සිරසා නමාමි. මය්හං භූරිපඤ්ඤස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. භූරිපඤ්ඤෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **භූරිපඤ්ඤෝ** = මහපොළොවමෙන් මහානුවණ ඇතිහෙයින් **භූරිපඤ්ඤෝ** නම්වන සේක.

★ **මය්හං භගවා මහාපඤ්ඤෝ, මහාපඤ්ඤෝ වත මය්හං භගවා, තං මහාපඤ්ඤං භගවන්තං සිරසා නමාමි. මය්හං මහාපඤ්ඤස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මහාපඤ්ඤෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **මහාපඤ්ඤෝ** = මහානුවණ ඇතිහෙයින් **මහාපඤ්ඤෝ** නම්වන සේක.

★ **මය්හං භගවා වීතලෝභෝ, වීතලෝභෝ වත මය්හං භගවා, තං වීතලෝභං භගවන්තං සිරසා නමාමි. මය්හං වීතලෝභස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වීතලෝභෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **වීතලෝභෝ** = ලෝභය දුරුකලහෙයින් **වීතලෝභ** නම්වන සේක.

★ මය්හං භගවා තථාගතෝ, තථාගතෝ වත මය්හං භගවා, තං තථාගතං භගවන්තං සිරසා නමාමි. මය්හං තථාගතස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තථාගතෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **තථාගතෝ** = පෙර බුදුවරුමෙන් වැඩිහෙයින් **තථාගත** නම්වන සේක.

★ මය්හං භගවා අප්පටිපුග්ගලෝ, අප්පටිපුග්ගලෝ වත මය්හං භගවා, තං අප්පටිපුග්ගලං භගවන්තං සිරසා නමාමි. මය්හං අප්පටිපුග්ගලස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අප්පටිපුග්ගලෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අප්පටිපුග්ගලෝ** = මැඩලිය හැක්කෙක් නැතිහෙයින් **අප්පටිපුග්ගල** නම්වන සේක.

★ මය්හං භගවා අසමෝ, අසමෝ වත මය්හං භගවා, තං අසමං භගවන්තං සිරසා නමාමි. මය්හං අසමස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අසමෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අසමෝ** = කිසිවෙකුට සමනොවන-හෙයින් **අසම** නම්වන සේක.

★ මය්හං භගවා විසාරදෝ, විසාරදෝ වත මය්හං භගවා, තං විසාරදං භගවන්තං සිරසා නමාමි. මය්හං විසාරදස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. විසාරදෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **විසාරදෝ** = සියලු දෙයෙහි විශාරදබැවින් **විසාරද** නම්වන සේක.

★ මය්හං භගවා නිපුණෝ, නිපුණෝ වත මය්හං භගවා, තං නිපුණං භගවන්තං සිරසා නමාමි. මය්හං නිපුණස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. නිපුණෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **නිපුණෝ** = සියලු දෙයෙහි දක්ෂබැවින් **නිපුණ** නම්වන සේක.

★ මය්හං භගවා තණ්හච්ඡිදෝ, තණ්හච්ඡිදෝ වත මය්හං භගවා, තං තණ්හච්ඡිදං භගවන්තං සිරසා නමාමි. මය්හං තණ්හච්ඡිදස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. තණ්හච්ඡිදෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **තණ්හච්ඡිදෝ** = තණ්හාව සිදලූහෙයින් **තණ්හච්ඡිද** නම්වන සේක.

★ මය්හං භගවා වීතධූමෝ, වීතධූමෝ වත මය්හං භගවා, තං වීතධූමං භගවන්තං සිරසා නමාමි. මය්හං වීතධූමස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. වීතධූමෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **වීතධූමෝ** = කෙලෙස් දූමයන් පහකල-හෙයින් **වීතධූම** නම්වන සේක.

★ මය්හං භගවා අනුපලිත්තෝ, අනුපලිත්තෝ වත මය්හං භගවා, තං අනුපලිත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං අනුපලිත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අනුපලිත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **අනුපලිත්තෝ** = කෙලෙස් හා නොඇලෙන බැවින් **අනුපලිත්ත** නම්වන සේක.

★ මය්හං භගවා ආහුනෙය්‍යෝ, ආහුනෙය්‍යෝ වත මය්හං භගවා, තං ආහුනෙය්‍යං භගවන්තං සිරසා නමාමි. මය්හං ආහුනෙය්‍යස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. ආහුනෙය්‍යෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **ආහුනෙය්‍යෝ** = සියලු පුද-පූජාවනට සුදුසු බැවින් **ආහුනෙය්‍ය** නම්වන සේක.

★ මය්හං භගවා යක්ඛෝ, යක්ඛෝ වත මය්හං භගවා, තං යක්ඛං භගවන්තං සිරසා නමාමි. මය්හං යක්ඛස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. යක්ඛෝ භගවා තාරේතු මං සංසාරම්හා
☞ **යක්ඛෝ** = මහානුභාව බැවින් **යක්ඛ** නම්වන සේක.

★ **මය්හං භගවා උත්තමපුග්ගලෝ, උත්තමපුග්ගලෝ වත මය්හං භගවා, තං උත්තමපුග්ගලං භගවන්තං සිරසා නමාමි. මය්හං උත්තමපුග්ගලස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. උත්තමපුග්ගලෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **උත්තමපුග්ගලෝ** = ලොවේ උතුම්ම පුද්ගලයා බැවින් **උත්තමපුග්ගල** නම්වන සේක.

★ **මය්හං භගවා අතුලෝ, අතුලෝ වත මය්හං භගවා, තං අතුලං භගවන්තං සිරසා නමාමි. මය්හං අතුලස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. අතුලෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **අතුලෝ** = මැණිය නොහැකි ගුණ ඇතිහෙයින් **අතුල** නම්වන සේක.

★ **මය්හං භගවා මහතෝ යසග්ගපත්තෝ, මහතෝ යසග්ගපත්තෝ වත මය්හං භගවා, තං මහතෝ යසග්ගපත්තං භගවන්තං සිරසා නමාමි. මය්හං මහතෝ යසග්ගපත්තස්ස භගවතෝ අත්තානං පරිච්චජාමි. මහතෝ යසග්ගපත්තෝ භගවා තාරේතු මං සංසාරම්හා**
☞ **මහතෝ යසග්ගපත්ත** = මහත්වූ යසසින් අග්‍රබවට පැමිණිහෙයින් **මහතෝ යසග්ගපත්ත** නම්වන සේක.

සාධු ! සාධු ! සාධු !

1. ආරකත්තා හතත්තා ච - කිලේසාරින සෝ මුනි
හත සංසාර චක්කාරෝ - පච්චයාදීන චාරහෝ
න රහෝ කරෝති පාපානි - අරහං තං නමාමහං

සෝ මුනි කිලේසාරිං ආරකත්තා ච හතත්තා ච, හත සංසාර චක්කාරෝ, පච්චයාදීන [ච+අරහෝ] චාරහෝ, න රහෝ පාපානි කරෝති, අහං තං අරහං නමාමි. # [නමාමි+අහං = නමාමහං]
➔ සෝ(ඒ) මුනි(මුනින්ද්‍රයන් වහන්සේ) කිලේසාරිං (කෙලෙස් සතුරන්) ආරකත්තා ච (දුරුකල හෙයින් ද) හතත්තා ච (නැසූ හෙයින් ද), හත(නැසූ) සංසාර(සංසාර) චක්කාරෝ(චක්‍ර ඇති සේක), පච්චයාදීන (ප්‍රත්‍යාදීනට/ පූජාවන්ට) [ච+අරහෝ] චාරහෝ (සුදුසු වනසේක), රහෝ(රහසින්වත්) පාපානි(පව්) න කරෝති (නොකරන සේක), අහං(මම) තං(ඒ) අරහං(අරහතුන් වහන්සේට) නමාමි (නමස්කාර කරමි.)
☞ ඒ මුනින්ද්‍රයන් වහන්සේ කෙලෙස් සතුරන් දුරුකල හෙයින් ද නැසූ හෙයින් ද, නැසූ සංසාර චක්‍ර ඇති සේක, ප්‍රත්‍යාදී පූජාවන්ට සුදුසු වනසේක, රහසින්වත් පව් නොකරන සේක, මම ඒ අරහතුන් වහන්සේට නමස්කාර කරමි.

2. සම්මා සම්බුද්ධ සද්ධම්ම - සම්මා සම්බුද්ධ දේසන
සම්මා සම්බුද්ධ ඤෙය්‍යාස්ස - සම්මා සම්බුද්ධ තෙ නමො.

සම්මා සම්බුද්ධ සද්ධම්ම, සම්මා සම්බුද්ධ දේසන, සම්මා සම්බුද්ධ ඤෙය්‍යාස්ස, සම්මා සම්බුද්ධ! තෙ නමො.#
➔ සම්මා(මනාව) සම්බුද්ධ(අවබොධකල) සද්ධම්ම(සද්ධර්මය ඇති), සම්මා(මනාව) සම්බුද්ධ(අවබොධකල) දේසන (දේශනා ඇති), සම්මා(මනාව) සම්බුද්ධ(අවබොධකල) ඤෙය්‍යාස්ස (දතයුතු දේ ඇති), සම්මා සම්බුද්ධ! (සම්මා සම්බුදු රජාණන් වහන්ස !) තෙ (ඔබ වහන්සේට) නමො (නමස්කාරය වේවා!)

☞ මනාව අවබොධකල සද්ධර්මය ඇති, මනාව අවබොධකල දේශනා ඇති, මනාව අවබොධකල දතයුතු දේ ඇති, සම්මා සම්බුදු රජාණන් වහන්ස ! ඔබ වහන්සේට නමස්කාරය වේවා!

3. විජ්ජාචරණ සම්පන්නෝ - තිසසෝ විජ්ජා පකාසිතා
අට්ඨ විජ්ජා පඤ්ච දස - චරණං තං නමාමහං.

විජ්ජාචරණ සම්පන්නෝ, තිසසෝ විජ්ජා පකාසිතා, අහං තං අට්ඨ විජ්ජා පඤ්ච දස චරණං නමාමි. # [නමාමි+අහං = නමාමහං]
➔ විජ්ජාචරණ සම්පන්නෝ (විජ්ජාචරණ සම්පන්නවූ), තිසසෝ විජ්ජා (ත්‍රිවිද්‍යාවන්) පකාසිතා (දේශනා කලාවූ), තං(ඒ) අට්ඨ විජ්ජා (අෂ්ඨ විද්‍යා) පඤ්ච දස චරණං (පසලොස් චරණ ධර්මයන්ගෙන් සමන්විතයන් වහන්ස !) [ඔබ වහන්සේට] අහං නමාමි (මාගේ නමස්කාරය වේවා !)
☞ විජ්ජාචරණ සම්පන්නවූ, ත්‍රිවිද්‍යාවන් දේශනා කලාවූ, ඒ අෂ්ඨ විද්‍යා පසලොස් චරණ ධර්මයන්ගෙන් සමන්විතයන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

4. සුගතත්තා සුගත්තත්තා - සෝභනා යස්ස වා ගති,
ගතත්තා සුන්දරං ඨානං - සුගතෝ නාම තේ නමෝ

සුගතත්තා සුගත්තත්තා යස්සවා ගති සෝභනා, සුන්දරං ඨානං ගතත්තා, සුගතෝ නාම තේ නමෝ
➔ සුගතත්තා (ශෝභන වචන ඇති හෙයින්ද) සුගත්තත්තා (ශෝභන සිරුරක් ඇති හෙයින්ද) යස්සවා (යමෙකුගේ) ගති (පැමිණි මග) සෝභනා (ශෝභන හෙයින්ද) , සුන්දරං (සුන්දර) ඨානං (තැනට/නිවනට) ගතත්තා (වැඩිය හෙයින්ද), සුගතෝ නාම (සුගත නම් වූ) තේ (ඔබ වහන්සේට) නමෝ (නමස්කාර වේවා!)
☞ශෝභන වචන ඇති හෙයින්ද ,ශෝභන සිරුරක් ඇති හෙයින්ද, යමෙකුගේ පැමිණි මග ශෝභන හෙයින්ද, සුන්දර නිවනට වැඩිය හෙයින්ද, සුගත නම් වූ ඔබ වහන්සේට, නමස්කාර වේවා!

5 සත්තාවාසාදි සංඛාතෙ - කාමරූපාදිකෙ තථා
සංඛාර සත්ත මොකාස - ලොකෙ යො වෙදි තං නමො

සත්තාවාසාදි සංඛාතෙ, තථා කාමරූපාදිකෙ, සංඛාර සත්ත මොකාස යො ලොකෙ වෙදි තං නමො
➔ සත්තාවාසාදි (සත්ත්ව වාස ආදි) සංඛාතෙ (සමූහය ද), තථා(එලෙසම) කාමරූපාදිකෙ (කාමලෝක රූපාලෝක ආදිය ද), සංඛාර සත්ත මොකාස (සංස්කාර - සත්ත්ව - අවකාශ - යන ලෝකයන් ද) යො ලොකෙ (යමෙක් ලොවෙහි) වෙදි(අවබෝධ කලේ ද) තං (උන්වහන්සේට) නමො(නමස්කාර වේවා!)
☞ සත්ත්ව වාස ආදි සමූහය ද, එලෙසම කාමලෝක රූපාලෝක ආදිය ද, සංස්කාර - සත්ත්ව - අවකාශ යන ලෝකයන් ද යමෙක් ලොවෙහි අවබෝධ කලේ ද උන්වහන්සේට නමස්කාර වේවා!

6. යො ලොකෙ අනුත්තරො දේව - බ්‍රහ්මා සුර නරොරගෙ
දමේසි ධම්මේ පුරිසෙ - සාරථිං තං නමාමහං

යො ලොකෙ අනුත්තරො [දේව+බ්‍රහ්ම+අසුර] දේවබ්‍රහ්මාසුර [නරේ + උරගේ] නරොරගෙ ධම්මේ පුරිසෙ දමේසි, තං සාරථිං [නමාමි + අහං]නමාමහං
➔ යො(යමෙක්) ලොකෙ (ලොවෙහි) අනුත්තරො (අනුත්තර වේද) දේවබ්‍රහ්මාසුර [දේව+බ්‍රහ්ම+අසුර] (දෙවි බඹ අසුර) නරොරගෙ [නරේ + උරගේ] (නරයන් හා නාගයින්) ධම්මේ පුරිසෙ (දමනය කලයුතු වූ පුරුෂයන්) දමේසි (දමනය කලා වූ), තං (ඒ) සාරථිං (සාරථීන් වහන්සේට) නමාමහං [නමාමි+අහං] (මාගේ නමස්කාරය වේවා!)
☞ යමෙක් ලොවෙහි අනුත්තර වේද, දෙවි බඹ අසුර නරයන් හා නාගයින් යන දමනය කලයුතු වූ පුරුෂයන් දමනය කලා වූ, ඒ සාරථීන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**7. දාතා තිභව සම්පත්තිං - නේතා සිවපුරං වරං
සත්ථා දේව මනුස්සානං - තං නමාමි නරුත්තමං**

තිභව සම්පත්තිං දාතා, වරං සිවපුරං නේතා, දේව මනුස්සානං සත්ථා, තං නරුත්තමං නමාමි
➔ තිභව(මෙලොව පරලොව නිවන්) සම්පත්තිං (සම්පත්) දාතා(ගෙන දෙන්නා වූ), වරං(උතුම්) සිවපුරං (නිවන් පුරයට) නේතා (රැගෙන යන්නාවූ), දේව මනුස්සානං (වූදෙවි මිනිසුන්ගේ) සත්ථා (ශාස්තෘන් වූ), තං නරුත්තමං (ඒ නරොත්තමයන් වහන්සේට) නමාමි (නමස්කාර වේවා!.)
☞ මෙලොව පරලොව නිවන් සම්පත් ගෙන දෙන්නා වූ, උතුම් නිවන් පුරයට රැගෙන යන්නාවූ, වූදෙවි මිනිසුන්ගේ ශාස්තෘන් වූ, ඒ නරොත්තමයන් වහන්සේට නමස්කාර වේවා!

**8. චතුසච්ච මබුජ්ඣිත්ථ - බෝධේතා යෝ පජාය ච
සාමං සච්චානි සම්බුජ්ඣි - තං බුද්ධං පණමාමහං.**
චතුසච්චං බුජ්ඣිත්ථ, යෝ පජාය ච බෝධේතා සාමං සච්චානි සම්බුජ්ඣි, තං බුද්ධං අහං පණමාමි # [චතුසච්චමබුජ්ඣිත්ථ= චතුසච්චං + බුජ්ඣිත්ථ / පණමාමහං = පණමාමි + අහං]
➔ චතුසච්චං (චතුරාර්ය සත්‍යය) බුජ්ඣිත්ථ (අවබෝධ කලා වූද), යෝ (යමෙක්) පජාය ච (සත්ව සමූහයාට ද/ අන් ප්‍රජාවට ද) බෝධේතා (අවබෝධ කරවූද) සාමං (තමන් වහන්සේම) සච්චානි (සත්‍යය) සම්බුජ්ඣි (අවබෝධ කලාවූ), තං බුද්ධං (ඒ බුදුරජාණන් වහන්සේට) අහං පණමාමි (මාගේ නමස්කාරය වේවා !)
☞චතුරාර්ය සත්‍යය අවබෝධ කලා වූද අන්‍යය සත්ත්වයනට අවබෝධ කරවූද තමන් වහන්සේම සර්වප්‍රකාරයෙන් සත්‍යය අවබෝධ කලාවූ ඒ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

**9. භාග්‍යවා භග්ගවා යුත්තෝ - භගේහි ච විභත්තවා
භවේසු වන්ත ගමනෝ - භගවා නාම තේ නමෝ**

භාග්‍යවා යුත්තෝ භග්ගවා, භගේහි ච විභත්තවා, භවේසු වන්ත ගමනෝ, භගවා නාම තේ නමෝ
➔ භාග්‍යවා (සියලු පුණ්‍ය භාග්‍යයන්) යුත්තෝ(ඇත්තා වූ ද/ යුක්ත වූද) භග්ගවා (රාග ද්වේෂ මෝහාදී සියලු කෙලෙස් බිඳහෙලුවා වූද), භගේහි ච (යසඉසුරු ධර්මඥාණ සිරි සම්පත් ආදී සියලු ධර්මයන්ට හිමිකරුවෙක් බැවින්ද) විභත්තවා (සියලු ධර්ම බෙදා බෙදා දැක්වූ බැවින්ද), භවේසු(භවයෙහි) වන්ත(වමාළාවූ[නවතාදැමූ]) ගමනෝ (ගමන් ඇතිබැවින්ද), භගවා නාම (භගවා නම්වූ) තේ නමෝ (ඔබ වහන්සේට නමස්කාර වේවා !)
☞ සියලු පුණ්‍ය භාග්‍යයන් ගෙන් ගෙන් යුක්තවූ ද, රාග ද්වේෂ මෝහාදී සියලු කෙලෙස් බිඳහෙලුවා වූද, යසඉසුරු ධර්මඥාණ සිරි සම්පත් ආදී සියලු ධර්මයන්ට හිමිකරුවෙක්

බැවින්ද, සියලු ධර්ම බෙදා බෙදා දැක්වූ බැවින්ද, භවයෙහි වමාළාවූ[නවතාදැමූ] ගමන් ඇතිබැවින්ද, භගවා නම්වූ ඔබ වහන්සේට නමස්කාර වේවා !

1 අනුච්චාවච සීලස්ස - නිපකස්සච ඣායිනෝ
චිත්තං යස්ස වසීභූතං - ඒකග්ගං සුසමාහිතං.

න උච්චාවච සීලස්ස නිපකස්ස ච ඣායිනෝ, යස්ස චිත්තං වසීභූතං, ඒකග්ගං සුසමාහිතං #[අනුච්චාවච = න + උච්චාවච]

➔ න උච්චාවච (අඩු වැඩි නොවන) සීලස්ස (සිල් ඇති) නිපකස්ස ච (ප්‍රඥාවන්ත වූ) ඣායිනෝ (ධ්‍යානයන්හි ඇලුනාවූ) යස්ස (යම් තැනැත්තකුගේ) චිත්තං (සිත) වසීභූතං (තමාට වසඟ වූයේද), ඒකග්ගං(එකඟ වූවේ ද) සුසමාහිතං (මනාකොට අරමුණෙහි පිහිටියේද)

☞ අඩු වැඩි නොවන සිල් ඇති, ප්‍රඥාවන්ත, ධ්‍යානයන්හි ඇලුනාවූ යම් තැනැත්තකුගේ සිත තමාට වසඟ වූයේද එකඟ වූවේ ද මනාකොට අරමුණෙහි පිහිටියේද

2 තං වේ තමෝනුදං ධීරං - තෙවිජ්ජං මච්චුහායිනං
හිතං දේව මනුස්සානං - ආහුසබ්බප්පහායිනං

[ආහු+සබ්බ+පහායිනං] ආහුසබ්බප්පහායිනං

තං වේ තමෝනුදං ධීරං තෙවිජ්ජං මච්චුහායිනං දේව මනුස්සානං හිතං සබ්බප්පහායිනං ආහු#

➔ තං (උන්වහන්සේට) වේ(ඒකාන්තයෙන්ම) තමෝනුදං (මොහඳුර දුරු කළ) ධීරං (කෙලෙස් තවන වීර්යය ඇති) තෙවිජ්ජං (ත්‍රිවිද්‍යාවෙන් යුක්ත) මච්චුහායිනං (මරණය ඉක්මවූ) දේව මනුස්සානං (දෙව් මිනිසුන්ට) හිතං (හිත වූ) සබ්බප්පහායිනං (සියලු කෙලෙස් ප්‍රහානය කල තැනැත්තෙක්) [යැයි]ආහු (කීහ)[බුද්ධාදි ආර්යයෝ කියත්]

☞ඒකාන්තයෙන්ම උන්වහන්සේට මොහඳුර දුරු කළ කෙලෙස් තවන වීර්යය ඇති ත්‍රිවිද්‍යාවෙන් යුක්ත මරණය ඉක්මවූ දෙව් මිනිසුන්ට හිත වූ සියලු කෙලෙස් ප්‍රහානය කල තැනැත්තෙක් යැයි බුද්ධාදි ආර්යයෝ කියත්.

3 තීහි විජ්ජාහි සම්පන්නං - අසම්මූල්හවිහාරිනං
බුද්ධං අන්තිමසාරීරං - තං නමස්සාමි ගොතමං.

තීහි විජ්ජාහි සම්පන්නං අසම්මූල්හ-විහාරිනං අන්තිමසාරීරං තං ගොතමං බුද්ධං නමස්සාමි

➔ තීහි විජ්ජාහි (ත්‍රිවිද්‍යාවෙන්) සම්පන්නං (සමන්විත වූ) අසම්මූල්හ (නොමුළාව) විහාරිනං (වැඩවාසය කරන) අන්තිම-සාරීරං (අවසන් ශිරුර දරන්නා වූ) තං ගොතමං (ඒ ගෞතම) බුද්ධං (බුදුරජාණන් වහන්සේට) නමස්සාමි (නමස්කාර වේවා!)

☞ ත්‍රිවිද්‍යාවෙන් සමන්විත වූ නොමුළාව වැඩවාසය කරන්නාවූ අවසන් ශිරුර දරන්නා වූ ඒ ගෞතම බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!

බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි.

➔ බුද්ධං(බුද්ධ රත්නය) ජීවිත පරියන්තං (දිවිහිමියෙන්) සරණං ගච්චාමි. (සරණ යමි.)

☞ බුද්ධ රත්නය දිවිහිමියෙන් සරණ යමි.

බුද්ධං යාව නිබ්බානං සරණං ගච්ඡාමි.

➔ බුද්ධං(බුද්ධ රත්නය) යාව නිබ්බානං (නිවන දක්වාම) සරණං ගච්චාමි. (සරණ යමි.)

☞බුද්ධ රත්නය නිවන දක්වාම සරණ යමි.

යේ ච බුද්ධා අතීතාච යේ ච බුද්ධා අනාගතා පච්චුප්පන්නාච යේ බුද්ධා අහං වන්දාමි සබ්බදා.

➔ යේ ච බුද්ධා (යම් බුදුවරුන්) අතීතා-ච (අතීතයේ වැඩසිටියා-ද) යේ ච බුද්ධා(යම් බුදුවරුන්) අනාගතා (අනාගතයේ වැඩසිටින්නෝ-ද)) පච්චුප්පන්නා-ච (වර්ථමානයේ-ද) යේ බුද්ධා (යම් බුදුවරයෙක් වේ-ද) [උන්වහන්සේලාට] අහං(මම) වන්දාමි(වන්දනා කරමි.) සබ්බදා(සැමදා)
☞ අතීතයේ වැඩසිටියාවූ බුදුවරුන්ට ද අනාගතයේ වැඩසිටින්නා වූ බුදුවරුන්ට වර්ථමානයේ වැඩසිටින බුදුන්ට ද සැමදා මම වන්දනා කරමි.

නත්ථි මේ සරණං අඤ්ඤං, බුද්ධෝ මේ සරණං වරං, ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං
➔ නත්ථි (නැත) මේ(මට) සරණං(සරණක්) අඤ්ඤං(අන්), බුද්ධෝ(බුදුන්) මේ(මට) සරණං(සරණය) වරං(උතුම්) , ඒතේන(ඒ) සච්ච වජ්ජේන (සත්‍යය වචනයෙන්) හෝතු (වේවා) මේ(මට) ජයමංගලං (ජය මංගල්‍යයක්)
☞ බුද්ධ රත්නය හැර මට අන් සරණක් නැත්තේය බුද්ධ රත්නය මාගේ උතුම් සරණ වන්නේය ඒ සත්‍යය වචනයෙන් මට ජය මංගල්‍යයක් වේවා!

උත්තමංගේන වන්දේහං පාදපංසු වරුත්තමං, බුද්ධේ යෝ කලිතෝ දෝසෝ බුද්ධෝ ඛමතු තං මමං
➔ උත්තමංගේන (හිස මුදුනින්) වන්දේහං [වන්දේමි+අහං] (වඳිමි මම) පාදපංසු (පා දූහුවිලි) වරුත්තමං (භාග්‍යවතුන් වහන්සේගේ) බුද්ධේ(බුද්ධ රත්නය කෙරෙහි) යෝ(යම්) කලිතෝ දෝසෝ (පමා වරදක්) [සිදුවී නම්] බුද්ධෝ (භග්යවතුන් වහන්සේ) තං (එයට) මමං (මට) ඛමතු(සමාවන සේක්වා)
☞භග්‍යවතුන් වහන්සේගේ සිරිපා පහස ලද දූහුවිල්ලද මම හිස මුදුනින් වන්දනා කරමි. බුද්ධ රත්නය කෙරෙහි මගේ පමා වරදක් සිදුවී නම් භග්‍යවතුන් වහන්සේ එයට මට සමාවන සේක්වා!

නමාමි බුද්ධං ගුණ සාගරන්තං- සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝ ජිගුඡච්ඡෝ සකලෝ දූගන්ධෝ - ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

ගුණ සාගරන්තං බුද්ධං නමාමි, සත්තා සදා සුඛී අවේරා හොන්තු, කායෝ ජිගුඡච්ඡෝ සකලෝ දූගන්ධෝ, අහං ච සබ්බේ මරණං ගච්ඡන්ති
➔ ගුණ සාගරන්තං (ගුණ සයුරක් වූ) බුද්ධං (බුදුහිමි) නමාමි (නමදිමි), සත්තා(සත්ත්වයෝ) සදා(සැමදා) සුඛී(සැපඇති) අවේරා(වෛර නැත්තෝ) හොන්තු (වෙත්වා!), කායෝ(කය) ජිගුඡච්ඡෝ (පිළිකුල් සහගතය) සකලෝ(සියලු අතින්ම) දූගන්ධෝ (දුගඳය), අහං (මමත්) සබ්බේ ච (සියලුදෙනාමත්) මරණං (මරණයට) ගච්ඡන්ති (යන්නාහ.)
☞ ගුණ සයුරක් වූ බුදුහිමි නමදිමි, සත්ත්වයෝ සැමදා සැපඇති වෛර නැත්තෝ වෙත්වා! මේ කය පිළිකුල් සහගතය සියලු අතින්ම දූගඳය, මමත් සියලුදෙනාමත් මරණයට යන්නාහ.

<u>ධර්ම වන්දනාව</u>
ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති

➔ භගවතා (භාග්‍යවතුන් වහන්සේගේ) ධම්මෝ (ධර්මය) ස්වාක්ඛාතෝ (මනාලෙස දේශනාකරණ ලද්දේය) සන්දිට්ඨිකෝ (තමා විසින්ම අවබෝධකල යුත්තේය) අකාලිකෝ (කල් නොයවා ඵල දෙන්නේය) ඒහිපස්සිකෝ (හේතු කරුණු සහිතබැවින් හා පිරිසිදු බැවින් ඇවිත් උත්සහකර බලන්න යැයි කිවහැක්කේය) ඕපනයිකෝ (තමාගේ සිතතුල වඩාගැනීමට ඉතාම සුදුසුය) විඤ්ඤූහී (නුවණැත්තන් විසින්) පච්චත්තං (තනිව තම තමාම) වේදිතබ්බෝ (අවබෝධකල යුත්තේය)
☞ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය මනාලෙස දේශනාකරණ ලද්දේය, තමා විසින්ම අවබෝධකල යුත්තේය, කල් නොයවා ඵල දෙන්නේය, හේතු කරුණු සහිතබැවින් හා පිරිසිදු බැවින් ඇවිත් උත්සහකර බලන්න යැයි කිවහැක්කේය, තමාගේ සිතතුල වඩාගැනීමට ඉතාම සුදුසුය, නුවණැත්තන් විසින් තනිව තම තමාම අවබෝධකල යුත්තේය.

ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි.
➔ ධම්මං (ධර්ම රත්නය) ජීවිත පරියන්තං (දිවිහිමියෙන්) සරණං ගච්චාමි. (සරණ යමි.)
☞ ධර්ම රත්නය දිවිහිමියෙන් සරණ යමි.

ධම්මං යාව නිබ්බානං සරණං ගච්ඡාමි.
➔ ධම්මං (ධර්ම රත්නය) යාව නිබ්බානං (නිවන දක්වාම) සරණං ගච්චාමි. (සරණ යමි.)
☞ධර්ම රත්නය නිවන දක්වාම සරණ යමි.

යේ ච ධම්මා අතීතාච යේ ච ධම්මා අනාගතා පච්චුප්පන්නා ච යේ ධම්මා අහං වන්දාමි සබ්බදා.
➔ යේ ච ධම්මා (යම් ධර්ම රත්නයක්) අතීතා-ච (අතීතයේ දේශනා කලා-ද) යේච ධම්මා(යම් ධර්ම රත්නය) අනාගතා (අනාගතයේ දේශනා කරන්නේ-ද)) පච්චුප්පන්නා-ච (වර්ථමානයේ-ද) යේ ධම්මා (යම් ධර්ම රත්නය වේ-ද) [ඒ ධර්ම රත්නයට] අහං(මම) වන්දාමි(වන්දනා කරමි.) සබ්බදා(සැමදා)
☞ අතීතයේ දේශනා කලා වූ ධර්ම රත්නයට ද අනාගතයේ දේශනා කරන්නාවූ ධර්ම රත්නයට ද වර්ථමානයේ පවතින ධර්ම රත්නයට ද සැමදා මම වන්දනා කරමි.

නත්ථි මේ සරණං අඤ්ඤං, ධම්මෝ මේ සරණං වරං, ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං,
➔ නත්ථි (නැත) මේ(මට) සරණං(සරණක්) අඤ්ඤං(අන්), ධම්මෝ (ධර්ම රත්නය) මේ(මට) සරණං(සරණය) වරං(උතුම්), ඒතේන(ඒ) සච්ච වජ්ජේන (සත්‍යය වචනයෙන්) හෝතු (වේවා) මේ(මට) ජයමංගලං (ජය මංගල්‍යයක්)
☞ ධර්ම රත්නය හැර මට අන් සරණක් නැත්තේය ධර්ම රත්නය මාගේ උතුම් සරණ වන්නේය ඒ සත්‍යය වචනයෙන් මට ජය මංගල්‍යයක් වේවා!

උත්තමංගේන වන්දේහං ධම්මං ච තිවිධං වරං, ධම්මේ යෝ කලිතෝ දෝසෝ ධම්මෝ ඛමතු තං මමං
➔ තිවිධං (මාර්ග - ඵල - නිවන, යැයි ත්‍රිවිද වූ) වරං (උතුම්) ධම්මං ච (ධර්ම රත්නයට ද) උත්තමංගේන (හිස මුදුනින්) [වන්දේමි+අහං]වන්දේහං (මම වදිමි) ධම්මේ (ධර්ම රත්නය

කෙරෙහි) යෝ(යම්) කලිතෝ දෝසෝ (පමා වරදක්) [සිදුවී නම්] ධම්මෝ (ධර්ම රත්නය) තං (එයට) මමං (මට) ඛමතු(සමාවන සේක්වා !)
☞ මම මාර්ග - ඵල - නිවන, යැයි ත්‍රිවිද වූ උතුම් ධර්ම රත්නයට ද හිස මුදුනින් වදිමි, ධර්ම රත්නය කෙරෙහි යම් පමා වරදක් සිදුවී නම් ධර්ම රත්නය එයට මට සමාවන සේක්වා!

නමාමි ධම්මං ගුණ සාගරන්තං- සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝ ජිගුඡච්ඡෝ සකලෝ දුගන්ධෝ - ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

ගුණ සාගරන්තං ධම්මං නමාමි, සත්තා සදා සුඛී අවේරා හොන්තු, කායෝ ජිගුඡච්ඡෝ සකලෝ දුගන්ධෝ, අහං ච සබ්බේ මරණං ගච්ඡන්ති
➔ ගුණ සාගරන්තං (ගුණ සයුරක් වූ) ධම්මං (ධර්ම රත්නයට) නමාමි (නමදිමි), සත්තා(සත්ත්වයෝ) සදා(සැමදා) සුඛී(සැපඇති) අවේරා(වෛර නැත්තෝ) හොන්තු (වෙත්වා!), කායෝ(කය) ජිගුඡච්ඡෝ (පිළිකුල් සහගතය) සකලෝ(සියලු අතින්ම) දුගන්ධෝ (දුගඳය), අහං (මමත්) සබ්බේ ච (සියලුදෙනාමත්) මරණං (මරණයට) ගච්ඡන්ති (යන්නාහ.)
☞ ගුණ සයුරක් වූ ධර්ම රත්නයට නමදිමි, සත්ත්වයෝ සැමදා සැපඇති වෛර නැත්තෝ වෙත්වා! මේ කය පිළිකුල් සහගතය සියලු අතින්ම දුගඳය, මමත් සියලුදෙනාමත් මරණයට යන්නාහ.

<u>සංඝ වන්දනාව</u>

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ සාවක සංඝෝ ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති

➔ භගවතෝ (භාග්‍යවතුන් වහන්සේගේ) සාවක (ශාවක) සංඝෝ (සංඝයා) සුපටිපන්නෝ (නිවනට යන මනා ප්‍රතිපදාවේ යෙදෙන්නේය), භගවතෝ (භාග්‍යවතුන් වහන්සේගේ) සාවක (ශාවක) සංඝෝ (සංඝයා) උජුපටිපන්නෝ (නිවනට යන ඍජු-අවංක මධ්‍යම ප්‍රතිපදාවේ යෙදෙන්නේය),භගවතෝ (භාග්‍යවතුන් වහන්සේගේ) සාවක (ශාවක) සංඝෝ (සංඝයා) ඤායපටිපන්නෝ (නිවනට යන ඤාණාන්විත ප්‍රතිපදාවේ යෙදෙන්නේය),
භගවතෝ (භාග්‍යවතුන් වහන්සේගේ) සාවක (ශාවක) සංඝෝ (සංඝයා) සාමීචිපටිපන්නෝ (දෙව් මිනිසුන්ගේ පූජා සත්කාර ලැබීමට සුදුසු වූ ප්‍රතිපදාවේ යෙදෙන්නේය), යදිදං (යම් මේ) චත්තාරි පුරිස යුගානි [පුරිස චත්තාරි යුගානි] (පුරුෂයන් වශයෙන් යුගල් සතරක්වූ/ මාර්ග-ඵල වශයෙන් යුගල සතරක් වූ) අට්ඨ පුරිස පුග්ගලා (අෂ්ඨ ආර්ය පුද්ගලයන් වූ) ඒස (ඒ) භගවතෝ (භාග්‍යවතුන් වහන්සේගේ) සාවක (ශාවක) සංඝෝ (සංඝයා) ආහුනෙය්‍යෝ (දුරසිට වුවද ගෙනවිත් සියලු ධනය වියදමකර පූජාකරන සිව්පසය පිළිගැනීමට සුදුසුවන සේක) පාහුනෙය්‍යෝ (සියලු ආකාරයෙන් ද සියල්ලටම පළමුවෙන් ද පූජාකරන සිව්පසය පිළිගැනීමට සුදුසුවන සේක) දක්ඛිණෙය්‍යෝ (පරලොව සැප ලැබීම පිණිස කරණ පූජාවන් පිළිගැනීමට සුදුසුවන සේක) අඤ්ජලිකරණීයෝ (දොහොත් මුදුනේ තබා සියලු ලෝකයා විසින් කරන වන්දනාමාන පිළිගැනීමට සුදුසුවන සේක) ලෝකස්ස (ලෝක සත්ත්වයාට) අනුත්තරං (උතුම් වූ) පුඤ්ඤක්ඛෙත්තං (පිං කෙතක් වන සේක.)

☞භාග්‍යවතුන් වහන්සේගේ ශාවක සංඝයා නිවනට යන මනා ප්‍රතිපදාවේ යෙදෙන්නේය, භාග්‍යවතුන් වහන්සේගේ ශාවක සංඝයා නිවනට යන ඍජු-අවංක මධ්‍යම ප්‍රතිපදාවේ යෙදෙන්නේය, භාග්‍යවතුන් වහන්සේගේ ශාවක සංඝයා නිවනට යන ඤාණාන්විත ප්‍රතිපදාවේ යෙදෙන්නේය, භාග්‍යවතුන් වහන්සේගේ ශාවක සංඝයා දෙව් මිනිසුන්ගේ පූජා සත්කාර

ලැබීමට සුදුසු වූ ප්‍රතිපදාවේ යෙදෙන්නේය, යම් මේ මාර්ග-ඵල වශයෙන් යුගල සතරක් වූ අෂ්ඨ ආර්ය පුද්ගලයන් වූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා දුරසිට වුවද ගෙනවිත් සියලු ධනය වියදමකර පූජාකරන සිව්පසය පිළිගැනීමට සුදුසුවන සේක, සියලු ආකාරයෙන් ද සියල්ලටම පළමුවෙන් ද පූජාකරන සිව්පසය පිළිගැනීමට සුදුසුවන සේක, පරලොව සැප ලැබීම පිණිස කරණ පූජාවන් පිළිගැනීමට සුදුසුවන සේක, දොහොත් මුදුනේ තබා සියලු ලෝකයා විසින් කරන වන්දනාමාන පිළිගැනීමට සුදුසුවන සේක, ලෝක සත්ත්වයාට උතුම් වූ පිං කෙතක් වන සේක.

සංඝ ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි.

➔ සංඝං (සංඝ රත්නය) ජීවිත පරියන්තං (දිවිහිමියෙන්) සරණං ගච්ඡාමි. (සරණ යමි.)

☞ සංඝ රත්නය දිවිහිමියෙන් සරණ යමි.

සංඝං යාව නිබ්බානං සරණං ගච්ඡාමි.

➔ සංඝං (සංඝ රත්නය) යාව නිබ්බානං (නිවන දක්වාම) සරණං ගච්ඡාමි. (සරණ යමි.)

☞ සංඝ රත්නය නිවන දක්වාම සරණ යමි.

යේ ච සංඝා අතීතාච යේ ච සංඝා අනාගතා පච්චුප්පන්නා ච යේ සංඝා අහං වන්දාමි සබ්බදා.

➔ යේ ච සංඝා (යම් සංඝ රත්නයක්) අතීතා-ච (අතීතයේ වැඩසිටියා-ද) යේ ච සංඝා (යම් සංඝ රත්නය) අනාගතා (අනාගතයේ වැඩසිටින්නේ-ද) පච්චුප්පන්නා-ච (වර්ථමානයේ-ද) යේ සංඝා (යම් සංඝ රත්නය වේ-ද) [ඒ සංඝ රත්නයට] අහං(මම) වන්දාමි(වන්දනා කරමි.) සබ්බදා(සැමදා)

☞ අතීතයේ වැඩසිටියා වූ සංඝ රත්නයට ද අනාගතයේ වැඩසිටින්නා වූ සංඝ රත්නයට ද වර්ථමානයේ වැඩසිටින සංඝ රත්නයට ද සැමදා මම වන්දනා කරමි.

නත්ථි මේ සරණං අඤ්ඤං, සංඝෝ මේ සරණං වරං, ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං,

➔ නත්ථි (නැත) මේ(මට) සරණං(සරණක්) අඤ්ඤං(අන්), සංඝෝ (සංඝ රත්නය) මේ(මට) සරණං(සරණය) වරං(උතුම්), ඒතේන(ඒ) සච්ච වජ්ජේන (සත්‍යය වචනයෙන්) හෝතු (වේවා) මේ(මට) ජයමංගලං (ජය මංගල්‍යයක්)

☞ සංඝ රත්නය හැර මට අන් සරණක් නැත්තේය සංඝ රත්නය මාගේ උතුම් සරණ වන්නේය ඒ සත්‍යය වචනයෙන් මට ජය මංගල්‍යයක් වේවා!

උත්තමංගේන වන්දේහං සංඝං ච තිවිධෝත්තමං, සංඝේ යෝ කලිතෝ දෝසෝ සංඝෝ ඛමතු තං මමං

➔ [තිවිධ + උත්තමං] තිවිධෝත්තමං (පෘතුජ්ජන සේඛ අසේඛ යැයි ත්‍රිවිද වූ උතුම්) සංඝං ච (සංඝ රත්නයට ද) උත්තමංගේන (හිස මුදුනින්) [වන්දේමි+අහං]වන්දේහං (මම වදිමි) සංඝේ (සංඝ රත්නය කෙරෙහි) යෝ(යම්) කලිතෝ දෝසෝ (පමා වරදක්) [සිදුවී නම්] සංඝෝ (සංඝ රත්නය) තං (එයට) මමං (මට) ඛමතු(සමාවන සේක්වා !)

☞ පෘතුජ්ජන සේඛ අසේඛ යැයි ත්‍රිවිද වූ උතුම් සංඝ රත්නයට ද හිස මුදුනින් වදිමි, සංඝ රත්නය කෙරෙහි යම් පමා වරදක් සිදුවී නම් සංඝ රත්නය එයට මට සමාවන සේක්වා!

නමාමි සංඝං ගුණ සාගරන්තං- සත්තා සදා හොන්තු සුඛී අවේරා
කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ - ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

ගුණ සාගරන්තං සංඝං නමාමි, සත්තා සදා සුඛී අවේරා හොන්තු, කායෝ ජිගුච්ඡෝ සකලෝ දුගන්ධෝ, අහං ච සබ්බේ මරණං ගච්ඡන්ති
➔ ගුණ සාගරන්තං (ගුණ සයුරක් වූ) සංඝං (සංඝ රත්නය) නමාමි (නමදිමි), සත්තා(සත්ත්වයෝ) සදා(සැමදා) සුඛී(සැපඇති) අවේරා(වෛර නැත්තෝ) හොන්තු (වෙත්වා!), කායෝ(කය) ජිගුච්ඡෝ (පිළිකුල් සහගතය) සකලෝ(සියලු අතින්ම) දුගන්ධෝ (දුගඳය), අහං (මමත්) සබ්බේ ච (සියලුදෙනාමත්) මරණං (මරණයට) ගච්ඡන්ති (යන්නාහ.)
☞ ගුණ සයුරක් වූ සංඝ රත්නය නමදිමි, සත්ත්වයෝ සැමදා සැපඇති වෛර නැත්තෝ වෙත්වා! මේ කය පිළිකුල් සහගතය සියලු අතින්ම දුගඳය, මමත් සියලුදෙනාමත් මරණයට යන්නාහ.

<u>ඡත්තමානවක ගාථා</u>

1. යෝ වදතං පවරෝ මනුජේසු - සක්‍යමුනි භගවා කතකිච්චෝ
පාරගතෝ බලවිරිය සමංගි - තං සුගතං සරණත්ථ මුපේමි.

යෝ වදතං මනුජේසු පවරෝ සක්‍යමුනි භගවා කතකිච්චෝ පාරගතෝ බල-විරිය සමංගි තං සුගතං සරණත්ථමුපේමි [සරණත්ථං+උපේමි]
➔ යෝ වදතං (යමෙක් කතාකරන) මනුජේසු (මිනිසුන් අතරෙන්) පවරෝ (උතුම්ම කතා ඇත්තේ ද) සක්‍යමුනි (සාක්‍යමුනින්ද්‍රයන්වූද) භගවා (භාග්‍යයත්වූ ද) කතකිච්චෝ (දුකෙන් මිදීමට කලයුතු සියලු කෘත්‍යයන් කරඇත්තාවූද) පාරගතෝ (පරතෙර නම් නිවනට වැඩමකලාවූ ද) බල-විරිය සමංගි (කායික බලයෙන්ද ඥාණබලයෙන් ද චතුරංග සමන්නාගත විරියෙන්ද සමන්විතවූ) තං සුගතං (ඒ මනාගමන්ඇති සුගතයන් වහන්සේ) සරණත්ථමුපේමි [සරණත්ථං+උපේමි] (සියලු දුකෙන් මිදීම පිණිසද සියලු රැකවරනය පිණිසද සරණයමි.)
☞ යමෙක් කතාකරන මිනිසුන් අතරෙන් උතුම්ම කතා ඇත්තේ ද, ඒ සාක්‍යමුනින්ද්‍රයන්වූද භාග්‍යයත්වූ ද දුකෙන් මිදීමට කලයුතු සියලු කෘත්‍යයන් කරඇත්තාවූද පරතෙර නම් නිවනට වැඩමකලාවූ ද කායික බලයෙන්ද ඥාණබලයෙන් ද චතුරංග සමන්නාගත විරියෙන්ද සමන්විතවූ ඒ මනාගමන්ඇති සුගතයන් වහන්සේ සියලු දුකෙන් මිදීම පිණිසද සියලු රැකවරනය පිණිසද සරණයමි.

2. රාග විරාග මනේජ මසෝකං - ධම්ම මසංකත මප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං - ධම්මමිමං සරණත්ථ මුපේමි.

රාගවිරාගමනේජමසෝකං [රාගවිරාගං+අනේජං+අසෝකං] ධම්මමසංකතමප්පටිකූලං [ධම්මං+අසංකතං+අප්පටිකූලං] මධුරමිමං [මධුරං+ඉමං] පගුණං සුවිභත්තං ධම්මමිමං [ධම්මං+ඉමං] සරණත්ථ මුපේමි [සරණත්ථං+උපේමි]#
➔ රාගවිරාගමනේජමසෝකං [රාගවිරාගං (රාගය දුරුකරන්නාවූද) +අනේජං (තණ්හාවෙන් නොසැලෙන්නා වූද)+ අසෝකං (දුක්-සෝක නැත්තාවූද)] ධම්මමසංකතමප්පටිකූලං [+අසංකතං (හේතුවලින් හටනොගත්තාවූද) +අප්පටිකූලං (ප්‍රතික්ෂේප කලයුත්තක් නැත්තාවූද)] මධුරමිමං [+ඉමං + මධුරං] (මේ මිහිරි) ධම්මං (නිවන් ධර්මය) පගුණං (බුදුන්විසින් ප්‍රගුණකර) සුවිභත්තං (මනාව බෙදා බෙදා දක්වන ලද්දේය) ධම්මමිමං [ධම්මං+ඉමං] (එම මේ ධර්මරත්නය) සරණත්ථමුපේමි [සරණත්ථං+උපේමි] (සියලු දුකෙන් මිදීම පිණිසද සියලු රැකවරනය පිණිසද සරණයමි.)
☞ රාගය දුරුකරන්නාවූද තණ්හාවෙන් නොසැලෙන්නා වූද දුක්-සෝක නැත්තාවූද හේතුවලින් හටනොගත්තාවූද ප්‍රතික්ෂේප කලයුත්තක් නැත්තාවූද මේ මිහිරි නිවන් ධර්මය බුදුන්විසින්

ප්‍රගුණකර මනාව බෙදා බෙදා දක්වන ලද්දේය එම මේ ධර්මරත්නය සියලු දුකෙන් මිදීම පිණිසද සියලු රැකවරනය පිණිසද සරණයමි.

3. යත්ථ ච දින්න මහප්ඵල මාහු - චතුසු සුචීසු පුරිසයුගේසු
අට්ඨ ච පුග්ගල ධම්මදසා තේ - සංඝම්මං සරණත්ථ මුපේමි.

යත්ථ ච දින්නමහප්ඵලමාහු [දින්නං+මහප්ඵලං+ආහු] සුචීසු චතුසු පුරිසයුගේසු අට්ඨ ච පුග්ගලා තේ ධම්මදසා සංඝම්මං [සංඝං+ඉමං] සරණත්ථමුපේමි [සරණත්ථං+උපේමි]
➔ යත්ථ (යම්තැනක/ ආර්ය සංඝයා කෙරෙහි) දින්නමහප්ඵලමාහු [දින්නං+මහප්ඵලං+ආහු] ච (දුන්දෙය මහත්ඵල වේයැයි කියනලදද) සුචීසු (අතිශයින්ම පිරිසිදුභාවයට පැමිණියාවූද) චතුසු පුරිසයුගේසු (පුද්ගල යුගල වශයෙන් සතරක්වූද) අට්ඨ ච පුග්ගලා (අෂ්ඨ ආර්ය පුද්ගලවූ) තේ (උන්වහන්සේලා) ධම්මදසා (ධර්මය ප්‍රත්‍යක්ෂයෙන් දක්නාලද්දේය) සංඝම්මං [සංඝං+ඉමං] (මේ සංඝරත්නය) සරණත්ථමුපේමි [සරණත්ථං+උපේමි] (සියලු දුකෙන් මිදීම පිණිසද සියලු රැකවරනය පිණිසද සරණයමි.)
☞ ආර්ය සංඝයා කෙරෙහි දුන්දෙය මහත්ඵල වේයැයි කියනලදද, අතිශයින්ම පිරිසිදුභාවයට පැමිණියාවූද පුද්ගල යුගල වශයෙන් සතරක්වූද ධර්මය ප්‍රත්‍යක්ෂයෙන් දක්නාලද අෂ්ඨ ආර්ය පුද්ගලවූ මේ සංඝරත්නය සියලු දුකෙන් මිදීම පිණිසද සියලු රැකවරනය පිණිසද සරණයමි.

<u>චුද්දස බුද්ධ ඤාණ වන්දනාව</u>

1. දුක්ඛේ ඤාණං බුද්ධ ඤාණං
(දුක පිලිබඳ ඤාණය බුද්ධ ඤාණයකි)
2. දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ ඤාණං
(දුකට හේතු දන්නා ඤාණය බුද්ධ ඤාණයකි)
3. දුක්ඛ නිරෝධේ ඤාණං බුද්ධ ඤණං
(දුක නැතිකිරීම පිලිබඳ ඤාණය බුද්ධ ඤාණයකි)
4. දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාය ඤාණං බුද්ධ ඤාණං
(දුක නැතිකරන පිලිවෙල දන්නා ඤාණය බුද්ධ ඤාණයකි)
5. අත්ථ පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
(විපාක ඵල පිලිබඳ ඤාණය බුද්ධ ඤාණයකි)

6. ධම්ම පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
(විපාක වලට හේතු දන්නා ඤාණය බුද්ධ ඤාණයකි)
7. නිරුත්ති පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
(හේතු ඵල ධර්ම ව්‍යාවහර භෂාවෙන් [මිනිසුන් අතර බාවිතාවන භාෂාවෙන්] දේශනාකිරීට දන්නා ඤාණය බුද්ධ ඤාණයකි)
8. පටිභාන පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
(හේතු-ඵල හා එය දේශනාකලයුතු ආකාරය වැටහීම පිලිබඳ ඤාණය බුද්ධ ඤාණයකි)
9. ඉන්ද්‍රිය පරෝපරියන්තෙ ඤාණං බුද්ධ ඤාණං
(සත්ත්වයන්ගේ සද්ධා ආදී ඉන්ද්‍රිය ධර්මයන්ගේ දියුණු නොදියුණු බව දන්නා ඤාණය බුද්ධ ඤාණයකි.)
10. සත්තානං ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං
(සත්ත්වයන්ගේ ආශ්‍රව හා අනුසය ධර්ම දන්නා ඤාණය බුද්ධ ඤාණයකි)
11. යමකපාටිහාරියේ ඤාණං බද්ධ ඤාණං
(යමමහා පෙලහර පෑමේ ඤාණය බුද්ධ ඤාණයකි)

12. **මහාකරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං**
(මහාකරුණා සමවතට සමවැදීමේ ඤාණය බුද්ධ ඤාණයකි)
13. **සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං**
(සර්වඥතා ඤාණය බුද්ධ ඤාණයකි)
14. **අනාවරණ ඤාණං බුද්ධ ඤාණං**
(ලොව ඇති සියලුදේ දැනගැනීමට බාදාවක්/ආවරණයක් නැත්බව බුද්ධ ඤාණයකි.)

ඉමානි චුද්දස බුද්ධ ඤාණානි. ඉමේසං අට්ඨඤාණානි සාවකසාධාරණානි ඡ ඤාණානි අසාධාරණානි සාවකේහි. ඉමේහි චුද්දස බුද්ධඤාණෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.

➔ ඉමානි (මේ) චුද්දස බුද්ධ ඤාණානි (බුද්ධ ඤාණ දාහතරය.). ඉමේසං (මොවුන් අතරින්) අට්ඨඤාණානි (ඤාණ අටක්) සාවක-සාධාරණානි (ශාවකයන් හා සාධාරණ වේ/ශාවකයන්ටත් ඇත්තේය.) ඡ ඤාණානි (ඤාණ හයක්) සාවකේහි (ශාවකයන් හා) අසාධාරණානි (අසාධාරණය /ශාවකයන්ට නැත්තේය.) ඉමේහි (මේ) චුද්දස බුද්ධ ඤාණෙහි (බුද්ධ ඤාණ දාහතරෙන්) සමන්නාගතං (සමන්විත වූ) සම්මා සම්බුද්ධං (සම්මා සම්බුද්ධ) භගවන්තං (භාග්‍යවතුන් වහන්සේට) සිරසා නමාමි (දොහොත් මුදුන්දී නමස්කාර කරමි.)
☞ මේ බුද්ධ ඤාණ දාහතරය. මොවුන් අතරින් ඤාණ අටක් ශාවකයන් හා සාධාරණ වේ/ශාවකයන්ටත් ඇත්තේය ඤාණ හයක් ශාවකයන් හා අසාධාරණය /ශාවකයන්ට නැත්තේය, මේ බුද්ධ ඤාණ දාහතරෙන් සමන්විත වූ සම්මා සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේට දොහොත් මුදුන්දී නමස්කාර කරමි.
සාධු ! සාධු ! සාධු !

<u>අටලොස් බුද්ධ ඥාණ වන්දනාව</u>

1. **අතීතංසේ බුද්ධස්ස භගවතෝ අප්පටිහතං ඤාණං**
➔ අතීතංසේ [අතීතං + අංසේ] (අතීත කොට්ඨශයෙහිද) බුද්ධස්ස භගවතෝ (භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ) අප්පටිහතං (නොපැකිලිව පවත්නා) ඤාණං (ඥානයකි.)

☞ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඥාණය අතීත කොට්ඨශයෙහිද නොපැකිලිව පවතින්නේය.

2. **අනාගතංසේ බුද්ධස්ස භගවතෝ අප්පටිහතං ඤාණං**
➔ අනාගතංසේ [අනාගතං + අංසේ] (අනාගත කොට්ඨශයෙහිද) බුද්ධස්ස භගවතෝ (භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ) අප්පටිහතං (නොපැකිලිව පවත්නා) ඤාණං (ඥානයකි.)
☞ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඥාණය අනාගත කොට්ඨශයෙහිද නොපැකිලිව පවතින්නේය.
3. **පච්චුප්පන්නංසේ බුද්ධස්ස භගවතෝ අප්පටිහතං ඤාණං**
➔ පච්චුප්පන්නංසේ [පච්චුප්පන්නං + අංසේ] (වර්ථමාන කොට්ඨශයෙහිද) බුද්ධස්ස භගවතෝ (භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ) අප්පටිහතං (නොපැකිලිව පවත්නා) ඤාණං (ඥානයකි.)
☞ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඥාණය වර්ථමාන කොට්ඨශයෙහිද නොපැකිලිව පවතින්නේය.

ඉමේහි තීහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ.

➔ ඉමේහි (මේ) තීහි ධම්මේහි (තුන් ධර්මයන්ගෙන්) සමන්නාගතස්ස (සමන්නාගත වූ/ සමන්විත වූ) බුද්ධස්ස භගවතෝ (භාග්‍යවත් බුදුරජාණන් වහනේසේගේ)
☞මේ ධර්ම තුනෙන් සමන්නාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහනේසේගේ

4. සබ්බ කාය කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං
➔ සබ්බ (සියලු) කාය කම්මං (කායික ක්‍රියා) ඤාණ පුබ්බංගමං (නුවණ මුල්කරගෙන/පෙරටුකරගෙන) ඤාණානු පරිවත්තං (නුවණ අනුව පවත්නේය.)
☞ සියලු කායික ක්‍රියා නුවණ මුල්කරගෙන/පෙරටුකරගෙන නුවණ අනුව පවත්නේය.
5. සබ්බං වචීකම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං.
➔ සබ්බ (සියලු) වචී කම්මං (වාචික ක්‍රියා) ඤාණ පුබ්බංගමං (නුවණ මුල්කරගෙන/පෙරටුකරගෙන) ඤාණානු පරිවත්තං (නුවණ අනුව පවත්නේය.)
☞ සියලු වාචික ක්‍රියා නුවණ මුල්කරගෙන/පෙරටුකරගෙන නුවණ අනුව පවත්නේය.
6.සබ්බං මනෝ කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං.
➔ සබ්බ (සියලු) මනෝ කම්මං (මානසික ක්‍රියා) ඤාණ පුබ්බංගමං (නුවණ මුල්කරගෙන/පෙරටුකරගෙන) ඤාණානු පරිවත්තං (නුවණ අනුව පවත්නේය.)
☞ සියලු මානසික ක්‍රියා නුවණ මුල්කරගෙන/පෙරටුකරගෙන නුවණ අනුව පවත්නේය.

ඉමේහි ඡහි ධම්මේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ
➔ ඉමේහි (මේ) ඡහි ධම්මේහි (සය ධර්මයන්ගෙන්) සමන්නාගතස්ස (සමන්නාගත වූ/ සමන්විතවූ) බුද්ධස්ස භගවතෝ (භාග්‍යවත් බුදුරජාණන් වහනේසේගේ)
☞මේ ධර්ම සයෙන් සමන්නාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහනේසේගේ
7.නත්ථි ඡන්දස්ස හානි.(ලොවැඩ කිරිමෙහි වූ කැමැත්තෙහි පිරිහීමක් නැත්තේය.)
8. නත්ථි ධම්ම දේසනාය හානි. (ධර්මදේශනාවෙහි පිරිහීමක් නැත්තේය.)
9. නත්ථි විරියස්ස හානි. (වීර්යයේ පිරිහීමක් නැත්තේය.)
10. නත්ථි සමාධිස්ස හානි (සමාධියෙහි පිරිහීමක් නැත්තේය.)
11. නත්ථි පඤ්ඤාය හානි (ප්‍රඥාවෙහි පිරිහීමක් නැත්තේය.)
12. නත්ථි විමුත්තියා හානි. (අර්හත් ඵල විමුත්තියෙහි පිරිහීමක් නැත්තේය.)

ඉමේහි ද්වාදසහි ධම්මමේහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ
➔ ඉමේහි (මේ) ද්වාදසහි ධම්මේහි (දොළොස් ධර්මයන්ගෙන්) සමන්නාගතස්ස (සමන්නාගත වූ/ සමන්විතවූ) බුද්ධස්ස භගවතෝ (භාග්‍යවත් බුදුරජාණන් වහනේසේගේ)
☞මේ ධර්ම දොළොසින් සමන්නාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහනේසේගේ
13. නත්ථි දවා (නුවණින් තොර වූ වේගවත් කායික වාචසික ක්‍රීඩා ආදියක් නැත්තේය.)
14. නත්ථි රවා (නුවණින් තොරවූ යුහුසුළු කියුම් නැත්තේය.)
15. නත්ථි අප්ඵුඨං (නුවනින් ස්පර්ෂ නොකල ක්‍රියාවක් ද නැත්තේය)
16. නත්ථි වේගායිත්තත්තං (සිහියෙන් තොරව කරනු ලබන වේගවත් ක්‍රියා නැත්තේය)
17.නත්ථි අබ්‍යාවට මනො (නිරර්ථක සිතිවිලි නැත්තේය.)
18.නත්ථි අප්පටිසංඛානු පෙක්ඛා (නොදන්නා නිසා උපෙක්ෂාවිමක් ද නැත්තේය)
ඉමේහි අටඨාරසහි ධම්මේහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.
➔ ඉමේහි (මේ) අටඨාරසහි ධම්මේහි (අටලොස් ධර්මයන්ගෙන්) සමන්නාගතං (සමන්නාගත වූ/ සමන්විතවූ) සම්මා සම්බුද්ධං භගවන්තං (භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට) සිරසා නමාමි (නමස්කාර කරමි)
☞මේ අටලොස් ධර්මයන්ගෙන් සමන්නාගත වූ භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම දෙහොත් මුදුන් දී නමස්කාර කරමි.
සාධු ! සාධු ! සාධු !

<u>සත් සත්තති ඤාණ වත්ථූනි</u>. (සත් සැත්තෑ ඤාණ වස්තු/ සත් සැත්තෑ ඤාණ වන්දනාව)

1. ජාති පච්චයා ජරා මරණන්ති ඤාණං,
2. අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං,
3. අතීතම්පි අද්ධානං ජාතිපච්චයා ජරා මරණන්ති ඤාණං,
4. අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං,
5. අනාගතම්පි අද්ධානං ජාති පචචයා ජරාමරණන්ති ඤාණං ,
6. අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං,
7. යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං, තම්පි ඛයධම්මං වයධම්මං විරාගධම්ම නිරොධධම්මනති ඤාණං.

➔ 1.ජාති පච්චයා (ඉපදීම ඇති කල්හි) ජරා [මරණං + ඉති]මරණන්ති (ජරා මරණ ඇත්තේ යයි) ඤාණං (දැනගන්නා ඤාණය),
2.අසති ජාතියා (ඉපදීම නැති කල්හි) නත්ථි ජරා-මරණන්ති (ජරා මරණ නැත්තේ යයි) ඤාණං (දැනගන්නා ඤාණය),
3.[අතීතං + අපි] අතීතම්පි අද්ධානං (අතීත කාළයෙහි ද) ජාති පච්චයා (ඉපදීම නිසා) ජරා මරණන්ති (ජරා මරණ ඇතිවිනි යයි) ඤාණං (දන්නා ඤාණය),
4.අසති ජාතියා (ඉපදිම නැති කල්හි) නත්ථි ජරාමරණන්ති (ජරා මරණ නැතැයි) ඤාණං (දන්නා ඤාණය),
5.[අනාගතං + අපි] අනාගතම්පි අද්ධානං (අනාගත කාළයෙහිද) ජාති පචචයා (ඉපදීම ඇති කල්හි) ජරාමරණන්ති (ජරා මරණ ඇති වන්නේයයි) ඤාණං (දැනගන්නා ඤාණය),
6.අසති ජාතියා (ඉපදිම නැති කල්හි) නත්ථි ජරාමරණන්ති (ජරා මරණ නැතැයි) ඤාණං (දන්නා ඤාණය),
7.[යං + අපි + අස්ස] යම්පිස්ස (ඔහුට යම්) තං ධම්මට්ඨිති (ඒ ධර්මයන්ගේ හේතු ඵල ස්වභෝවය පිලිබඳ) ඤාණං (දන්නා ඤාණයක් වේ ද), තම්පි (එයද) ඛයධම්මං (ක්ෂයවන ධර්මයකි) වයධම්මං (වැයවීයන ධර්මයකි) විරාගධම්ම (වෙන්වීයන ධර්මයකි) [නිරොධ-ධම්මං + ඉති] නිරොධධම්මනති (නිරෝධවන/දුරුවන ධර්මයක් යැයි) ඤාණං (දැනගන්නා නුවනය).

☞
1.ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත්තේ යයි දැනගන්නා ඤාණය.
2.ඉපදීම නැති කල්හි ජරා මරණ නැත්තේ යයි දැනගන්නා ඤාණය.
3.අතීත කාළයෙහිද ඉපදීම නිසා ජරා මරණ ඇතිවිනි යයි දන්නා ඤාණය.
4.ඉපදිම නැති කල්හි ජරා මරණ නැතැයි දන්නා ඤාණය.
5.අනාගත කාළයෙහිද, ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇති වන්නේයයි දැනගන්නා ඤාණය.
6.ඉපදිම නැති කල්හි ජරා මරණ නැතැයි දන්නා ඤාණය,
7.ඔහුට ඉහත ධර්මයන්ගේ හේතු ඵල ස්වභෝවය පිලිබඳ දන්නා ඤාණයක් වේ ද, එයද ක්ෂයවන ධර්මයකි වැයවීයන ධර්මයකි වෙන්වීයන ධර්මයකි නිරෝධවන/දුරුවන ධර්මයක් යැයි දැනගන්නා ඤාණය.

★ පහත ඇති ඉතිරි පද වලටද මෙසේ සත් ආකාරයකින් ක්‍රමය යොදාගත යුතුය.

8. භව පච්චයා ජාතීති ඤාණං.
9. අසති භස්මිං නත්ථි ජාතීතිඤාණං

➔ 8.භව පච්චයා (භවය ඇතිකල්හි) [ජාති+ඉති]ජාතීති (ජාතිය ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
9.අසති භස්මිං (භවය නැතිකල්හි) නත්ථි ජාතීති (ජාතිය නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 8. භවය ඇතිකල්හි ජාතිය ඇත්තේ යැයි දන්නා ඤාණය).
9.භවය නැතිකල්හි ජාතිය නැත්තේ යයි දන්නා ඤාණය
පෙ-
15.උපාදාන පචචයා භවෝති ඤාණං
16.අසති උපාදනස්මිං නත්ථි භවොති ඤාණං
➔ 15. උපාදාන පච්චයා (උපාදානය ඇතිකල්හි) [භවෝ+ඉති] භවෝති (භවය ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
16.අසති උපාදනස්මිං (උපාදානය නැතිකල්හි) නත්ථි භවොති (භවය නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 15. උපාදානය ඇතිකල්හි භවය ඇත්තේ යැයි දන්නා ඤාණය).
16. උපාදානය නැතිකල්හි භවය නැත්තේ යයි දන්නා ඤාණය
-පෙ-
22.තණ්හා පච්චයා උපාදානන්ති ඤාණං
23.අසති තණ්හාය නතථි උපාදානන්ති ඤාණං
➔ 22. තණ්හා පච්චයා (තණ්හාව ඇතිකල්හි) [උපාදානං + ඉති] උපාදානන්ති (උපාදානය ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
23.අසති තණ්හාය (තණ්හාව නැතිකල්හි) නත්ථි උපාදානන්ති (උපාදානය නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 22. තණ්හාව ඇතිකල්හි උපාදානය ඇත්තේ යැයි දන්නා ඤාණය).
23. තණ්හාව නැතිකල්හි උපාදානය නැත්තේ යයි දන්නා ඤාණය
-පෙ-
29.වේදනා පච්චයා තණ්හාති ඤාණං
30.අසති වේදනාය නත්ථි තණ්හාති ඤාණං
➔ 29. වේදනා පච්චයා (වේදනාව ඇතිකල්හි) [තණ්හා+ඉති] තණ්හාති (තණ්හාව ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
30.අසති වේදනාය (වේදනාව නැතිකල්හි) නත්ථි තණ්හාති (තණ්හාව නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 29. වේදනාව ඇතිකල්හි තණ්හාව ඇත්තේ යැයි දන්නා ඤාණය).
30. වේදනාව නැතිකල්හි තණ්හාව නැත්තේ යයි දන්නා ඤාණය
.-පෙ-
36.ඵස්ස පච්චයා වේදනාති ඤාණං.
37.අසති ඵස්සස්මිං නත්ථි වේදනාති ඤාණං
➔ 36. ඵස්ස පච්චයා (ස්පර්ශය ඇතිකල්හි) [වේදනා+ඉති] වේදනාති (වේදනාව ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
37.අසති ඵස්සස්මිං (ස්පර්ශය නැතිකල්හි) නත්ථි වේදනාති (වේදනාව නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 36. ස්පර්ශය ඇතිකල්හි වේදනාව ඇත්තේ යැයි දන්නා ඤාණය).
37 ස්පර්ශය නැතිකල්හි වේදනාව නැත්තේ යයි දන්නා ඤාණය
-පෙ-
43.සළායතන පච්චයා ඵස්සෝති ඤාණං.
44.අසති සළායතනස්මිං නත්ථි ඵස්සෝති ඤාණං

➔ 43. සළායතන පච්චයා (ආයතන හය ඇතිකල්හි) [ඵස්සෝ+ඉති] ඵස්සෝති (ස්පර්ශය ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
44.අසති සළායතනස්මිං (ආයතන හය නැතිකල්හි) නත්ථි ඵස්සෝති (ස්පර්ශය නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 43. ආයතන හය ඇතිකල්හි ස්පර්ශය ඇත්තේ යැයි දන්නා ඤාණය).
44. ආයතන හය නැතිකල්හි ස්පර්ශය නැත්තේ යයි දන්නා ඤාණය
-පෙ-
50.නාම රූප පච්චයා සළායතනන්ති ඤාණං.
51.අසති නාමරූපස්මිං නතථි සළායතනන්ති ඤාණං
➔ 50. නාම රූප පච්චයා (නාම රූප ඇතිකල්හි) [සළායතනං +ඉති] සළායතනන්ති (ආයතන හය ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
51.අසති නාමරූපස්මිං (නාම රූප නැතිකල්හි) නත්ථි සළායතන්ති (ආයතන හය නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 50. නාම රූප ඇතිකල්හි ආයතන හය ඇත්තේ යැයි දන්නා ඤාණය).
51. නාම රූප නැතිකල්හි ආයතන හය නැත්තේ යයි දන්නා ඤාණය
-පෙ-
57.විඤ්ඤාණ පච්චයා නාම රූපන්ති ඤාණං
58.අසති විඤ්ඤාණස්මිං නත්ථි නාම රූපන්ති ඤාණං.
➔ 57. විඤ්ඤාණ පච්චයා (විඤ්ඤාණය ඇතිකල්හි) [නාම රූපං +ඉති] නාම රූපන්ති (නාම රූප ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
58.අසති විඤ්ඤාණස්මිං (විඤ්ඤාණය නැතිකල්හි) නත්ථි නාම රූපන්ති (නාම රූප නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 57. විඤ්ඤානය ඇතිකල්හි නාම රූප ඇත්තේ යැයි දන්නා ඤාණය).
58. විඤ්ඤාණය නැතිකල්හි නාම රූප නැත්තේ යයි දන්නා ඤාණය
-පෙ-
64.සංඛාර පච්චයා විඤ්ඤාණන්ති ඤාණං.
65.අසති සංඛාරෙසු නත්ථි විඤ්ඤාණන්ති ඤාණං.
➔ 64. සංඛාර පච්චයා (සංස්කාර ඇතිකල්හි) [විඤ්ඤාණං +ඉති] විඤ්ඤාණන්ති (විඤ්ඤාණය ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
65.අසති සංඛාරෙසු (සංස්කාර නැතිකල්හි) නත්ථි විඤ්ඤාණන්ති (විඤ්ඤාණය නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 64. සංස්කාර ඇතිකල්හි විඤ්ඤාණය ඇත්තේ යැයි දන්නා ඤාණය).
65. සංස්කාර නැතිකල්හි විඤ්ඤාණය නැත්තේ යයි දන්නා ඤාණය
-පෙ-
71.අවිජ්ජා පච්චයා සංඛාරාති ඤාණං.
72.අසති අවිජ්ජාය නත්ථි සංඛාරාති ඤාණං.
➔ 71. අවිජ්ජා පච්චයා (අවිද්‍යාව ඇතිකල්හි) [සංඛාරා+ඉති] සංඛාරාති (සංස්කාර ඇත්තේ යැයි) ඤාණං (දන්නා ඤාණය).
72.අසති අවිජ්ජාය (අවිද්‍යාව නැතිකල්හි) නත්ථි සංඛාරාති (සංස්කාර නැත්තේ යයි) ඤාණං (දන්නා ඤාණය).
☞ 71. අවිද්‍යාව ඇතිකල්හි සංස්කාර ඇත්තේ යැයි දන්නා ඤාණය).
72. අවිද්‍යාව නැතිකල්හි සංස්කාර නැත්තේ යයි දන්නා ඤාණය

77.යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං තම්පි ඛය ධම්මං විරාග ධම්මං නිරෝධ ධම්මන්ති ඤාණන්ති.

➔77.[යං + අපි + අස්ස] යම්පිස්ස (ඔහුට යම්) තං ධම්මට්ඨිති (ඒ ධර්මයන්ගේ හේතු ඵල ස්වභෝවය පිලිබඳ) ඤාණං (දන්නා ඤාණයක් වේ ද), තම්පි (එයද) ඛයධම්මං (ක්ෂයවන ධර්මයකි) වයධම්මං (වැයවීයන ධර්මයකි) විරාගධම්ම (වෙන්වීයන ධර්මයකි) [නිරොධ-ධම්මං + ඉති] නිරොධධම්මනති (නිරෝධවන/දුරුවන ධර්මයක් යැයි) ඤාණං (දැනගන්නා නුවනය).

☞ 77. ඔහුට ඉහත ධර්මයන්ගේ හේතු ඵල ස්වභෝවය පිලිබඳ දන්නා ඤාණයක් වේ ද, එයද ක්ෂයවන ධර්මයකි වැයවීයන ධර්මයකි වෙන්වීයන ධර්මයකි නිරෝධවන/දුරුවන ධර්මයක් යැයි දැනගන්නා ඤාණය.

ඉමානි සත්ත සත්ති ඤාණානි. ඉමේහි සත්ත සත්තතියා ඤාණේහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.

➔ ඉමානි (මේ) සත්ත සත්ති (සත් සැත්තෑ) ඤාණානි (ඤාණයෝය) ඉමේහි (මෙම) සත්ත සත්තතියා (සත් සැත්තෑ) ඤාණේහි (ඤාණයන්ගෙන්) සමන්නාගතං (සමන්විත වූ) සම්මා සම්බුද්ධං (සම්මා සම්බුද්ධ) භගවන්තං (භාග්‍යවතුන් වහන්සේට) සිරසා නමාමි (දොහොත් මුදුන්දී නමස්කාර කරමි.)

☞ මේ සත් සැත්තෑ ඤාණයෝය, මෙම සත් සැත්තෑ ඤාණයන්ගෙන් සමන්විත වූ සම්මා සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේට දොහොත් මුදුන්දී නමස්කාර කරමි.
සාධු! සාධු ! සාධු !

<u>සතර මහා සංවේග ස්ථාන</u>

මායා සුතෝ සුගත සාකිය සීහනාථෝ
ජාතක්ඛණේ සපදසා වභිසංකමිත්වා
යස්මිං උදීරයි ගිරං වර ලුම්බිණිම්හි
තං ජාත චේතිය මහං සිරසා නමාමි.

මායා සුතෝ සුගත සාකිය සීහනාථෝ, ජාතක්ඛණේ [සපදසා + ඒව + අභිසංකමිත්වා] සපදසා-වභිසංකමිත්වා වර ලුම්බිණිම්හි යස්මිං [ගිරං+උදීරයි] උදීරයිගිරං, තං ජාත [චේතියං+අහං] චේතියමහං සිරසා නමාමි

➔ මායා (මහාමායා දේවියගේ) සුතෝ (පුත් වූ) සුගත (ශෝභන ගමන් ඇති) සාකිය සීහනාථෝ (ශාක්‍ය සීහොත්තම වූ මහා කාරුණිකයන් වහන්සේ), ජාතක්ඛණේ (උපන් මොහොතේ) සපදසා-වභිසංකමිත්වා [සපදසා+ඒව+අභිසංකමිත්වා] (සිය පයින්ම උතුරට වැඩමවා) වර (උතුම්) ලුම්බිණිම්හි (ලුම්බිණි උයනෙහි) යස්මිං (යම් තැනක සිට) උදීරයිගිරං [ගිරං +උදීරයි] (වචනයන් ප්‍රකාශ කලේද) , තං (ඒ) ජාත (උප්පත්ති) චේතියමහං [චේතියං +අහං] (චෛත්‍යය මම) සිරසා නමාමි (හිස්මුදුනින් නමස්කාර කරමි.)

☞ මහාමායා දෙවියගේ පුත් වූ ශෝභන ගමන් ඇති ශාක්‍ය සීහොත්තම වූ මහා කාරුණිකයන් වහන්සේ, උපන් මොහොතේ, සිය පයින් උතුරට සත් පියවරක් වැඩමවා, උතුම් ලුම්බිණි උයනෙහි යම් තැනක සිට " අග්ගෝ හමස්මි " යනාදි වචනයන් ප්‍රකාශ කලේද, එහි කරවන ලද චෛත්‍යද ඒ පූජ්‍ය ස්ථානය ද මම හිස්මුදුනින් නමස්කාර කරමි.

යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනේන
ජෙත්වා සවාසන කිලේස බලං මුණින්දෝ
සම්බෝධි ඤාණමධිගම්ම විභාසි සම්මා
තං බෝධි චේතියමහං සිරසා නමාමි.

මුණින්දෝ යස්මිං වජිරාසන බන්ධනේන නිසජ්ජ, සවාසන කිලේස බලං ජෙත්වා, සම්බෝධි [ඤාණං + අධිගම්ම] ඤාණමධිගම්ම විභාසි සම්මා, තං බෝධි [චේතියං+අහං] චේතියමහං සිරසා නමාමි

➔ මුණින්දෝ (මුණීන්ද්‍රයන් වහන්සේ) යස්මිං (යම්) වජිරාසන බන්ධනේන (වජ්‍රාසනයක පළඟ බැඳගෙන) නිසජ්ජ (වැඩහිඳ), සවාසන කිලේස (වසනා සහිත කෙලෙස්) බලං (බලමුළුව) ජෙත්වා (ජයගෙන), සම්බෝධි (සර්වඥතා) ඤාණමධිගම්ම [ඤාණං (ඥාණය) සම්මා (මැනවින්)+ අධිගම්ම (අවබෝධකරගෙන)] විභාසි (වැඩවාසය කළ සේක්ද), තං (ඒ) බෝධි (බුද්ධත්ව) චේතියමහං [චේතියං +අහං] (චෛත්‍යය මම) සිරසා නමාමි (හිස්මුදුනින් නමස්කාර කරමි.)

☞ මුණීන්ද්‍රයන් වහන්සේ යම් වජ්‍රාසනයක පළඟ බැඳගෙන වැඩහිඳ, වසනා සහිත කෙලෙස් බලමුළුව ජයගෙන, සර්වඥතා ඥාණය මැනවින් අවබෝධකරගෙන වැඩවාසය කළ සේක්ද, ඒ බුද්ධත්ව චෛත්‍යය මම හිස්මුදුනින් නමස්කාර කරමි.

සංකම්පයං දසසහස්සිය ලෝක ධාතුං
දේසේසි යත්‍ර භගවා වර ධම්ම චක්කං
බාරාණසීපුර සමීප වනේ මිගානං
තං ධම්ම චේතිය මහං සිරසා නමාමි.

භගවා යත්‍ර දසසහස්සිය ලෝක ධාතුං සංකම්පයං වර ධම්ම චක්කං දේසේසි, **බාරාණසීපුර** සමීප මිගානං වනේ, තං ධම්ම [චේතියං +අහං] චේතියමහං සිරසා නමාමි.#

➔ භගවා (භාග්‍යවතුන් වහන්සේ) යත්‍ර (යම් තැනෙක වැඩ හිදගෙන) දසසහස්සිය ලෝක ධාතුං (දස දහසක් ලොක ධාතුව) සංකම්පයං (කම්පා කරවමින්) වර (උතුම්) ධම්ම චක්කං (ධර්ම චක්‍රය) දේසේසි (දෙසූ සේක්ද), **බාරාණසීපුර** සමීප (බරණැස් නුවරට සමීප) මිගානං වනේ (මුව වනයෙහි), තං ධම්ම (ඒ ධර්ම) චේතියමහං [චේතියං +අහං] (චෛත්‍යය මම)සිරසා නමාමි (හිස්මුදුනින් නමස්කාර කරමි.)

☞ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක වැඩ හිදගෙන, දස දහසක් ලොක ධාතුව කම්පා කරවමින් උතුම් වූ ධර්ම චක්‍රය දෙසූ සේක්ද, බරණැස් නුවරට සමීප මුව වනයෙහි වූ ඒ ධර්ම චෛත්‍යය මම හිස්මුදුනින් නමස්කාර කරමි.

කත්වාන ලෝක හිතමත්ත හිතඤ්ච නාථෝ
අසීතිකෝව උපවත්තන කානනම්හි
යස්මිං නිපජ්ජ ගතවා නිරුපාදධිසෙසං
නිබ්බාන චේතිය මහං සිරසා නමාමි.

නාථෝ [ලෝක+හිතං+අත්ත+හිතං +ච] ලෝකහිතමත්තහිතඤ්ච කත්වාන අසීතිකෝව උපවත්තන කානනම්හි යස්මිං නිපජ්ජ නිරුපාදධිසෙසං ගතවා නිබ්බාන චේතියමහං සිරසා නමාමි

➔ නාථෝ (මහාකාරුණිකයන් වහන්සේ) [ලෝක+හිතං (ලෝකවාසීන්ට හිතවැඩ ද) +අත්ත+හිතං+ච (තම හිතවැඩ ද)] ලෝකහිතමත්තහිතඤ්ච කත්වාන (කොට) අසීතිකෝව (අසූ අවුරුදු ඇත්තෙක්ව) උපවත්තන කානනම්හි (උපවත්තන සල්වනයෙහි) යස්මිං (යම්

තැනෙක) නිපජ්ජ (සැතපී) නිරුපාදධිසෙසං (නිරුපාධිශේෂ පරිනිර්වාණ ධාතුවට) ගතවා (ගිය සේකද / වැඩිසේකද) නිබ්බාන (පරිනිර්වාණ) චේතියමහං [චේතියං +අහං] (චෛත්‍යය මම)සිරසා නමාමි (හිස්මුදුනින් නමස්කාර කරමි.)

☞ ඒ මහාකාරුණිකයන් වහන්සේ ලෝකවාසීන්ට හිතවැඩ ද තම හිතවැඩ ද කොර නිමවා, උපතින් අසූ අවුරුදු ඇත්තෙක්ව, උපවත්තන සල්වනයෙහි යම් නැනෙක සැතපී නිරුපාධිශේෂ පරිනිර්වාණ ධාතුවට වැඩමකල සේකද, ඒ පරිනිර්වාණ චෛත්‍යය මම හිස්මුදුනින් නමස්කාර කරමි.
සාධු ! සාධු! සාධු !

<u>සුගතෝවාදය (සුගතයන් වහන්සේගේ අවවාදය)</u>
අප්පමාදේන භික්ඛවේ සම්පාදේථ
දුල්ලභෝ බුද්ධුප්පාදෝ ලොකස්මිං
දුල්ලභෝ මනුස්සත්ත පටිලාභෝ
දුල්ලභා ඛණ සම්පත්ති
දුල්ලභා පබ්බජ්ජා
දුල්ලභං සද්ධම්ම සවනං
දුල්ලභෝ සප්පුරිස සංසෙවෝ

➔ අප්පමාදේන (අප්‍රමාදව) භික්ඛවේ (මහණෙනි!) සම්පාදේථ (නිවන්මග සාදාගන්න)
දුල්ලභෝ (දුර්ලභය) බුද්ධුප්පාදෝ (බුද්ධෝත්පාදය) ලොකස්මිං (ලොවෙහි)
දුල්ලභෝ (දුර්ලභය) මනුස්සත්ත (මිනිසත් බව) පටිලාභෝ (ලැබීම)
දුල්ලභා (දුර්ලභය) ඛණ (අෂ්ඨක් ක්ෂණයෙන් මිදුණු පරිපූර්ණ ක්ෂණ/සුදුසු කාල) සම්පත්ති (සම්පත්තිය)
දුල්ලභා (දුර්ලභය) පබ්බජ්ජා (බුද්ධශාසනයෙහි පැවිද්ද)
දුල්ලභං (දුර්ලභය) සද්ධම්ම (ශ්‍රී සද්ධර්ම) සවනං (ශ්‍රවණය)
දුල්ලභෝ (දුර්ලභය) සප්පුරිස (බුද්ධසත්පු ෂයානන්) සංසෙවෝ (ඇසුරට ලැබීම)
☞ මහණෙනි! අප්‍රමාදව නිවන්මග සාදාගන්න, ලොවෙහි බුද්ධෝත්පාදය දුර්ලභය, මිනිසත් බව ලැබීම දුර්ලභය, අෂ්ඨක් ක්ෂණයෙන් මිදුණු පරිපූර්ණ ක්ෂණ/සුදුසු කාල සම්පත්තිය දුර්ලභය, බුද්ධශාසනයෙහි පැවිද්ද දුර්ලභය, ශ්‍රී සද්ධර්ම ශ්‍රවණය දුර්ලභය, බුද්ධ සත්පු ෂයානන් ඇසුරට ලැබීම දුර්ලභය.

2 ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ
ධුනාථ මච්චුනෝසේනං - නළාගාරංව කුඤ්ඤරෝ.

ආරභථ නික්ඛමථ බුද්ධ සාසනේ යුඤ්ජථ, කුඤ්ඤරෝ [නළාගාරං+ඉව] නළාගාරංව මච්චුනෝ සේනං ධුනාථ
➔ ආරභථ (ඇරඹීමේ වීර්ය කරව්) නික්ඛමථ (ඇරඹූ වීර්ය පැවැත්වීමේ වීර්ය කරව්) බුද්ධ සාසනේ (බුදු සසුනෙහි) යුඤ්ජථ (යෙදෙව්- උත්සහවත් වව්), කුඤ්ඤරෝ (හස්ති රාජයෙකු) [නළා(බටකොළ)+අගාරං(ගෙයක්) [බිඳ දමන්නාක්] +ඉව (මෙන්)] නළාගාරංව මච්චුනෝ (කෙලෙස් මාර) සේනං (සෙනග) ධුනාථ (විනාශකරව්/ කම්පාකරව්!)
☞ ඇරඹීමේ වීර්ය කරව්! ඇරඹූ වීර්ය පැවැත්වීමේ වීර්ය කරව්! බුදු සසුනෙහි යෙදෙව්- උත්සහවත් වව්! හස්ති රාජයෙකු බටකොළ ගෙයක් බිඳ දමන්නාක් මෙන් කෙලෙස් මාර සෙනග විනාශකරව්/ කම්පාකරව්!

3 යෝ ඉමස්මිං ධම්ම විනයේ-අප්පමත්තෝ විහෙස්සති.
පහාය ජාති සංසාරං - දුක්ඛස්සන්තං කරිස්සති.

යෝ ඉමස්මිං ධම්ම විනයේ, අප්පමත්තෝ විහෙස්සති. [සෝ] ජාති සංසාරං පහාය [දුක්ඛස්ස+අන්තං] දුක්ඛස්සන්තං කරිස්සති
➔ යෝ (යමෙක්) ඉමස්මිං (මේ) ධම්ම-විනයේ (ධර්ම විනයෙහි/ බුදු සස්නෙහි), අප්පමත්තෝ (අප්‍රමාදව) විහෙස්සති (වාසයකරයි නම්). [සෝ=ඔහු] ජාති සංසාරං (ජාති සංසාරය) පහාය (හැරදමා) [දුක්ඛස්ස+අන්තං] දුක්ඛස්සන්තං (දුක් කෙළවර) කරිස්සති (කරන්නේය.)
☞ යමෙක් මේ ධර්ම විනයෙහි/ බුදු සස්නෙහි අප්‍රමාදව වාසයකරයි නම්, ඔහු ජාති සංසාරය හැරදමා දුක් කෙළවර කරන්නේය.

<u>**පටිච්චසමුප්පාද ධර්මය.**</u>
අවිජ්ජා පච්චයා සංඛාරා. සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සෝක පරිදේව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති.

➔ අවිජ්ජා (අවිද්‍යාව) පච්චයා (හේතුකරගෙන) සංඛාරා (සංස්ඛාර ඇතිවේ). සංඛාර (සංස්ඛාර) පච්චයා (හේතුකරගෙන)විඤ්ඤාණං (සිත ඇතිවේ), විඤ්ඤාණ (සිත) පච්චයා (හේතුකරගෙන) නාමරූපං (නාම රූප ඇතිවේ), නාමරූප (නාම රූප) පච්චයා (හේතුකරගෙන) සළායතනං (ආයතන හය ඇතිවේ), සළායතන (ආයතන හය) පච්චයා (හේතුකරගෙන) ඵස්සෝ (ස්ඵර්ෂය ඇතිවේ), ඵස්ස (ස්ඵර්ෂය) පච්චයා (හේතුකරගෙන) වේදනා (වේදනාව ඇතිවේ), වේදනා (වේදනාව) පච්චයා (හේතුකරගෙන) තණ්හා (තණ්හාව ඇතිවේ) තණ්හා (තණ්හාව) පච්චයා (හේතුකරගෙන) උපාදානං (උපාදානය ඇතිවේ), උපාදාන (උපාදාන) පච්චයා (හේතුකරගෙන) භවෝ (භවය ඇතිවේ), භව (භවය) පච්චයා (හේතුකරගෙන) ජාති (ඉපදීම ඇතිවේ), ජාති (ඉපදීම) පච්චයා (හේතුකරගෙන) ජරා (ජරාවට යාම) මරණං (මරණය) සෝක (සෝක කිරීම්) පරිදේව (හැඬීම් වැලපීම්) දුක්ඛ (දුක්) [දොමනස්ස+උපායාසා] දොමනස්සුපායාසා (දොම්නස් හා සිතේ දැඩිවෙහස) සම්භවන්ති (ඇති වෙති.) [ඒවං +ඒතස්ස] ඒවමේතස්ස (මෙසේ මෙ) කේවලස්ස (හුදෙක්ම) [දුක්ඛ+ඛන්ධස්ස] දුක්ඛක්ඛන්ධස්ස (දුක් සමූහයාගේ) සමුදයෝ (ඇතිවීම/හටගැනීම/ඉපදීම) හෝති (වේ/සිදුවේ).

☞ අවිද්‍යාව හේතුකරගෙන සංස්ඛාර ඇතිවේ, සංස්ඛාර හේතුකරගෙන සිත ඇතිවේ, සිත හේතුකරගෙන නාම රූප ඇතිවේ, නාම රූප හේතුකරගෙන ආයතන හය ඇතිවේ, ආයතන හය හේතුකරගෙන ස්ඵර්ෂය ඇතිවේ, ස්ඵර්ෂය හේතුකරගෙන වේදනාව ඇතිවේ, වේදනාව හේතුකරගෙන තණ්හාව ඇතිවේ, තණ්හාව හේතුකරගෙන උපාදානය ඇතිවේ, උපාදාන හේතුකරගෙන භවය ඇතිවේ, භවය හේතුකරගෙන ඉපදීම ඇතිවේ, ඉපදීම හේතුකරගෙන
ජරාවට යාම මරණය සෝක කිරීම් හැඬීම් වැලපීම් දුක් දොම්නස් හා සිතේ දැඩිවෙහස ඇති වෙති. හුදෙක්ම මෙසේ මේ දුක් සමූහයාගේ හටගැනීම සිදුවේ.

<u>**පටිලොම වාරය**</u>
අවිජ්ජායත්වේව අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධෝ, සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ, විඤ්ඤාන නිරෝධා නාම රූප නිරෝධෝ, නාම රූප නිරෝධා සළායතන නිරෝධෝ, සළායතන නිරෝධා ඵස්ස නිරෝධෝ, ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ, වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ, තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ, උපාදාන නිරෝධා භව

නිරෝධො, භව නිරෝධා ජාති නිරෝධො, ජාති නිරෝධා ජරා මරණං සෝක පරිදේව දුක්ඛදෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධො හොති.

➔ [අවිජ්ජාය+ තු +ඒව] අවිජ්ජායත්වේව (අවිද්‍යාව ම වනාහි) අසේස (ඉතිරියක් නැතිව) විරාග (නොඇලීම නම් මාර්ගයෙන්) නිරෝධා (නිරුද්ද වීමෙන්) සංඛාර (සංස්කාර) නිරෝධො (නිරුද්දවේ), සංඛාර (සංස්කාර) නිරෝධා (නිරුද්ද වීමෙන්) විඤ්ඤාණ (සිත) නිරෝධො (නිරුද්දවේ), විඤ්ඤාන (සිත) නිරෝධා (නිරුද්ද වීමෙන්) නාමරූප නිරෝධො (නාමරූප නිරුද්දවේ), නාමරූප නිරෝධා (නාමරූප නිරුද්ද වීමෙන්) සළායතන (ආයතන හය) නිරෝධො (නිරුද්දවේ), සළායතන (ආයතන හය) නිරෝධා (නිරුද්ද වීමෙන්) ඵස්ස (ස්ඵර්ෂය) නිරෝධො (නිරුද්දවේ), ඵස්ස (ස්ඵර්ෂය) නිරෝධා (නිරුද්ද වීමෙන්) වේදනා (වේදනාව) නිරෝධො (නිරුද්දවේ), වේදනා (වේදනාව) නිරෝධා (නිරුද්ද වීමෙන්) තණ්හා (තණ්හාව) නිරෝධො (නිරුද්දවේ), තණ්හා (තණ්හාව) නිරෝධා (නිරුද්ද වීමෙන්) උපාදාන (උපාදානය) නිරෝධො (නිරුද්දවේ), උපාදාන (උපාදානය) නිරෝධා (නිරුද්ද වීමෙන්) භව (භවය) නිරෝධො (නිරුද්දවේ), භව (භවය) නිරෝධා (නිරුද්ද වීමෙන්) ජාති (ඉපදීම) නිරෝධො (නිරුද්දවේ), ජාති (ඉපදීම) නිරෝධා (නිරුද්ද වීමෙන්) ජරා (ජරාවට යාම) මරණං (මරණය) සෝක (සෝක කිරීම්) පරිදේව (හැඬීම් වැලපීම්) දුක්ඛ (දුක්) [දොමනස්ස+උපායාසා] දොමනස්සුපායාසා (දොම්නස් හා සිතේ දැඩිවෙහස) නිරුජ්ඣන්ති (නිරුද්ධවෙති). [ඒවං +ඒතස්ස] ඒවමේතස්ස (මෙසේ මෙ) කේවලස්ස (හුදෙක්ම) [දුක්ඛ+ඛන්ධස්ස] දුක්ඛක්ඛන්ධස්ස (දුක් සමූහයාගේ) නිරෝධො (නිරුද්ධවීම) හොති (වේ/සිදුවේ)

☞ අවිද්‍යාව ම වනාහි ඉතිරියක් නැතිව නොඇලීම නම් මාර්ගයෙන් නිරුද්ද වීමෙන් සංස්කාර නිරුද්දවේ, සංස්කාර නිරු ද වීමෙන් සිත නිරු දවේ, සිත නිරුද්ද වීමෙන් නාම රූප නිරුද්දවේ, නාම රූප නිරුද්ද වීමෙන් ආයතන හය නිරුද්දවේ, ආයතන හය නිරුද්ද වීමෙන් ස්ඵර්ෂය නිරුද්දවේ, ස්ඵර්ෂය නිරුද්ද වීමෙන් වේදනාව නිරුද්දවේ, වේදනාව නිරුද්ද වීමෙන් තණ්හාව නිරුද්දවේ, තණ්හාව නිරුද්ද වීමෙන් උපාදානය නිරුද්දවේ, උපාදාන නිරුද්ද වීමෙන් භවය නිරුද්දවේ, භවය නිරුද්ද වීමෙන් ඉපදීම නිරුද්දවේ, ඉපදීම නිරුද්ද වීමෙන් ජරාවට යාම මරණය සෝක කිරීම් හැඬීම් වැලපීම් දුක් දොම්නස් හා සිතේ දැඩිවෙහස නිරුද්දවෙති. හුදෙක්ම මෙසේ මේ දුක් සමූහයාගේ නිරුද්ධවීම සිදුවේ.

<u>**සූවිසිපට්ඨාන ධර්මය**</u>

හේතු පච්චයෝ. ආරම්මණ පච්චයෝ. අධිපති පච්චයෝ. අනන්තර පච්චයෝ. සමනන්තර පච්චයෝ. සහජාත පච්චයෝ. අඤ්ඤමඤ්ඤ පච්චයෝ. නිස්සය පච්චයෝ.
උපනිස්සය පච්චයෝ. පුරේජාත පච්චයෝ. පච්චාජාත පච්චයෝ. ආසේවන පච්චයෝ. කම්ම පච්චයෝ. විපාක පච්චයෝ. ආහාර පච්චයෝ. ඉන්ද්‍රිය පච්චයෝ. ඣාන පච්චයෝ. මග්ග පච්චයෝ. සම්පයුත්ත පච්චයෝ. විප්පයුත්ත පච්චයෝ. අත්ථි පච්චයෝ. නත්ථි පච්චයෝ. විගත පච්චයෝ. අවිගත පච්චයෝති.

➔හේතු ප්‍රත්‍යය. ආරම්මණ ප්‍රත්‍යය. අධිපති ප්‍රත්‍යය. අනන්තර ප්‍රත්‍යය. සමනන්තර ප්‍රත්‍යය. සහජාත ප්‍රත්‍යය. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය. නිස්සය ප්‍රත්‍යය. උපනිස්සය ප්‍රත්‍යය. පුරේජාත ප්‍රත්‍යය. පච්චාජාත ප්‍රත්‍යය. ආසේවන ප්‍රත්‍යය. කම්ම ප්‍රත්‍යය. විපාක ප්‍රත්‍යය. ආහාර ප්‍රත්‍යය. ඉන්ද්‍රිය ප්‍රත්‍යය. ඣාන ප්‍රත්‍යය. මග්ග ප්‍රත්‍යය. සම්පයුත්ත ප්‍රත්‍යය. විප්පයුත්ත ප්‍රත්‍යය. අත්ථි ප්‍රත්‍යය. නත්ථි ප්‍රත්‍යය.. විගත ප්‍රත්‍යය. අවිගත ප්‍රත්‍යය.

ඒතේන සච්චවජ්ජේන සොත්ථි මේ හොතු සබ්බදා.
➔ ඒතේන (මේ) සච්චවජ්ජේන (සත්‍යය වචනයෙන්) සොත්ථි (සෙත්ක් සාන්තියක්) මේ(මට) හොතු (වේවා) සබ්බදා (සැමදා)
☞ මේ සත්‍යය වචනයෙන් සැමදා මට සෙතක් සාන්තියක් වේවා!

<u>චතුරාරක්ෂක භාවනා</u>
<u>බුද්ධානුස්සති භාවනාව</u>

1. බුද්ධානුස්සති මෙත්තා ච - අසුභං මරණස්සති
ඉති ඉමා චතුරාරක්ඛා - භික්ඛු භාවෙය්‍ය සීලවා

සීලවා භික්ඛු බුද්ධානුස්සති මෙත්තාච අසුභං මරණස්සති ඉති ඉමා චතුරාරක්ඛා භාවෙය්‍ය
➔ සීලවා (සුසිල්වත්) භික්ඛු (යෝගාවචර තෙම) බුද්ධානුස්සති (බුදුගුණ) මෙත්තාච (මෛතිය ද) අසුභං (අසුභය) මරණස්සති (මරණය) ඉති (යන) ඉමා (මේ) චතුරාරක්ඛා (චතුරාරක්ෂක භාවනා) භාවෙය්‍ය (වඩන්නේය)
☞ සුසිල්වත් යෝගාවචර තෙම බුදුගුණ, මෛතිය, අසුභය, මරණය යන මේ චතුරාරක්ෂක භාවනා වඩන්නේය.

2. අන්න්ත විත්ථාර ගුණං - ගුණතෝනුස්සරං මුනිං
භාවෙය්‍ය බුද්ධිමා භික්ඛු - බුද්ධානුස්සති මාදිතෝ

බුද්ධිමා භික්ඛු [බුද්ධානුස්සතිං +ආදිතෝ] බුද්ධානුස්සතිමාදිතෝ භාවෙය්‍ය අන්න්ත විත්ථාර ගුණං මුනිං [ගුණතෝ+අනුස්සරං] ගුණතෝනුස්සරං
➔ බුද්ධිමා භික්ඛු (බුද්ධිමත් යෝගාවචරයා) බුද්ධානුස්සතිමාදිතෝ [බුද්ධානුස්සතිං +ආදිතෝ] (බුදුගුණ පළමුව) භාවෙය්‍ය (වඩනනේය) අන්න්ත (අනන්ත) විත්ථාර (පතළ) ගුණං (ගුණස්කන්ධයක් ඇති) මුනිං (සම්මා සම්බුදු රජාණන් වහන්සේ) ගුණතෝනුස්සරං [ගුණතෝ +අනුස්සරං] (ගුණවශයෙන් භාවනාකරන්නේය/ සිහිකරන්නේය.)
☞ බුද්ධිමත් යෝගාවචරයා චතුරාරක්ෂක භාවනා අතුරෙන් පළමුව බුදුගුණ භාවනා වඩනනේය. අනන්තවූ පතළවූ ගුණස්කන්ධයක් ඇති සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගුණවශයෙන් සිහිකරන්නේය.

3. සවාසනේ කිලේසේ සෝ - ඒකෝ සබ්බේ නිඝාතිය
අහු සුසුද්ධසන්තානෝ - පූජානඤ්ච සදාරහෝ

සෝ ඒකෝ [සහ+වාසනේ] සවාසනේ සබ්බේ කිලේසේ නිඝාතිය සුසුද්ධ-සන්තානෝ අහු, පූජානඤ්ච [සදා+අරහෝ] සදාරහෝ
➔ සෝ (ඔහු/ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ) ඒකෝ (තනිවම) සවාසනේ [සහ+වාසනේ] (වාසනා සහිතව/ අතීත වැරදි පුරුදු සහිතව) සබ්බේ (සකල/ සියලු) කිලේසේ (ක්ලේශයන්) නිඝාතිය (නසා) සුසුද්ධ-සන්තානෝ (අතිශයින් ශුද්ධ සන්තාන ඇත්තේ) අහු (වූහ), පූජානඤ්ච (පූජාවන්ට ද) සදාරහෝ [සදා+අරහෝ] (සැමදා සුදුසු වූ සේක.)
☞ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තනිවම වාසනා සහිතව සකල ක්ලේශයන් නසා අතිශයින් ශුද්ධ සන්තාන ඇතියෝය. දෙව් මිනිසුන් විසින් කරනු ලබන අනේක ප්‍රකාර පූජාවන්ට ද සුදුසු වූ සේක.

4. සබ්බකාලගතේ ධම්මේ - සබ්බේ සම්මා සයං මුනි
සබ්බාකාරේන බුජ්ඣිත්වා -එකෝ සබ්බඤ්ඤුතං ගතෝ

මුනි සබ්බකාල-ගතේ සබ්බේ ධම්මේ සයං සම්මා [සබ්බ+ආකාරේන] සබ්බාකාරේන බුජ්ඣිත්වා එකෝ සබ්බඤ්ඤුතං ගතෝ

➔ මුනි (භාග්‍යවත් මුනින්ද්‍රයන් වහන්සේ) සබ්බකාල-ගතේ (අතීත,අනාගත,වර්තමාන යන සර්ව කාලයන්ට අයත් වූ) සබ්බේ ධම්මේ (සියලු ධර්මයන්) සයං (තමන් වහන්සේ විසින්) සම්මා (මනාකොට) [සබ්බ+ආකාරේන]සබ්බාකාරේන (සියලු ආකාරයන් ගෙන්) බුජ්ඣිත්වා (අවබෝධකර) එකෝ (තනිවම) සබ්බඤ්ඤුතං ගතෝ (සර්වඥත්වයට පැමිණි සේක)

☞ භාග්‍යවත් මුනින්ද්‍රයන් වහන්සේ අතීත,අනාගත,වර්තමාන යන සර්ව කාලයන්ට අයත් වූ සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් මනාකොට සියලු ආකාරයන් ගෙන් අවබෝධකර තනිවම සර්වඥ්ඥ බුද්ධත්වයට පැමිණි සේක.

5. විපස්සනාදි විජ්ජාහි - සීලාදි චරණේහිච
සුසමිද්දේහි සම්පන්නෝ - ගගනාභේහි නායකෝ

නායකෝ සුසමිද්දේහි [ගගන+අභ+ඒහි] ගගනාභේහි විපස්සනාදි විජ්ජාහි සීලාදි චරණේහි ච සම්පන්නෝ

➔ නායකෝ (නායකයන් වහන්සේ) සුසමිද්දේහි (අතිශයින් සමෘද්ධවූ) [ගගන+අභ+ඒහි] ගගනාභේහි (ආකාශය බඳුවූ) විපස්සනාදි (විදර්ශනා ඥානාදි) විජ්ජාහි (විද්‍යාවන්ගෙන් ද) සීලාදි (ශීලාදි) චරණේහිච (චරණ ධර්මයන්ගෙන් ද) සම්පන්නෝ (යුක්තවන සේක.)

☞ නායකයන් වහන්සේ /භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අතිශයින් සමෘද්ධවූ ආකාශය බඳුවූ විදර්ශනා ඥානාදි විද්‍යාවන්ගෙන් ද ශීලාදි චරණ ධර්මයන්ගෙන් ද යුක්තවන සේක.

6. සම්මා ගතෝ සුභං ඨානං - අමෝඝවචනෝ ච සෝ
තිවිදස්සාපි ලෝකස්ස - ඤාතා නිරවසේස තෝ

සෝ සුභං ඨානං සම්මා ගතෝ අමෝඝවචනෝ තිවිදස්සාපි ලෝකස්ස ච නිරවසේසතෝ ඤාතා

➔ සෝ (ඔහු/ භගවත් බුදුරජාණන් වහන්සේ) සුභං ඨානං (පරම සුන්දර නිර්වානයට) සම්මා (මනා කොට) ගතෝ (වැඩියසේක.) අමෝඝවචනෝ (නොහිස් නොවරදින වචන ඇති සේක.) තිවිදස්සාපි (තිවිධවූම) ලෝකස්ස ච (ලෝකය ද) නිරවසේසතෝ (නිරවශේෂයෙන්/ ඉතිරියක් නැතිව) ඤාතා (දැන වදාළ සේක.)

☞ භගවත් බුදුරජාණන් වහන්සේ පරම සුන්දර නිර්වානයට මනා කොට වැඩිය සේක. නොහිස් නොවරදින වචන ඇති සේක. තිවිධවූම ලෝකය ද නිරවශේෂයෙන්/ඉතිරියක් නැතිව දැන වදාළ සේක.

7. අනේකේහි ගුණෝඝේහි - සබ්බසත්තුත්තමෝ අහු
අනේකේහි උපායේහි - නරදම්මේ දමේසිච.

[භගවා] අනේකේහි [ගුණ+ඕඝේහි] ගුණෝඝේහි [සබ්බ+සත්ත+උත්තමෝ] සබ්බසත්තුත්තමෝ අහු අනේකේහි උපායේහි නරදම්මේ ච දමේසි

➔ [භගවා= භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ] අනේකේහි (ශීලාදි නොයෙක් ආකාරවූ) ගුණෝඝේහි [ගුණ+ඕඝේහි] (ගුණ ගංඟාවන්ගෙන්) සබ්බසත්තුත්තමෝ [සබ්බ+සත්ත+උත්තමෝ] (සියලු සත්ත්වයන්ටම උත්තම) අහු (වූසේක.) අනේකේහි

(අනේක) උපායේහි (උපායන්ගෙන්) නරදමේ ච (නොදැමුනු පුද්ගලයන් ද) දමේසි (දමනය කළ සේක.)
☞ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශීලාදි නොයෙක් ආකාරවූ ගුණ ගංභාවන්ගෙන් සියලු සත්ත්වයන්ටම උත්තමවූ සේක. අනේක උපායන්ගෙන් නොදැමුනු පුද්ගලයන් ද දමනය කළ සේක.

8. ඒකෝ සබ්බස්ස ලෝකස්ස- සබ්බසත්තානුසාසකෝ
භාග්‍ය ඉස්සරියාදීනං - ගුණානං පරමෝනිධි.

[භගවා] සබ්බස්ස ලෝකස්ස ඒකෝ [සබ්බ-සත්ත+අනුසාසකෝ] සබ්බසත්තානුසාසකෝ, භාග්‍ය ඉස්සරියාදීනං ගුණානං පරමෝ-නිධි
➔[භගවා = භග්‍යවත් බුදුරජාණන් වහන්සේ] සබ්බස්ස ලෝකස්ස (සකල ලෝකයාටම) ඒකෝ (එකම/අසහාය) සබ්බසත්තානුසාසකෝ [සබ්බ-සත්ත+අනුසාසකෝ] (සියලු සත්ත්වයන්ට අනුශාසනය කරන්නාවූ ශාස්තෲන් වහන්සේය.), භාග්‍ය ඉස්සරියාදීනං (භාග්‍ය ඓශ්වර්යාදි) ගුණානං (ගුණයෙන්ගේ) පරමෝ-නිධි (උතුම්ම නිධානය වූ සේක.)
☞ භග්‍යවත් බුදුරජාණන් වහන්සේ සකල ලෝකයාටම එකමවූ /අසහායවූ සියලු සත්ත්වයන්ට අනුශාසනය කරන්නාවූ ශාස්තෘන් වහන්සේය. භාග්‍ය ඓශ්වර්යාදි ගුණයෙන්ගේ උතුම්ම නිධානය වූ සේක.

9. පඤ්ඤාස්ස සබ්බධම්මේසු - කරුණා සබ්බජන්තුසු
අත්තත්ථානං පරත්ථානං - සාධිකා ගුණජෙට්ඨිකා.

[අස්ස+පඤ්ඤා] පඤ්ඤාස්ස සබ්බ-ධම්මේසු, සබ්බ-ජන්තුසු කරුණා, [අත්ත+අත්ථානං] අත්තත්ථානං [පර+අත්ථානං] පරත්ථානං සාධිකා ගුණ-ජෙට්ඨිකා
➔ [පඤ්ඤාස්ස] අස්ස (උන්වහන්සේගේ) සබ්බ-ධම්මේසු (සකලධර්මයන් කෙරෙහි පවත්නා) පඤ්ඤා (ප්‍රඥාවද), සබ්බ-ජන්තුසු (සකල සත්වයන් කෙරෙහි පවත්නා) කරුණා (මහා කරුණාවද), [අත්ත+අත්ථානං] අත්තත්ථානං (ආත්මාර්ථය) [පර+අත්ථානං] පරත්ථානං (පරාර්ථය) සාධිකා (සිදුකරන) ගුණ-ජෙට්ඨිකා (ප්‍රධාන ගුණය./ ප්‍රධාන ගුණ දෙකය.)
☞ උන්වහන්සේගේ සකලධර්මයන් කෙරෙහි පවත්නා ප්‍රඥාවද සකල සත්වයන් කෙරෙහි පවත්නා මහා කරුණාවද ආත්මාර්ථය, පරාර්ථය සිදුකරන ප්‍රධාන ගුණය./ ප්‍රධාන ගුණ දෙකය.

10. දායාද පාරමී චිත්වා - පඤ්ඤායත්තානමුද්ධරී
උද්දරී සබ්බධම්මේ ච - දයායඤ්ඤේ ච උද්දරී.
[භගවා] දායාද පාරමී චිත්වා, [පඤ්ඤාය+අත්තානං+උද්ධරී] පඤ්ඤායත්තානමුද්ධරී, සබ්බධම්මේ ච උද්දරී, [දයාය+අඤ්ඤේ] දයායඤ්ඤේ ච උද්දරී
➔ [භගවා= භාග්‍යවතුන් වහන්සේ] දායාද (සකල සත්වයන් කෙරෙහි පවත්නා මහා කරුණාවෙන්) පාරමී (සමතිස් පෙරුම් දහම්) චිත්වා (සපුරා/රැස්කර), පඤ්ඤායත්තානමුද්ධරී [පඤ්ඤාය+අත්තානං+උද්ධරී] (ප්‍රඥාවෙන් තමන් සසර සයුරෙන් නගාගත් සේක.), සබ්බ-ධම්මේ ච (සකලධර්ම සමූහයද) උද්දරී (දැන වදාල සේක.), දයායඤ්ඤේ [දයාය+අඤ්ඤේ] ච (කරුණාවෙන් අන්‍ය සත්වයන් ද) උද්දරී (සසර සයුරෙන් ගොඩ නැගූ සේක.)
☞ භාග්‍යවතුන් වහන්සේ සකල සත්වයන් කෙරෙහි පවත්නා මහා කරුණාවෙන් සමතිස් පෙරුම් දහම් සපුරා ප්‍රඥාවෙන් තමන් සසර සයුරෙන් නගාගත් සේක. සකලධර්ම සමූහයද දැන වදාල සේක. කරුණාවෙන් අන්‍ය සත්වයන් ද සසර සයුරෙන් ගොඩ නැගූ සේක.

11. දිස්සමානෝපි තාවස්ස - රූපකායෝ අචින්තියෝ

අසාධාරණඤාණඩ්ඩෙ - ධම්මකායේ කථාව කා

තාවස්ස [තාව+අස්ස] දිස්සමානෝ-පි රූපකායෝ අචින්තියෝ, අසාධාරණඤාණඩ්ඩෙ [අසාධාරණ-ඤාණ+අඩ්ඩෙ] ධම්මකායේ කථාව කා
➔ තාවස්ස [තාව+අස්ස] (උන්වහන්සේගේ/ භගවත් බුදුරජාණන් වහන්සේගේ) දිස්සමානෝ-පි (ඇසට පෙනෙන්නාවූද) රූපකායෝ (රූපකයගැනද) අචින්තියෝ (සිතාගත නොහැක.), අසාධාරණඤාණඩ්ඩෙ [අසාධාරණ-ඤාණ+අඩ්ඩෙ] (අසාධාරණ ඤාණයන්ගෙන් පොහොසත් වූ) ධම්මකායේ (ධර්මකාය ගැන) කථාව කා (කවර කථාද /එය සිතිය නොහැකිමය.)

☞ භගවත් බුදුරජාණන් වහන්සේගේ ඇසට පෙනෙන්නාවූද රූපකයගැනද සිතාගත නොහැක. අසාධාරණ ඤාණයන්ගෙන් පොහොසත් වූ ධර්මකාය ගැන කවර කථාද එය සිතිය නොහැකිමය.

<u>මෛත්‍රී භාවනාව</u>

1. අත්තූපමාය සබ්බේසං - සත්තානං සුඛකාමතං
පස්සිත්වා කමතෝ මෙත්තං - සබ්බසත්තේසු භාවයේ.

[අත්ත+උපමාය] අත්තූපමාය සබ්බේසං සත්තානං සුඛ-කාමතං පස්සිත්වා, මෙත්තං සබ්බ-සත්තේසු කමතෝ භාවයේ
➔ අත්තූපමාය [අත්ත+උපමාය] (තමා නිදසුනෙහි තබා/ තමාව උපමාකර) සබ්බේසං සත්තානං (සියළු සත්වයෝ) සුඛ-කාමතං (සැපයට කැමැති යැයි) පස්සිත්වා (බලා), මෙත්තං (මෛත්‍රිය) සබ්බ-සත්තේසු (සියලු සත්වයන් කෙරෙහි) කමතෝ (පිළිවෙළින්) භාවයේ (වැඩිය යුතුය.)
☞තමා සැපයට කැමැත්තා සේම අන් සියළු සත්වයෝ සැපයට කැමැති යැයි තමා නිදසුනෙහි තබා බලා සියලු සත්වයන් කෙරෙහි පිළිවෙළින් මෛත්‍රිය වැඩිය යුතුය.

2. සුඛී භවෙය්‍යං නිද්දුක්ඛෝ - අහං නිච්චං අහං විය
හිතා ච මේ සුඛී හොන්තු - මජ්ඣත්තා ච වේරිනෝ

අහං නිච්චං සුඛී භවෙය්‍යං නිද්දුක්ඛෝ, අහං විය මේ හිතා ච මජ්ඣත්තා ච වේරිනෝ සුඛී හොන්තු
➔ අහං (මම) නිච්චං (නිරන්තරයෙන්) සුඛී භවෙය්‍යං (සැප ඇත්තෙක් වෙම්වා) නිද්දුක්ඛෝ (දුක් නැත්තෙක් වෙම්වා), අහං විය (මා මෙන්) මේ (මාහට) හිතා ච (හිත සත්වයෝද) මජ්ඣත්තා ච (මධ්‍යස්ථයෝ ද) වේරිනෝ (වෛරීහුද) සුඛී හොන්තු (සුවපත් වෙත්වා !)
☞ මම නිරන්තරයෙන් සැප ඇත්තෙක් වෙම්වා. දුක් නැත්තෙක් වෙම්වා.මා මෙන් මාහට හිත සත්වයෝද මධ්‍යස්ථයෝ ද වෛරීහුද සැම කල්හිම සුවපත් වෙත්වා!

3. ඉමම්හි ගාමක්ඛෙත්තම්හි - සත්තා හොන්තු සුඛී සදා
තතෝ පරඤ්ච රජ්ජේසු - චක්කවාළේසු ජන්තුනෝ.

ඉමම්හි ගාමක්ඛෙත්තම්හි සත්තා සදා සුඛී හොන්තු, තතෝ පරඤ්ච රජ්ජේසු චක්කවාළේසු ජන්තුනෝ [සදා සුඛී හොන්තු]
➔ ඉමම්හි (මේ) ගාමක්ඛෙත්තම්හි (ගම්ප්‍රදේශයෙහි) සත්තා (සත්වයෝ) සදා (සැමදා) සුඛී හොන්තු (සුවපත් වෙත්වා), තතෝ (එයින්) පරඤ්ච (ඔබ්බේ) රජ්ජේසු (රාජ්‍යවල)

චක්කවාළේසු (සක්වළවල) ජන්තුනෝ (සත්වයෝද) [සදා සුඛී හොන්තු (සැම කල්හි සුවපත් වෙත්වා.)]
☞ මේ ගම්ප්‍රදේශයෙහි සකල සත්වයෝ සැමකල්හි සුවපත් වෙත්වා. එයින් ඔබ්බෙ රාජ්‍යවල ද සක්වළවල ද සත්වයෝද සැම කල්හි සුවපත් වෙත්වා.

4. සමන්තා චක්කවාළේසු - සත්තානන්තේසු පාණිනෝ
සුඛිනෝ පුග්ගලා භූතා - අත්තභාවගතා සියුං

සමන්තා [සත්තා+අනන්තේසු] සත්තානන්තේසු චක්කවාළේසු පාණිනෝ පුග්ගලා භූතා අත්තභාවගතා සුඛිනෝ සියුං
➔ සමන්තා (හාත්පස) අනන්තේසු (අනන්ත) චක්කවාළේසු (සක්වලවල්හි) සත්තා (සත්වයෝ) පාණිනෝ (ප්‍රාණීහු) පුග්ගලා (පුද්ගලයෝ) භූතා (භූතයෝ) අත්තභාවගතා (ආත්මභාව ඇත්තෝ) සුඛිනෝ සියුං (සුවපත් වෙත්වා.)
☞ මේ සක්වලට හාත්පස අනන්ත සක්වලවල්හි සියලු සත්වයෝ සකල ප්‍රාණීහු සකල පුද්ගලයෝ සකල භූතයෝ සකල ආත්මභාව ඇත්තෝ සුවපත් වෙත්වා.

5. තථා ඉත්ථී පුමා චේව - අරියා අනරියා පි ච
දේවා නරා අපායට්ඨා - තථා දස දිසාසු ච.

තථා ඉත්ථී පුමා චේව අරියා අනරියා පි ච දේවා නරා අපායට්ඨා [සුඛී හොන්තු] තථා දස දිසාසු ච [සත්තා සුඛී හොන්තු]
➔ තථා (එසේම) ඉත්ථී (ස්ත්‍රීහුද) පුමා (පුරුෂයෝ) චේව (මෙන්ම) අරියා (ආර්යයෝද) අනරියා (අනාර්යයෝ) පි ච (ද) දේවා (දෙවියෝද) නරා (මනුස්සයෝද) අපායට්ඨා (අපායිකයෝද) [සුඛී හොන්තු (සුවපත් වෙත්වා)] තථා (එලෙසම) දස දිසාසු ච (දශ දිසාවෙහි) [සත්තා සුඛී හොන්තු (සත්වයෝ සුවපත් වෙත්වා!)]
☞ එසේම සියළු ස්ත්‍රීහුද, පුරුෂයෝද, ආර්යයෝද, අනාර්යයෝද, දෙවියෝද, මනුස්සයෝද, අපායිකයෝද, සුවපත් වෙත්වා! එලෙසම දශ දිසාවෙහි සකළ සත්වයෝද සුවපත් වෙත්වා!

<u>මෛත්‍රී භාවනාව</u>
අහං අවේරෝ හෝමි. අබ්‍යාපජ්ඣෝ හෝමි. අනීඝා හෝමි, සුඛී අත්තානං පරිහරාමි. අහං විය මය්හං අචරියුපජ්ඣායා මාතා පිතරෝ හිත සත්තා මජ්ඣත්තික සත්තා වේරි සත්තා
අවේරා හොන්තු අබ්‍යාපජ්ඣා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු. දුක්ඛා මුච්චන්තු යථාලද්ධ සම්පත්තිතෝ මා විගච්ඡන්තු කම්මස්සකා.
ඉමස්මිං විහාරේ ඉමස්මිං ගෝචර ගාමේ ඉමස්මිං නගරේ ඉමස්මිං ජනපදේ ඉමස්මිං ලංකාදීපේ ඉමස්මං ජම්බුදීපේ ඉමස්මිං චක්කවාළේ ඉස්සර ජනා සීමට්ඨක දේවතා සබ්බේ සත්තා අවේරා හොන්තු අබ්‍යාපජ්ඣා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු දුක්ඛා මුච්චන්තු යථා ලද්ධ සම්පත්තිතෝ මා විගච්ඡන්තු කම්මස්සකා.
පුරත්ථිමාය දිසාය, දක්ඛිණාය දිසාය, පච්ඡිමාය දිසාය, උත්තරාය දිසාය, පුරත්ථිමාය අනුදිසාය, දක්ඛිණාය අනුදිසාය, පච්ඡිමාය අනුදිසාය, උත්තරාය අනුදිසාය, හෙට්ඨිමාය දිසාය, උපරිමාය දිසාය,
සබ්බේ සත්තා සබ්බේ පාණා සබ්බේ භූතා සබ්බේ පුග්ගලා සබ්බේ අත්තභාව පරියාපන්නා, සබ්බා ඉත්ථියෝ සබ්බේ පුරිසා සබ්බේ අරියා සබ්බේ අනරියා සබ්බේ දේවා සබ්බේ මනුස්සා සබ්බේ විනිපාතිකා අවේරා හොන්තු අබ්‍යාපජ්ඣා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු. දුක්ඛා මුච්චන්තු යථා ලද්ධ සම්පත්තිතෝ මා විගච්ඡන්තු කම්මස්සකා

➔ අහං (මම) අවේරෝ හෝමි (වෛර නොවෙමි). අබ්‍යාපජ්ඣෝ හෝමි (නිරෝගි වෙමි.) අනීඝා හෝමි (නිදුක් වෙමි) සුඛී අත්තානං පරිහරාමි (සුවසේ ආත්මය පරිහරණය කරමි/සුවපත් වෙමි.)
අහං විය (මා මෙන්ම) මය්හං (මාගේ) අචරියුපජ්ඣායා (ආචාර්ය උපාධ්‍යාය) මාතා පිතරෝ (මව්පිය) හිත සත්තා (හිත සත්වයෝද) මජ්ඣත්තිකා සත්තා (මැදහත් සත්වයෝද) වේරි සත්තා (වෛරී සත්වයෝද) අවේරා හොන්තු (වෛර නොවෙත්වා.) අබ්‍යපජ්ඣා හොන්තු (නිරෝගි වෙත්වා) අනීඝා හොන්තු (නිදුක් වෙත්වා) සුඛී අත්තානං පරිහරන්තු. (සුවපත් වෙත්වා) දුක්ඛා මුච්චන්තු (දුකින් මිදෙත්වා) යථාලද්ධ සම්පත්තිතෝ (ලද සැපතින්) මා විගච්ඡන්තු (නොපිරිහෙත්වා) කම්මස්සකා (කර්මය ස්වකීය කොට ඇත්තාහ.)

ඉමස්මිං විහාරේ (මේ විහාරයෙහිද) ඉමස්මිං ගෝචර ගාමෙ (මේ ගොදුරු ගමෙහිද) ඉමස්මිං නගරේ (මේ නුවරෙහිද) ඉමස්මිං ජනපදේ (මේ ජනපදයෙහිද) ඉමස්මිං ලංකාදීපේ (මේ ලක්දිවෙහිද) ඉමස්මං ජම්බුදීපේ (මේ දඹදිවෙහිද) ඉමස්මිං චක්කවාළේ (මේ සක්වලෙහිද) ඉස්සර ජනා (ඉසුරු ජනයෝද) සීමට්ඨක දේවතා (සීමට්ඨක දෙවියෝද) සබ්බේ සත්තා (සියලු සත්වයෝද) අවේරා හොන්තු (වෛර නොවෙත්වා) අබ්‍යාපජ්ඣා හොන්තු (නිරෝග වෙත්වා) අනීඝා හොන්තු (නිදුක් වෙත්වා) සුඛී අත්තානං පරිහරන්තු (සුවපත් වෙත්වා) දුක්ඛා මුච්චන්තු (දුකින් මිදෙත්වා) යථා ලද්ධ සම්පත්තිතෝ (ලද සැපතින්) මා විගච්ඡන්තු (නොපිරිහෙත්වා) කම්මස්සකා (කර්මය ස්වකීය කොට ඇත්තාහ.)

පුරත්ථිමාය දිසාය (නැගෙනහිර දිශාවෙහිද), දක්ඛිණාය දිසාය (දකුණු දිශාවෙහිද), පච්ඡිමාය දිසාය (බටහිර දිශාවෙහිද), උත්තරාය දිසාය (උතුරු දිශාවෙහිද), පුරත්ථිමාය අනුදිසාය (ගිනිකොන දිශාවෙහිද), දක්ඛිණාය අනුදිසාය (නිරිතදිග දිසාවෙහිද), පච්ඡිමාය අනුදිසාය (වයඹ දිසාවෙහිද), උත්තරාය අනුදිසාය (ඊසාන දිශාවෙහිද), හෙට්ඨිමාය දිසාය (යට දිශාවෙහිද), උපරිමාය දිසාය (උඩ දිශාවෙහිද), සබ්බේ සත්තා (සියලු සත්වයෝද) සබ්බේ පාණා (සියලු ප්‍රාණීහුද) සබ්බේ භූතා (සියලු භූතයෝද) සබ්බේ පුග්ගලා (සියලු පුද්ගලයෝද) සබ්බේ අත්තභාව පරියාපන්නා (සියලු ආත්මභාව ඇත්තෝද), සබ්බා ඉත්ථියෝ (සියලු ස්ත්‍රීහුද) සබ්බේ පුරිසා (සියලු පුරුෂයෝද) සබ්බේ අරියා (සියලු ආර්යයෝද) සබ්බේ අනරියා (සියලු අනාර්යයෝද) සබ්බේ දේවා (සියලු දෙවියෝද) සබ්බේ මනුස්සා (සියලු මනුස්සයෝද) සබ්බේ විනිපාතිකා (සියලු අපායික සත්වයෝද) අවේරා හොන්තු (වෛර නොවෙත්වා) අබ්‍යාපජ්ඣා හොන්තු (නීරෝගි වෙත්වා) අනීඝා හොන්තු (නිදුක් වෙත්වා) සුඛී අත්තානං පරිහරන්තු (සුවපත් වෙත්වා) දුක්ඛා මුච්චන්තු (දුකින් මිදෙත්වා) යථා ලද්ධ සම්පත්තිතෝ (ලද සැපතින්) මා විගච්ඡන්තු (නොපිරිහෙත්වා) කම්මස්සකා (කර්මය ස්වකීය කොට ඇතතාහ.)

තේරුම
මම වෛර නොවෙමි. තරහ නොවෙමි. නිදුක් වෙමි. නිරෝගි වෙමි. සුවපත් වෙමි.
මා මෙන්ම මාගේ ආචාර්ය උපාධ්‍යාය මව්පිය හිත සත්වයෝද මැදහත් සත්වයෝද වෛරී සත්වයෝද වෛර නොවෙත්වා. තරහා නොවෙත්වා නිදුක් වෙත්වා නිරෝගි වෙත්වාසුවපත් වෙත්වා දුකින් මිදෙත්වා ලද සැපතින් නොපිරිහෙත්වා කර්මය ස්වකීය කොට ඇත්තාහ.
මේ විහාරයෙහිද, මේ ගොදුරු ගමෙහිද මේ නුවරෙහිද මේ ජනපදයෙහිද මේ ලක්දිවෙහිද මේ දඹදිවෙහිද මේ සක්වලෙහිද ඉසුරු ජනයෝද සීමට්ඨක දෙවියෝද සියළු සත්වයෝද වෛර නොවෙත්වා තරහා නොවෙත්වා නිදුක් වෙත්වා නිරෝග වෙත්වා සුවපත් වෙත්වා දුකින් මිදෙත්වා ලද සැපතින් නොපිරිහෙත්වා කර්මය ස්වකීය කොට ඇත්තාහ.
නැගෙනහිර දිශාවෙහිද, දකුණු දිශාවෙහිද, බටහිර දිශාවෙහිද, උතුරු දිශාවෙහිද, ගිනිකොන දිශාවෙහිද, නිරිතදිග දිසාවෙහිද, වයඹ දිසාවෙහිද, ඊසාන දිශාවෙහිද, යට දිශාවෙහිද, උඩ දිශාවෙහිද, සියලු සත්වයෝද, සියලු ප්‍රාණීහුද, සියලු භූතයෝද, සියලු පුද්ගලයෝද, සියලු

ආත්මභාව ඇත්තෝද, සියලු ස්ත්‍රීහුද, සියලු පුරුෂයෝද, සියලු ආර්යයෝද, සියලු අනාර්යයෝද, සියලු දෙවියෝද, සියලු මනුස්සයෝද, සියලු අපායික සත්වයෝද, වෛර නොවෙත්වා, තරහා නොවෙත්වා, නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, ලද සැපතින් නොපිරිහෙත්වා, කර්මය ස්වකීය කොට ඇතතාහ.

<u>අශුභ භාවනාව</u>

1. අවිඤ්ඤාණාසුභනිභං - සවිඤ්ඤාණාසුභං ඉමං
කායං අසුභතෝ පස්සං - අසුභං භාවයේ සතිං

අවිඤ්ඤාණාසුභනිභං [අවිඤ්ඤාණ+අසුභ+නිභං] සවිඤ්ඤාණාසුභං [සවිඤ්ඤාණ+අසුභං] ඉමං කායං අසුභතෝ පස්සං අසුභං සතිං භාවයේ

➔ අවිඤ්ඤාණාසුභනිභං [අවිඤ්ඤාණ+අසුභ+නිභං] (විඤ්ඤානය පහවූ හෙවත් මළ + සිරුරකට/අසුභයකට+ සමාන ලෙස) සවිඤ්ඤාණාසුභං [සවිඤ්ඤාණ+අසුභං] (සවිඤ්ඤාණක හෙවත් පණඇති + ශරීරය සලකා-සමානකර) ඉමං කායං (මේ කය) අසුභතෝ (පිළිකුල් වශයෙන්) පස්සං (බලමින්) අසුභං සතිං (අසුභා භාවනාව) භාවයේ (වැඩිය යුතුයි.)

☞ විඤ්ඤානය පහවූ හෙවත් මළ සිරුරකට/අසුභයකට සමාන ලෙස සවිඤ්ඤාණක හෙවත් පණඇති මේ ශරීරය සලකා-සමානකර, මේ කය පිළිකුල් වශයෙන් බලමින් අසුභා භාවනාව වැඩිය යුතුයි.

2. වණ්ණ සණ්ඨාන ගන්ධේහි - ආසයෝ කාසතෝ තථා
පටික්කුලානි කායේමේ - කුණපානි ද්විසෝළස

කායේමේ [කායේ+ඉමේ] වණ්ණ සණ්ඨාන ගන්ධේහි ආසයෝ තථා කාසතෝ පටික්කුලානි කුණපානි ද්විසෝළස

➔ කායේමේ [ඉමේ+කායේ] (මේ ශරිරයෙහි) වණ්ණ (පැහැයෙන්ද) සණ්ඨාන (හැඩයෙන්ද) ගන්ධේහි (ගන්ධයෙන්ද) ආසයෝ (ලගින්පිහිටි දේවල් වශයෙන් ද) තථා (එලෙසම) කාසතෝ (පිහිටිතැන වශයෙන්ද) පටික්කුලානි (පිළිකුල්වූ) කුණපානි (කුණුප) ද්විසෝළස (කොටස් දෙතිසකි.)

☞ මේ ශරිරයෙහි පැහැයෙන්ද, හැඩයෙන්ද, ගන්ධයෙන්ද, ලගින්පිහිටි දේවල් වශයෙන් ද පිහිටිතැන වශයෙන්ද පිළිකුල්වූ කුණුප කොටස් දෙතිසකි.

3. පතිතම්හාපි කුණපා - ජෙගුච්ඡං කායනිස්සිතං
ආධාරෝ හි සුචි තස්ස - කායේතු කුණපේ ඨිතං

පතිතම්හා-පි කුණපා කාය-නිස්සිතං ජෙගුච්ඡං, [<u>අපි</u>] තස්ස ආධාරෝ හි සුචි කායේ [කුණපෝ] තු කුණපේ ඨිතං

➔ පතිතම්හා-පි (ශරිරයෙන් වෙන්ව වැටුනාවූ) කුණපා (කුණුපයටද වඩා) කාය-නිස්සිතං (කයෙහි පවත්නා කුණුපය) ජෙගුච්ඡං (පිළිකුල්ය), [<u>අපි</u>](කුමක් හෙයින්ද යත්?) තස්ස (වැටුනා වූ කුණුපයාගේ) ආධාරෝ (ආධාරය/පවත්නා තැන) හි(වනාහි) සුචි (පිරිසිදුය) කායේ (කයෙහි පිහිටි) [කුණපෝ (කුණුපය)] තු(වනාහි) කුණපේ (කුණුපයෙහිම) ඨිතං (පිහිටියේය)

☞ ශරිරයෙන් වෙන්ව වැටුනාවූ කුණුපයටද වඩා කයෙහි පවත්නා කුණුපය පිළිකුල්ය. කුමක් හෙයින්ද යත්? වැටුනා වූ කුණුපයාගේ ආධාරය (පවත්නා තැන) වනාහි පිරිසිදුය. කයෙහි පිහිටි කුණුපය වනාහි කුණුපයෙහිම පිහිටියේය.

4. මීළ්හේ කිමිව කායොයං - අසුචිම්හි සමුට්ඨිතෝ
අන්තෝ අසුචි සම්පුණ්ණෝ - පුණ්ණවච්චකුටී විය.

කායොයං [කායෝ+අයං] මීළ්හේ කිමිව [කිමි+ඉව] අසුචිම්හි සමුට්ඨිතෝ, පුණ්ණ-වච්චකුටී විය අන්තෝ අසුචි සම්පුණ්ණෝ.#

➔ කායොයං [අයං+කායෝ](මේ කය) මීළ්හේ (අසූචියෙහි) කිමිව [කිමි+ඉව] (උපදනා පණුවෙකු මෙන්) අසුචිම්හි (අසූචියෙහිම) සමුට්ඨිතෝ (හටගත්තේය), පුණ්ණ-වච්චකුටී (පිරුණු වැසිකිළියක්) විය (මෙන්) අන්තෝ (ඇතුලත) අසුචි (අසූචියෙන්) සම්පුණ්ණෝ (පිරී ඇත්තේය.)

☞ මේ කය අසූචියෙහි උපදනා පණුවෙකු මෙන් අසූචියෙහිම හටගත්තේය, පිරුණු වැසිකිළියක් මෙන් ඇතුලත අසූචියෙන් පිරී ඇත්තේය.

5. අසුචි සන්දතේ නිච්චං - යථා මේදකථාලිකා
නානා කිමිකුලාවාසෝ - පක්කචන්දනිකා විය.

යථා මේදකථාලිකා [අස්මා කායතෝ] නිච්චං අසුචි සන්දතේ [අයං කායෝ] පක්කචන්දනිකා විය නානා කිමි-කුලා-වාසෝ

➔ යථා මේදකථාලිකා (සිදුරු ඇති මස්තෙල් සැලියකින් මෙන්) [අස්මා කායතෝ (මේ ශරීරයෙන්)] නිච්චං (නිරන්තරයෙන්) අසුචි (මල මූත්‍රාදී අසූචි) සන්දතේ (ගලන්නේය.) [අයං කායෝ (මේ ශරීරය)] පක්ක-චන්දනිකා (වැසිකිළි කානු එකතුවන පල්වූ වළක්) විය (මෙන්) නානා (නොයෙක්) කිමි-කුලා-වාසෝ (පණුකුලයන්ගේ වාසස්ථානයකි.)

☞ සිදුරු ඇති මස්තෙල් සැලියකින් මෙන් මේ ශරීරයෙන් නිරන්තරයෙන් මල මූත්‍රාදී අසූචි ගලන්නේය. මේ ශරීරය වැසිකිළි කානු එකතුවන පල්වූ වළක් මෙන් නොයෙක් පණුකුලයන්ගේ වාසස්ථානයකි.

6. ගණ්ඩභූතෝ රෝගභූතෝ - වණභූතෝ සමුස්සයෝ.
අතේකිච්ඡෝ ජේගුච්ඡෝ - පභින්න කුණපූපමෝ.

[අයං] සමුස්සයෝ ගණ්ඩභූතෝ රෝගභූතෝ වණභූතෝ අතේකිච්ඡෝ [අතේ-කිච්ඡෝ+අති] ජේගුච්ඡෝ පභින්න කුණපූපමෝ

➔[අයං (මේ)] සමුස්සයෝ (ශරීරය) ගණ්ඩභූතෝ (ගෙඩියක් වැනිය) රෝගභූතෝ (රෝගයක් වැනිය) වණභූතෝ (වණයක් වැනිය) අතේකිච්ඡෝ [අතේ-කිච්ඡෝ (පිළියම් කිරීමට දුෂ්කර වූවකි)+අති (අතිශයින්)] ජේගුච්ඡෝ (පිළිකුල්දෙයකි) පභින්න (තැනින් තැන බිඳුණු) කුණපූපමෝ (කුණපයක් වැනිය)

☞ මේ ශරීරය ගෙඩියක් වැනිය, රෝගයක් වැනිය, වණයක් වැනිය, පිළියම් කිරීමට දුෂ්කර වූවකි, අතිශයින් පිළිකුල්දෙයකි, තැනින් තැන බිඳුණු කුණපයක් වැනිය.

1. අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
ඒකද්වාරේන පවිසිත්වා - නවද්වාරේහි සන්දති.

අන්නං පානං ඛාදනීයං මහාරහං භෝජනඤ්ච ඒක-ද්වාරේන පවිසිත්වා නව-ද්වාරේහි සන්දති

➔ අන්නං (බත්ද) පානං (පානයන්ද) ඛාදනීයං (කැවිලිද) මහාරහං (වටිනා) භෝජනඤ්ච (බොජුන් ද) ඒක-ද්වාරේන (එක් දොරකින්) පවිසිත්වා (ඇතුළුව) නව-ද්වාරේහි (නව දොරකින්) සන්දති (වැගිරෙන්නේය.)

☞ බත්ද පානයන්ද කැවිලිද වටිනා බොජුන් ද යන මේවා එක් දොරකින් ශරීරයට ඇතුළුව නව දොරකින් වැගිරෙන්නේය.

2. අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
භුඤ්ජති සපරිවාරෝ - නික්ඛාමෙන්තෝ නිලීයති.

අන්නං පානං ඛාදනීයං මහාරහං භෝජනඤ්ච සපරිවාරෝ භුඤ්ජති නික්ඛාමෙන්තෝ නිලීයති
➔ අන්නං (බත්ද) පානං (පානයන්ද) ඛාදනීයං (කැවිලිද) මහාරහං (වටිනා) භෝජනඤ්ච (බොජුන් ද) සපරිවාරෝ (පිරිවර සහිතව) භුඤ්ජති (අනුභව කරයි) නික්ඛාමෙන්තෝ (පිටකරන්නා/ පිට කරණ කල්හි) නිලීයති (සැඟවෙයි.)
☞ බත්ද පානයන්ද කැවිලිද වටිනා බොජුන් ද පිරිවර සහිතව හිඳ අනුභව කරන්නේය, පිට කරණ කල්හි සැඟවෙන්නේය.

3. අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
භුඤ්ජති අභිනන්දන්තෝ - නික්ඛාමෙන්තෝ ජිගුච්ඡති.

අන්නං පානං ඛාදනීයං මහාරහං භෝජනඤ්ච අභිනන්දන්තෝ භුඤ්ජති නික්ඛාමෙන්තෝ ජිගුච්ඡති
➔ අන්නං (බත්ද) පානං (පානයන්ද) ඛාදනීයං (කැවිලිද) මහාරහං (වටිනා) භෝජනඤ්ච (බොජුන් ද) අභිනන්දන්තෝ (ප්‍රීතියෙන්) භුඤ්ජති (අනුභව කරයි) නික්ඛාමෙන්තෝ (පිටකරන්නා/ කයින් බැහැර කරණ කල්හි) ජිගුච්ඡති (පිළිකුල් කරයි.)
☞ බත්ද පානයන්ද කැවිලිද වටිනා බොජුන් ද ප්‍රීතියෙන් අනුභව කරන්නේය. කයින් බැහැර කරණ කල්හි පිළිකුල් කරන්නේය.

4. අන්නං පානං ඛාදනීයං - භෝජනඤ්ච මහාරහං
ඒකරත්තිපරිවාසා - සබ්බං භවති පූතිකං

අන්නං පානං ඛාදනීයං මහාරහං භෝජනඤ්ච [අස්මිං කායේ] ඒක-රත්ති-පරිවාසා සබ්බං පූතිකං භවති
➔ අන්නං (බත්ද) පානං (පානයන්ද) ඛාදනීයං (කැවිලිද) මහාරහං (වටිනා) භෝජනඤ්ච (බොජුන් ද) [අස්මිං කායේ (මේ කයතුල)] ඒක-රත්ති-පරිවාසා (එක් රාත්‍රියක් ගතවීමෙන්) සබ්බං පූතිකං භවති (සියල්ල කුණුවන්නේය.)
☞ බත්ද පානයන්ද කැවිලිද වටිනා බොජුන් ද මේ කයතුල එක් රාත්‍රියක් ගතවීමෙන් සියල්ල කුණුවන්නේය.

<u>මරණානුස්සති භාවනාව</u>

1. පවාතදීප තුල්‍යාය - සායුසන්තියාක්ඛයං
පරූපමාය සම්පස්සං - භාවයේ මරණස්සතිං

පවාත-දීප තුල්‍යාය සායුසන්තියාක්ඛයං [ස-ආයුසන්ති-යා-ක්ඛයං] පරූපමාය [පර+උපමාය] සම්පස්සං මරණස්සතිං භාවයේ
➔ පවාත-දීප තුල්‍යාය (මහතත් වූ සුළඟට හසු වූ පහන නිවියන්නා සේ) සායුසන්තියාක්ඛයං [ස-ආයු-සන්ති-යා-ක්ඛයං] (ආයුෂ පරම්පරාව ගෙවීයන්නේය) [මරණයට පත්] පරූපමාය [පර+උපමාය] (අන්‍යයන් උපමා කොට) සම්පස්සං (බලමින්) මරණස්සතිං භාවයේ (මරණානුස්සති භාවනාව වැඩිය යුතුය.)

☞ මහතත් වූ සුළඟට හසු වූ පහන නිවියන්නා සේ ආයුෂ පරම්පරාව ගෙවීයන්නේය, (මරණයට පත්) අන්‍යයන් උපමා කොට බලමින් මරණානුස්සති භාවනාව වැඩිය යුතුය.

2. මහා සම්පත්ති සම්පත්තා - යථා සත්තා මතා ඉධ
තථා අහං මරිස්සාමි - මරණං මම හෙස්සති.

ඉධ මහා සම්පත්ති සම්පත්තා සත්තා යථා මතා තථා අහං මරිස්සාමි මරණං මම හෙස්සති
➔ ඉධ (මෙලොව) මහා සම්පත්ති (මහා සම්පත්තියට) සම්පත්තා (පැමිණියා වූ) සත්තා (සත්වයෝ) යථා (යම්සේ) මතා (මලාහුද) තථා (එපරිද්දෙන්) අහං (මමද) මරිස්සාමි (මැරෙන්නෙමි.) මරණං මම හෙස්සති (මම මරණයට පත්වන්නේය.)
☞ මෙලොව මහා සම්පත්තියට පැමිණියා වූසත්වයෝ යම්සේ මලාහුද එපරිද්දෙන් මමද මැරෙන්නෙමි. මම මරණයට පත්වන්නේය.

3. උප්පතතියා සහේවේදං - මරණං ආගතං සදා
මරණත්ථාය ඕකාසං - වධකෝ විය ඒසති.

උප්පතතියා සහේවේදං [සහ+ඒව+ඉදං] මරණං ආගතං සදා මරණත්ථාය ඕකාසං වධකෝ විය ඒසති
➔ ඉදං මරණං (මේ මරණය) උප්පතතියා සහ ඒව (උප්පත්තිය සමගම) ආගතං (ආ එකෙක) සදා (සැම කල්හිම) මරණත්ථාය (මැරීම පිණිස) ඕකාසං (අවස්තාවක්) වධකෝ (වධකයෙකු) විය (මෙන්) ඒසති (සොයයි.)
☞ මේ මරණය උප්පත්තිය සමගම ආ එකෙක. මාරයා සැම කල්හිම මැරීම පිණිස අවස්තාවක් වධකයෙකු මෙන් සොයන්නේය.

4. ඊසකං අනිවත්තනං - සතතං ගමනුස්සුකං
ජීවිතං උදයා අත්ථං - සූරියෝ විය ධාවති.

සතතං ගමනුස්සුකං [ගමනං+උස්සුකං] ඊසකං අනිවත්තනං සූරියෝ උදයා අත්ථං විය ජීවිතං ධාවති
➔ සතතං (නිරන්තරයෙන්) ගමනුස්සුකං [ගමනං+උස්සුකං] (ගමනට උත්සහා කරන) ඊසකං (මොහොතක්වත්) අනිවත්තනං (නොනවතින) සූරියෝ (හිරු) උදයා (උදාවීමෙහි සිට) අත්ථං (අස්තානයට යන්නාක්) විය (මෙන්) ජීවිතං (ජීවිතය) ධාවති (දුවයි/ඉපදීමේ පටන් මරණය කරා දුවයි)
☞ නිරන්තරයෙන් ගමනට උත්සහා කරන මොහොතක්වත් නොනවතින හිරු උදාවීමෙහි සිට අස්තානයට යන්නාක් මෙන් ජීවිතය ඉපදීමේ පටන් මරණය කරා දුවන්නේය.

5. විජ්ජු බුබ්බුල උස්සාව - ජලරාජී පරික්ඛයං
ඝාතකෝව රිපු තස්ස - සබ්බත්ථාපි අවාරියෝ

විජ්ජු බුබ්බුල උස්සාව ජලරාජී [ඉව ඉමං ජීවිතං] පරික්ඛයං [ඉදං මරණං] සබ්බත්ථාපි අවාරියෝ ඝාතකෝව රිපු තස්ස
➔ විජ්ජු (විදුලියක් මෙන්) බුබ්බුල (දිය බුබුලක් මෙන්) උස්සාව (පිණි බිඳක් මෙන්) ජලරාජී (දියෙහි ඇඳි ඉරක්) [ඉව ඉමං ජීවිතං (මෙන් මේ ජීවිතය)] පරික්ඛයං (ක්ෂය වන්නේය.) [ඉදං මරණං (මේ මරණය)] සබ්බත්ථාපි (කවර ආකාරයකින් වත්) අවාරියෝ (වැලැක්විය නොහැකි) ඝාතකෝ-ව (මරන්නට එන ඝාතකයෙක් වැනිය) රිපු තස්ස (ඔහුගේ සතුරු)

☞ විදුලියක් මෙන් දිය බුබුලක් මෙන් පිණි බිඳක් මෙන් දියෙහි ඇඳි ඉරක් මෙන් මේ ජීවිතය වහා ක්ෂය වන්නේය. මේ මරණය කවර ආකාරයකින් වත් වැලැක්විය නොහැකිය. මරන්නට එන සතුරු ඝාතකයෙක් වැනිය

6. සුයසත්ථාම පුඤ්ඤිද්ධි - බුද්ධි වුද්ධි ජිනං ද්වයං
සතෙසි මරණං ඛිප්පං - කා තු මාදිසකේ කථා.

සුයසත්ථාම [සු-යස+ථාම] පුඤ්ඤිද්ධි බුද්ධි වුද්ධි ජිනං ද්වයං ඛිප්පං සතෙසි, මරණං කා තු මාදිසකේ කථා
➔ සුයසත්ථාම [සු-යස+ථාම] (මහත් වූ යසසින්ද, බලයෙන්ද) පුඤ්ඤිද්ධි (පිනෙන්ද) බුද්ධි (නුවනින්ද) වුද්ධි (වැඩුනා වූ) ජිනං ද්වයං (බුදු පසේබුදු වහන්සේලා ද) ඛිප්පං සතෙසි (වහා නැසුවේය.), මරණං කා තු මාදිසකේ කථා (මා වැනියන් මැරීම ගැන කවර කථාද.)
☞ මහත් වූ යසසින්ද, බලයෙන්ද, පිනෙන්ද, නුවනින්ද, වැඩුනා වූ බුදු පසේබුදුන් වහන්සේලා ද මාරයා වහා නැසුවේය. මා වැනියන් මැරීම ගැන කවර කථාද

7. පච්චයානඤ්ච වේකල්‍යා - බාහිරජ්ඣත්තුපද්දවා
මරාමහං නිමේසාපි - මරමානෝ අනුක්ඛණං.

අනුක්ඛණං මරමානෝ පච්චයානඤ්ච වේකල්‍යා බාහිරජ්ඣත්තුපද්දවා [බාහිර+අජ්ඣත්ත+උපද්දවා] නිමේසා-පි මරාමහං [මරාමි+<u>අහං</u>]
➔ අනුක්ඛණං (මෝහොතක්පාසා) මරමානෝ (මැරෙන්නා වූ) <u>අහං**(මම)**</u> පච්චයානඤ්ච වේකල්‍යා (ප්‍රත්‍යයන් නොලැබී යාමෙන් ද) බාහිරජ්ඣත්තුපද්දවා [බාහිර+අජ්ඣත්ත+උපද්දවා] (බාහිර අභ්‍යන්තර උපද්‍රවයකින් ද) නිමේසා-පි (මොහොතකින්) මරාමහං [මරාමි +-] (මැරෙමි.)
☞ ක්ෂණකයක් පාසා සිදුවන නාම රූප බිඳීම නිසා මෝහොතක් මෝහොතක් පාසා මැරෙන්නා වූ මම ජීවත්වීමට උවමනා ප්‍රත්‍යයන් නොලැබී යාමෙන් ද බාහිර අභ්‍යන්තර උපද්‍රවයකින් ද ඇසිපිය හෙළීමට ද කෙටි කළකදී/ මොහොතකින් මැරෙමි.

<u>නිතර සිහිකිරීමට</u>

ජාති ජරා ව්‍යාධි චුති අපායා - අතීත අප්පත්තක වට්ටදුක්ඛං
ඉදානි ආහාර ගවෙට්ඨි දුක්ඛං - සංවේග වත්ථුනි ඉමානි අට්ඨ.

➔ ජාති (ඉපදීම) ජරා (දිරීම) ව්‍යාධි (ව්‍යාධි/ රෝග/ ලෙඩ) චුති (මරණය) අපායා (අපාය දුක්ඛයද) අතීත අප්පත්තක (අතීත හා අනාගත) වට්ටදුක්ඛං (සංසාර දුකද) ඉදානි (දැන්) ආහාර (ආහාර) ගවෙට්ඨි (සෙවීමේ) දුක්ඛං (දුකද) [යන] ඉමානි අට්ඨ (මේවා අට) සංවේග වත්ථුනි (සංවේග වස්තු නම් වේ.)
☞ ඉපදීම දිරීම ලෙඩවීම මරණය හා අපාය දුක්ඛයද අතීත සංසාර දුකද අනාගත සංසාර දුකද දැන් ආහාර සෙවීමේ දුකද යන මේවා සංවේග වස්තු නම් වේ.

★ **සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා**
සචිත්තපරියෝදපනං - ඒතං බුද්ධානසාසනං

සබ්බ පාපස්ස අකරණං, [සබ්බ] කුසලස්ස උපසම්පදා, සචිත්තපරියෝදපනං [සක+චිත්ත+පරියෝදපනං] ඒතං බුද්ධානසාසනං [බුද්ධානං+සාසනං]

➔ සබ්බ පාපස්ස (සියලු පාපයන්ගේ) අකරණං (නොකිරීම), සබ්බ කුසලස්ස (සියලු කුසලයන්ගේ) උපසම්පදා (නිරතවීම), සචිත්තපරියෝදපනං [සක+චිත්ත+පරියෝදපනං] (තම සිත නීවරණ ධර්මයන්ගෙන් පිරිසිදු කිරීම) ඒතං (යන මෙය) බුද්ධානසාසනං [බුද්ධානං+සාසනං] (බුදුවරුන්ගේ අනුශාසනයයි)
☞ සියලු පාපයන්ගේ නොකිරීම, සියලු කුසලයන්ගේ නිරතවීම, තම සිත නීවරණ ධර්මයන්ගෙන් පිරිසිදු කිරීම, යන මෙය බුදුවරුන්ගේ අනුශාසනයයි.

★ **ඛන්තී පරමං තපෝ තිතික්ඛා - නිබ්බානං පරමං වදන්ති බුද්ධා**
නහි පබ්බජිතෝ පරූපඝාතී - සමණෝ හොති පරං විහේඨයන්තෝ

තිතික්ඛා ඛන්තී පරමං තපෝ, නිබ්බානං පරමං බුද්ධා වදන්ති, පරූපඝාතී නහි පබ්බජිතෝ පරං විහේඨයන්තෝ සමණෝ [න] හොති
➔ තිතික්ඛා ඛන්තී (ඉවසීම නම් ක්ෂාන්තිය) පරමං තපෝ (උතුම්ම තපසයි), නිබ්බානං පරමං (නිවන උතුම්ම යැයි) බුද්ධා වදන්ති (බුදුවරු කියති), පරූපඝාතී (අනුන් නසන්නා) නහි පබ්බජිතෝ (පැවිද්දෙක් නොවේ) පරං විහේඨයන්තෝ (අනුන්ට හිංසාකරන්නා) සමණෝ න හොති (ශ්‍රමණයෙක් නොවේ)
☞ ඉවසීම නම් ක්ෂාන්තිය උතුම්ම තපසයි, නිවන උතුම්ම යැයි බුදුවරු කියති, අනුන් නසන්නා පැවිද්දෙක් නොවේ, අනුන්ට හිංසාකරන්නා ශ්‍රමණයෙක් නොවේ.

★ **අනූපවාදෝ අනූපඝාතෝ - පාතිමොක්ඛේ ච සංවරෝ,**
මත්තඤ්ඤුතා ච භත්තස්මිං - පන්තං ච සයනාසනං
අධිචිත්තේ ච ආයෝගෝ - ඒතං බුද්ධානසාසනං

➔ අනූපවාදෝ (දොස් නොකීම ද) අනූපඝාතෝ (අනුන්ට හිංසානොකිරීම ද) පාතිමොක්ඛේ ච සංවරෝ (උපසම්පදා සීලයෙහි සංවරවීම ද), මත්තඤ්ඤුතා ච භත්තස්මිං (ආහාරයේ පමණ දැන වැළදීම ද) පන්තං (විවේක) ච සයනාසනං (සෙනසුන් ඇසුරුකිරරීම ද), අධිචිත්තේ ච ආයෝගෝ (ධ්‍යාන- අභිඤ්ඤා- මාර්ග- ඵල- ලබාගැනීමෙහි උත්සහවත්වීම ද) ඒතං බුද්ධානසාසනං (යනමෙය බුදුවරුන්ගේ අනුශාසනයයි.)
☞ දොස් නොකීම ද, අනුන්ට හිංසානොකිරීම ද, උපසම්පදා සීලයෙහි සංවරවීම ද, ආහාරයේ පමණ දැන වැළදීම ද, විවේක සෙනසුන් ඇසුරුකිරරීම ද, ධ්‍යාන- අභිඤ්ඤා- මාර්ග- ඵල- ලබාගැනීමෙහි උත්සහවත්වීම ද, යනමෙය බුදුවරුන්ගේ අනුශාසනයයි.

★ **සබ්බේ සංඛාරා අනිච්චාති - යදා පඤ්ඤාය පස්සති**
අථ නිබ්බින්දති දුක්ඛේ - ඒස මග්ගො විසුද්ධියා

සබ්බේ සංඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති, අථ දුක්ඛේ නිබ්බින්දති, ඒස විසුද්ධියා මග්ගො
➔ සබ්බේ සංඛාරා (සියලු සංස්කාර ධර්මයෝ/ හේතුවලින් හටගත් ධර්මයෝ) අනිච්චාති (අනිත්‍ය යැයි) යදා (යම්දවසක) පඤ්ඤාය පස්සති (නුවණින් දකීද), අථ (එවිට) දුක්ඛේ නිබ්බින්දති (දුකින් නිදහස්වෙයි), ඒස විසුද්ධියා (එය විසුද්ධියේ/ නිවන් දැකීමේ) මග්ගො (මාර්ගයයි)
☞ සියලු සංස්කාර ධර්මයෝ/ හේතුවලින් හටගත් ධර්මයෝ අනිත්‍ය යැයි යම්දවසක නුවණින් දකීද, එවිට දුකින් නිදහස්වෙයි, එය විසුද්ධියේ/ නිවන් දැකීමේ මාර්ගයයි.

★ **සබ්බේ සංඛාරා දුක්ඛාති - යදා පඤ්ඤාය පස්සති**

අථ නිබ්බින්දති දුක්ඛේ - ඒස මග්ගෝ විසුද්ධියා

➔ සබ්බේ සංඛාරා (සියලු සංස්කාර ධර්මයෝ/ හේතුවලින් හටගත් ධර්මයෝ) දුක්ඛාති (දුක් යැයි) -පෙ-

★ **සබ්බේ ධම්මා අනත්තානි - යදා පඤ්ඤාය පස්සති**
අථ නිබ්බින්දති දුක්ඛේ - ඒස මග්ගෝ විසුද්ධියා.

➔ සබ්බේ ධම්මා (සියලු ධර්මයෝ) අනත්තානි (අනාත්ම යැයි) -පෙ-

<u>ධාතු හා චෛත්‍ය වන්දනා</u>.

වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං
සාරීරිකධාතු මහා බොධිං - බුද්ධරූපං සකලං සදා

සබ්බඨානේසු පතිට්ඨිතං සබ්බං චේතියං සාරීරිකධාතු මහා බොධිං සකලං බුද්ධරූපං සදා වන්දාමි
➔ සබ්බඨානේසු (සියලු තැන්හි) පතිට්ඨිතං (පිහිටියාවූ) සබ්බං චේතියං (සියලු චෛත්‍යයන් ද) සාරීරිකධාතු (ශාරීරික ධාතූන් වහන්සේලාද) මහා බොධිං (මහා බෝධීන්ද) සකලං බුද්ධරූපං (සියලු බුද්ධරූපයන්ද) සදා වන්දාමි (සැමදා වන්දනාකරමි)
☞ සියලු තැන්හි පිහිටියාවූ සියලු චෛත්‍යයන් ද ශාරීරික ධාතූන් වහන්සේලාද මහා බෝධීන්ද සියලු බුද්ධරූපයන්ද සැමදා වන්දනාකරමි.

උණ්හීසං චතස්සෝ දාඨා - අක්ඛා ද්වේ ච ධාතුයෝ
අසම්භින්නා ඉමා සත්ත - සේසා භින්නා ච ධාතුයෝ

උණ්හීසං චතස්සෝ දාඨා අක්ඛා ද්වේ ච ඉමා ධාතුයෝ සත්ත අසම්භින්නා සේසා ධාතුයෝ භින්නා
➔ උණ්හීසං (ලලාට ධාතූන්වහන්සේද) චතස්සෝ දාඨා (සතර දළදා වහන්සේලාද) අක්ඛා ද්වේ ච (අකු ධාතූන්වහන්සේලා දෙනම ද) ඉමා ධාතුයෝ සත්ත (මේ ධාතූන් සත්නම) අසම්භින්නා (නොබිඳුනාහ) සේසා ධාතුයෝ (සෙසු ධාතූන්වහන්සේලා) භින්නා (බිඳීගියාහ)
☞ ලලාට ධාතූන්වහන්සේද සතර දළදා වහන්සේලාද අකු ධාතූන්වහන්සේලා දෙනම ද යන මේ ධාතූන් සත්නම නොබිඳුනාහ, සෙසු ධාතූන්වහන්සේලා බිඳීගියාහ.

මහන්තා මුග්ග මත්තා ච - මජ්ඣිමා භින්න තණ්ඩුලා
ඛුද්දකා සාසප මත්තා ච - නානා වණ්ණා ච ධාතුයෝ

මහන්තා මුග්ග මත්තා ච මජ්ඣිමා භින්න තණ්ඩුලා ඛුද්දකා සාසප මත්තා ච ධාතුයෝ ච නානා වණ්ණා
➔ මහන්තා (මහත් වූ ධාතුහු) මුග්ග මත්තා ච (මුං පියලි පමණද) මජ්ඣිමා (මධ්‍යම ධාතුහු) භින්න තණ්ඩුලා (කඩ සහල්/හුනු සහල් පමණද) ඛුද්දකා (කුඩා ධාතුහු) සාසප මත්තා ච (අබ ඇට පමණද) ධාතුයෝ නානා වණ්ණා ච (ධාතූන් නොයෙක් වර්ණ ඇත්තේ ද වන්නාහ.)
☞ මහත් වූ ධාතුහු මුං පියලි පමණද මධ්‍යම ධාතුහු කඩ සහල්/හුනු සහල් පමණද කුඩා ධාතුහු අබ ඇට පමණද වූහ. ඒ ධාතූන් නොයෙක් වර්ණ ඇතියෝ ද වන්නාහ.

මහන්තා සොණ්ණ වණ්ණා ච - මුත්ත වණ්ණා ච මජ්ඣිමා
ඛුද්දකා මකුල වණ්ණා ච - සෝළස දෝණ මත්තිකා

මහන්තා සොණ්ණ වණ්ණා ච මජ්ඣිමා මුත්ත වණ්ණා ච ඛුද්දකා මකුල වණ්ණා ච සෝළස දෝණ මත්තිකා
➔ මහන්තා (මහත් ධාතූහු) සොණ්ණ වණ්ණා ච (රන් පැහැ ඇත්තේද) මජ්ඣිමා (මධ්‍යම ධාතූහු) මුත්ත වණ්ණා ච (මුතු පැහැ ඇත්තේද) ඛුද්දකා (කුඩා ධාතූහු) මකුල වණ්ණා ච (සමන් කැකුළු පැහැ ඇත්තේද)[වේ. සියල්ල] සෝළස දෝණ මත්තිකා (ද්‍රෝණ දහසයක් පමණ වන්නාහ.)
☞ මහත් ධාතූහු රන් පැහැ ඇත්තේද, මධ්‍යම ධාතූහු මුතු පැහැ ඇත්තේද, කුඩා ධාතූහු සමන් කැකුළු පැහැ ඇත්තේද වේ, සියල්ල ද්‍රෝණ දහසයක් පමණ වන්නාහ.

මහන්තා පඤ්ච නාලියෝ නාලියෝ පඤ්ඤ මජ්ඣිමා
ඛුද්දකා ඡනාලි චේව ඒතා සබ්බාපි ධාතුයෝ.

ඒතා සබ්බාපි ධාතුයෝ මහන්තා පඤ්ච නාලියෝ මජ්ඣිමා පඤ්ඤ නාලියෝ චේව ඛුද්දකා ඡනාලි
➔ ඒතා සබ්බාපි ධාතුයෝ (ඒ සියලු ධාතූන්)[අතුරෙන්] මහන්තා (මහත් ධාතූහු) පඤ්ච නාලියෝ (නැලි පසක් ද) මජ්ඣිමා (මධ්‍යම ධාතූහු) පඤ්ඤ නාලියෝ (පස් නැළියක්ද) චේව (එමෙන්ම) ඛුද්දකා (කුඩා ධාතූහු) ඡනාලි (නැළි සයක් ද වන්නාහ.)
☞ ඒ සියලු ධාතූන් අතුරෙන් මහත් ධාතූහු නැලි පසක් ද මධ්‍යම ධාතූහු පස් නැළියක්ද කුඩා ධාතූහු නැළි සයක් ද වන්නාහ.

උණ්හීසං සීහලේ දීපේ - බ්‍රහ්මලෝකේ ච වාමකං
සීහලේ දක්ඛිණක්ඛං ච - සබ්බපේතා පතිට්ඨිතා

උණ්හීසං සීහලේ දීපේ වාමකං ච බ්‍රහ්මලෝකේ දක්ඛිණක්ඛං [දක්ඛිණ+අක්ඛං] සීහලේ ච සබ්බපේතා [සබ්බපි+ඒතා] පතිට්ඨිතා
➔ උණ්හීසං (ලලාට ධාතුව) සීහලේ දීපේ (සිංහල ද්වීපයෙහි ද) වාමකං (වම් අකු ධාතුව) බ්‍රහ්මලෝකේ ච (බ්‍රහ්ම ලෝකයෙහි ද) දක්ඛිණක්ඛං [දක්ඛිණ+අක්ඛං] (දකුණු අකු ධාතුව) සීහලේ ච (සිංහල ද්වීපයෙහි ද)[වශයෙන්] සබ්බපේතා [සබ්බපි+ඒතා] (ඒ සියලු ධාතූන් වහන්සේලා) පතිට්ඨිතා (පිහිටා ඇත්තේය.)
☞ ලලාට ධාතුව සිංහල ද්වීපයෙහි ද,වම් අකු ධාතුව බ්‍රහ්ම ලෝකයෙහි ද දකුණු අකු ධාතුව සිංහල ද්වීපයෙහි ද වශයෙන් ඒ සියලු ධාතූන් වහන්සේලා පිහිටා ඇත්තේය.

චත්තාලීසා සමා දන්තා - කේසා ලෝමා ච සබ්බසෝ
දේවා හරිංසු ඒකේකං - චක්කවාළ පරම්පරා.

සබ්බසෝ සමා දන්තා චත්තාලීසා, දේවා කේසා ලෝමා ච ඒකේකං [ඒකං+ඒකං] චක්කවාළ පරම්පරා හරිංසු
➔ සබ්බසෝ (සියල්ල වශයනේ) සමා දන්තා (සම වූ දන්ත ධාතූන්)චත්තාලීසා (සතලිස් නමකි), දේවා (දෙවියෝ) කේසා ලෝමා ච (කේස ලෝම ධාතූන් වහන්සේලා) ඒකේකං [ඒකං+ඒකං] (එක එකබැගින්) චක්කවාළ (සක්වල) පරම්පරා හරිංසු (පරම්පරාව අතරේ ගෙන ගිය.)

☞ සියල්ල වශයනේ සම වූ දන්ත ධාතූන් සතලිස් නමකි, දෙවියෝ කේස ලෝම ධාතූන් වහන්සේලා එක එකබැගින් සක්වල පරම්පරාව අතරේ ගෙන ගිය.

<u>සොළොස්මස්ථානය වැදීම.</u>

මහියංගණං නාගදීපං කළ්‍යාණං පදලාංඡනං - දිවාගුහං දීඝවාපී චේතියඤ්ච මුතිංගණං
තිස්සමහා විහාරඤ්ච බෝධිං මරිචවට්ටියං - සොණ්ණමාලී මහා චේතිං ථූපාරාම භයාගිරිං
ජේතවනං සේලචේතියං තථා කාචරගාමකං - ඒතේ සොළස ඨානානි අහං වන්දාමි සබ්බදා.

➔ මහියංගණං (මයියංගන දාගැබ) නාගදීපං (නාගදීප දාගැබ) කළ්‍යාණං (කැළණි දාගැබ) පදලාංඡනං (ශ්‍රී පාදස්තානය) දිවාගුහං (දිවාගුහාව) දීඝවාපී (දීඝවාපි දාගැබ) මුතිංගණං චේතියං (මුතියංගණ දාගැබ) තිස්සමහා විහාරඤ්ච (තිස්සමහා විහාර දාගැබ) බෝධිං (ශ්‍රී මහ බෝධිය) මරිචවට්ටියං (මිරිසවැටි දාගැබ) සොණ්ණමාලී මහා චේතිං (රුවන්වැලි මහා දාගැබ) ථූපාරාම (ථූපාරාම දාගැබ) භයාගිරිං (අභයගිරි දාගැබ) ජේතවනං (ජේතවන දාගැබ) සේලචේතියං (මිහින්තලේ සේල චෛත්‍යය) තථා (එලෙසම) කාචරගාමකං (කතරගම කිරිවෙහෙර) ඒතේ සොළස ඨානානි (මේ සොළොස් ස්ථාන) අහං වන්දාමි සබ්බදා (මම සැමදා වදිමි.)

<u>බෝධි වන්දනා</u>

යස්ස මූලෙ නිසින්නෝව - සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා - වන්දේ තං බෝධි පාදපං.

#සත්ථා යස්ස [බෝධි]මූලෙ නිසින්නෝව සබ්බඤ්ඤුතං පත්තෝ සබ්බාරි [සබ්බ+අරි] විජයං අකා තං බෝධි පාදපං වන්දේ #
➔ සත්ථා (ශාස්තෲන් වහන්සේ) යස්ස [බෝධි] මූලෙ (යම් බෝධි මූලයක) නිසින්නෝව (හිඳිමින්) සබ්බඤ්ඤුතං පත්තෝ (සර්වඥ්ඥ භාවයට පත්වූසේක්ද) සබ්බාරි [සබ්බ+අරි] (සියලු සතුරන්) විජයං අකා (දිනූසේක්ද) තං බෝධි පාදපං (ඒ බෝධි පාදය) වන්දේ (වන්දනාකරමි.)
☞ ශාස්තෲන් වහන්සේ යම් බෝධි මූලයක හිඳිමින් සර්වඥ්ඥ භාවයට පත්වූසේක්ද, සියලු සතුරන් දිනූසේක්ද, ඒ බෝධි පාදය වන්දනාකරමි.
ඉමේ ඒතේ මහා බෝධි - ලෝක නථේන පූජිතා
අහම්පි තේ නමස්සාමි - බෝධි රාජා නමත්ථු තේ.

ඉමේ ඒතේ ලෝක නථේන පූජිතා මහා බෝධි, අහම්පි [අහං+අපි] තේ නමස්සාමි, බෝධි රාජා තේ නමත්ථු
➔ ඉමේ ඒතේ (මේ ඒ) ලෝක නථේන (ලෝකනාථයානන් වහන්සේ විසින්) පූජිතා (පුදනලද) මහා බෝධි (මහා බෝධීන් වහන්සේය), අහම්පි [අහං+අපි] (මමද) තේ (ඔබට) නමස්සාමි (නමස්කාර කරමි), බෝධි රාජා (බෝධිරාජයානන් වහන්ස) තේ නමත්ථු (ඔබට නමස්කාර වේවා!)
☞ මේ ඒ ලෝකනාථයානන් වහන්සේ විසින් පුදනලද ශ්‍රී මහා බෝධීන් වහන්සේය, මමද ඔබට නමස්කාර කරමි, බෝධිරාජයානන් වහන්ස ඔබට නමස්කාර වේවා!

පඨමං බෝධි පල්ලඞ්කං - දුතියඤ්ච අනිම්මිසං
තතියං චංකමනං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං.
පඤ්චමං අජපාලඤ්ච - මුචලින්දේන ඡට්ඨමං
සත්තමං රජායතනං - වන්දේ තං මුනි සේවිතං.

➔ [භගවා (භාග්‍යවතුන් වහන්සේ)] පඨමං බෝධි පල්ලඞ්කං (පළමුව බෝමුල වජිරාසනයෙහිද) දුතියඤ්ච අනිමිසං (දෙවනුව අනිමිස ලෝචනයෙහිද) තතියං සෙට්ඨං චංකමනං (තෙවනුව උතුම් සක්මනෙහිද) චතුත්ථං රතනාඝරං (සතරවනුව රතනාගරයෙහිද) පඤ්ඤමං අජපාලඤ්ච (පස්වනුව අජපල් නුගරුක මුලද) මුචලින්දේන ඡට්ඨමං (සත්වනුව මුචලින්ද විල අසලද) සත්තමං රජායතනං (සත්වනුව රාජායතන කිරිපලු නුගරුක මුලද) [විහාසි (වැඩහුන්සේක)] තං මුනි සේවිතං වන්දේ (ඒ මුනින්ද්‍රයන් වහන්සේ විසින් සේවනය කරනලද ස්ථානයනට වන්දනාකරමි.)

මහා කරුණාරස පතිමණ්ඩිතස්ස අනන්ත ඤාණස්ස අසාධාරණ පඤ්ඤස්ස දසපාරමිතා බල සමුදිතස්ස දසබල සමන්නාගතස්ස අපරිමෙය්‍යා ගුණ සාගරස්ස අම්භාකං සත්ථුනෝ සරස රංසිජාල පරිකිණ්ණං සම්මා සම්බුද්ධ පූජිතං සිරිබොධිරාජං සිරසා නමාමි.

➔ මහා කරුණාරස පතිමණ්ඩිතස්ස (මහා කරුණා රසයෙන් සැරසුනු) අනන්ත ඤාණස්ස (අනන්ත ඤාණනේ යුතු) අසාධාරණ පඤ්ඤස්ස (අනුන්හා සාධාරණ නොවන ප්‍රඥාවෙන් යුක්ත) දසපාරමිතා බල සමුදිතස්ස (දසපාරමී බලයන්ගෙන් උපන්නාවූ) දසබල සමන්නාගතස්ස (දසබලයන්ගෙන් සමන්විතවූ) අපරිමෙය්‍යා ගුණ සාගරස්ස (මැනිය නොහැකි ගුණ සයුරක්වූ) අම්භාකං (අපගේ) සත්ථුනෝ (ශාස්තෲන් වහන්සේගේ) සරස (හත්පසින්) රංසිජාල (රස්මි දහරා) පරිකිණ්ණං (ගැවසීගත්තේය) සම්මා සම්බුද්ධ පූජිතං (ඒ සම්මා සම්බුදුන්ගෙන් පිදුම් ලද) සිරිබොධිරාජං (සිරි බෝධි රාජයානන් වහන්සේට) සිරසා නමාමි (දොහොත්මුදුන්දී නමස්කාර කරමි.)

ඉන්නනීල වණ්ණ පත්ත සේත ඛන්ධ භාසුරං
සත්ථු නෙත්ත පංකජාභි පූජිතග්ග සාතදං
අග්ග බෝධි නාම වාම දේව රුක්ඛ සන්නිභං
තං විසාල බෝධිපාදපං නමාමි සබ්බදා

ඉන්නනීල වණ්ණ පත්ත සේත ඛන්ධ භාසුරං, සත්ථු නෙත්ත පංකජාභි පූජිතග්ග [පූජිත+අග්ග] සාතදං අග්ග බෝධි නාම වාම දේව රුක්ඛ සන්නිභං තං විසාල බෝධිපාදපං සබ්බදා නමාමි

➔ ඉන්නනීල වණ්ණ (ඉඳුනිල්මිණි පැහැයෙන්) පත්ත (පත්‍රද) සේත (සුදුපැහැයෙන්) ඛන්ධ (කඳ ද) භාසුරං (බබළන්නාවූ), සත්ථු (ශස්තෘන් වහන්සේගේ) නෙත්ත පංකජාභි (නේත්‍ර පත්මයන්ගෙන්) පූජිතග්ග [පූජිත+අග්ග] (පිදුම් ලද, අග්‍ර) සාතදං (සිසිල් සැප දෙන්නාවූ) අග්ග බෝධි නාම (උතුම් බෝධිය නම්වූ) වාම (මනරම්) දේව රුක්ඛ (දෙව්ලොව රුකකට) සන්නිභං (සමවූ) තං විසාල (ඒ විශාල) බෝධිපාදපං (බෝධි පාදය) සබ්බදා නමාමි (සැමදා නමස්කාර කරමි.)

☞ ඉඳුනිල්මිණි පැහැයෙන් පත්‍රද සුදුපැහැයෙන් කඳ ද බබළන්නාවූ, ශස්තෘන් වහන්සේගේ නේත්‍ර පත්මයන්ගෙන් පිදුම් ලද, අග්‍ර සිසිල් සැප දෙන්නාවූ උතුම් බෝධිය නම්වූ, මනරම් දෙව්ලොව රුකකට සමවූ ඒ විශාල බෝධි පාදය සැමදා නමස්කාර කරමි.

සුපතිට්ඨිත රට්ඨනුරාධපුරේ - සමදිට්ඨිත දක්ඛිණසාඛභවං
සුභ මේඝවනම්බර මේඝනිභං - ජයබෝධිමහං පණමාමි වරං.

රට්ඨනුරාධපුරේ [රට්ඨ+අනුරාධපුරේ] සුපතිට්ඨිත සමදිට්ඨිත දක්ඛිණසාඛභවං මේඝවනම්බර සුභ මේඝනිභං වරං ජයබෝධිමහං [ජයබෝධිං+අහං] පණමාමි

➔ රට්ඨ‍යනුරාධපුරේ [රට්ඨ+අනුරාධපුරේ] (අනුරාධපුර නගරයෙහි) සුපතිට්ඨිත (මනාලෙස පිහිටියාවූ) සමදිට්ඨිත (භාග්‍යවතුන් වහන්සේ විසින් මනාලෙස අධිෂ්ඨාන කල) දක්ඛිණසාඛභවං (දකුණුශාකාවවූ) මේඝවනම්බර (අහසෙහි) සුභ මේඝනිභං (සතුට ගෙනෙන වැහිවලාවක් බඳුවූ) වරං (උතුම්) ජයබෝධිමහං [ජයබෝධිං+අහං] (ශ්‍රීමහා බෝධින් වහන්සේට මම) පණමාමි (නමස්කාර කරමි.)

☞ අනුරාධපුර නගරයෙහි මනාලෙස පිහිටියාවූ භාග්‍යවතුන් වහන්සේ විසින් මනාලෙස අධිෂ්ඨාන කල දකුණුශාකාවවූ අහසෙහි සතුට ගෙනෙන වැහිවලාවක් බඳුවූ උතුම් ශ්‍රීමහා බෝධින් වහන්සේට මම නමස්කාර කරමි.

සේවිතං ධම්ම රාජේන - නර දේවේහි පූජිතං
වන්දාමි බෝධිරාජානං - නිබ්බාන සුඛ දායකං

ධම්ම රාජේන සේවිතං නර දේවේහි පූජිතං නිබ්බාන සුඛ දායකං බෝධිරාජාණං වන්දාමි

➔ ධම්ම රාජේන (ධර්ම රාජයන් වහන්සේ විසින්) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) නර දේවේහි (දෙවි මිනිසුන් විසින්) පූජිතං (පුදනු ලබන්නා වූ) නිබ්බාන සුඛ දායකං (නිවන් සුවය ගෙන දෙන්නා වූ) බෝධිරාජාණං (බෝධිරාජයාණන් වහන්සේට) වන්දාමි (වන්දනාකරමි)

☞ ධර්ම රාජයන් වහන්සේ විසින් සේවනය කරණ ලද්දා වූ දෙවි මිනිසුන් විසින් පුදනු ලබන්නා වූ වදින පුදන ජනයාට නිවන් සුවය ගෙන දෙන්නා වූ බෝධිරාජයාණන් වහන්සේට වන්දනාකරමි.

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
වන්දාමි බෝධි රාජානං - නිබ්බාන සුඛ සිද්ධියා.

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං නිබ්බාන සුඛ සිද්ධියා වන්දාමි

➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේ) නිබ්බාන සුඛ සිද්ධියා (නිවන් සැප ලැබීම පිණිස) වන්දාමි (වන්දනාකරමි)

☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බෝධිරාජයානන් වහන්සේ නිවන් සැප ලැබීම පිණිස වන්දනාකරමි.

සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - පුප්ඵේනේතේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං පුප්ඵේනේතේන [පුප්ඵේන+ඒතේන] සාදරං පූජේමි

➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේට) පුප්ඵේනේතේන [පුප්ඵේන+ඒතේන] (මේ මලින්) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)

☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට මේ මල් ආදරයෙන් පූජා කරමි.පූජා වේවා.

සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ගන්ධ පුප්ඵේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං ගන්ධ පුප්ඵේන සාදරං පූජේමි
➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේව) ගන්ධ පුප්ඵේන (සුවඳ මලින්) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)
☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට සුවඳ මල් ආදරයෙන් පූජා කරමි.පූජා වේවා

සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - පුප්ඵ දාමේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං පුප්ඵ දාමේන සාදරං පූජේමි
➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේව) පුප්ඵ දාමේන (මල්දමින්) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)
☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට මල් දම් ආදරයෙන් පූජා කරමි.පූජා වේවා.

පහන් පූජාව
සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - දීපාලෝකේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං දීපාලෝකේන [දීපා+ආලෝකේන] සාදරං පූජේමි
➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේව දීපාලෝකේන [දීපා+ආලෝකේන] (පහන් ආලෝකයෙන්) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)
☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට පහන් ආලෝකයන් ආදරයෙන් පූජා කරමි.පූජා වේවා.

සුවද දූම් පූජාව
සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ගන්ධ ධූපේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං ගන්ධ ධූපේන සාදරං පූජේමි
➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය

කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේට) ගන්ධ ධූපේන (සුවඳ දුමයෙන්) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)
☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට මේ මල් ආදරයෙන් පූජා කරමි.පූජා වේවා.

කොඩි පූජාව
සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ධජේනේතේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං ධජේනේතේන [ධජේන+ඒතේන] සාදරං පූජේමි
➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේට) ධජේනේතේන [ධජේන+ඒතේන] (මේ කොඩියෙන්) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)
☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට මේ කොඩියෙන් ආදරයෙන් පූජා කරමි.පූජා වේවා.

අෂ්ඨපාන ගිලන්පස
සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - අට්ඨ පානේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං අට්ඨ පානේන සාදරං පූජේමි
➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේට) අට්ඨ පානේන (අෂ්ඨ පාන ගිලන්පස) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)
☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට අෂ්ඨ පාන ගිලන්පස ආදරයෙන් පූජා කරමි.පූජා වේවා.

සුවඳ පැන් පූජාව
සේවිතං ධම්ම රාජනෙ - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ගන්ධෝදකේන සාදරං

ධම්මරාජේන සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] පත්තුං සේවිතං බෝධි රාජානං ගන්ධෝදකේන [ගන්ධ+උදකේන] සාදරං පූජේමි
➔ ධම්මරාජේන (ධර්මරාජයාණන් වහන්සේ විසින්) සම්බෝධිමුත්තමං [සම්බෝධිං+උත්තමං] (උතුම් සම්බෝධියට) පත්තුං (පැමිණීම පිණිස) සේවිතං (සේවනය කරණ ලද්දා වූ) බෝධි රාජානං (බෝධිරාජයානන් වහන්සේට) ගන්ධෝදකේන [ගන්ධ+උදකේන] (සුවඳ පැනින්) සාදරං පූජේමි (ආදරයෙන් පූජා කරමි)
☞ ධර්මරාජයාණන් වහන්සේ විසින් උතුම් සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද්දා වූ බොධිරාජයන් වහන්සේට සුවඳ පැන් ආදරයෙන් පූජා කරමි.පූජා වේවා.

1 ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩෙ පමෝදිතා
ජයං තදා නාග ගණා මහේසිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හොතු

සුබෝධි මූලේ මුනින්දස්ස ජයෝ අහෝසි මාරස්ස හි පරාජයෝ අහෝසි, තදා බෝධි මණ්ඩෙ පමෝදිතා නාග ගණා 'ජයං මහේසිනෝ' උග්ඝෝසයුං ඒතේන සච්චේන සුවත්ථි හොතු

➔ සුබෝධි මූලේ (ශ්‍රී මහා බෝමුල) මුනින්දස්ස (මුනින්ද්‍රයන් වහන්සේට) ජයෝ අහෝසි (ජය අත්විය) මාරස්ස හි (මරුට වනාහි) පරාජයෝ අහෝසි (පරාජය අත්විය), තදා (එකල) බෝධි මණ්ඩෙ (බෝධි මණ්ඩලයෙහි) පමෝදිතා (ප්‍රමුදිතවූ/ සතුටින් පිනාගිය) නාග ගණා (නාග සමූහයා) ජයං මහේසිනෝ ("මහා ඍෂින් වහන්සේට ජය අත්වූයේය " යැයි) උග්ඝෝසයුං (ප්‍රීති ඝෝෂා කලහ) ඒතේන සච්චේන (ඒ සත්‍යයෙන්) සුවත්ථි හොතු (යහපතක් වේවා!)

☞ ශ්‍රී මහා බෝමුල මුනින්ද්‍රයන් වහන්සේට ජය අත්විය මරුට වනාහි පරාජය අත්විය, එකල බෝධි මණ්ඩලයෙහි ප්‍රමුදිතවූ/ සතුටින් පිනාගිය නාග සමූහයා "මහා ඍෂින් වහන්සේට ජය අත්වූයේය " යැයි ප්‍රීති ඝෝෂා කලහ. ඒ සත්‍යයෙන් යහපතක් වේවා!

2 ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩෙ පමෝදිතා
සුපණ්ණ සංඝාපි ජයං මහේසිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හොතු

සුබෝධි මූලේ මුනින්දස්ස ජයෝ අහෝසි මාරස්ස හි පරාජයෝ අහෝසි, බෝධි මණ්ඩෙ පමෝදිතා සුපණ්ණ සංඝා-පි ජයං මහේසිනෝ උග්ඝෝසයුං ඒතේන සච්චේන සුවත්ථි හොතු

➔ සුබෝධි මූලේ (ශ්‍රී මහා බෝමුල) මුනින්දස්ස (මුනින්ද්‍රයන් වහන්සේට) ජයෝ අහෝසි (ජය අත්විය) මාරස්ස හි (මරුට වනාහි) පරාජයෝ අහෝසි (පරාජය අත්විය), බෝධි මණ්ඩෙ (බෝධි මණ්ඩලයෙහි) පමෝදිතා (ප්‍රමු තවූ/ සතුටින් පිනාගිය) සුපණ්ණ සංඝා-පි (ගුරුළු සමූහයා-ද) ජයං මහේසිනෝ ("මහා ඍෂින් වහන්සේට ජය අත්වූයේය " යැයි) උග්ඝෝසයුං (ප්‍රීති ඝෝෂා කලහ) ඒතේන සච්චේන (ඒ සත්‍යයෙන්) සුවත්ථි හොතු (යහපතක් වේවා!)

☞ ශ්‍රී මහා බෝමුල මුනින්ද්‍රයන් වහන්සේට ජය අත්විය මරුට වනාහි පරාජය අත්විය, එකල බෝධි මණ්ඩලයෙහි ප්‍රමුදිතවූ/ සතුටින් පිනාගිය ගුරුළු සමූහයා ද "මහා ඍෂින් වහන්සේට ජය අත්වූයේය " යැයි ප්‍රීති ඝෝෂා කලහ. ඒ සත්‍යයෙන් යහපතක් වේවා!

3 ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩෙ පමෝදිතා
ජයං තදා දේව ගණා මහේසිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හොතු

සුබෝධි මූලේ මුනින්දස්ස ජයෝ අහෝසි මාරස්ස හි පරාජයෝ අහෝසි, තදා බෝධි මණ්ඩෙ පමෝදිතා දේව ගණා ජයං මහේසිනෝ උග්ඝෝසයුං ඒතේන සච්චේන සුවත්ථි හොතු

➔ සුබෝධි මූලේ (ශ්‍රී මහා බෝමුල) මුනින්දස්ස (මුනින්ද්‍රයන් වහන්සේට) ජයෝ අහෝසි (ජය අත්විය) මාරස්ස හි (මරුට වනාහි) පරාජයෝ අහෝසි (පරාජය අත්විය), තදා (එකල) බෝධි මණ්ඩෙ (බෝධි මණ්ඩලයෙහි) පමෝදිතා (ප්‍රමුදිතවූ/ සතුටින් පිනාගිය) දේව ගණා (දේව

සමූහයා) ජයං මහේසිනෝ ("මහා ඍෂින් වහන්සේට ජය අත්වූයේය " යැයි) උග්ඝෝසයුං (ප්‍රීති ඝෝෂා කලහ) ඒතේන සච්චේන (ඒ සත්‍යයෙන්) සුවත්ථි හොතු (යහපතක් වේවා!)
☞ ශ්‍රී මහා බෝමුල මුනින්ද්‍රයන් වහන්සේට ජය අත්විය මරුට වනාහි පරාජය අත්විය, එකල බෝධි මණ්ඩලයෙහි ප්‍රමුදිතවූ/ සතුටින් පිනාගිය දේව සමූහයා "මහා ඍෂින් වහන්සේට ජය අත්වූයේය " යැයි ප්‍රීති ඝෝෂා කලහ. ඒ සත්‍යයෙන් යහපතක් වේවා!

4 ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩේ පමෝදිතා
ජයං තදා බ්‍රහ්ම ගණාපි තාදිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හොතු

සුබෝධි මූලේ මුනින්දස්ස ජයෝ අහෝසි මාරස්ස හි පරාජයෝ අහෝසි, තදා බෝධි මණ්ඩේ පමෝදිතා බ්‍රහ්ම ගණා-පි ජයං තාදිනෝ උග්ඝෝසයුං ඒතේන සච්චේන සුවත්ථි හොතු
➔ සුබෝධි මූලේ (ශ්‍රී මහා බෝමුල) මුනින්දස්ස (මුනින්ද්‍රයන් වහන්සේට) ජයෝ අහෝසි (ජය අත්විය) මාරස්ස හි (මරුට වනාහි) පරාජයෝ අහෝසි (පරාජය අත්විය), තදා (එකල) බෝධි මණ්ඩේ (බෝධි මණ්ඩලයෙහි) පමෝදිතා (ප්‍රමුදිතවූ/ සතුටින් පිනාගිය) බ්‍රහ්ම ගණා-පි (බ්‍රක්ම සමූහයා ද) ජයං තාදිනෝ ("අනන්තවූ නොසැලෙන ගුණයන්ගෙන් යුත් භාග්‍යවතුන් වහන්සේට ජය අත්වූයේය " යැයි) උග්ඝෝසයුං (ප්‍රීති ඝෝෂා කලහ) ඒතේන සච්චේන (ඒ සත්‍යයෙන්) සුවත්ථි හොතු (යහපතක් වේවා!)
☞ ශ්‍රී මහා බෝමුල මුනින්ද්‍රයන් වහන්සේට ජය අත්විය මරුට වනාහි පරාජය අත්විය, එකල බෝධි මණ්ඩලයෙහි ප්‍රමුදිතවූ/ සතුටින් පිනාගිය බ්‍රක්ම සමූහයා ද " අනන්තවූ නොසැලෙන ගුණයන්ගෙන් යුත් භාග්‍යවතුන් වහන්සේට ජය අත්වූයේය " යැයි ප්‍රීති ඝෝෂා කලහ. ඒ සත්‍යයෙන් යහපතක් වේවා!

ඉමාසබ්බායෝ ගාථා රචිතානං මහාථේරානං සිරසා නමාමි.
➔ ඉමාසබ්බායෝ (මේ සියලු) ගාථා (ගාථාවන්) රචිතානං (රචනාකල) මහාථේරානං (මහ තෙරුන් වහන්සේලාට) සිරසා නමාමි. (දොහොත් මුදුනේ තබා වන්දනා කරමි.)
☞මේ සියලු ගාථාවන් රචනාකල මහ තෙරුන් වහන්සේලාට දොහොත් මුදුනේ තබා වන්දනා කරමි.

<u>පිරිත් සජ්ඣායනා</u>
<u>මඞ්ගලසුත්තං</u> (මංගල සූත්‍රය)

එවං මේ සුතං – එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. අථ ඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඔභාසෙත්වා යේන භගවා තේනුපසඞ්කමි; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛෝ සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

★ <u>එවං</u> මේ සුතං (මා විසින් <u>මෙසේ</u> අසන ලදී) එකං සමයං (එක් සමයක/ එක් කාලයක) භගවා (භාග්‍යවතුන් වහන්සේ) සාවත්ථියං (සැවැත් නුවර සමීපයේ) විහරති (වැඩවාසය කරනසේක.) ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ (අනේපිඬු සිටානන්ගේ ජේතවන ආරාමයෙහි). අථ ඛෝ (එකල්හි) අඤ්ඤතරා දේවතා (එක්තරා දෙවියෙක්) අභික්කන්තාය රත්තියා (රාත්‍රියේ පෙරයම ගෙවීගිය කල්හි) අභික්කන්ත-වණ්ණා (විසිතුරු ශෝභවත් රූ ඇති) කේවලකප්පං ජේතවනං (මුලු ජේතවනයම) ඔභාසෙත්වා (ආලෝකමත් කර) යේන භගවා (යම්තැනක භාග්‍යවතුන් වහන්සේ වැඩවාසය කරයිද) [තේන+උපසඞ්කමි] තේනුපසඞ්කමි (එතැනට පැමිණියේය); උපසඞ්කමිත්වා (පැමිණ) භගවන්තං (භාග්‍යවතුන් වහන්සේට) අභිවාදෙත්වා (වන්දනාමාන කර) එකමන්තං (එක් පසෙක) අට්ඨාසි (සිටියේය). එකමන්තං ඨිතා (එක්පසක සිටින්නාවූ) ඛෝ සා දෙවතා (ඒ දෙව්තෙම) භගවන්තං (භාග්‍යවතුන් වහන්සේව) ගාථාය අජ්ඣභාසි. (ගාථාවකින් ඇමතීය.)
☞ මා විසින් මෙසේ අසන ලදී - එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයේ අනේපිඬු සිටානන්ගේ ජේතවන ආරාමයෙහි වැඩවාසය කරනසේක, එකල රාත්‍රියේ පෙරයම ගෙවීගිය කල්හි විසිතුරු ශෝභාවත් රූ ඇති එක්තරා දෙවියෙක් මුලු ජේතවනයම ආලෝකමත් කරමින් භාග්‍යවතුන් වහන්සේ වැඩවාසය කරන තැනට පැමිණියේය, පැමිණ භාග්‍යවතුන් වහන්සේට වන්දනාමාන කර එක් පසෙක සිටියේය, එක්පසක සිටින්නාවූ ඒ දෙව්තෙම භාග්‍යවතුන් වහන්සේව ගාථාවකින් ඇමතීය.

1. බහූ දේවා මනුස්සා ච, මඞ්ගලානි අචින්තයුං;
ආකඞ්ඛමානා සොත්ථානං, බ්‍රෑහි මඞ්ගලමුත්තමං.

• සොත්ථානං ආකඞ්ඛමානා බහූ දෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං, [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං බ්‍රෑහි.
★ සොත්ථානං (මෙලොව පරලොව සැප) ආකඞ්ඛමානා (කැමතිවන්නාවූ) බහූ (බොහෝ) දේවා මනුස්සා ච (දෙවියෝ ද මිනිසුන් ද) මඞ්ගලානි (අභිවෘද්ධිය ගෙනෙන මංගල කරුණු) අචින්තයුං (සිතූහ), [භාග්‍යවතුන් වහන්ස! ඔවුන්ට සිතාගත නොහැකිවූ ඒ] [උත්තමං + මඞ්ගලං] මඞ්ගලමුත්තමං (උතුම් මංගල කරුණු) බ්‍රෑහි (කියන්න / දේශනාකරන සේක්වා!)
☞ මෙලොව පරලොව සැප කැමතිවන්නාවූ බොහෝ දෙවියෝ ද මිනිසුන් ද අභිවෘද්ධිය ගෙනෙන මංගල කරුණු සිතූහ, භාග්‍යවතුන් වහන්ස! ඔවුන්ට සිතාගත නොහැකිවූ ඒ උතුම් මංගල කරුණු දේශනාකරන සේක්වා!
[★★ මෙහි උතුම් මංගල කරුණු යනු මෙලොව පරලොව අභිවෘද්ධිය, මෙලොව පරලොව නිවන් සැප ගෙනදෙන්නාවූ කරුණුය]

2. අසේවනා ච බාලානං, පණ්ඩිතානඤ්ච සේවනා;
පූජා ච පූජනීයානං, ඒතං මඞ්ගලමුත්තමං.

• බාලානං අසේවනා ච, [පණ්ඩිතානං+ච] පණ්ඩිතානඤ්ච සේවනා; පූජනීයානං පූජා ච, ඒතං [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං.
★ බාලානං (පස්පව් ආදියෙහි යෙදෙන්නාවූ කුසල අකුසල පිළිබඳ අවබෝධයක් නැතියවුන්) අසේවනා ච (ඇසුරු නොකිරීම ද), [පණ්ඩිතානං+ච] පණ්ඩිතානඤ්ච (පස්පවින් වැලකුණු කුසල අකුසල පිළිබඳ අවබෝධයක් ඇතියවුන්) සේවනා (ඇසුරු කිරීම ද); පූජනීයානං (වැඳිය පිදිය යුත්තන්ට) පූජා ච (පූජාසත්කාර කිරීම ද), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය)
☞ පස්පව් ආදියෙහි යෙදෙන්නාවූ කුසල අකුසල පිළිබඳ අවබෝධයක් නැතියවුන් ඇසුරු නොකිරීම ද පස්පවින් වැලකුණු කුසල අකුසල පිළිබඳ අවබෝධයක් ඇතියවුන් ඇසුරු කිරීම ද වැඳිය පිදිය යුත්තන්ට පූජාසත්කාර කිරීම ද යන මේවා උතුම් මංගල කරුණුය.

3. පතිරූපදේසවාසො ච, පුබ්බේ ච කතපුඤ්ඤතා;
අත්තසම්මාපණිධි ච, ඒතං මඞ්ගලමුත්තමං.

• පතිරූප-දේස-වාසො ච, පුබ්බේ කත-පුඤ්ඤතා ච; [අත්තා+සම්මා-පණිධි] අත්තසම්මාපණිධි ච, ඒතං මඞ්ගලමුත්තමං.
★ පතිරූප-දේස-වාසො ච (සුදුසු දේශයක වාසය කිරීම / කුසල් කලහැකි පෙදෙසක වාසය කිරීම ද), පුබ්බේ (පෙර) කත-පුඤ්ඤතා ච (කල පින්ඇතිබව ද); [අත්තා+සම්මා-පණිධි] අත්තසම්මාපණිධි ච (තමාව නිවැරදි ධර්ම මාර්ගයෙහි පිහිටවීම ද), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).
☞ නිවැරදි ලෙස ජීවත්වෙමින් කුසල් කලහැකි පෙදෙසක වාසය කිරීම ද පෙර බුද්ධකාලයන්හි කල පින්ඇතිබව ද තමාව නිවැරදි ධර්ම මාර්ගයෙහි පිහිටවීම ද යන මේවා උතුම් මංගල කරුණුය.

4. බාහුසච්චඤ්ච සිප්පඤ්ච, විනයෝ ච සුසික්ඛිතෝ;
සුභාසිතා ච යා වාචා, ඒතං මඞ්ගලමුත්තමං.

• [බාහුසච්චං+ච] බාහුසච්චඤ්ච [සිප්පං+ච] සිප්පඤ්ච, විනයෝ සුසික්ඛිතෝ ච; යා වාචා සුභාසිතා ච, ඒතං මඞ්ගලමුත්තමං.
★ [බාහුසච්චං+ච] බාහුසච්චඤ්ච (ධර්මය හා අන් නිවැරදී දේ පිළිබඳ බුහුශ්‍රැත බව ද) [සිප්පං+ච] සිප්පඤ්ච (නිවැරදි ශිල්ප ශාස්ත්‍ර දැණුම ද), විනයෝ (සිත කය වචනය යන හික්මවිය යුතු තුන් දොරෙහි) සුසික්ඛිතෝ ච (මනාව හික්මුනු බව ද); යා වාචා සුභාසිතා ච (දහම් දෙසීම් ආදී සංවර වචනයෙන් කිදේද), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).
☞ ධර්මය හා අන් නිවැරදී දේ පිළිබඳ බුහුශ්‍රැත බව ද නිවැරදි ශිල්ප ශාස්ත්‍ර දැණුම ද සිත කය වචනය යන හික්මවිය යුතු තුන් දොරෙහි මනාව හික්මුනු බව ද දහම් දෙසීම් ආදී සංවර වචනයෙන් කිදේද කීම ද යන මේවා උතුම් මංගල කරුණුය.

5. මාතාපිතු උපට්ඨානං, පුත්තදාරස්ස සඞ්ගහෝ;
අනාකුලා ච කම්මන්තා, ඒතං මඞ්ගලමුත්තමං.

• මාතාපිතු උපට්ඨානං, පුත්තදාරස්ස සඞ්ගහෝ, අනාකුලා කම්මන්තා ච, ඒතං මඞ්ගලමුත්තමං.
★ මාතාපිතු උපට්ඨානං (මව්පියනට උපස්ථාන කිරීම), පුත්තදාරස්ස (අඹුදරුවන්ට) සඞ්ගහෝ (මෙලොව පරලොව සැප පිණිස ධර්මානුකූලව සංග්‍රහකිරීම),

අනාකුලා කම්මන්තා ච (තමාගේ නිවැරදි ජීවනූපායේ කලට වේලාවට නිවැරදිලෙස නිරත වීමද), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).
☞ මව්පියනට උපස්ථාන කිරීම, අඹුදරුවන්ට මෙලොව පරලොව සැප පිණිස ධර්මානුකූලව සංග්‍රහකිරීම, තමාගේ නිවැරදි ජීවනූපායේ කලට වේලාවට නිවැරදිලෙස නිරත වීමද යන මේවා උතුම් මංගල කරුණුය

6. දානඤ්ච ධම්මචරියා ච, ඤාතකානඤ්ච සඞ්ගහෝ;
අනවජ්ජානි කම්මානි, ඒතං මඞ්ගලමුත්තමං

• [දානං+ච] දානඤ්ච ධම්ම-චරියා ච, [ඤාතකානං+ච] ඤාතකානඤ්ච සඞ්ගහෝ, අනවජ්ජානි කම්මානි, ඒතං මඞ්ගලමුත්තමං
★[දානං+ච] දානඤ්ච (දන් දීම ද) ධම්ම-චරියා ච (දස කුසල ක්‍රියාවන්හි හැසිරීම ද), [ඤාතකානං+ච] ඤාතකානඤ්ච (ඥාතීනට) සඞ්ගහෝ (මෙලොව පරලොව සැප පිණිස ධර්මානුකූලව සංග්‍රහකිරීම), අනවජ්ජානි කම්මානි (සිතින් කයින් වචනයින් විවිධාකාරවූ කුසල් වැඩෙන ක්‍රියාවන්හි නිරතවීම), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).
☞ දන් දීම ද දස කුසල ක්‍රියාවන්හි නිරතවීම ද ඥාතීනට මෙලොව පරලොව සැප පිණිස ධර්මානුකූලව සංග්‍රහකිරීම ද සිතින් කයින් වචනයින් විවිධාකාරවූ කුසල් වැඩෙන ක්‍රියාවන්හි නිරතවීම යන මේවා උතුම් මංගල කරුණුය.

7. ආරති විරති පාපා, මජ්ජපානා ච සංයමෝ
අප්පමාදෝ ච ධම්මේසු, ඒතං මඞ්ගලමුත්තමං.

• පාපා ආරති පාපා විරති, මජ්ජපානා සංයමෝ ච [කුසලේසු] ධම්මේසු අප්පමාදෝ ච, ඒතං මඞ්ගලමුත්තමං.
★ පාපා ආරති (පාප ක්‍රියාවන්හි නොඇලීම) පාපා විරති (පාප ක්‍රියාවන් කයවචනයෙන් නොකිරීම), මජ්ජපානා සංයමෝ ච (මත්පැනින් වැලකීම) [කුසලේසු] ධම්මේසු අප්පමාදෝ ච (කුසල ධර්මයන්හි අප්‍රමාදබව / කුසල ධර්මයන් සකසා කරමින් නිතර කරමින් කැමැත්තෙන් කරමින් වීර්යයෙන් කරමින් අප්‍රමාදව වාසයකිරීම), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය)..
☞ පාප ක්‍රියාවන්හි නොඇලීම, පාප ක්‍රියාවන් කයවචනයෙන් නොකිරීම, මත්පැනින් වැලකීම, කුසල ධර්මයන් සකසා කරමින් නිතර කරමින් කැමැත්තෙන් කරමින් වීර්යයෙන් කරමින් අප්රමාදව වාසයකිරීම යන මේවා උතුම් මංගල කරුණුය.

8. ගාරවෝ ච නිවාතෝ ච, සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලේන ධම්මසවනං, ඒතං මඞ්ගලමුත්තමං.

• ගාරවෝ ච නිවාතෝ ච, සන්තුට්ඨී ච කතඤ්ඤුතා කාලේන ධම්මසවනං, ඒතං මඞ්ගලමුත්තමං
★ ගාරවෝ ච (වැඳුම් පිදුම් ලැබීමට සුදුස්සන්ට එසේ ගෞරව කිරිම ද) නිවාතෝ ච (නිහතමානීබව ද), සන්තුට්ඨී ච (ලදදෙයින් සතුටුවීම ද) කතඤ්ඤුතා (කල ගුණ දන්නාබව) කාලේන ධම්මසවනං (නිතර නිනර කලණ මිතුරන් හමුවී තම ධර්මගැටලු විසඳී කුසලපක්ෂය වැඩෙන සේ බණ ඇසීම), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).

☞ වැඳුම් පිදුම් ලැබීමට සුදුස්සන්ට එසේ ගෞරව කිරිම ද ලදදෙයින් සතුටුවීම ද නිහතමානීබව ද කල ගුණ දන්නාබව ද, නිතර නිනර කලණ මිතුරන් හමුවී තම ධර්මගැටලු විසඳී කුසලපක්ෂය වැඩෙන සේ බණ ඇසීම ද යන මේවා උතුම් මංගල කරුණුය.

9. ඛන්තී ච සෝවචස්සතා, සමණානඤ්ච දස්සනං
කාලේන ධම්මසාකච්ඡා, ඒතං මඞ්ගලමුත්තමං.

• ඛන්තී ච සෝවචස්සතා, [සමණානං+ච] සමණානඤ්ච දස්සනං කාලේන ධම්මසාකච්ඡා, ඒතං මඞ්ගලමුත්තමං.

★ ඛන්තී ච (ඉවසීම ද) සෝවචස්සතා (නිවැරදි අවවාද පිළිගන්නාවූ සුවච කීකරුබව ද), [සමණානං+ච] සමණානඤ්ච දස්සනං (කෙලෙසුන් සමනයකල ශ්‍රමනයන් වහන්සේලා වෙතට යාම වන්දනාමාන කිරීම උපස්ථාන කිරීම උන්වහන්සේලාගේ ගුණ සිහිකිරීම ආදී වශයෙන් ශ්‍රමනයන් වහන්සේලාගේ දර්ශනය ද) කාලේන ධම්මසාකච්ඡා (කාලයෙන් කාලයට තමන් දන්නා ධර්මකරුණු අන් ධර්මදරයන් හා සාකච්ඡාකිරීම ද), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).

☞ ඉවසීම ද නිවැරදි අවවාද පිළිගන්නාවූ සුවච කීකරුබව ද කෙලෙසුන් සමනයකල ශ්‍රමනයන් වහන්සේලා වෙතට යාම වන්දනාමාන කිරීම උපස්ථාන කිරීම උන්වහන්සේලාගේ ගුණ සිහිකිරීම ආදී වශයෙන් ශ්‍රමනයන් වහන්සේලාගේ දර්ශනය ද කාලයෙන් කාලයට තමන් දන්නා ධර්මකරුණු අන් ධර්මදරයන් හා සාකච්ඡාකිරීම ද යන මේවා උතුම් මංගල කරුණුය

10. තපෝ ච බ්‍රහ්මචරියඤ්ච, අරියසච්චාන දස්සනං
නිබ්බානසච්ඡිකිරියා ච, ඒතං මඞ්ගලමුත්තමං

• තපෝ ච [බ්‍රහ්මචරියං+ච] බ්‍රහ්මචරියඤ්ච, අරියසච්චාන දස්සනං නිබ්බාන-සච්ඡිකිරියා ච, ඒතං මඞ්ගලමුත්තමං

★ තපෝ ච (රාග ද්වේෂ මෝහ දුරුවන අයුරින් වීර්යය කිරීම ද) [බ්‍රහ්මචරියං+ච] බ්‍රහ්මචරියඤ්ච (බ්‍රක්මචාරී වීම ද), අරියසච්චාන දස්සනං (ආර්යය සත්‍යයන් අවබෝධකිරීම් වශයෙන් දැකීම ද) නිබ්බාන-සච්ඡිකිරියා ච (නිවන් අවබෝධකිරීම ද), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).

☞ රාග ද්වේෂ මෝහ දුරුවන අයුරින් වීර්යය කිරීම ද බ්‍රක්මචාරී වීම ද ආර්යය සත්‍යයන්, අවබෝධකිරීම් වශයෙන් දැකීම ද නිවන් අවබෝධකිරීම ද යන මේවා උතුම් මංගල කරුණුය

11. ඵුට්ඨස්ස ලෝකධම්මේහි, චිත්තං යස්ස න කම්පති;
අසෝකං විරජං ඛෙමං, ඒතං මඞ්ගලමුත්තමං

• ලෝකධම්මේහි ඵුට්ඨස්ස යස්ස චිත්තං න කම්පති අසෝකං විරජං ඛෙමං, ඒතං මඞ්ගලමුත්තමං

★ ලෝකධම්මේහි (ලාභ අලාභ යස අයස නින්දා ප්‍රසංසා සැප දුක් යන අටලෝදහම්හි) ඵුට්ඨස්ස (විවිධ අවස්ථාවනට පැමිණියාවූ) යස්ස (යමකුගේ) චිත්තං (සිත) න කම්පති (නොසැලීම ද / ඔදවැඩීම හෝ දුකටපත්නොවීම ද) අසෝකං (සියලු සෝකයන්ගෙන් දුරුවීම ද) විරජං (කෙලෙස් දූහුවිලි වලින් පිරිසිදු වීම ද) ඛෙමං (සියලු බියන් දුරුකිරීම ද), ඒතං (යන මේවා) [මඞ්ගලං + උත්තමං] මඞ්ගලමුත්තමං. (උතුම් මංගල කරුණුය).

☞ ලාභ අලාභ යස අයස නින්දා ප්‍රසංසා සැප දුක් යන අටලෝදහම්හි විවිධ අවස්ථාවනට පැමිණියාවූ යමකුගේ සිත නොසැලීම ද / ඔදවැඩීම හෝ දුකටපත්නොවීම ද සියලු සෝකයන්ගෙන් දුරුවීම ද කෙලෙස් දුහුවිලි වලින් පිරිසිදු වීම ද සියලු බියන් දුරුකිරීම ද යන මේවා උතුම් මංගල කරුණුය.

12. ඒතාදිසානි කත්වාන, සබ්බත්ථමපරාජිතා;
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති, තං තෙසං මඞ්ගලමුත්තම''න්ති.

• [ඒතානි+ඊදිසානි] ඵතාදිසානි කත්වාන, [සබ්බත්ථ+ම+අපරාජිතා] සබ්බත්ථමපරාජිතා සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති, තෙසං තං [මඞ්ගලං + උත්තමං+ඉති] මඞ්ගලමුත්තම''න්ති

★[ඒතානි+ඊදිසානි] ඵතාදිසානි (මෙසේ මෙවැනිවූ) කත්වාන (කොට / මංගල කරණු සිද්ධකර), [සබ්බත්ථ+ම+අපරාජිතා] සබ්බත්ථමපරාජිතා (සියලු තැන්හි නොපැරදී) සබ්බත්ථ (සියලුතැන්හි) සොත්ථිං (සැපවත්බවට) ගච්ඡන්ති (යන්නාහ / පත්වන්නාහ), තෙසං (ඔවුන්ට/ මෙලොව පරලොව සැප බලාපොරොත්තු වෙන්නන්ට) තං (එය/ එසේ කිරීම) [මඞ්ගලං + උත්තමං+ඉති] මඞ්ගලමුත්තම''න්ති (උතුම් මංගල කරුණකි.)

☞ මෙසේ මෙවැනිවූ මංගල කරණු සිද්ධකර සියලු තැන්හි නොපැරදී සියලුතැන්හි සැපවත්බවට පත්වන්නාහ. මෙලොව පරලොව සැප බලාපොරොත්තු වෙන්නන්ට එසේ කිරීම උතුම් මංගල කරුණකි.
මඞ්ගලසුත්තං නිට්ඨිතං. (මංගල සූත්‍රය නිමියේය.)

<u>රතනසුත්තං (රතන සූත්‍රය)</u>

1. යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ;
සබ්බෙව භූතා සුමනා භවන්තු, අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං.

• [යානි+ඉධ] යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ, [සබ්බෙ+ඒව] සබ්බෙව භූතා සුමනා භවන්තු, අථෝපි [මය්හං] භාසිතං සක්කච්ච සුණන්තු.
භුම්මානි වා අන්තලික්ඛෙ වා යානි භූතානි ඉධ සමාගතානි සබ්බෙ භූතා ඒව සුමනා භවන්තු, අථෝපි මය්හං භාසිතං සක්කච්ච සුණන්තු.

★ භුම්මානි වා (පොළොවෙහි වූ හෝ) අන්තලික්ඛෙ වා (අහසෙහි වූ හෝ) යානි භූතානි (යම් සත්ත්වයෝ / යම් අමනුස්ස කොට්ටාසයෝ) ඉධ (මෙහි) සමාගතානි (රැස්වූවා ද) සබ්බෙ භූතා ඒව (ඒ සියලු සත්වයෝම) සුමනා භවන්තු (සතුටු සිත්ඇත්තෝ වේත්වා!), අථෝපි (තවද) මය්හං (මගේ) භාසිතං (කීම/ දේශනාව) සක්කච්ච (සැදීපැහැදී) සුණන්තු (අසන්න).

☞ පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුස්ස කොට්ටාසයෝ මෙහි රැස්වූවා ද ඒ සියලු සත්වයෝම සතුටු සිත්ඇත්තෝ වේත්වා! තවද මගේ දේශනාව සැදීපැහැදී අසන්න

2. තස්මා හි භූතා නිසාමේථ සබ්බෙ, මෙත්තං කරෝථ මානුසියා පජාය;
දිවා ච රත්තෝ ච හරන්ති යෙ බලිං, තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා.

• [යස්මා ධම්මසවණං ඉධ ආගතා] තස්මා හි සබ්බේ භූතා නිසාමේථ, මානුසියා පජාය මෙත්තං කරෝථ, යේ දිවා ච රත්තෝ ච [තුම්හේ උද්දිස්ස] බලිං හරන්ති තස්මා හි අප්පමත්තා නේ රක්ඛථ

★[යස්මා ධම්මසවණං ඉධ ආගතා (යම්සේ මෙහි දහම් ඇසීමට ආවේද)] තස්මා හි (එබැවින්) සබ්බේ භූතා (සියලු සත්ත්වයෝ) නිසාමේථ (අසව්), මානුසියා පජාය (මිනිස් ප්‍රජාවට) මෙත්තං කරෝථ (මෛත්‍රී කරව්), යේ (යමෙක්) දිවා ච රත්තෝ ච (දිවා රෑ දෙකෙහි) [තුම්හේ උද්දිස්ස (නුඹලා වෙනුවෙන්)] බලිං (ගරුසත්කාර පුණ්‍යානුමෝදනා) හරන්ති (ගෙනදෙති ද) තස්මා හි (එබැවින්) අප්පමත්තා (අප්‍රමාදව) නේ (ඔවුන්) රක්ඛථ (රකිව්)

☞ යම්සේ නුඹලා මෙහි සතුටු සිතින් දහම් ඇසීමට ආවේද එබැවින් සියලු සත්ත්වයෝ මාගේ කීම අසව්, මිනිස් ප්‍රජාවට මෛත්‍රී කරව්, මිනිස් ප්‍රජාවක් දිවා රෑ දෙකෙහි නුඹලා වෙනුවෙන් ගරුසත්කාර පුණ්‍යානුමෝදනා කරන බැවින් ඔවුන් අප්‍රමාදව රකිව්!

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා, සග්ගේසු වා යං රතනං පණීතං;
න නෝ සමං අත්ථි තථාගතේන, ඉදම්පි බුද්ධේ රතනං පණීතං;
එතේන සච්චේන සුවත්ථි හෝතු.

• ඉධ වා හුරං වා යං කිඤ්චි විත්තං [හෝති], සග්ගේසු වා යං පණීතං රතනං [හෝති], [තං] තථාගතේන සමං න නෝ අත්ථි, බුද්ධේ [ඉදං+අපි] ඉදම්පි පණීතං රතනං, එතේන සච්චේන සුවත්ථි හෝතු

★ ඉධ වා (මෙලොව හෝ) හුරං වා (අන් ලොවක හෝ) යං කිඤ්චි විත්තං (යම්කිසි සම්පතක්) [හෝති (වේද)], සග්ගේසු වා (දේවලෝකයන්හි හෝ) යං පණීතං රතනං (යම් උතුම් රත්නයක්) [හෝති (වේද)], [තං (එය/ ඒ රත්නය)] තථාගතේන (තථාගතයන් හා) සමං (සමවීමක්) න නෝ අත්ථි (නැත්තේමය), බුද්ධේ (බුදුරජුන් කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ මෙලොව හෝ අන් ලොවක හෝ යම්කිසි සම්පතක් වේද, දේවලෝකයන්හි හෝ යම් උතුම් රත්නයක් වේද, ඒ සියලු රත්නයන් තථාගතයන් හා සමවීමක් නැත්තේමය, බුදුරජුන් කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

4. ඛයං විරාගං අමතං පණීතං, යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ;
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි, ඉදම්පි ධම්මේ රතනං පණීතං;
එතේන සච්චේන සුවත්ථි හෝතු.

• සමාහිතෝ සක්‍යමුනී ඛයං විරාගං අමතං පණීතං [නිබ්බානං] [යං+ද+අජ්ඣගා] යදජ්ඣගා, <u>තේන ධම්මේන න [සමං+අත්ථි] සමත්ථි කිඤ්චි</u> # තේන ධම්මේන සමං කිඤ්චි න අත්ථි #, ධම්මේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ සමාහිතෝ (ආර්ය මාර්ග සමාධියෙන් සමාධිමත් වූ) සක්‍යමුනී (සාක්‍යමුනින්ද්‍රයන් වහන්සේ) ඛයං (කෙලෙසුන් ගෙන් ක්ෂයවූ) විරාගං (කෙලෙසුන් හා නොඇලුනා වූ) අමතං (අමෘත වූ) පණීතං (උතුම් වූ) **<u>යං(යම්)</u>** නිබ්බානං (නිවනක්) අජ්ඣගා (අවබෝධකලේ ද), තේන ධම්මේන (ඒ නිර්වාණය ධර්මය හා) සමං (සමවූ) කිඤ්චි (කිසිවක්) න අත්ථි (නැත),

ධම්මේ (ධර්මයෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ ආර්ය මාර්ග සමාධියෙන් සමාධිමත් වූ සාක්‍යමුනින්ද්‍රයන් වහන්සේ කෙලෙසුන් ගෙන් ක්ෂයවූ කෙලෙසුන් හා නොඇලුනා වූ අමෘත වූ උතුම් වූ යම් නිවනක් අවබෝධකලේ ද ඒ නිර්වාණධර්මය හා සමවූ කිසිවක් නැත, ධර්මයෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

5. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං, සමාධිමානන්තරිකඤ්ඤමාහු;
සමාධිනා තේන සමෝ න විජ්ජති, ඉදම්පි ධම්මේ රතනං පණීතං;
එතේන සච්චේන සුවත්ථි හෝතු.

• බුද්ධසෙට්ඨෝ යං සුචිං [සමාධිං] පරිවණ්ණයී, <u>සමාධිමානන්තරිකඤ්ඤමාහු [සමාධිං+ආනන්තරික+යං+ආහු</u> = බුද්ධසෙට්ඨෝ යං [මග්ග]සමාධිං ආනන්තරිකං ආහු] තේන සමාධිනා සමෝ න විජ්ජති, ධම්මේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ බුද්ධසෙට්ඨෝ (බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ) යං (යම්) සුචිං (අතිශයින් පිරිසිදුවූ) සමාධිං (සමාධියක්) පරිවණ්ණයී (අතිශයින් වර්ණණාකලේ ද), බුද්ධසෙට්ඨා (බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේලා) යං (යම්) [මග්ග]සමාධිං (මාර්ග සමාධියක්) ආනන්තරිකං (තමාට අනතුරුව ඒකාන්තයෙන් එලදෙන්නේ යැයි) ආහු (කීවාද/ දේශනා කලාද), තේන සමාධිනා (ඒ සමාධිය හා) සමෝ (සමවූ දෙයක්) න විජ්ජති (විද්‍යාමාන නොවේ), ධම්මේ (ධර්මයෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ අතිශයින් පිරිසිදුවූ යම් සමාධියක් අතිශයින් වර්ණණාකලේ ද බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේලා යම් මාර්ග සමාධියක් තමාට අනතුරුව ඒකාන්තයෙන් එලදෙන්නේ යැයි දේශනා කලාද ඒ සමාධිය හා සමවූ දෙයක් විද්‍යාමාන නොවේ, ධර්මයෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

6. යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා, චත්තාරි එතානි යුගානි හොන්ති;
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා, එතේසු දින්නානි මහප්ඵලානි;
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• සතං පසත්ථා යේ පුග්ගලා අට්ඨ [හොන්ති], එතානි චත්තාරි යුගානි හොන්ති, තේ සුගතස්ස සාවකා දක්ඛිණෙය්‍යා, එතේසු දින්නානි මහප්ඵලානි [හොන්ති], සඞ්ඝේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ සතං පසත්ථා (බුද්ධාදී සත්පුරුෂයන් විසින් ප්‍රශංසාකරණලද) යේ පුග්ගලා (යම් පුද්ගලයන්) අට්ඨ හොන්ති (අටදෙනෙක් වෙත් ද), එතානි (ඔවුන්) යුගානි චත්තාරි හොන්ති (යුගල සතරක් වෙති), තේ (ඒ) සුගතස්ස සාවකා (සුගතයන්ගේ ශ්‍රාවකයන් වහන්සේලා) දක්ඛිණෙය්‍යා (කර්මය කර්මඵලය විශ්වාසකර දෙන දන් පිලිගැනීමට සුදුස්සෝය.), එතේසු (ඔවුන් කෙරෙහි/ උන්වහන්සේලාට) දින්නානි (දුන්දේ) මහප්ඵලානි හොන්ති (මහත්ඵල වෙති), සඞ්ඝේ (සංඝයා වහන්සේලා කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද)

පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ බුද්ධාදී සත්පුරුෂයන් විසින් ප්‍රශංසාකරණලද යම් පුද්ගලයන් අටදෙනෙක් වෙත් ද ඔවුන් යුගල වශයෙන් සතරක් වෙති. ඒ සුගතයන්ගේ ශ්‍රාවකයන් වහන්සේලා කර්මය කර්මඵලය විශ්වාසකර දෙන දන් පිලිගැනීමට සුදුස්සෝය, උන්වහන්සේලාට දුන්දේ මහත්ඵල වෙති, සංඝයා වහන්සේලා කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

7. යේ සුප්පයුත්තා මනසා දළ්හේන, නික්කාමිනෝ ගෝතමසාසනම්හි;
තේ පත්තිපත්තා අමතං විගය්හ, ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා;
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• යේ ගෝතමසාසනම්හි සුප්පයුත්තා දළ්හේන මනසා නික්කාමිනෝ, තේ අමතං විගය්හ මුධා ලද්ධා නිබ්බුතිං භුඤ්ජමානා පත්ති-පත්තා, සඞ්ඝේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ යේ (යමෙක්) ගෝතමසාසනම්හි (ගෞතම තථාගතයන්ගේ ශාසනයෙහි) සුප්පයුත්තා (මනාව යෙදෙමින් / තුන්දොර සංවරයෙන් යුතුව මනා ප්‍රතිපත්තියෙහි යෙදී) දළ්හේන මනසා (දැඩි සිතින්/ දැඩි වීරියෙන් යුතු සිතින්) නික්කාමිනෝ (නික්මුනෝ / සියලු කෙලෙසුන් ගෙන් නික්මුනෝය), තේ (ඔවුන්/ උන්වහන්සේලා) අමතං (අමෘතය නම් නිවනට) විගය්හ (බැස) මුධා (නොමිලේ) ලද්ධා (ලැබුවා වූ) නිබ්බුතිං (නිවන්සැප/ ඵලසමාපත්තිය) භුඤ්ජමානා (වින්දනයකරන) පත්ති-පත්තා (නිවනට පැමිණියෝය), සඞ්ඝේ (සංඝයා වහන්සේලා කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ යමෙක් ගෞතම තථාගතයන්ගේ ශාසනයෙහි තුන්දොර සංවරයෙන් යුතුව මනා ප්‍රතිපත්තියෙහි යෙදී දැඩි වීරියෙන් යුතු සිතින් සියලු කෙලෙසුන් ගෙන් නික්මුනෝ ද, උන්වහන්සේලා අමෘතය නම් නිවනට බැස නොමිලේ ලැබුවා වූ නිවන්සැප නම් ඵලසමාපත්ති රසය වින්දනයකරන නිවනට පැමිණියෝය, සංඝයා වහන්සේලා කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

8. යථින්දඛීලෝ, පඨවිංසිතෝ සියා, චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ;
තථූපමං සප්පුරිසං වදාමි, යෝ අරියසච්චානි අවෙච්ච පස්සති;
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• [යථා+ඉන්දඛීලෝ] යථින්දඛීලෝ පඨවිංසිතෝ, චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ සියා, යෝ අරියසච්චානි අවෙච්ච පස්සති, [තං] සප්පුරිසං [තථා+උපමං] තථූපමං වදාමි, ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ යථා (යම්සේ) පඨවිංසිතෝ (පොළොවෙහි පිහිටුවා ඇති) ඉන්දඛීලෝ (ඉන්ද්‍රඛීලය) චතුබ්භි වාතේහි (සිව්දිගින් එන සුලඟින්) අසම්පකම්පියෝ සියා (නොසැලෙන්නේ වේද), යෝ (යමෙක්) අරියසච්චානි (ආර්යය සත්‍යයන්) අවෙච්ච පස්සති (ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධකරන්නේ ද), [තං] සප්පුරිසං (ඒ සත්පුරුෂයා) [තථා+උපමං] තථූපමං (එලෙස උපමායැයි/ ඒ ඉන්ද්‍රඛීලය බඳු යැයි) වදාමි (කියමි), සඞ්ඝේ (සංඝයා වහන්සේලා කෙරෙහි)

[ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ යම්සේ පොළොවෙහි පිහිටුවා ඇති ඉන්ද්‍රඛීලය සිව්දිගින් එන සුලගින් නොසැලෙන්නේ වේද, එලෙසම යමෙක් ආර්යය සත්‍යයන් ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධකරන්නේ ද ඒ සත්පුරුෂයා ඒ ඉන්ද්‍රඛීලය බඳු යැයි කියමි, සංඝයා වහන්සේලා කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

9. යේ අරියසච්චානි විභාවයන්ති, ගම්භීරපඤ්ඤේන සුදේසිතානි;
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා, න තේ භවං අට්ඨමමාදියන්ති;
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• යේ ගම්භීර-පඤ්ඤේන සුදේසිතානි අරියසච්චානි විභාවයන්ති, තේ කිඤ්චාපි [භුසං+පමත්තා] භුසප්පමත්තා හොන්ති, <u>න තේ භවං [අට්ඨමං+ආදියන්ති]</u> අට්ඨමමාදියන්ති (තේ අට්ඨමං භවං න ආදියන්ති), සඞ්ඝේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ යේ (යමෙක්ලා) ගම්භීර-පඤ්ඤේන (ගැඹුරු නුවණින්/ සර්වඥ්ඥතා ඥාණයෙන්) සුදේසිතානි (මනාලෙස දේශනාකල) අරියසච්චානි (ආර්ය සත්‍යයන්) විභාවයන්ති (පැහැදිලි කරගනිත් ද/ අවබෝධ කරයි ද), තේ කිඤ්චාපි (ඔවුන්ගෙන් කිසිවෙක්/ උන්වහන්සේලාගෙන් කිසිවෙක්) භුසං පමත්තා හොන්ති (බෙහෙවින් ප්‍රමාද වුවත්/ දෙව්ලොව නැවත නැවත ඉපදීම් ආදියෙන් රහත්විමට ප්‍රමාද වුවත්), තේ (ඔවුන්/ උන්වහන්සේලා) අට්ඨමං භවං (අටවන බවයක්/ අටවන උප්පත්තියක්) න ආදියන්ති (නොගන්නේය/ නොලබන්නේය), සඞ්ඝේ (සංඝයා වහන්සේලා කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ යමෙක්හු සර්වඥ්ඥතා ඥාණයෙන් මනාලෙස දේශනාකල ආර්ය සත්‍යයන් අවබෝධ කරයි ද උන්වහන්සේලාගෙන් කිසිවෙක් දෙව්ලොව නැවත නැවත ඉපදීම් ආදියෙන් රහත්විමට ප්‍රමාද වුවත් අටවන උප්පත්තියක් නොලබන්නේය, සංඝයා වහන්සේලා කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

10. සහාවස්ස දස්සනසම්පදාය, තයස්සු ධම්මා ජහිතා භවන්ති;
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච, සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි.
චතූහපායේහි ච විප්පමුත්තෝ, ඡ චාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• <u>[සහ+ඒව+අස්ස] සහාවස්ස දස්සනසම්පදාය</u> (අස්ස දස්සනසම්පදාය සහ ඒව), සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච, සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි තයස්සු ධම්මා ජහිතා භවන්ති. [චතූහි+අපායේහි] චතූහපායේහි ච විප්පමුත්තෝ, [ඡ+අභිඨානානි] ඡචාභිඨානානි අභබ්බෝ කාතුං , සඞ්ඝේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ අස්ස (ඔහුගේ/ ඉහත ගාථාවේ කී සෝවාන් පුද්ගලයාගේ) දස්සනසම්පදාය (සෝවාන්වීමත්) සහ ඒව (සමගම), සක්කායදිට්ඨී (සක්කාය දෘෂ්ටිය) විචිකිච්ඡිතඤ්ච (බුද්ධාදී අටතැනෙහි සැකය), සීලබ්බතං (ගෝවුත ආදී සීලයෙන් නිවනලැබේය) වාපි (යැයි) යදත්ථි කිඤ්චි (යම් කිසිවක් ඇත්ද/ කිසියම් දෘෂ්ඨික් ඇත්ද) තයස්සු ධම්මා (ඒ තුන් ධර්මයන්) ජහිතා භවන්ති

(දුරුකලා වෙති), [චතූහි+අපායේහි] චතූහපායේහි ච (සතර අපායෙන් ද) විප්පමුත්තෝ (මිදුනේය), [ඡ+අභිඨානානි] ඡචාභිඨානානි (මව් මැරීම් ආදී සවැදෑරුම් බරපතල පාපයන්) කාතුං අභබ්බෝ (කිරීමට අබව්‍යවේ/ නොකරන්නේය) සඞ්ඝේ (සංඝයා වහන්සේලා කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ ඉහත ගාථාවේ කී සෝවාන් පුද්ගලයාගේ සෝවාන්වීමත් සමගම
සක්කාය දෘෂ්ටිය, බුද්ධාදී අටතැනෙහි සැකය, "ගෝවුත ආදී සීලයෙන් නිවනලැබේය" යැයි කිසියම් දෘෂ්ඨීක් ඇත්ද, ඒ තුන් ධර්මයන් දුරුකලා වෙති. සතර අපායෙන් ද මිදුනේය, මව් මැරීම් ආදි සවැදෑරුම් බරපතල පාපයන් නොකරන්නේය, සංඝයා වහන්සේලා කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං, කායේන වාචා උද චේතසා වා;
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය, අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා;
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• සෝ කායේන වාචා උද චේතසා වා කිඤ්චාපි පාපකං කම්මං කරෝති, සෝ තස්ස පටිච්ඡාදාය අභබ්බෝ, දිට්ඨපදස්ස අභබ්බතා වුත්තා, සඞ්ඝේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ සෝ (ඔහු/ සෝවාන් තැනැත්තා) කායේන වාචා (කයින් වචනයෙන්) උද (නැතහොත්) චේතසා වා (සිතින් හෝ), [භාග්‍යවතුන් වහන්සේ පැනවූ සික්ෂාපද කැඩීම් වශයෙන්] කිඤ්චාපි (කිසියම්) පාපකං කම්මං (වැරදි ක්‍රියාවක්) කරෝති (කරයි ද), සෝ (ඔහු/ සෝවාන් තැනැත්තා) තස්ස පටිච්ඡාදාය අභබ්බෝ (එය සැගවීමට අබව්‍යය/ එය නොසගවන්නේය), දිට්ඨපදස්ස (සෝවාන් තැනැත්තාගේ) අභබ්බතා වුත්තා (වරද නොසඟවන බව දේශනාකරනලදී) [මජ්ඣිම නිකායේ කෝසම්බිය සූත්‍රයේ දේශනාකර ඇත], සඞ්ඝේ (සංඝයා වහන්සේලා කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ සෝවාන් තැනැත්තා කයින් වචනයෙන් නැතහොත් සිතින් හෝ භාග්‍යවතුන් වහන්සේ පැනවූ සික්ෂාපද කැඩීම් වශයෙන් කිසියම් වැරදි ක්‍රියාවක් කරයි ද ඔහු එය නොසගවන්නේය, සෝවාන් තැනැත්තාගේ වරද නොසඟවන බව දේශනාකරනලදී, සංඝයා වහන්සේලා කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

12. වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගේ, ගිම්හානමාසේ පඨමස්මිං ගිම්හේ;
තථූපමං ධම්මවරං අදෙසයී, නිබ්බානගාමිං පරමං හිතාය;
ඉදම්පි බුද්ධේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• යථා ගිම්හාන-මාසේ පඨමස්මිං ගිම්හේ වනප්පගුම්බේ ඵුස්සිතග්ගේ [හෝති], [භගවා] පරමං හිතාය [තථා+උපමං]තථූපමං නිබ්බානගාමිං ධම්මවරං අදෙසයී, බුද්ධේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු

★ යථා (යම්සේ) ගිම්හේ (ගිම්හානයේ) පඨමස්මිං ගිම්හාන-මාසේ (පළමු ගිම්හාන මාසයේ) වනප්පගුම්බේ (වන ගොමුවන්) ඵුස්සිතග්ගේ [හෝති] (මල් පිපී බරවේද), [භගවා (භාග්‍යවතුන් වහන්සේ)] පරමං හිතාය (අනුන්ගේ හිතපිණිස) [තථා+උපමං] තථූපමං (එබඳුම ආකාර ඇති)

නිබ්බානගාමිං (නිවනට ගෙනයන්නාවූ) ධම්මවරං (උතුම් ශ්‍රී සද්ධර්මය) අදෙසයි (දේසූසේක), බුද්ධේ (භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ යම්සේ ගිම්හානයේ පළමු මාසයේ වන ගොමුවන් නන්ආකාර මලින් පිරී බරවේද, එලෙසම භාග්‍යවතුන් වහන්සේ අනුන්ගේ හිතපිණිස සතරසතිපට්ටාන ආදී ධර්මයන්ගෙන් පිරිපුන් වූ ද නිවනට ගෙනයන්නාවූ ද උතුම් ශ්‍රී සද්ධර්මය දේසූසේක, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ, අනුත්තරෝ ධම්මවරං අදේසයි;
ඉදම්පි බුද්ධේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ අනුත්තරෝ [භගවා] ධම්මවරං අදේසයි, බුද්ධේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ වරෝ (බුදුබව ලැබීමෙන් උතුම් ශ්‍රේෂ්ඨබවට පතවූ) වරඤ්ඤූ (නිවන් අවබෝධකිරීමෙන්ම උතුම් නිවන පිළිබඳ දන්නාවූ) වරදෝ (සත්ත්වයනට උතුම් විමුක්ති සැප දෙන්නාවූ) වරාහරෝ (උතුම් නිවන්මග ගෙනහැර පාන්නාවූ) අනුත්තරෝ (සියලු දෙවිමිනිසුන්ට වඩා සියලු ගුණයන්ගෙන් උතුම්වූ) [භගවා (භාග්‍යවතුන් වහන්සේ)] ධම්මවරං (උතුම් ශ්‍රී සද්ධර්මය) අදේසයි (දේශනාකල සේක), බුද්ධේ (භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි) [ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ බුදුබව ලැබීමෙන් උතුම් ශ්‍රේෂ්ඨබවට පතවූ නිවන් අවබෝධකිරීමෙන්ම උතුම් නිවන පිළිබඳ දන්නාවූ සත්ත්වයනට උතුම් විමුක්ති සැප දෙන්නාවූ උතුම් නිවන්මග ගෙනහැර පාන්නාවූ සියලු දෙවිමිනිසුන්ට වඩා සියලු ගුණයන්ගෙන් උතුම්වූ භාග්‍යවතුන් වහන්සේ උතුම් ශ්‍රී සද්ධර්මය දේශනාකල සේක, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

14. ඛීණං පුරාණං නව නත්ථි සම්භවං, විරත්තචිත්තායතිකේ භවස්මිං;
තේ ඛීණබීජා අවිරූළ්හිඡන්දා, නිබ්බන්ති ධීරා යථායං පදීපෝ;
ඉදම්පි සඞ්ඝේ රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

• පුරාණං ඛීණං නව සම්භවං නත්ථි, [විරත්ත-චිත්තා+ආයතිකේ] <u>විරත්තචිත්තායතිකේ භවස්මිං</u> (ආයතිකේ භවස්මිං විරත්ත-චිත්තා) , තේ ඛීණ-බීජා අවිරූළ්හි-ඡන්දා ධීරා, [යථා+අයං] යථායං පදීපෝ නිබ්බන්ති, සඞ්ඝේ ඉදම්පි රතනං පණීතං, එතේන සච්චේන සුවත්ථි හෝතු.

★ පුරාණං ඛීණං (අතීත කර්මයන් අනාගජීවිතයක විපාකදීම නවතාදැමුවා වූ ද) නව සම්භවං නත්ථි (වර්ථමානයේ නැවත විපාක දෙන කර්ම රුස්කිරීමක් නැත්තාවූ ද), ආයතිකේ භවස්මිං (අනාගත ජීවිතයෙහි) විරත්ත-චිත්තා (නොඇලුනු සිත ඇත්තාවූ ද), ඛීණ-බීජා (ප්‍රතිසන්ධි සිත නම් උප්පත්තිය ඇතිකරණ බීජය විනාශකලා වූ ද) අවිරූළ්හි-ඡන්දා (නැවත ඉපදීමෙහි ආශාවක් නැති) තේ (ඒ) ධීරා (ධෛර්යවන්තයෝ), [යථා+අයං] යථායං පදීපෝ (මේ පහන මෙන්) නිබ්බන්ති (නිවීයති/ පිරිනිවෙති), සඞ්ඝේ (සංඝයා වහන්සේලා කෙරෙහි)

[ඉදං+අපි]ඉදම්පි (මෙය ද) පණීතං රතනං (උතුම් රත්නබාවයකි) එතේන සච්චේන (මේ සත්‍යය බලයෙන්) සුවත්ථි හෝතු (සෙතක් වේවා)

☞ අතීත කර්මයන් අනාගජීවිතයක විපාකදීම නවතාදැමුවා වූ ද වර්ථමානයේ නැවත විපාක දෙන කර්ම රැස්කිරීමක් නැත්තාවූ ද අනාගත ජීවිතයෙහි නොඇලුනු සිත ඇත්තාවූ ද ප්‍රතිසන්ධි සිත නම් උප්පත්තිය ඇතිකරණ බීජය විනාශකලා වූ ද නැවත ඉපදීමෙහි ආශාවක් නැති ඒ ධෛර්යවන්තයෝ (රහතන් වහන්සේලා) මේ පහන නිවීයන්නාක් මෙන් පිරිනිවෙති, සංඝයා වහන්සේලා කෙරෙහි මෙය ද උතුම් රත්නබාවයකි, මේ සත්‍යය බලයෙන් සෙතක් වේවා

15. යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛේ;
තථාගතං දේවමනුස්සපූජිතං, බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු.

• [යානි+ඉධ] යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛේ, දේවමනුස්ස-පූජිතං, තථාගතං බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු.
භුම්මානි වා අන්තලික්ඛේ වා යානි භූතානි ඉධ සමාගතානි, [මයං] දේවමනුස්ස-පූජිතං, තථාගතං බුද්ධං නමස්සාම [සබ්බේ සත්තානං] සුවත්ථි හෝතු.

★ භුම්මානි වා (පොළොවෙහි වූ හෝ) අන්තලික්ඛේ වා (අහසෙහි වූ හෝ) යානි භූතානි (යම් සත්ත්වයෝ / යම් අමනුස්ස කොට්ටාසයෝ) ඉධ (මෙහි) සමාගතානි (රැස්වූවා ද) [මයං (අපි)] දේවමනුස්ස-පූජිතං (දෙවිමිනිසුන් විසින් පුදන ලද), තථාගතං (තථාගත නම්වූ) බුද්ධං (බුදුරජුන්ට) නමස්සාම (නමස්කාර කරමු) [සබ්බේ සත්තානං (සියලු සත්වයනට)] සුවත්ථි හෝතු (සෙතක් වේවා).

☞ පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුස්ස කොට්ටාසයෝ මෙහි රැස්වූවා ද අපි දෙවිමිනිසුන් විසින් පුදන ලද තථාගත නම්වූ බුදුරජුන්ට නමස්කාර කරමු, සියලු සත්වයනට සෙතක් වේවා.

16. යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛේ;
තථාගතං දේවමනුස්සපූජිතං, ධම්මං නමස්සාම සුවත්ථි හෝතු.

• [යානි+ඉධ] යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛේ, දේවමනුස්ස-පූජිතං, තථාගතං ධම්මං නමස්සාම සුවත්ථි හෝතු.
භුම්මානි වා අන්තලික්ඛේ වා යානි භූතානි ඉධ සමාගතානි, [මයං] දේවමනුස්ස-පූජිතං, තථාගතං ධම්මං නමස්සාම [සබ්බේ සත්තානං] සුවත්ථි හෝතු.

★ භුම්මානි වා (පොළොවෙහි වූ හෝ) අන්තලික්ඛේ වා (අහසෙහි වූ හෝ) යානි භූතානි (යම් සත්ත්වයෝ / යම් අමනුස්ස කොට්ටාසයෝ) ඉධ (මෙහි) සමාගතානි (රැස්වූවා ද) [මයං (අපි)] දේවමනුස්ස-පූජිතං (දෙවිමිනිසුන් විසින් පුදන ලද), තථාගතං (කෙලෙස් දුරුකරමින් නිවනට ගමන්කරවන බැවින් තථාගත නම්වූ) ධම්මං (ධර්මයට) නමස්සාම (නමස්කාර කරමු) [සබ්බේ සත්තානං (සියලු සත්වයනට)] සුවත්ථි හෝතු (සෙතක් වේවා).

☞ පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුස්ස කොට්ටාසයෝ මෙහි රැස්වූවා ද අපි දෙවිමිනිසුන් විසින් පුදන ලද කෙලෙස් දුරුකරමින් නිවනට ගමන්කරවන බැවින් තථාගත නම්වූ ධර්ම රත්නයට නමස්කාර කරමු, සියලු සත්වයනට සෙතක් වේවා.

17. යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ;
තථාගතං දේවමනුස්සපූජිතං, සංඝං නමස්සාම සුවත්ථි හෝතු.

• [යානි+ඉධ] යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ, දේවමනුස්ස-පූජිතං, තථාගතං සංඝං නමස්සාම සුවත්ථි හෝතු.
භුම්මානි වා අන්තලික්ඛෙ වා යානි භූතානි ඉධ සමාගතානි, [මයං] දේවමනුස්ස-පූජිතං, තථාගතං සංඝං නමස්සාම [සබ්බෙ සත්තානං] සුවත්ථි හෝතු.

★ භුම්මානි වා (පොළොවෙහි වූ හෝ) අන්තලික්ඛෙ වා (අහසෙහි වූ හෝ) යානි භූතානි (යම් සත්ත්වයෝ / යම් අමනුස්ස කොට්ඨාසයෝ) ඉධ (මෙහි) සමාගතානි (රැස්වූවා ද) [මයං (අපි)] දේවමනුස්ස-පූජිතං (දෙවිමිනිසුන් විසින් පුදන ලද), තථාගතං (ඒ ඒ මර්ගයෙන් කෙලෙස් දුරුකරමින් නිවනට යන බැවින් තථාගත නම්වූ) සංඝං (සංඝයාට) නමස්සාම (නමස්කාර කරමු) [සබ්බෙ සත්තානං (සියලු සත්වයනට)] සුවත්ථි හෝතු (සෙතක් වේවා).

☞ පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුස්ස කොට්ඨාසයෝ මෙහි රැස්වූවා ද අපි දෙවිමිනිසුන් විසින් පුදන ලද ඒ ඒ මර්ගයෙන් කෙලෙස් දුරුකරමින් නිවනට යන බැවින් තථාගත නම්වූ සංඝරත්නයට නමස්කාර කරමු, සියලු සත්වයනට සෙතක් වේවා.

<u>මෙත්තසුත්තං</u>

1. කරණීයමත්ථකුසලේන, යන්තං සන්තං පදං අභිසමෙච්ච;
සක්කෝ උජූ ච සුජූ ච, සුවචෝ චස්ස මුදු අනතිමානී.

• [කරණීයං+අත්ථ-කුසලේන] කරණීයමත්ථකුසලේන, [යං+තං] යන්තං සන්තං පදං අභිසමෙච්ච, සක්කෝ උජූ ච සුජූ ච, සුවචෝ [ච+අස්ස] චස්ස මුදූ අනතිමානී.

සන්තං පදං අභිසමෙච්ච [විහරිතුකාමේන] යං කරණීයං, අත්ථ-කුසලේන තං කරණීයං, [සෝ] සක්කෝ අස්ස උජූ ච අස්ස සුජූ ච අස්ස, සුවචෝ ච අස්ස මුදූ අස්ස අනතිමානී අස්ස.

★ සන්තං පදං (ශාන්තවූ නිවනට) අභිසමෙච්ච (පැමිණ/ අවබෝධකර) [විහරිතුකාමේන (විසීමට කැමැත්තා විසින්)] යං කරණීයං (යමක් කලයුතු ද), අත්ථ-කුසලේන (තම සුභසිද්ධියෙහි දක්ෂයා විසින්) තං කරණීයං (එය කලයුතුය), [සෝ (ඔහු)] සක්කෝ අස්ස (තමකටයුත්තේ උත්සහවත්වීමෙහි දක්ෂ වන්නේය) උජූ ච අස්ස (ඍජු අවංක ද වන්නේය) සුජූ ච අස්ස (අතිශයින්ම ඍජු අවංක ද වන්නේය) සුවචෝ ච අස්ස (ධාර්මික අවවාදයෙහි සුවචකීකරු ද වන්නේය) මුදූ අස්ස (ධාර්මික දේ කෙරෙහි මෘදු වන්නේය) අනතිමානී අස්ස (නිහතමානී වන්නේය).

☞ ශාන්තවූ නිවන අවබෝධකර විසීමට කැමැත්තා විසින් යමක් කලයුතු ද තම සුභසිද්ධියෙහි දක්ෂයා විසින් එය කලයුතුය, ඔහු තමකටයුත්තේ උත්සහවත්වීමෙහි දක්ෂ වන්නේය, ඍජු අවංක වන්නේය, අතිශයින්ම ඍජු අවංක වන්නේය, ධාර්මික අවවාදයෙහි සුවචකීකරු වන්නේය, ධාර්මික දේ කෙරෙහි මෘදු වන්නේය, නිහතමානී වන්නේය.

2. සන්තුස්සකෝ ච සුභරෝ ච, අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති;
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච, අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ.

• සන්තුස්සකෝ අස්ස ච සුභරෝ ච අස්ස, අප්පකිච්චෝ ච අස්ස සල්ලහුක-වුත්ති අස්ස, සන්තින්ද්‍රියෝ ච අස්ස නිපකෝ ච අස්ස, අප්පගබ්භෝ අස්ස කුලේසු අනනුගිද්ධෝ අස්ස

★ සන්තුස්සකෝ ච අස්ස (ලද දෙයින් සතුටුවන්නෙක් ද වන්නේය) සුභරෝ ච අස්ස (පහසුවෙන් පෝෂණය කලහැක්කෙක් ද වන්නේය), අප්පකිච්චෝ ච අස්ස (භාවනාවෙන් පරිබාහිරවූ ස්වල්ප කටයුතු ඇත්තෙක් වන්නේය) සල්ලහුක-වුත්ති අස්ස (අවශ්‍යම පිරිකර පමණක් ඇති සැහැල්ලු ගතිපැවතුම් ඇත්තෙක් ද වන්නේය), සන්තින්ද්‍රියෝ ච අස්ස (සන්සුන් ඉඳුරන් ඇත්තෙක් ද වන්නේය) නිපකෝ ච අස්ස (තමකටයුතු සිදුකිරීමෙහි නුවණැත්තෙක් වන්නේය), අප්පගබ්භෝ අස්ස (දැඩි ගතිපැවතුම් ඇති අසංවර වූවෙක් නොවන්නේය) කුලේසු අනනුගිද්ධෝ අස්ස (දායක කුලයන් කෙරෙහි / දායක පිරිස් කෙරෙහි නොඇලුනෙක් වන්නේය)

☞ ලද දෙයින් සතුටුවන්නෙක් වන්නේය, පහසුවෙන් පෝෂණය කලහැක්කෙක් වන්නේය, භාවනාවෙන් පරිබාහිරවූ ස්වල්ප කටයුතු ඇත්තෙක් වන්නේය, අවශ්‍යම පිරිකර පමණක් ඇති සැහැල්ලු ගතිපැවතුම් ඇත්තෙක් වන්නේය, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වන්නේය, තමකටයුතු සිදුකිරීමෙහි නුවණැත්තෙක් වන්නේය, දැඩි ගතිපැවතුම් ඇති අසංවර වූවෙක් නොවන්නේය, දායක කුලයන් කෙරෙහි / දායක පිරිස් කෙරෙහි නොඇලුනෙක් වන්නේය.

3. න ච ඛුද්දං සමාචරේ කිඤ්චි, යෙන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං;
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු, සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.

• යෙන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං, [තං] කිඤ්චි ඛුද්දං ච න සමාචරේ, සබ්බේ සත්තා සුඛිනෝ හොන්තු, ඛේමිනෝ හොන්තු, සුඛිතත්තා භවන්තු

★ යෙන (යමකින්/ යම්කරුණක් නිසා) විඤ්ඤූ පරේ (නුවණැති අන්‍යයන්) උපවදෙය්‍යුං (නින්දා කරත් ද), [තං] කිඤ්චි ඛුද්දං ච (එබඳුවූ කිසියම් කුඩාවූ වරදක්වත්) න සමාචරේ (නොකරන්නේය), සබ්බේ සත්තා (සියලු සත්ත්වයෝ) සුඛිනෝ හොන්තු (සැපඇත්තෝ වෙත්වා), ඛේමිනෝ හොන්තු (භියනැත්තෝ වෙත්වා), සුඛිතත්තා භවන්තු (සුවපත්වූ සිත් ඇත්තෝ වෙත්වා!)

☞ යම්කරුණක් නිසා නුවණැති අන්‍යයන් නින්දා කරත් ද එබඳුවූ කිසියම් කුඩාවූ වරදක්වත් නොකරන්නේය. සියලු සත්ත්වයෝ සැපඇත්තෝ වෙත්වා, භියනැත්තෝ වෙත්වා, සුවපත්වූ සිත් ඇත්තෝ වෙත්වා!

4. යේ කේචි පාණභූතත්ථි, තසා වා ථාවරා වා අනවසේසා;
දීඝා වා යේ මහන්තා වා, මජ්ඣිමා රස්සකා’ණුකථූලා.

• තසා වා ථාවරා වා, යේ කේචි [පාණභූතා+අත්ථි] පාණභූතත්ථි අනවසේසා, යේ දීඝා වා මහන්තා වා, මජ්ඣිමා [රස්සකා+අණුක-ථූලා] රස්සකා’ණුකථූලා

★ තසා වා (කෙලෙස් සහිත බැවින් තැතිගන්නාසුලු වූ ද) ථාවරා වා (කෙලෙස් දුරුකලහෙයින් ස්ථාවරවූ ද), යේ කේචි (යම්කිසි) [පාණභූතා+අත්ථි] පාණභූතත්ථි (සත්ත්වයෝ ඇත්ද) අනවසේසා (ශේෂයක් නැතිව [ඒ සියලු දෙනාද]), යේ දීඝා වා මහන්තා වා (යම් දීර්ඝ සිරුරු ඇත්තෝ ද විශාල සිරුරු ඇත්තෝ ද), මජ්ඣිමා (මධ්‍යම ප්‍රමාණ සිරුරු ඇත්තෝ ද)

රස්සකා'ණුකථූලා [රස්සකා+අණුක-ථූලා] (මිටි සිරුරු ඇත්තෝ ද සියුම් සිරුරු ඇත්තෝ ද මහත සිරුරු ඇත්තෝ ද)

☞ කෙලෙස් සහිත බැවින් තැතිගන්නාසුලු වූ ද කෙලෙස් දුරුකලහෙයින් ස්ථාවරවූ ද යම්කිසි සත්ත්වයෝ ඇත්ද ශේෂයක් නැතිව ඒ සියලු දෙනා ද දීර්ඝ සිරුරු ඇත්තෝ ද විශාල සිරුරු ඇත්තෝ ද මධ්‍යම ප්‍රමාණ සිරුරු ඇත්තෝ ද මිටි සිරුරු ඇත්තෝ ද සියුම් සිරුරු ඇත්තෝ ද මහත සිරුරු ඇත්තෝ ද

5. දිට්ඨා වා යේව අදිට්ඨා, යේ ච දූරේ වසන්ති අවිදූරේ;
හූතා වා සම්භවේසී වා, සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.

• යේව දිට්ඨා අදිට්ඨා වා, යේ ච දූරේ වසන්ති අවිදූරේ [වසන්ති], භූතා වා සම්භවේසී වා, සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

★ යේව දිට්ඨා (යම් දක්නාලද හෝ) අදිට්ඨා වා (නොදක්නා ලද හෝ), යේ ච දූරේ වසන්ති (යම් දුරවසන හෝ) අවිදූරේ [වසන්ති] (ලග වසන හෝ), භූතා වා (ඉපදීම අවසන්කල හෝ) සම්භවේසී වා (මතු ඉපදෙන හෝ), සබ්බේ සත්තා (සියලු සත්ත්වයෝ) භවන්තු සුඛිතත්තා (සුවපත්වූ සිත් ඇත්තෝ වෙත්වා!)

☞ දක්නාලද හෝ නොදක්නා ලද හෝ දුරවසන හෝ ලග වසන හෝ ඉපදීම අවසන්කල හෝ මතු ඉපදෙන හෝ සියලු සත්ත්වයෝ සුවපත්වූ සිත් ඇත්තෝ වෙත්වා!

6. න පරෝ පරං නිකුබ්බේථ, නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා, නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.

• පරෝ පරං න නිකුබ්බේථ, කත්ථචි නං කඤ්චි [න+අතිමඤ්ඤේථ] නාතිමඤ්ඤේථ, <u>[න+අඤ්ඤං+අඤ්ඤස්ස] නාඤ්ඤමඤ්ඤස්ස බ්‍යාරෝසනාය පටිඝසඤ්ඤාය [දුක්ඛං+ඉච්ඡෙය්‍ය] දුක්ඛමිච්ඡෙය්‍ය.</u>
(අඤ්ඤං අඤ්ඤස්ස බ්‍යාරෝසනාය වා පටිඝසඤ්ඤාය වා දුක්ඛං න ඉච්ඡෙය්‍ය)

★ පරෝ පරං (අනිකෙක් අනිකෙකු) න නිකුබ්බේථ (නොරවටත්වා), කත්ථචි (කිසිතැනක) නං කඤ්චි (ඒ කිසිවෙකුට) [න+අතිමඤ්ඤේථ] නාතිමඤ්ඤේථ (අවමන් නොකරත්වා), අඤ්ඤං අඤ්ඤස්ස (එකෙක් අනිකෙකුට) බ්‍යාරෝසනාය වා (රැවීම් ගෙරවීම් ආදියෙන් හෝ) පටිඝසඤ්ඤාය වා (ක්‍රෝධ සිතින් හෝ) දුක්ඛං (දුකක්) න ඉච්ඡෙය්‍ය (නොකැමති වේවා)

☞ අනිකෙක් අනිකෙකු නොරවටත්වා, කිසිතැනක ඒ කිසිවෙකුට අවමන් නොකරත්වා, එකෙක් අනිකෙකුට රැවීම් ගෙරවීම් ආදියෙන් හෝ ක්‍රෝධ සිතින් හෝ දුකක් නොකැමති නො වේවා!

7. මාතා යථා නියං පුත්තං ආයුසා එකපුත්තමනුරක්ඛේ;
එවම්පි සබ්බභූතේසු, මානසං භාවයේ අපරිමාණං.

• <u>යථා මාතා නියං පුත්තං ආයුසා [එකං+පුත්තං+අනුරක්ඛේ] එකපුත්තමනුරක්ඛේ</u> (යථා මාතා නියං එකං පුත්තං ආයුසා අනුරක්ඛේ), එවම්පි සබ්බ-භූතේසු, අපරිමාණං [මෙත්තං] මානසං භාවයේ.

★ යථා (යම්සේ) මාතා (මව) නියං (තමාගේ) එකං (එකම) පුත්තං (පුතු) ආයුසා (දිවිදෙවැනි කොට) අනුරක්ඛේ (රකින්නේද), එවම්පි (එලෙසම/ ඒ ආකාරයටම) සබ්බ-භූතේසු (සියලු සත්ත්වයන් කෙරෙහි) අපරිමාණං (අප්‍රමාණවූ) [මෙත්තං] මානසං (මෛත්‍රී සිත) භාවයේ (වඩන්න).

☞ යම්සේ මව තමාගේ එකම පුතු දිවිදෙවැනි කොට රකින්නේද ඒ ආකාරයටම සියලු සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණවූ මෛත්‍රී සිත වඩන්න.

8. මෙත්තඤ්ච සබ්බලෝකස්මිං, මානසං භාවයේ අපරිමාණං;
උද්ධං අධෝ ච තිරියඤ්ච, අසම්බාධං අවේරං අසපත්තං.

• අසම්බාධං අවේරං අසපත්තං අපරිමාණං [මෙත්තං+ච] මෙත්තඤ්ච මානසං උද්ධං අධෝ ච [තිරියං+ච] තිරියඤ්ච, සබ්බ-ලෝකස්මිං භාවයේ.

★ අසම්බාධං (බාදාවක් නැති/ සීමාවක් නැති) අවේරං (වෛරයක් නැති/ අතරතුර වෛරසිත් නැති) අසපත්තං (සතුරන් නැති/ සතුරු සිත් නැති) අපරිමාණං (අප්‍රමාණවූ) මෙත්තං මානසං ච (මෛත්‍රීසිත ද) උද්ධං අධෝ ච (උඩට ද යටට ද) [තිරියං+ච] තිරියඤ්ච (තිරසට ද/ අට දිශාවට ද), සබ්බ-ලෝකස්මිං (සියලු ලෝකයෙහි/ සියලු සත්ත්ව ලෝකයෙහි) භාවයේ (වඩන්න).

☞ සීමාවක් නැති අතරතුර වෛරසිත් නැති සතුරු සිත් නැති මෛත්‍රීසිත උඩට ද යටට ද තිරසට ද සියලු සත්ත්ව ලෝකයකෙරෙහි වඩන්න

9. තිට්ඨං චරං නිසින්නෝ වා , සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
එතං සතිං අධිට්ඨෙය්‍ය, බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු.

• තිට්ඨං චරං නිසින්නෝ වා සයානෝ වා [යාවතා+අස්ස] යාවතස්ස [තාවතා] විගත-මිද්ධෝ [හුත්වා] එතං සතිං අධිට්ඨෙය්‍ය, [බ්‍රහ්මං+ඒතං] බ්‍රහ්මමේතං විහාරං [ඉධ+ආහු] ඉධමාහු.

යාවතා තිට්ඨං චරං නිසින්නෝ වා සයානෝ වා [ඉරියාපථෝ] අස්ස, තාවතා විගත-මිද්ධෝ හුත්වා එතං සතිං අධිට්ඨෙය්‍ය, ඒතං ඉධ බ්‍රහ්මං විහාරං ආහු.

★ යාවතා (යම්තාක්) තිට්ඨං (සිටින) චරං (ඇවිදින) නිසින්නෝ වා (හිඳින හෝ) සයානෝ වා (නිදන හෝ) [ඉරියාපථෝ] අස්ස (ඉරියව් වන්නේ ද), තාවතා (ඒ සියල්ලේ) විගත-මිද්ධෝ හුත්වා (නිදි දුරුකරන ලද්දෙක්ව) එතං සතිං (මේ සිහිය/ මේ මෛත්‍රීසහගත සිහිය) අධිට්ඨෙය්‍ය (පවත්වන්නේය), ඒතං (මෙය) ඉධ (මෙහි/ මේ බුද්ධශාසනයේ) බ්‍රහ්මං විහාරං (ශ්‍රේෂ්ඨ වාසයකිරීමක් යැයි) ආහු (කීහ/ බුද්ධාදී උතුමෝ කීහ).

☞ යම්තාක් සිටින ඇවිදින හිඳින නිදන හෝ ඉරියව් වන්නේ ද ඒ සියල්ලේම නිදි දුරුකරන ලද්දෙක්ව, මේ මෛත්‍රීසහගත සිහිය පවත්වන්නේය මේ බුද්ධශාසනයේ මෙය ශ්‍රේෂ්ඨ වාසයකිරීමක් යැයි බුද්ධාදී උතුමෝ කීහ.

10 . දිට්ඨිං ච අනුපග්ගම්ම, සීලවා දස්සනේන සම්පන්නෝ;
කාමේසු විනෙය්‍ය ගෙධං, න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති.

• දිට්ඨිං ච අනුපග්ගම්ම, දස්සනේන සම්පන්නෝ සීලවා, කාමේසු ගෙධං විනෙය්‍ය, ජාතු ගබ්භසෙය්‍යං න හි [පුන+ඒති+ඉති] පුනරේතීති. (ජාතු පුන ගබ්භසෙය්‍යං නහි ඒති)

★ දිට්ඨිං ච (සක්කාය දිට්ඨිය ආදි දෘෂ්ඨියකට) අනුපග්ගම්ම (නොපැමිණ), දස්සනේන සම්පන්නෝ (සෝවාන් ඵලය ලැබූවෙක්ව), සීලවා (සිල්වත්ව/ ලෝකුත්තර ශීලයෙන් සිල්වත්ව), කාමේසු ගෙධං විනෙය්‍ය (කාමයන්හි ගිජුබව දුරුකර [අනාගාමී ඵලයට පැමිණ]), ජාතු (ඒකාන්තයෙන්ම) පුන (නැවත) ගබ්භසෙය්‍යං (මව්ගැබක වාසයට) නහි ඒති (නොඑන්නේය.)

☞ සක්කාය දිට්ඨිය ආදි දෘෂ්ඨියකට නොපැමිණ, සෝවාන් ඵලය ලැබූවෙක්ව, ලෝකුත්තර ශීලයෙන් සිල්වත්ව, කාමයන්හි ගිජුබව දුරුකර අනාගාමී ඵලයට පැමිණ, ඒකාන්තයෙන්ම නැවත මව්ගැබක වාසයට නොඑන්නේය.

<u>ජය මංගලගාථා</u>

1. බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං
ගිරිමේඛලං උදිතඝෝර සසේන මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

• බාහුං [සහස්සං+අභිනිම්මිතං+සහ+ආයුධං] සහස්සමභිනිම්මිතසායුධං තං ගිරිමේඛලං උදිතඝෝර [සහ+සේන] සසේන මාරං මුනින්දෝ දානාදි ධම්ම විධිනා ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

තං සහ ආයුධං බාහුං සහස්සං අභිනිම්මිතං උදිතඝෝර සේන සහ ගිරිමේඛලං මාරං මුනින්දෝ දානාදි ධම්ම විධිනා ජිතවා හෝති, තං තේජසා තේ ජයමංගලානි භවතු

★ තං (ඒ) සහ ආයුධං (අයුධ සහිතව) බාහුං සහස්සං (අත්දහසක්) අභිනිම්මිතං (මවාගෙන) උදිතඝෝර සේන සහ (මොරදෙන සේනාව සහිත) ගිරිමේඛලං (ගිරිමේඛලා ඇතුමත සිටින) මාරං (මාරයාව) මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) දානාදි (දානාදී) ධම්ම (පාරමී ධර්ම) විධිනා (විදිහෙන්/ බලෙන්) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ ඒ අයුධ සහිතව අත්දහසක් මවාගෙන, මොරදෙන සේනාව සහිතව ගිරිමේඛලා ඇතුමත සිටින මාරයාව, මුනින්ද්‍රයන් වහන්සේ දානාදී පාරමී ධර්ම බලෙන් දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

2. මාරාතිරේක මභියුජ්ඣිත සබ්බ රත්තිං
ඝෝරම්පනාලවක මක්ඛ මථද්ධ යක්ඛං
ඛන්ති සුදන්ත විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි

• [මාරං+අතිරේකං+අභියුජ්ඣිතං+සබ්බං+රත්තිං] මාරාතිරේකමභියුජ්ඣිතසබ්බරත්තිං [ඝෝරං+පන+ආලවකං+අක්ඛං+ථද්ධං+යක්ඛං] ඝෝරම්පනාලවකමක්ඛමථද්ධයක්ඛං

මුනින්දෝ සුදන්ත ඛන්තී දානාදි ධම්ම විධිනා ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

අතිරේකං පන මාරං සබ්බං රත්තිං අභියුජ්ඣිතං ඝෝරං අක්ඛං ථද්ධං ආලවකං යක්ඛං මුනින්දෝ සුදන්ත ඛන්තී විධිනා ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

★ අතිරේකං පන මාරං (අතිරේක මාරයෙක් බඳුවූ / දෙවැනි මාරයෙක් බඳුවූ) සබ්බං රත්තිං අභියුජ්ඣිතං (මුලුරැයක් අතිශයින් යුධකලාවූ) ඝෝරං (ඝෝරවූ) අක්ඛං (මැඩියනොහැක්කාවූ / යටත්කල නොහැක්කා වූ) ථද්ධං (දැඩිවූ) ආලවකං යක්ඛං (ආලවක යක්ෂයාව) මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) සුදන්ත ඛන්තී (මනාව හික්මවන ලද ක්ෂාන්ති / මනාව පරුදුකල ඉවසීමේ) විධිනා (විදිහෙන්/ බලෙන්) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ දෙවැනි මාරයෙක් මෙන් මුලුරැයක් අතිශයින් යුධකලාවූ ඝෝරවූ යටත්කල නොහැක්කා වූ දැඩිවූ ආලවක යක්ෂයාව, මුනින්ද්‍රයන් වහන්සේ මනාව පරුදුකල ක්ෂාන්තිය නම් ඉවසීමේ බලෙන් දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

3. නාලාගිරිං ගජවරං අතිමත්ත භූතං
   දාවග්ගි චක්ක මසනීව සුදාරුණං තං
   මෙත්තම්බු සේක විධිනා ජිතවා මුනින්දෝ
   තං තේජසා භවතු තේ ජයමංගලානි

• නාලාගිරිං ගජවරං අතිමත්තභූතං [දාවග්ගිචක්කං+අසනි+ඉව] දාවග්ගිචක්කමසනීව සුදාරුණං තං මුනින්දෝ [මෙත්ත+අම්බු-සේක] මෙත්තම්බුසේක විධිනා ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

දාවග්ගිචක්කං ඉව අසනි ඉව තං අතිමත්තභූතං සුදාරුණං නාලාගිරිං ගජවරං මුනින්දෝ [මෙත්ත+අම්බු-සේක] මෙත්තම්බුසේක විධිනා ජිතවා හෝති, තං තේජසා තේ ජයමංගලානි භවතු

★ දාවග්ගි-චක්කං ඉව (කැරකෙ ලැව්ගින්නක් බඳුවූ) අසනි ඉව (අකුනක් මෙන් වූ) තං අතිමත්තභූතං (ඒ අතිශයින් මත්වූ) සුදාරුණං (අතිශයින් දරුණුවූ) නාලාගිරිං ගජවරං (නාලාගිරි නම් බියකරු ඇතු) මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) [මෙත්ත+අම්බු-සේක] මෙත්තම්බුසේක (මෛත්‍රී නම් දියදයරා ඉසීමේ / මෙත්දිය දහරාවේ) විධිනා (විදිහෙන්/ බලෙන්) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ කැරකැවී එන ලැව්ගින්නක් බඳුවූ ද අකුනක් මෙන් වූ ද ඒ අතිශයින් මත්වූ අතිශයින් දරුණුවූ නාලාගිරි නම් බියකරු ඇතු, මුනින්ද්‍රයන් වහන්සේ මෙත්දිය දහරාවේ බලෙන් දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

4. උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදාරුණං තං
   ධාවං තියෝජන පථං ගුලිමාල වන්තං
   ඉද්ධීභිසංඛත මනෝ ජිතවා මුනින්දෝ
   තං තේජසා භවතු තේ ජයමංගලානි.

• [උක්ඛිත්ත+ඛග්ගං+අති+හත්ථ] උක්ඛිත්තඛග්ගමතිහත්ථ තියෝජන-පථං ධාවං තං සුදාරුණං ගුලිමාලවන්තං මුනින්දෝ මනෝ [ඉද්ධිහි+අභිසංඛත] ඉද්ධීභිසංඛත ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

★ [උක්ඛිත්ත+ඛග්ගං+අති+හත්ථ] උක්ඛිත්තඛග්ගමතිහත්ථ (ඔසවාගත් කඩුවක් අතැතිව) තියෝජන-පථං (තුන්යොදුන් මගක්) ධාවං (දුවන/ දිව්ව) තං සුදාරුණං (ඒ අතිශයින් දරුණුවූ) ගුලිමාලවන්තං (ඇඟිලි මාලා පැළඳ ඇති අංගුලිමාලව) මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) මනෝ (මනසින්) [ඉද්ධිහි+අභිසංඛත] ඉද්ධීභිසංඛත (ඍද්ධි ප්‍රාතිහාර්ය පා) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ ඇඟිලි මාලා පැළඳ ඔසවාගත් කඩුවක් අතැතිව තුන්යොදුන් මගක් දිව්ව ඒ අතිශයින් දරුණුවූ අංගුලිමාලව , මුනින්ද්‍රයන් වහන්සේ මනසින් ඍද්ධි ප්‍රාතිහාර්ය පා දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

5. කත්වාන කට්ඨ මුදරං ඉව ගබ්භිනීයා
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣේ
සන්තේන සෝම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි.

• ජනකාය මජ්ඣේ [කට්ඨං+උදරං] කට්ඨමුදරං [අත්තානං] ගබ්භිනීයා ඉව කත්වාන චිඤ්චාය දුට්ඨ වචනං මුනින්දෝ සෝම සන්තේන විධිනා ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

★ ජනකාය මජ්ඣේ (මහජනයා මැද) [කට්ඨං+උදරං] කට්ඨමුදරං (දරකෑලි බඩක් ඇතිව / බඩේ දරකෑලි බැඳගෙන) [අත්තානං](තමා) ගබ්භිනීයා ඉව කත්වාන (ගැබිනියක් මෙන් කොට / ගැබිනියක් මෙන් රඟදක්වන) චිඤ්චාය (චිඤ්චි මානවිකාවගේ) දුට්ඨ වචනං (දුෂ්ඨ වචන) මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) සෝම සන්තේන (ශාන්ත භාවයේ) විධිනා (විදිහෙන්/ බලෙන්) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ මහජනයා මැද බඩේ දරකෑලි බැඳගෙන තමා ගැබිනියක් මෙන් රඟදක්වන චිඤ්චි මානවිකාවගේ දුෂ්ඨ වචන, මුනින්ද්‍රයන් වහන්සේ ශාන්ත භාවයේ බලෙන් දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

6. සච්චං විහාය මතිසච්චක වාද කේතුං
වාදාභිරෝපිතමනං අති අන්ධභූතං
පඤ්ඤාපදීප ජලිතෝ ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි.

• සච්චං විහාය [වාද+අභිරෝපිත-මනං] වාදාභිරෝපිතමනං අති අන්ධභූතං වාදකේතුං මති-සච්චකං මුනින්දෝ පඤ්ඤා-පදීප ජලිතෝ ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

★ සච්චං විහාය (සත්‍යය හැරදමා) [වාද+අභිරෝපිත-මනං] වාදාභිරෝපිතමනං (වාදකිරීමේ සිතින් / වාදකර දිනීමේ සිතින්) අති අන්ධභූතං (අතිශයින් මුලාවූ) වාදකේතුං (වාදකිරීමේ අතිදක්ෂයා වූ) මති-සච්චකං (නුවණැති සච්චකව) පඤ්ඤා-පදීප ජලිතෝ (ප්‍රඥාව නැමති පහන දල්වන ලද) මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ සත්‍යය හැරදමා වාදකර දිනීමේ සිතින් අතිශයින් මුලාවූ වාදකිරීමේ අතිදක්ෂයා වූ නුවණැති සච්චකව, ප්‍රඥාව නැමති පහන දල්වන ලද මුනින්ද්‍රයන් වහන්සේ දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

7. නන්දෝපනන්ද භුජගං විබුධං මහිද්ධිං
   පුත්තේන ථේර භුජගේන දමාපයන්තෝ
   ඉද්ධූප දේස විධිනා ජිතවා මුනින්දෝ
   තං තේජසා භවතු තේ ජයමංගලානි.

• මුනින්දෝ විබුධං මහිද්ධිං නන්දෝපනන්ද භුජගං පුත්තේන ථේර භුජගේන [ඉද්ධි+උපදේස] ඉද්ධූපදේස විධිනා දමාපයන්තෝ ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

★ මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) විබුධං (පණ්ඩිතවූ) මහිද්ධිං (ඍද්ධිමත්) නන්දෝපනන්ද භුජගං (නන්දෝපනන්ද නාගයාව) පුත්තේන ථේර භුජගේන (පුත්‍රවූ ස්ථවිර නාගයා ලවා) [ඉද්ධි+උපදේස] ඉද්ධූපදේස විධිනා (ඍද්ධිපෑමේ උපදේශදීමෙන්) දමාපයන්තෝ (දමනයකරමින්) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ මුනින්ද්‍රයන් වහන්සේ, පණ්ඩිතවූ ඍද්ධිමත් නන්දෝපනන්ද නාගයාව තම පුත්‍රවූ ස්ථවිර නාගයා ලවා [මහා මුගලන් හිමි ලවා] ඍද්ධිපෑමේ උපදේශදීමෙන් දමනයකරමින් දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

8. දුග්ගාහ දිට්ඨී භුජගේන සුදට්ඨ හත්ථං
   බ්‍රහ්මං විසුද්ධි ජුති මිද්ධි බකාභිධානං
   ඤාණාගදේන විධිනා ජිතවා මුනින්දෝ
   තං තේජසා භවතු තේ ජයමංගලානි.

• දුග්ගාහ දිට්ඨී භුජගේන සුදට්ඨ හත්ථං [විසුද්ධි-ජුතිං+ඉද්ධි-බක+අභිධානං] විසුද්ධිජුතිමිද්ධිබකාභිධානං බ්‍රහ්මං මුනින්දෝ ඤාණාගදේන විධිනා ජිතවා [හෝති] තං තේජසා තේ ජයමංගලානි භවතු

★ දුග්ගාහ (වැරදි ලෙස ගන්නාලද) දිට්ඨී භුජගේන (දෘෂ්ඨිය නැමති සර්පයා විසින්) සුදට්ඨ හත්ථං (අතිශයින් දරුණුලෙස දෂ්ඨකරන ලද අතින් යුතුව) විසුද්ධි-ජුතිං (සුදු ආලෝකයෙන් බබළන) ඉද්ධි (ඍද්ධිමත්) බක-අභිධානං බ්‍රහ්මං (බක නම් බ්‍රහ්මයාව) මුනින්දෝ (මුනින්ද්‍රයන් වහන්සේ) ඤාණාගදේන විධිනා (ඤාණය නැමති ඖෂධ බලයෙන්) ජිතවා [හෝති] (දිනූසේක) තං තේජසා (ඒ තේජසින්) තේ (ඔබට) ජයමංගලානි භවතු (ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ වැරදි දෘෂ්ඨිය නැමති සර්පයා විසින් අතිශයින් දරුණුලෙස දෂ්ඨකරන ලද අතින් යුතුව සුදු ආලෝකයෙන් බබළන ඍද්ධිමත් බක නම් බ්‍රක්මයාව, මුනින්ද්‍රයන් වහන්සේ ඤාණය නැමති ඖෂදයෙන් දිනූසේක, ඒ තේජසින් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

9. ඒතාපි බුද්ධ ජය මංගල අට්ඨ ගාථා
යෝ වාචකෝ දින දිනේ සරතේ මතන්දි
හිත්වාන නේක විවිධානි චුපද්ද වානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍යා නරෝ සපඤ්ඤො

• ඒතාපි බුද්ධ ජය මංගල ගාථා අට්ඨ යෝ වාචකෝ දින දිනේ සරතේ ම+අතන්දි [සෝ] සපඤ්ඤො නරෝ නේක විවිධානි [ච+උපද්දවානි] චුපද්දවානි හිත්වාන මොක්ඛං සුඛං අධිගමෙය්‍යා.

★ ඒතාපි (මේ) බුද්ධ ජය මංගල ගාථා අට්ඨ (බුද්ධ ජය මංගල ගාථා අට) යෝ වාචකෝ (යම් කියවන්නෙක්) දින දිනේ (දිනක් දිනක්පාසා) සරතේ ම+අතන්දි (කම්මැලි නොවී / කුසීත නොවී සිහිකරන්නේ නම්) [සෝ] සපඤ්ඤො නරෝ (ඒ නුවණැති මිනිසා) නේක විවිධානි (නොයෙන් ආකාර වූ) [ච+උපද්දවානි] චුපද්දවානි (උපද්‍රවයන් ද) හිත්වාන (දුරුකර) මොක්ඛං සුඛං (මෝක්ෂ සැප / නිවන් සැප) අධිගමෙය්‍යා (ලබන්නේය).

☞ මේ බුද්ධ ජය මංගල ගාථා අට යම් කියවන්නෙක් දිනක් දිනක්පාසා කුසීත නොවී සිහිකරන්නේ නම්, ඒ නුවණැති මිනිසා නොයෙන් ආකාරයේ වූ උපද්‍රවයන් දුරුකර නිවන් සැප ලබන්නේය

<u>මහා ජයමංගල ගාථා</u>

1. මහා කාරුණිකෝ නාථෝ හිතාය සබ්බ පාණිනං
පූරෙත්වා පාරමී සබ්බා පත්තෝ සම්බෝධි මුත්තමං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං . / / /

• මහා කාරුණිකෝ නාථෝ සබ්බ පාණිනං හිතාය, සබ්බා පාරමී පූරෙත්වා [සම්බෝධිං+උත්තමං] සම්බෝධිමුත්තමං පත්තෝ, ඒතේන සච්ච වජ්ජේන තේ ජයමංගලං හෝතු

★ මහා කාරුණිකෝ නාථෝ (මහා කාරුණිකවූ මුනින්ද්‍රයන් වහන්සේ) සබ්බ පාණිනං හිතාය (සියලු සත්ත්වයනට හිතපිණිස), සබ්බා පාරමී පූරෙත්වා (සියලු පාරමි පුරා) [සම්බෝධිං+උත්තමං] සම්බෝධිමුත්තමං පත්තෝ (උතුම් සම්බෝධියට පැමිණියේය / උතුම් බුදුබවට පත්වූයේය), ඒතේන සච්ච වජ්ජේන (මේ සත්‍යය වචනයෙන්) තේ ජයමංගලං හෝතු (ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ මහා කාරුණිකවූ මුනින්ද්‍රයන් වහන්සේ සියලු සත්ත්වයනට හිතපිණිස සියලු පාරමි පුරා උතුම් බුදුබවට පත්වූයේය, මේ සත්‍යය වචනයෙන් ඔබට ජයමංගලයක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

2. ජයන්තෝ බෝදියා මූලේ සක්‍යානං නන්දි වද්ධනෝ
ඒවං තුය්හං ජයෝ හෝතු ජයස්සු ජයමංගලං . / / /

• සක්‍යානං නන්දි වද්ධනෝ [භගවා] බෝදියා මූලේ ජයන්තෝ ජයමංගලං ජයස්සු ඒවං තුය්හං ජයෝ හෝතු

★ සක්‍යානං (සාක්‍යයන්ගේ) නන්දි වද්ධනෝ (සතුට වඩන්නාවූ) [භගවා](භාග්‍යවතුන් වහන්සේ) බෝදියා මූලේ ජයන්තෝ (ශ්‍රීමහ බෝධිමූලයේ ජයගනිමින්) ජයමංගලං ජයස්සු (ජයමගුල් පැවැත්වූහ), ඒවං තුය්හං ජයෝ හෝතු (එලෙසම ඔබට ජය වේවා!)

☞ සාක්‍යයන්ගේ සතුට වඩන්නාවූ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රීමහ බෝධිමූලයේ ජයගනිමින් ජයමගුල් පැවැත්වූහ, එලෙසම ඔබට ජය වේවා!

3. සක්කත්වා බුද්ධරතනං ඔසධං උත්තමං වරං
හිතං දේව මනුස්සානං බුද්ධතේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ දුක්ඛා වූපසමෙන්තු තේ

• දේව මනුස්සානං හිතං උත්තමං වරං ඔසධං බුද්ධරතනං සක්කත්වා [තේන] බුද්ධතේජේන සොත්ථිනා [තේ] සබ්බේ [නස්සන්තු+උපද්දවා] නස්සන්තුපද්දවා තේ සබ්බේ දුක්ඛා වූපසමෙන්තු

★ දේව මනුස්සානං හිතං (දෙව්මිනිසුන්ට හිතසුව සලසන) උත්තමං වරං ඔසධං (ශ්‍රේෂ්ඨ උතුම් ඖෂදයක්වූ) බුද්ධරතනං (බුද්ධ රත්නයට) සක්කත්වා (ගරුසත්කාර කර) [තේන] (ඒ) බුද්ධතේජේන (බුද්ධතේජසින්) සොත්ථිනා (සුවසේ) [තේ](ඔබගේ) සබ්බේ උපද්දවා (සියලු උපද්‍රවයෝ) නස්සන්තු (නැසෙත්වා) තේ සබ්බේ දුක්ඛා වූපසමෙන්තු (ඔබගේ සියලු දුක් සංසිදේවා!)
☞ දෙව්මිනිසුන්ට හිතසුව සලසන ශ්‍රේෂ්ඨ උතුම් ඖෂදයක්වූ බුද්ධ රත්නයට ගරුසත්කාර කර ඒ බුද්ධතේජසින් සුවසේ ඔබගේ සියලු උපද්‍රවයෝ නැසෙත්වා ඔබගේ සියලු දුක් සංසිදේවා!

4. සක්කත්වා ධම්මරතනං ඔසධං උත්තමං වරං
පරිළාහූපසමනං ධම්ම තේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ භයා වූපසමෙන්තු තේ

• [පරිළාහ+උපසමනං] පරිළාහූපසමනං උත්තමං වරං ඔසධං ධම්මරතනං සක්කත්වා [තේන] ධම්මතේජේන සොත්ථිනා [තේ] සබ්බේ [නස්සන්තු+උපද්දවා] නස්සන්තුපද්දවා තේ සබ්බේ භයා වූපසමෙන්තු

★ [පරිළාහ+උපසමනං] පරිළාහූපසමනං ([කෙලෙස්] පරිලාහයන් දාහයන් සමනයකරන්නාවූ) උත්තමං වරං ඔසධං (ශ්‍රේෂ්ඨ උතුම් ඖෂදයක්වූ) ධම්මරතනං (ධර්ම රත්නයට) සක්කත්වා (ගරුසත්කාර කර) [තේන] (ඒ) ධම්මතේජේන (ධර්මතේජසින්) සොත්ථිනා (සුවසේ) [තේ](ඔබගේ) සබ්බේ උපද්දවා (සියලු උපද්‍රවයෝ) නස්සන්තු (නැසෙත්වා) තේ සබ්බේ භයා වූපසමෙන්තු (ඔබගේ සියලු භිය සංසිදේවා!)

☞ කෙලෙස් පරිලාහයන් දාහයන් සමනයකරන්නාවූ ශ්‍රේෂ්ඨ උතුම් ඖෂදයක්වූ ධර්ම රත්නයට ගරුසත්කාර කර ඒ ධර්මතේජසින් සුවසේ ඔබගේ සියලු උපද්‍රවයෝ නැසෙත්වා ඔබගේ සියලු භිය සංසිදේවා!

5. සක්කත්වා සංඝරතනං ඔසධං උත්තමං වරං
ආහුනෙය්‍යං පාහුනෙය්‍යං සංඝ තේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ රෝගා වූපසමෙන්තු තේ

• උත්තමං වරං ඔසධං ආහුනෙය්‍යං පාහුනෙය්‍යං සංඝරතනං සක්කත්වා [තේන] සංඝතේජේන සොත්ථිනා [තේ] සබ්බේ [නස්සන්තු+උපද්දවා] නස්සන්තුපද්දවා තේ සබ්බේ රෝගා වූපසමෙන්තු

★ උත්තමං වරං ඔසධං (ශ්‍රේෂ්ඨ උතුම් ඖෂදයක්වූ) ආහුනෙය්‍යං පාහුනෙය්‍යං (ආහුනෙය්‍ය පාහුනෙය්‍ය) සංඝරතනං (සංඝ රත්නයට) සක්කත්වා (ගරුසත්කාර කර) [තේන] (ඒ) සංඝතේජේන (සංඝතේජසින්) සොත්ථිනා (සුවසේ) [තේ](ඔබගේ) සබ්බේ උපද්දවා (සියලු උපද්‍රවයෝ) නස්සන්තු (නැසෙත්වා) තේ සබ්බේ රෝගා වූපසමෙන්තු (ඔබගේ සියලූ රෝග සංසිදේවා!)

☞ ශ්‍රේෂ්ඨ උතුම් ඖෂදයක්වූ ආහුනෙය්‍ය පාහුනෙය්‍ය සංඝ රත්නයට ගරුසත්කාර කර ඒ සංඝතේජසින් සුවසේ ඔබගේ සියලු උපද්‍රවයෝ නැසෙත්වා ඔබගේ සියලූ රෝග සංසිදේවා!

6. යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථු
රතනං බුද්ධ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

• විවිධා ලෝකේ යං කිඤ්චි පුථු රතනං විජ්ජති, [තං කිඤ්චි] බුද්ධ රතනං සමං නත්ථි, තස්මා තේ සොත්ථි භවන්තු

★ විවිධා ලෝකේ (විවිධවූ ලෝකයෙහි) යං කිඤ්චි පුථු රතනං (යම්කිසි මහගු රත්නයක්) විජ්ජති (විද්‍යමාන වේද/ පවතී ද), [තං කිඤ්චි] (ඒ කිසිවක්) බුද්ධරතනං සමං නත්ථි (බුද්ධරත්නය හා සමනොවේ), තස්මා (එබැවින්/ ඒ කරුණින්) තේ (ඔබට) සොත්ථි භවන්තු (යහපතක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ විවිධවූ ලෝකයන්හි යම්කිසි මහගු රත්නයන් පවතී ද, ඒ කිසිවක් බුද්ධරත්නය හා සමනොවේ, ඒ කරුණින් / ඒ සත්‍යයෙන් ඔබට යහපතක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

7. යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථු
රතනං ධම්ම සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

• විවිධා ලෝකේ යං කිඤ්චි පුථු රතනං විජ්ජති, [තං කිඤ්චි] ධම්ම රතනං සමං නත්ථි, තස්මා තේ සොත්ථි භවන්තු

★ විවිධා ලෝකේ (විවිධවූ ලෝකයෙහි) යං කිඤ්චි පුථු රතනං (යම්කිසි මහගු රත්නයක්) විජ්ජති (විද්‍යමාන වේද/ පවතී ද), [තං කිඤ්චි] (ඒ කිසිවක්) ධම්මරතනං සමං නත්ථි (ධර්ම රත්නය හා සමනොවේ), තස්මා (එබැවින්/ ඒ කරුණින්) තේ (ඔබට) සොත්ථි භවන්තු (යහපතක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)
☞ විවිධවූ ලෝකයන්හි යම්කිසි මහගු රත්නයන් පවතී ද, ඒ කිසිවක් ධර්මරත්නය හා සමනොවේ, ඒ කරුණින් / ඒ සත්‍යයෙන් ඔබට යහපතක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

8. යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථු
රතනං සංඝ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

• විවිධා ලෝකේ යං කිඤ්චි පුථු රතනං විජ්ජති, [තං කිඤ්චි] සංඝ රතනං සමං නත්ථි, තස්මා තේ සොත්ථි භවන්තු

★ විවිධා ලෝකේ (විවිධවූ ලෝකයෙහි) යං කිඤ්චි පුථු රතනං (යම්කිසි මහගු රත්නයක්) විජ්ජති (විද්‍යාමාන වේද/ පවතී ද), [තං කිඤ්චි] (ඒ කිසිවක්) සංඝ රතනං සමං නත්ථි (සංඝ රත්නය හා සමනොවේ), තස්මා (එබැවින්/ ඒ කරුණින්) තේ (ඔබට) සොත්ථි භවන්තු (යහපතක් වේවා!/ සුභසිද්ධියක් වේවා!)

☞ විවිධවූ ලෝකයන්හි යම්කිසි මහගු රත්නයන් පවත් ද, ඒ කිසිවක් සංඝ රත්නය හා සමනොවේ, ඒ කරුණින් / ඒ සත්‍යයෙන් ඔබට යහපතක් වේවා!/ සුභසිද්ධියක් වේවා!

9. නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධො මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලං

• මේ අඤ්ඤං සරණං නත්ථි, බුද්ධෝ මේ වරං සරණං, ඒතේන සච්ච වජ්ජේන තේ ජයමංගලං හෝතු

★ මේ (මට) අඤ්ඤං (අන්) සරණං (සරණක්) නත්ථි (නැත) බුද්ධෝ (බුදුන්) මේ (මට) වරං (උතුම්) සරණං (සරණය), ඒතේන (ඒ) සච්ච වජ්ජේන (සත්‍යය වචනයෙන්) තේ (ඔබට) ජයමංගලං (ජය මංගල්‍යයක්) හෝතු (වේවා)

☞ බුද්ධ රත්නය හැර මට අන් සරණක් නැත්තේය, බුද්ධ රත්නය මාගේ උතුම් සරණ වන්නේය, ඒ සත්‍යය වචනයෙන් ඔබට ජය මංගල්‍යයක් වේවා!

10. නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලං

• මේ අඤ්ඤං සරණං නත්ථි, ධම්මෝ මේ වරං සරණං, ඒතේන සච්ච වජ්ජේන තේ ජයමංගලං හෝතු

★ මේ (මට) අඤ්ඤං (අන්) සරණං (සරණක්) නත්ථි (නැත) ධම්මෝ (ධර්මය) මේ (මට) වරං (උතුම්) සරණං (සරණය), ඒතේන (ඒ) සච්ච වජ්ජේන (සත්‍යය වචනයෙන්) තේ (ඔබට) ජයමංගලං (ජය මංගල්‍යයක්) හෝතු (වේවා)

☞ ධර්ම රත්නය හැර මට අන් සරණක් නැත්තේය, ධර්ම රත්නය මාගේ උතුම් සරණ වන්නේය, ඒ සත්‍යය වචනයෙන් ඔබට ජය මංගල්‍යයක් වේවා!

11. නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලං

• මේ අඤ්ඤං සරණං නත්ථි, සංඝෝ මේ වරං සරණං, ඒතේන සච්ච වජ්ජේන තේ ජයමංගලං හෝතු

★ මේ (මට) අඤ්ඤං (අන්) සරණං (සරණක්) නත්ථි (නැත) සංඝෝ (සංඝයා) මේ (මට) වරං (උතුම්) සරණං (සරණය), ඒතේන (ඒ) සච්ච වජ්ජේන (සත්‍යය වචනයෙන්) තේ (ඔබට) ජයමංගලං (ජය මංගල්‍යයක්) හෝතු (වේවා)

☞ සංඝ රත්නය හැර මට අන් සරණක් නැත්තේය, සංඝ රත්නය මාගේ උතුම් සරණ වන්නේය, ඒ සත්‍යය වචනයෙන් ඔබට ජය මංගල්‍යයක් වේවා!

12. සබ්භීතියෝ විවජ්ජන්තු සබ්බ රෝගෝ විනස්සතු
මා තේ භවත්වන්තරායො සුඛී දීඝායුකෝ භව . / / /

• [සබ්බ+ඊතියෝ] සබ්භීතියෝ විවජ්ජන්තු සබ්බ රෝගෝ විනස්සතු තේ මා [භවතු+ව+අන්තරායො] භවත්වන්තරායො සුඛී දීඝායුකෝ භව

★ [සබ්බ+ඊතියෝ] සබ්භීතියෝ (සියලු විපත් උවදුරු) විවජ්ජන්තු (දුරුවෙත්වා) සබ්බ රෝගෝ විනස්සතු (සියලු රෝග නැසේවා) තේ (ඔබට) මා භවත්වන්තරායො [භවතු+ව+අන්තරායො] (අනතුරක් නොවේවා) සුඛී දීඝායුකෝ භව (සුවපත්ව දීර්ඝායුෂ ඇත්තෙක් වෙව!)

☞ සියලු විපත් උවදුරු දුරුවෙත්වා, සියලු රෝග නැසේවා, ඔබට අනතුරක් නොවේවා, සුවපත්ව දීර්ඝායුෂ ඇත්තෙක් වෙව!

13. භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

• සබ්බ මංගලං භවතු, සබ්බ දේවතා රක්ඛන්තු, සබ්බ බුද්ධානුභාවේන සදා තේ සොත්ථි භවන්තු

★ සබ්බ මංගලං භවතු (සියලු මංගල්‍යයන් වේවා), සබ්බ දේවතා රක්ඛන්තු (සියලු දෙවියෝ රකිත්වා), සබ්බ බුද්ධානුභාවේන (සියලු බුදුවරුන්ගේ ආනුභාව බලයෙන්) සදා තේ (සැමදා ඔබට) සොත්ථි භවන්තු (සෙතක් වේවා!)

☞ සියලු මංගල්‍යයන් වේවා, සියලු දෙවියෝ රකිත්වා, සියලු බුදුවරුන්ගේ ආනුභාව බලයෙන් සැමදා ඔබට සෙතක් වේවා!

14. භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

• සබ්බ මංගලං භවතු, සබ්බ දේවතා රක්ඛන්තු, සබ්බ ධම්මානුභාවේන සදා තේ සොත්ථි භවන්තු

★ සබ්බ මංගලං භවතු (සියලු මංගල්‍යයන් වේවා), සබ්බ දේවතා රක්ඛන්තු (සියලු දෙවියෝ රකිත්වා), සබ්බ ධම්මානුභාවේන (සියලු ධර්මරත්නයන්ගේ ආනුභාව බලයෙන්) සදා තේ (සැමදා ඔබට) සොත්ථි භවන්තු (සෙතක් වේවා!)
☞ සියලු මංගල්‍යයන් වේවා, සියලු දෙවියෝ රකිත්වා, සියලු ධර්මරත්නයන්ගේ ආනුභාව බලයෙන් සැමදා ඔබට සෙතක් වේවා!

15. භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානුභාවේන සදා සොත්ථී භවන්තු තේ

• සබ්බ මංගලං භවතු, සබ්බ දේවතා රක්ඛන්තු, සබ්බ සංඝානුභාවේන සදා තේ සොත්ථී භවන්තු

★ සබ්බ මංගලං භවතු (සියලු මංගල්‍යයන් වේවා), සබ්බ දේවතා රක්ඛන්තු (සියලු දෙවියෝ රකිත්වා), සබ්බ සංඝානුභාවේන (සියලු සංඝයාගේ ආනුභාව බලයෙන්) සදා තේ (සැමදා ඔබට) සොත්ථී භවන්තු (සෙතක් වේවා!)

☞ සියලු මංගල්‍යයන් වේවා, සියලු දෙවියෝ රකිත්වා, සියලු සංඝයාගේ ආනුභාව බලයෙන් සැමදා ඔබට සෙතක් වේවා!

16. නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන හන්තු තෙසං උපද්දවේ . / / /

• නක්ඛත්ත පාපග්ගහ යක්ඛ භූතානං [උපද්දවේ] නිවාරණා [පරිත්තස්ස+ආනුභාවේන] පරිත්තස්සානුභාවේන තෙසං උපද්දවේ හන්තු

★ නක්ඛත්ත පාපග්ගහ යක්ඛ භූතානං (නක්ෂත්‍ර පාපග්‍රහ යක්ෂ භූතයන්ගේ) [උපද්දවේ] නිවාරණා (උපද්‍රව දුරුකරන්නාවූ) [පරිත්තස්ස+ආනුභාවේන] පරිත්තස්සානුභාවේන (පිරිතෙහි ආනුභාව බලයෙන්) තෙසං උපද්දවේ හන්තු (ඒවායේ උවදුරු දුරුවෙත්වා!)

☞ නක්ෂත්‍ර පාපග්‍රහ යක්ෂ භූතයන්ගේ උපද්‍රව දුරුකරන්නාවූ පිරිතෙහි ආනුභාව බලයෙන් ඒවායේ උවදුරු දුරුවෙත්වා!

17. සබ්බේ බුද්ධා බලප්පත්තා පච්චෙකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තේජෙන රක්ඛං බන්ධාමි සබ්බසෝ.

• බලප්පත්තා සබ්බේ බුද්ධා, [පච්චෙකානං+ච] පච්චෙකානඤ්ච [අරහන්තානං+ච] අරහන්තානඤ්ච තේජෙන සබ්බසෝ යං බලං රක්ඛං බන්ධාමි

★ බලප්පත්තා සබ්බේ බුද්ධා (බලප්‍රාප්ත වූ සියලු බුදුවරුන්ගේ ද), [පච්චෙකානං+ච] පච්චෙකානඤ්ච (පසේ බුදුවරුන්ගේ ද) [අරහන්තානං+ච] අරහන්තානඤ්ච (රහතුන්ගේ ද) තේජෙන (තේජසින්) සබ්බසෝ (සියලු ආකාරයේ) යං බලං රක්ඛං බන්ධාමි (බලවත් ආරාක්ෂාවක් බදිමි.)

☞ බලප්‍රාප්ත වූ සියලු බුදුවරුන්ගේ ද පසේ බුදුවරුන්ගේ ද රහතුන්ගේ ද තේජසින් සියලු ආකාරයේ බලවත් ආරාක්ෂාවක් බදිමි.

<u>ඇනවුම් පිරිත</u>

1. යේ සන්තා සන්ත චිත්තා - තිසරණ සරණා එත්ථ ලෝකන්තරේ වා
භුම්මා භුම්මා ච දේවා ගුණගණගහණබ්‍යාවටා සබ්බකාලං
ඒතේ ආයන්තු දේවා වරකණකමයේ -මේරුරාජේ වසන්තෝ
සන්තෝ සන්තෝ සහේතුං මුනිවර වචනං - සෝතුමග්ගං සමග්ගා

• යේ තිසරණ සරණා සන්ත චිත්තා සබ්බකාලං [ගුණගණ-ගහණ+අබ්‍යාවටා] ගුණගණගහණබ්‍යාවටා සන්තා එත්ථ වා [ලෝක+අන්තරේ] ලෝකන්තරේ වා භුම්මා භුම්මා ච දේවා ඒතේ දේවා ආයන්තු වර-කණකමයේ මේරුරාජේ වසන්තෝ දේවා ආයන්තු සන්තෝ සන්තෝ සහේතුං මුනිවර වචනං [සෝතුං+අග්ගං] සෝතුමග්ගං සමග්ගා ආයන්තු

★ යේ තිසරණ සරණා (යම් තිසරණ සරණගියාවූ) සන්ත චිත්තා (ශාන්ත සිත් ඇති) සබ්බකාලං (සැමකල්හි) [ගුණගණ-ගහණ+අබ්‍යාවටා] ගුණගණගහණබ්‍යාවටා (යහපත්දේ කෙරෙහි නියලුනාවූ) සන්තා (සත්පුරුෂයෝ) එත්ථ වා (මෙහි හෝ) [ලෝක+අන්තරේ] ලෝකන්තරේ වා (ලෝකයන් අතර හෝ) භුම්මා භුම්මා ච (භූමට්ඨකවූ ද) ඒතේ දේවා (ඒ දෙවියෝ) ආයන්තු (එත්වා), වර-කණකමයේ (රන්මයවූ) මේරුරාජේ (මහමෙරුවේ) වසන්තෝ (වසන්නාවූ) දේවා ආයන්තු (දෙවියෝ එත්වා), සන්තෝ සන්තෝ (සත්පුරුෂයනි සත්පුරුෂයනි) සහේතුං (හේතු කරුණු සහිත) මුනි-වර අග්ගං වචනං (මුනින්ද්‍රයන් වහන්සේගේ උතුම් අග්‍ර වචන) සෝතුං (ඇසීමට) සමග්ගා ආයන්තු (සමගිව එත්වා)

☞ යම් තිසරණ සරණගියාවූ ශාන්ත සිත් ඇති සැමකල්හි යහපත්දේ කෙරෙහි නියලුනාවූ සත්පුරුෂයෝ මෙහි හෝ ලෝකයන් අතර හෝ භූමට්ඨකවූ හෝ ඒ දෙවියෝ එත්වා, රන්මයවූ මහමෙරුවේ වසන්නාවූ දෙවියෝ එත්වා, සත්පුරුෂයනි! සත්පුරුෂයනි! හේතු කරුණු සහිත මුනින්ද්‍රයන් වහන්සේගේ උතුම් අග්‍ර වචන ඇසීමට සමගිව එත්වා!

2. සබ්බේසු චක්කවාළේසු - යක්ඛා දේවා ච බ්‍රහ්මුණෝ
යං අම්මේහි කතං පුඤ්ඤං - සබ්බ සම්පත්ති සාධකං
සබ්බේ තං අනුමෝදිත්වා - සමග්ගා සාසනේ රතා
පමාද රහිතා හොන්තු - ආරක්ඛාසු විසේසතෝ

• සබ්බේසු චක්කවාළේසු යක්ඛා දේවා ච බ්‍රහ්මුණෝ අම්මේහි කතං සබ්බ සම්පත්ති සාධකං යං පුඤ්ඤං සබ්බේ තං අනුමෝදිත්වා සමග්ගා සාසනේ රතා ආරක්ඛාසු විසේසතෝ පමාද රහිතා හොන්තු

★ සබ්බේසු චක්කවාළේසු (සියලු සක්වලවල්හි) යක්ඛා දේවා ච බ්‍රහ්මුණෝ (යක්ෂයෝ ද දෙවියෝ ද බ්‍රහ්මයෝ ච) අම්මේහි කතං (අප විසින් කරනලද) සබ්බ සම්පත්ති සාධකං (සියලු සැපසම්පත් සාදන්නාවූ) යං පුඤ්ඤං (යම් පිණක් වේද) සබ්බේ (සියල්ලෝම) තං (එය) අනුමෝදිත්වා (අනුමෝදන්ව) සමග්ගා (සමගිව) සාසනේ රතා (සාසන ආලයෙන්) විසේසතෝ (විශේෂයෙන්) ආරක්ඛාසු (ආරක්ෂා කටයුතුවල) පමාද රහිතා හොන්තු (ප්‍රමාද නැත්තෝ වෙත්වා!)

☞ සියලු සක්වලවල්හි යක්ෂයෝ දෙවියෝ බ්‍රහ්මයෝ සියල්ලෝම අප විසින් කරනලද සියලු සැපසම්පත් සාදන්නාවූ පින්/කුසල් අනුමෝදන්ව සමගිව සාසන ආලයෙන් විශේෂයෙන් ආරක්ෂා කටයුතුවල ප්‍රමාද නැත්තෝ වෙත්වා!

3. සාසනස්ස ච ලෝකස්ස - වුද්ධී භවතු සබ්බදා
සාසනම්පි ච ලෝකඤ්ච - දේවා රක්ඛන්තු සබ්බදා
සද්ධිං හොන්තු සුඛී සබ්බේ - පරිවාරේහි අත්තනෝ
අනීඝා සුමනා හොන්තු - සහ සබ්බේහි ඤාතිභි.

• සබ්බදා සාසනස්ස ච ලෝකස්ස ච වුද්ධී භවතු, දේවා සබ්බදා සාසනම්පි ච ලෝකඤ්ච රක්ඛන්තු, සබ්බේ අත්තනෝ පරිවාරේහි සද්ධිං සුඛී හොන්තු, සබ්බේ සහ සබ්බේහි ඤාතිභි අනීඝා සුමනා හොන්තු.

★ සබ්බදා (සැමදා) සාසනස්ස ච (සාසනයේ ද) ලෝකස්ස ච (ලෝකයේ ද) වුද්ධී භවතු (අභිවෘද්ධියක් වේවා), සබ්බදා දේවා (සැමකල්හි දෙවියෝ) සාසනම්පි ච ලෝකඤ්ච (සාසනය ද ලෝකය ද) රක්ඛන්තු (රකිත්වා), සබ්බේ අත්තනෝ (සියල්ලෝ තමන්ගේ) පරිවාරේහි සද්ධිං (පිරිවරත් සමග) සුඛී හොන්තු (සුවපත් වෙත්වා), සබ්බේ (සියල්ලෝම) සහ සබ්බේහි ඤාතිභි (සියලු ඤාතීන් සමග) අනීඝා හොන්තු (දුක්නැත්තෝ වෙත්වා) සුමනා හොන්තු (සතුටු සිත් ඇත්තෝ වෙත්වා!)

☞ සැමදා සාසනයේ ද ලෝකයේ ද අභිවෘද්ධියක් වේවා! සැමකල්හි දෙවියෝ සාසනය ද ලෝකය ද රකිත්වා! සියල්ලෝ තමන්ගේ පිරිවරත් සමග සුවපත් වෙත්වා! සියල්ලෝම සියලු ඤාතීන් සමග දුක්නැත්තෝ වෙත්වා! සතුටු සිත් ඇත්තෝ වෙත්වා!

රාජතෝ වා, චෝරතෝ වා, මනුස්සතෝ වා, අමනුස්සතෝ වා, අග්ගිතෝ වා, උදකතෝ වා, පිසාචතෝ වා, ඛාණුකතෝ වා, කණ්ටකතෝ වා, නක්ඛත්තතෝ වා, ජනපද රෝගතෝ වා, අසද්ධම්මතෝ වා, අසන්දිට්ඨීතෝ වා, අසප්පුරිසතෝ වා,

★ රාජතෝ වා (රජුගෙන් හෝ), චෝරතෝ වා (සොරුන්ගෙන් හෝ), මනුස්සතෝ වා (මිනිසුන්ගෙන් හෝ), අමනුස්සතෝ වා (අමුනුස්සයන්ගෙන් හෝ), අග්ගිතෝ වා (ගින්නෙන් හෝ), උදකතෝ වා (ජලයෙන් හෝ), පිසාචතෝ වා (පිසාචයන්ගෙන් හෝ), ඛාණුකතෝ වා (උල්වලින් හෝ), කණ්ටකතෝ වා (කටුවලින් හෝ), නක්ඛත්තතෝ වා, (ග්‍රහදෝෂයන්ගෙන් හෝ), ජනපද රෝගතෝ වා (ජනපද රෝගවලින් හෝ), අසද්ධම්මතෝ වා (අසද්ධර්මයෙන් හෝ), අසන්දිට්ඨීතෝ වා (වැරදි දෘෂ්ඨී වලින් හෝ), අසප්පුරිසතෝ වා (අසත්පුරුෂයන්ගෙන් හෝ)

චණ්ඩ හත්ථි අස්ස මිග ගොණ කුක්කුර අහි විච්ඡික මණිසප්ප දීපි අච්ඡ තරච්ඡ සූකර මහිංස යක්ඛ රක්ඛසාදීහි නානා භයතෝ වා නානා රෝගතෝ වා, නානා උපද්දවතෝ වා, ආරක්ඛං ගණ්හන්තු.

★ චණ්ඩ (දරුනු) හත්ථි (ඇතුන්) අස්ස (අසුන්) මිග (සිව්පාවන්) ගොණ (ගොණුන්) කුක්කුර (බල්ලන්) අහි (සර්පයන්) විච්ඡික (ගෝනුස්සන්) මණිසප්ප (?) දීපි (දිවියන්) අච්ඡ (වලස්සු) තරච්ඡ (කළුවලස්සු) සූකර (ඌරන්) මහිංස (මීමන්) යක්ඛ (යක්ෂයන්) රක්ඛසා-දීහි (රාක්ෂයන් ආදීන්ගෙන්) [ඇතිවන] නානා භයතෝ වා (නොයෙක් බිය හෝ) නානා රෝගතෝ වා (නොයෙන් රෝග හෝ), නානා උපද්දවතෝ වා (නොයෙක් උපද්‍රව හෝ),[සදහා] ආරක්ඛං ගණ්හන්තු (ආරක්ෂා ගනිත්වා!)

පණිධානතෝ පට්ඨාය තථාගතස්ස දස පාරමියො දස උප පාරමියෝ දස පරමත්ථ පාරමියෝ පඤ්ච මහා පරිච්චාගේ, තිස්සෝචරියා, පච්ඡිම භවේ ගබ්භාවක්කන්තිං ජාතිං අභිනික්ඛමනං

පධානචරියං බොධිපල්ලංකේ මාර විජයං සබ්බඤ්ඤුතඤාණපටිවේදං නවලෝකුත්තර ධම්මෙති සබ්බේපිමේ බුද්ධගුණේ ආවජ්ජිත්වා, වෙසාලියා තීසු පාකාරන්තරේසු තියාමරත්තිං පරිත්තං කරන්තෝ ආයස්මා ආනන්දත්ථේරෝ විය කාරුඤ්ඤ චිත්තං උපට්ඨපෙත්වා.

★ පණීධානතෝ පට්ඨාය (ප්‍රථම ප්‍රාර්ථනාවේ පටන්) තථාගතස්ස (තථාගතයන් වහන්සේගේ) දස පාරමියො (දසපාරමී) දස උප පාරමියෝ (දස උපපාරමී) දස පරමත්ථ පාරමියෝ (දස පරමත්ථ පාරමී) පඤ්ච මහා පරිච්චාගේ (පස් මහා පරිත්‍යාග), තිස්සෝ-චරියා (තුන් චර්යාවන්), පච්ඡිම භවේ (අන්තිම භවයේ) ගබ්භාවක්කන්තිං (මවුගැබට පැමිණීම) ජාතිං (ඉපදීම) අභිනික්ඛමනං (මහභිනිෂ්ක්‍රමය) පධානචරියං (ප්‍රදන් වීර්යය වැඩීම) බොධිපල්ලංකේ මාර විජයං (බෝමැඩ මරුන් ජයගැනීම) සබ්බඤ්ඤුත ඤාණපටිවේදං (සර්වඥතා ඤාණාවබෝධය) නවලෝකුත්තර [ධම්මෙ+ඉති] ධම්මෙති (නවලෝකුත්තර ධර්ම යැයි) [සබ්බේ+අපි+ඉමේ] සබ්බේපිමේ (මේ සියලුම) බුද්ධගුණේ (බුදුගුණ) ආවජ්ජිත්වා (ආවර්ජනාකර/ මතක්කර), වෙසාලියා (විසාලාමහනුවර) තීසු (තුන්) [පාකාර+අන්තරේසු] පාකාරන්තරේසු (ප්‍රාකාරයන් අතරෙහි) තියාම-රත්තිං (රූ තුන්යම) පරිත්තං කරන්තෝ (පිරිත් කරන) ආයස්මා ආනන්දත්ථේරෝ විය (අයුෂ්මත් ආනන්ද තෙරුන් මෙන්) කාරුඤ්ඤ චිත්තං (කරුණා සිත) උපට්ඨපෙත්වා (එළවාගෙන / උපදවාගෙන)

කෝටිසත සහස්සේසු - චක්කවාලේසු දේවතා
යස්සාණං පතිගණ්හන්ති - යඤ්ච වේසාලියං පුරේ
රෝගාමනුස්ස දුබ්භික්ඛ - සම්භූතං තිවිධං භයං
ඛිප්පමන්තරධාපේසි - පරිත්තං තං භණාමහේ.

• කෝටිසත සහස්සේසු චක්කවාලේසු දේවතා [යස්ස+අණං] යස්සාණං පතිගණ්හන්ති, වේසාලියං පුරේ [රෝග+අමනුස්ස] රෝගාමනුස්ස දුබ්භික්ඛ සම්භූතං තිවිධං භයං [යං+ච] යඤ්ච [ඛිප්පං+අන්තරධාපේසි] ඛිප්පමන්තරධාපේසි, [මයං] තං පරිත්තං භණාමහේ.

★ කෝටි සත සහස්සේසු (කෝටි ලක්ෂයක්) චක්කවාලේසු (සක්වලයන්හි) දේවතා (දෙවියෝ) [යස්ස+අණං] යස්සාණං (යමකගේ අණ/ යම් පිරිතක අණ) පතිගණ්හන්ති (පිළිගනිත් ද), වේසාලියං පුරේ (විසාලාමහ නුවර) [රෝග+අමනුස්ස] රෝගාමනුස්ස දුබ්භික්ඛ (රෝග අමනුස්ස දුර්භික්ෂයෙන්) සම්භූතං (හටගත්) තිවිධං භයං ච (තුන්බිය ද) යං (යමක්/ යම් පිරිතක්) [ඛිප්පං+අන්තරධාපේසි] ඛිප්පමන්තරධාපේසි (වහා අතුරුදහන්කලේ ද), [මයං (අපි)] තං පරිත්තං (ඒ පිරිත) භණාමහේ (දේ ශනාකරන්නෙමු)

☞. කෝටි ලක්ෂයක් සක්වලයන්හි දෙවියෝ යම් පිරිතක අණ පිළිගනිත් ද, විසාලාමහ නුවර රෝග අමනුස්ස දුර්භික්ෂයෙන් හටගත් තුන්බිය ද යම් පිරිතක් වහා අතුරුදහන්කලේ ද අපි ඒ පිරිත දේශනාකරන්නෙමු.

<u>අටවිසි පිරිත</u>

1. තණ්හංකරෝ මහා වීරෝ - මේධඞ්කරෝ මහායසෝ
   සරණඞ්කරෝ ලෝකහිතෝ - දීපඞ්කරෝ ජුතින්ධරෝ

• මහා වීරෝ තණ්හංකරෝ බුද්ධෝ මහායසෝ මේධඞ්කරෝ බුද්ධෝ ලෝකහිතෝ සරණඞ්කරෝ බුද්ධෝ ජුතින්ධරෝ දීපඞ්කරෝ බුද්ධෝ

★ මහා වීරෝ තණ්හංකරෝ බුද්ධෝ (මහාවීරවූ තණ්හංකර බුදුපියාණන් වහන්සේ) මහායසෝ මේධඞ්කරෝ බුද්ධෝ (මහා යසස්ඇති මේධඞ්කර බුදුපියාණන් වහන්සේ) ලෝකහිතෝ සරණඞ්කරෝ බුද්ධෝ (ලොවට හිතසුව සලසන සරණඞ්කර බුදුපියාණන් වහන්සේ) ජුතින්ධරෝ දීපඞ්කරෝ බුද්ධෝ (බුදුරුසින් ප්‍රභාස්වරවූ දීපඞ්කර බුදුපියාණන් වහන්සේ)

2. කොණ්ඩඤ්ඤෝ ජනපාමොක්ඛෝ - මඞ්ගලෝ පුරිසාසභෝ
 සුමනෝ සුමනෝ ධීරෝ - රේවතෝ රති වද්ධනෝ

• ජනපාමොක්ඛෝ කොණ්ඩඤ්ඤෝ බුද්ධෝ පුරිසාසභෝ මඞ්ගලෝ බුද්ධෝ ධීරෝ සුමනෝ බුද්ධෝ රති වද්ධනෝ රේවතෝ බුද්ධෝ

★ ජනපාමොක්ඛෝ කොණ්ඩඤ්ඤෝ බුද්ධෝ (සත්ත්වයන් අතර ප්‍රධානියාවූ කොණ්ඩඤ්ඤ බුදුපියාණන් වහන්සේ) පුරිසාසභෝ මඞ්ගලෝ බුද්ධෝ (උත්තම පුරුෂයාවූ මඞ්ගල බුදුපියාණන් වහන්සේ) ධීරෝ සුමනෝ බුද්ධෝ (මහා වීර සුමන බුදුපියාණන් වහන්සේ) රති වද්ධනෝ රේවතෝ බුද්ධෝ (සතුටවඩන්නාවූ රේවත බුදුපියාණන් වහන්සේ)

3. සෝභිතෝ ගුණ සම්පන්නෝ - අනෝමදස්සි ජනුත්තමෝ
 පදුමෝ ලෝක පජ්ජෝතෝ - නාරදෝ වරසාරථී

• ගුණසම්පන්නෝ සෝභිතෝ බුද්ධෝ ජනුත්තමෝ අනෝමදස්සි බුද්ධෝ ලෝක පජ්ජෝතෝ පදුමෝ බුද්ධෝ වරසාරථී නාරදෝ බුද්ධෝ

★ ගුණසම්පන්නෝ සෝභිතෝ බුද්ධෝ (සියලු ගුණයන්ගෙන් සම්පූර්ණවූ සෝභිත බුදුපියාණන් වහන්සේ) ජනුත්තමෝ අනෝමදස්සි බුද්ධෝ (ජනයන් අතර උතුම්වූ අනෝමදස්ස බුදුපියාණන් වහන්සේ) ලෝක පජ්ජෝතෝ පදුමෝ බුද්ධෝ (ලොවම බබුලුවන්නාවූ පදුම බුදුපියාණන් වහන්සේ) වරසාරථී නාරදෝ බුද්ධෝ (නිවනට ගෙනයන උතුම් රතාචාර්යවරයාවූ නාරද බුදුපියාණන් වහන්සේ)

4. පදුමුත්තරෝ සත්තසාරෝ - සුමේධෝ අග්ග පුග්ගලෝ
 සුජාතෝ සබ්බ ලෝකග්ගෝ - පියදස්සී නරාසභෝ

• සත්තසාරෝ පදුමුත්තරෝ බුද්ධෝ අග්ග පුග්ගලෝ සුමේධෝ බුද්ධෝ සබ්බ ලෝකග්ගෝ සුජාතෝ බුද්ධෝ නරාසභෝ පියදස්සී බුද්ධෝ

★ සත්තසාරෝ පදුමුත්තරෝ බුද්ධෝ (සත්ත්වයන් අතර වටිනාමවූ පදුමුත්තර බුදුපියාණන් වහන්සේ / ගැඹුරුදෙහි ඇලුනාවූ පදුමුත්තර බුදුපියාණන් වහන්සේ) අග්ග පුග්ගලෝ සුමේධෝ බුද්ධෝ (අග්‍රපුද්ගලයාවූ සුමේධ බුදුපියාණන් වහන්සේ) සබ්බ ලෝකග්ගෝ සුජාතෝ බුද්ධෝ (සියලු ලෝකයට අග්‍රවූ සුජාත බුදුපියාණන් වහන්සේ) නරාසභෝ පියදස්සී බුද්ධෝ (නරශ්‍රේෂ්ඨයාවූ පියදස්සී බුදුපියාණන් වහන්සේ)

5. අත්ථදස්සී කාරුණිකෝ - ධම්මදස්සී තමෝනුදෝ
 සිද්ධත්ථෝ අසමෝ ලෝකේ - තිස්සෝ වරද සංවරෝ

• කාරුණිකෝ අත්ථදස්සී බුද්ධෝ තමෝනුදෝ ධම්මදස්සී බුද්ධෝ ලෝකේ අසමෝ සිද්ධත්ථෝ බුද්ධෝ වරද සංවරෝ තිස්සෝ බුද්ධෝ

★ කාරුණිකෝ අත්ථදස්සී බුද්ධෝ (මහාකාරුණිකවූ අත්ථදස්සී බුදුපියාණන් වහන්සේ) තමෝනුදෝ ධම්මදස්සී බුද්ධෝ (මොහඳුර දුරලන්නාවූ ධම්මදස්සී බුදුපියාණන් වහන්සේ) ලෝකේ අසමෝ සිද්ධත්ථෝ බුද්ධෝ (ලෝකයෙහි අසමවූ සිද්ධත්ථ බුදුපියාණන් වහන්සේ) වරද සංවරෝ තිස්සෝ බුද්ධෝ (සංවරබවින් උතුම්මවූ තිස්ස බුදුපියාණන් වහන්සේ)

6. ඵුසසෝ වරද සම්බුද්ධෝ - විපස්සී ච අනූපමෝ
සිඛී සබ්බ හිතෝ සත්ථා - වෙස්සභූ සුඛ දායකෝ

• වරදෝ ඵුසසෝ සම්බුද්ධෝ අනූපමෝ විපස්සී බුද්ධෝ සබ්බ හිතෝ සිඛී සත්ථා සුඛ දායකෝ වෙස්සභූ බුද්ධෝ

★ වරදෝ ඵුසසෝ සම්බුද්ධෝ (උතුම්දේ දෙන්නාවූ ඵුස්ස සම්බුදුපියාණන් වහන්සේ) අනූපමෝ විපස්සී බුද්ධෝ (කිසි උපමාවක් නැත්තාවූ විපස්සී බුදුපියාණන් වහන්සේ) සබ්බ හිතෝ සිඛී සත්ථා (සියලුදෙනාට හිතසුව සලසන සිඛී ශාස්තෘන් වහන්සේ) සුඛ දායකෝ වෙස්සභූ බුද්ධෝ (සියලු සැප දෙන්නාවූ වෙස්සභූ බුදුපියාණන් වහන්සේ)

7. කකුසන්ධෝ සත්ථවාහෝ - කෝණාගමනෝ රණඤ්ජහෝ
කස්සපෝ සිරි සම්පන්නෝ - ගෝතමෝ සාක්‍ය පුංගවෝ

• සත්ථවාහෝ කකුසන්ධෝ බුද්ධෝ රණඤ්ජහෝ කෝණාගමනෝ බුද්ධෝ සිරි සම්පන්නෝ කස්සපෝ බුද්ධෝ සාක්‍ය පුංගවෝ ගෝතමෝ බුද්ධෝ

★ සත්ථවාහෝ කකුසන්ධෝ බුද්ධෝ (නිවනට ගෙනයන ගැල පදවන්නාවූ කකුසඳ බුදුපියාණන් වහන්සේ) රණඤ්ජහෝ කෝණාගමනෝ බුද්ධෝ (කෙලෙසුන් දුරුකලාවූ කෝණාගමන බුදුපියාණන් වහන්සේ) සිරි සම්පන්නෝ කස්සපෝ බුද්ධෝ (සියලු සව්සිරියෙන් පිරුණාවූ කස්සප බුදුපියාණන් වහන්සේ) සාක්‍ය පුංගවෝ ගෝතමෝ බුද්ධෝ (සාක්‍යයන්ගේ ශ්‍රේෂ්ඨයාවූ ගෞතම බුදුපියාණන් වහන්සේ)
[මෙම සියලු ගුණ සෑම බුදුවරයකුගේම ඇත්තේය]

8. තේසං සච්චේන සීලේන - ඛන්ති මෙත්ත බලේන ච
තේපි ත්වං අනුරක්ඛන්තු - ආරෝගෝ්‍යන සුඛේනවා ති.

• තේ-පි තේසං සච්චේන බලේන, සීලේන බලේන, ඛන්ති බලේන, මෙත්ත බලේන, ච ත්වං ආරෝගෝ්‍යන සුඛේන ච අනුරක්ඛන්තු

★ තේ-පි (උන්වහන්සේලා ද) තේසං (උන්වහන්සේලාගේ) සච්චේන බලේන (සත්‍යය බලයෙන් ද) සීලේන බලේන (සීල බලයෙන් ද) ඛන්ති බලේන (ක්ෂාන්ති බලයෙන් ද) මෙත්ත බලේන ච (මෛත්‍රී බලයෙන් ද) ත්වං (ඔබව) ආරෝගෝ්‍යන සුඛේන ච (නිරෝගිකමින් ද සැපයෙන් ද) අනුරක්ඛන්තු (රකිත්වා!)

☞ උන්වහන්සේලා ද උන්වහන්සේලාගේ සත්‍යය බලයෙන් ද සීල බලයෙන් ද ක්ෂාන්ති බලයෙන් ද මෛත්‍රී බලයෙන් ද ඔබව නිරෝගිකමින් ද සැපයෙන් ද රකිත්වා!

<u>අංගුලිමාල පිරිත</u>

පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨාන ධෝවනං
උදකම්පි විනාසේති - සබ්බමේව පරිස්සයං
සොත්ථිනා ගබ්භවුට්ඨානං - යං ච සාධේති තං ඛණේ
ථෙරස්සංගුලිමාලස්ස - ලෝක නාථේන භාසිතං
කප්පට්ඨායි මහා තේජං - පරිත්තං තං භණාමහේ.

• යං පරිත්තං භණන්තස්ස [නිසින්න+ඨාන] නිසින්නට්ඨාන ධෝවනං [උදකං+අපි] උදකම්පි සබ්බමේව පරිස්සයං විනාසේති, යං සොත්ථිනා ගබ්භවුට්ඨානං ච තං ඛණේ සාධේති, ථෙරස්සංගුලිමාලස්ස ලෝක නාථේන භාසිතං මහා තේජං කප්පට්ඨායි තං පරිත්තං [මයං] භණාමහේ.

★ යං පරිත්තං (යම් පිරිතක්) භණන්තස්ස (දේශනා කරන්නනා) [නිසින්න+ඨාන] නිසින්නට්ඨාන (හිඳසිටි ස්ථානය) ධෝවනං (සේදූවාවූ) [උදකං+අපි] උදකම්පි (වතුර පවා) සබ්බමේව (සියලුම) පරිස්සයං (උවදුරු) විනාසේති (විනාශකරයි ද/ දුරුකරයි ද), යං (යමක් / යම් පිරිතක්) සොත්ථිනා (සුවසේ) ගබ්භවුට්ඨානං ච (දරුවන් බිහිකිරීම ද) තං ඛණේ සාධේති (ඒ මොහොතෙම සිදුකරදෙයි ද), ථෙරස්සංගුලිමාලස්ස (අංගුලිමාල තෙරුන් වහන්සේට) ලෝක නාථේන (ලෝකනාථයන් වහන්සේ විසින්) භාසිතං (දේශනා කරනලද) මහා තේජං (මහා තේජවන්ත) කප්පට්ඨායි (කල්පයක් පුරා බලය පවත්නාවූ) තං පරිත්තං (ඒ පිරිත) [මයං](අපි) භණාමහේ (දේශනා කරන්නෙමු).

☞ යම් පිරිතක් දේශනා කරන්නනා හිඳසිටි ස්ථානය සේදූවාවූ වතුර පවා සියලුම උවදුරු දුරුකරයි ද යම් පිරිතක් සුවසේ දරුවන් බිහිකිරීම ඒ මොහොතෙම සිදුකරදෙයි ද අංගුලිමාල තෙරුන් වහන්සේට ලෝකනාථයන් වහන්සේ විසින් දේශනා කරනලද මහා තේජවන්ත කල්පයක් පුරා බලය පවත්නාවූ ඒ පිරිත අපි දේශනා කරන්නෙමු

යතෝ’හං භගිනි අරියාය ජාතියා ජතෝ නාභී ජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වෝරෝපේතා, තේන සච්චේන සොත්ථි තේ හෝතු, සොත්ථි ගබ්භස්සා තී

• [යතෝ+අහං] යතෝ’හං භගිනි අරියාය ජාතියා ජාතෝ [න+අභිජානාමි] නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වෝරෝපේතා, තේන සච්චේන සොත්ථි තේ හෝතු, සොත්ථි ගබ්භස්ස+ඉති

★ භගිනි! (නැගනිය!) අහං (මම) අරියාය ජාතියා (ආර්යය ජාතියෙහි) යතෝ ජාතෝ (උපන්දා පටන්) සඤ්චිච්ච (දැන දැන) පාණං ජීවිතා (සත්ත්ව ජීවිත) වෝරෝපේතා (තොරකිරීමක්) [න+අභිජානාමි] නාභිජානාමි (නොදන්නෙමි / නොකලෙමි), තේන සච්චේන (ඒ සත්‍යයෙන්) තේ සොත්ථි හෝතු (ඔබට සෙත් වේවා), සොත්ථි ගබ්භස්ස (දරුගැබට සෙත් වේවා!)

☞ නැගනිය! මම ආර්යය ජාතියෙහි උපන්දා පටන් දැන දැන සත්ත්ව ජීවිත තොරකිරීමක් නොකලෙමි, ඒ සත්‍යයෙන් ඔබට සෙත් වේවා දරුගැබටද සෙත් වේවා!

<u>ජය පිරිත</u>

- සිරි ධිති මති තේජෝ ජය සිද්ධි මහිද්ධි මහා ගුණං, අපරිමිත [පුඤ්ඤ+අධිකාරස්ස] පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස, භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

★ සිරි (සිරිමත්) ධිති (ධෛර්යමත්) මති (ප්‍රඥාවන්ත) තේජෝ (තේජවන්ත) ජය සිද්ධි (ජයගෙනදෙන) මහිද්ධි (මහා ඍද්ධිමත්) මහා ගුණං (මහාගුණැති) අපරිමිත (ප්‍රමානකල නොහැකි) [පුඤ්ඤ+අධිකාරස්ස] පුඤ්ඤාධිකාරස්ස (පුණ්‍ය පරිත්‍යාග ඇති/ පුණ්‍ය සම්භාරයක් ඇති) සබ්බන්තරාය (සියලු අන්තරාවන්) නිවාරණ සමත්ථස්ස (වලක්වාලීමට සමර්ථවූ), භගවතෝ (භාග්‍යයවත්වූ) අරහතෝ (අර්හත්වූ) සම්මා සම්බුද්ධස්ස (සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ)

☞ සිරිමත් ධෛර්යමත් ප්‍රඥාවන් තේජවන්ත සියලු ජයගෙනදෙන මහා ඍද්ධිමත් මහාගුණැති ප්‍රමානකල නොහැකි පුණ්‍ය සම්භාරයක් ඇති සියලු අන්තරාවන් වලක්වාලීමට සමර්ථවූ භාග්‍යයවත්වූ අර්හත්වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ

- ද්වත්තිංස මහා පුරුෂ ලක්ඛණානුභාවේන, අසීත්‍යානුව්‍යංජණ ලක්ඛණානුභාවේන, අට්ඨුත්තර සත මංගල ලක්ඛණානුභාවේන, ඡබ්බණ්ණරංස්‍යානුභාවේන, කේතුමාලානුභාවේන, දස පාරමිතානුභාවේන, දස උපපාරමිතානුභාවේන, දස පරමත්ථ පාරමිතානුභාවේන, සීලසමාධිපඤ්ඤානුභාවේන, බුද්ධානුභාවේන, ධම්මානුභාවේන, සංඝානුභාවේන,

• ද්වත්තිංස මහා පුරුෂ [ලක්ඛණ+ආනුභාවේන] ලක්ඛණානුභාවේන, [අසීති+අනුව්‍යංජණ] අසීත්‍යානුව්‍යංජණ [ලක්ඛණ+ආනුභාවේන] ලක්ඛණානුභාවේන, [අට්ඨ+උත්තර-සත] අට්ඨුත්තරසත මංගල [ලක්ඛණ+ආනුභාවේන] ලක්ඛණානුභාවේන, [ඡබ්බණ්ණ-රංසි+ආනුභාවේන] ඡබ්බණ්ණරංස්‍යානුභාවේන, [කේතුමාලා+ආනුභාවේන] කේතුමාලානුභාවේන, [දස-පාරමිතා+ආනුභාවේන] දසපාරමිතානුභාවේන, [දස-උපපාරමිතා+ආනුභාවේන] දසඋපපාරමිතානුභාවේන, [දස-පරමත්ථ පාරමිතා+ආනුභාවේන] දසපරමත්ථ පාරමිතානුභාවේන, [සීල-සමාධි-පඤ්ඤා+ආනුභාවේන] සීලසමාධිපඤ්ඤානුභාවේන, බුද්ධානුභාවේන, ධම්මානුභාවේන, සංඝානුභාවේන,

★ ද්වත්තිංස මහා පුරුෂ [ලක්ඛණ+ආනුභාවේන] ලක්ඛණානුභාවේන (දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගේ ආනුභාවයෙන්), [අසීති+අනුව්‍යංජණ] අසීත්‍යානුව්‍යංජණ [ලක්ඛණ+ආනුභාවේන] ලක්ඛණානුභාවේන (අසූවක්වූ අනුව්‍යංජණ ලක්ෂණයන්ගේ ආනුභාවයෙන්), [අට්ඨ+උත්තර-සත] අට්ඨුත්තරසත (අටක් වැඩි සියයක්/ එකසියඅටක්වූ) මංගල [ලක්ඛණ+ආනුභාවේන] ලක්ඛණානුභාවේන (මගුල්ලකුණුවල ආනුභාවයෙන්), [ඡබ්බණ්ණ-රංසි+ආනුභාවේන] ඡබ්බණ්ණරංස්‍යානුභාවේන (සවනක්සණ බුදුරුස්වල ආනුභාවයෙන්), [කේතුමාලා+ආනුභාවේන] කේතුමාලානුභාවේන (චක්‍රාකාරව සිරසවටා ඇති රස්මිදහරාවේ ආනුභාවයෙන්), [දස-පාරමිතා+ආනුභාවේන] දසපාරමිතානුභාවේන (දස පාරමිතාවන්ගේ ආනුභාවයෙන්) [දස-උපපාරමිතා+ආනුභාවේන] දසඋපපාරමිතානුභාවේන (දස උපපාරමිත්වන්ගේ ආනුභාවයෙන්), [දස-පරමත්ථ පාරමිතා+ආනුභාවේන] දසපරමත්ථ පාරමිතානුභාවේන (දස පරමත්ථ පාරමිතාවන්ගේ ආනුභාවයෙන්),

[සීල-සමාධි-පඤ්ඤා+ආනුභාවේන] සීලසමාධිපඤ්ඤානුභාවේන (සීල සමාධි ප්‍රඥාවන්ගේ ආනුභාවයෙන්) බුද්ධානුභාවේන (බුද්ධ ආනුභාවයෙන්), ධම්මානුභාවේන (ධර්මයේ ආනුභාවයෙන්), සංඝානුභාවේන (සංඝයාගේ ආනුභාවයෙන්),

☞ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගේ ආනුභාවයෙන්, අසූවක්වූ අනුව්‍යංජණ ලක්ෂණයන්ගේ ආනුභාවයෙන්, එකසියඅටක්වූ මඟුල්ලකුණුවල ආනුභාවයෙන්, සවනක්සණ බුදුරුස්වල ආනුභාවයෙන්, චක්‍රාකාරව සිරසවටා ඇති රස්මිදහරාවේ ආනුභාවයෙන්, දස පාරමිතාවන්ගේ ආනුභාවයෙන්, දස උපපාරමිත්වන්ගේ ආනුභාවයෙන්, දස පරමත්ථ පාරමිතාවන්ගේ ආනුභාවයෙන්, සීල සමාධි ප්‍රඥාවන්ගේ ආනුභාවයෙන්, බුද්ධ ආනුභාවයෙන්, ධර්මයේ ආනුභාවයෙන්, සංඝයාගේ ආනුභාවයෙන්,

- තේජානුභාවේන, ඉධ්‍යානුභාවේන, බලානුභාවේන, ඤෙය්‍යධම්මානුභාවේන, චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවේන, නව ලෝකුත්තර ධම්මානුභාවේන, අට්ඨංගික මග්ගානුභාවේන, අට්ඨ සමාපත්‍යානුභාවේන, ඡලභිඤ්ඤානුභාවේන, මෙත්තාකරුණාමුදිතාඋපෙක්ඛානුභාවේන, සබ්බ පාරමිතානුභාවේන, රතනත්තය සරණානුභාවේන,

• [තේජ+ආනුභාවේන] තේජානුභාවේන, [ඉද්ධි+ආනුභාවේන] ඉධ්‍යානුභාවේන, [බල+ආනුභාවේන] බලානුභාවේන, [ඤෙය්‍ය-ධම්ම+ආනුභාවේන] ඤෙය්‍යධම්මානුභාවේන, චතුරාසීති සහස්ස [ධම්ම+ඛන්ධ+ආනුභාවේන] ධම්මක්ඛන්ධානුභාවේන, නව ලෝකුත්තර [ධම්ම+ආනුභාවේන] ධම්මානුභාවේන, [අට්ඨ+අංගික-මග්ග+ආනුභාවේන] අට්ඨංගිකමග්ගානුභාවේන, [අට්ඨ-සමාපත්ති+ආනුභාවේන] අට්ඨසමාපත්‍යානුභාවේන, [ඡ+අභිඤ්ඤා+ආනුභාවේන] ඡලභිඤ්ඤානුභාවේන, මෙත්තා-කරුණා-මුදිතා-උපෙක්ඛානුභාවේන, [සබ්බ-පාරමිතා+ආනුභාවේන] සබ්බපාරමිතානුභාවේන, රතනත්තය [සරණ+ආනුභාවේන] සරණානුභාවේන

★ [තේජ+ආනුභාවේන] තේජානුභාවේන (තේජසේ ආනුභාවයෙන්), [ඉද්ධි+ආනුභාවේන] ඉධ්‍යානුභාවේන (ඍද්ධීන්ගේ ආනුභාවයෙන්), [බල+ආනුභාවේන] බලානුභාවේන (බලයන්ගේ ආනුභාවයෙන්), [ඤෙය්‍ය-ධම්ම+ආනුභාවේන] ඤෙය්‍යධම්මානුභාවේන (අවබෝධකලාවූ ධර්මයන්ගේ ආනුභාවයෙන්), චතුරාසීති සහස්ස [ධම්ම+ඛන්ධ+ආනුභාවේන] ධම්මක්ඛන්ධානුභාවේන (අසූ හාරදහසක් ධර්මස්කන්දයේ ආනුභාවයෙන්), නව ලෝකුත්තර [ධම්ම+ආනුභාවේන] ධම්මානුභාවේන (නව ලෝකුත්තර ධර්මයන්ගේ ආනුභාවයෙන්), [අට්ඨ+අංගික-මග්ග+ආනුභාවේන] අට්ඨංගිකමග්ගානුභාවේන (මාර්ග අංග අටෙහි ආනුභාවයෙන්), [අට්ඨ-සමාපත්ති+ආනුභාවේන] අට්ඨසමාපත්‍යානුභාවේන (සමාපත්ති අටෙහි ආනුභාවයෙන්), [ඡ+අභිඤ්ඤා+ආනුභාවේන] ඡලභිඤ්ඤානුභාවේන (සයාකාර අභිඤ්ඤාවන්ගේ ආනුභාවයෙන්), මෙත්තා-කරුණා-මුදිතා-උපෙක්ඛානුභාවේන (මෛත්‍රී-කරුණා-මුදිතා-උපෙක්ෂාවන්ගේ ආනුභාවයෙන්), [සබ්බ-පාරමිතා+ආනුභාවේන] සබ්බපාරමිතානුභාවේන (සියලු පාරමිතාවන්ගේ ආනුභාවයෙන්), රතනත්තය සරණානුභාවේන [සරණ+ආනුභාවේන] (තුන්සරණෙහි ආනුභාවයෙන්)

☞ තේජසේ ආනුභාවයෙන්, ඍද්ධීන්ගේ ආනුභාවයෙන්, බලයන්ගේ ආනුභාවයෙන්, අවබෝධකලාවූ ධර්මයන්ගේ ආනුභාවයෙන්, අසූ හාරදහසක් ධර්මස්කන්දයේ ආනුභාවයෙන්, නව ලෝකුත්තර ධර්මයන්ගේ ආනුභාවයෙන්, මාර්ග අංග අටෙහි ආනුභාවයෙන්, සමාපත්ති අටෙහි ආනුභාවයෙන්, මෛත්‍රී-කරුණා-මුදිතා-උපෙක්ෂාවන්ගේ ආනුභාවයෙන්, සියලු පාරමිතාවන්ගේ ආනුභාවයෙන්, තුන්සරණෙහි ආනුභාවයෙන්,

- තුය්හං සබ්බ රෝග සෝක උපද්දව දුක්ඛ [දෝමනස්ස+උපායාසා] දෝමනස්සුපායාසා විනස්සන්තු, සබ්බ සංකප්පා තුය්හං සමිජ්ඣන්තු, දීඝායුකෝ හෝතු සත වස්ස ජීවේන, සමංගිකෝ හෝතු සබ්බදා.

★ තුය්හං (ඔබගේ) සබ්බ (සියලු) රෝග සෝක උපද්දව (රෝග සෝක උපද්‍රව) දුක්ඛ (දුක්) [දෝමනස්ස+උපායාසා] දෝමනස්සුපායාසා (දෝමනස්සයන් සිතේවෙහෙස) විනස්සන්තු (විනාශ වෙත්වා/ දුරුවෙත්වා), තුය්හං සබ්බ සංකප්පා සමිජ්ඣන්තු (ඔබගේ සියලු පැතුම් ඉටුවේවා), දීඝායුකෝ හෝතු (බෝහෝකල් ජීවත්වේවා) සබ්බදා (සැමදා) සත වස්ස ජීවේන (සියක් ආයුෂයෙන්) සමංගිකෝ හෝතු (යුත්තවූවෙක් වේවා).

☞ ඔබගේ සියලු රෝග සෝක උපද්‍රව දුක් දෝමනස්සයන් සිතේවෙහෙස දුරුවෙත්වා, ඔබගේ සියලු පැතුම් ඉටුවේවා, ඔබ බෝහෝකල් ජීවත්වේවා, සැමදා සියක් ආයුෂයෙන් යුත්තවූවෙක් වේවා!

- ආකාස වන භූමි තටාක ගංගා මහාසමුද්ද ආරක්ඛක දේවතා සදා තුම්හේ අනුරක්ඛන්තු, සබ්බ බුද්ධානුභාවේන, සබ්බ ධම්මානුභාවේන, සබ්බ සංඝානුභාවේන, බුද්ධ රතනං ධම්ම රතනං සංඝ රතනං තින්නං රතනානං ආනුභාවේන, චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවේන, පිඨකත්තයානුභාවේන, ජිනසාවකානුභාවේන, සබ්බේ තේ රෝගා, සබ්බේ තේ භයා, සබ්බේ තේ අන්තරායා, සබ්බේ තේ උපද්දවා, සබ්බේ තේ දුන්නිමිත්තා, සබ්බේ තේ අවමංගලා විනස්සන්තු.

★ ආකාස වන භූමි (අහසෙහි වනයන්හි පොළොවෙහි) තටාක ගංගා මහාසමුද්ද (වැව්පොකුණුවල ගංභාවල මහමුහුදෙහි) ආරක්ඛක දේවතා (ආරක්ෂක දෙවියෝ) සදා තුම්හේ අනුරක්ඛන්තු (සැමදා නුඹලාව රකිත්වා), සබ්බ බුද්ධානුභාවේන (සියලු බුදුවරුන්ගේ ආනුභාවයෙන්), සබ්බ ධම්මානුභාවේන (සද්ධර්මයේ සියලු ආනුභාවයෙන්), සබ්බ සංඝානුභාවේන (සංඝරත්නයේ සියලු ආනුභාවයෙන්), බුද්ධ රතනං (බුද්ද රත්නය) ධම්ම රතනං (ධර්ම රත්නය) සංඝ රතනං (සංඝ රත්නය) තින්නං රතනානං ආනුභාවේන (තුන් රත්නයන්ගේ ආනුභාවයෙන්), චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවේන (අසූහාරදහසක් ධර්මස්කන්දයේ ආනුභාවයෙන්), පිඨකත්තයානුභාවේන (තුන්පිටකයේ ආනුභාවයෙන්), ජිනසාවකානුභාවේන (බුද්ධ ශ්‍රාවකයන්ගේ ආනුභාවයෙන්), සබ්බේ තේ රෝගා (ඔබේ සියලු රෝග), සබ්බේ තේ භයා (ඔබේ සියලු බිය), සබ්බේ තේ අන්තරායා (ඔබේ සියලු අනතුරු), සබ්බේ තේ උපද්දවා (ඔබේ සියලු උපද්‍රව), සබ්බේ තේ දුන්නිමිත්තා (ඔබේ සියලු අසුභනිමිති), සබ්බේ තේ අවමංගලා (ඔබේ සියලු අසුභදේ) විනස්සන්තු (විනාශවෙත්වා / දුරුවෙත්වා).

☞ අහසෙහි වනයන්හි පොළොවෙහි වැව්පොකුණුවල ගංභාවල මහමුහුදෙහි ආරක්ෂක දෙවියෝ සැමදා නුඹලාව රකිත්වා, සියලු බුදුවරුන්ගේ ආනුභාවයෙන්, සද්ධර්මයේ සියලු ආනුභාවයෙන්, සංඝරත්නයේ සියලු ආනුභාවයෙන්, බුද්ද රත්නය ධර්ම රත්නය සංඝ රත්නය යන තුන් රත්නයන්ගේ ආනුභාවයෙන්, අසූහාරදහසක් ධර්මස්කන්දයේ ආනුභාවයෙන්, තුන්පිටකයේ ආනුභාවයෙන්, බුද්ධ ශ්‍රාවකයන්ගේ ආනුභාවයෙන්, ඔබේ සියලු රෝග, ඔබේ සියලු බිය, ඔබේ සියලු අනතුරු, ඔබේ සියලු උපද්‍රව, ඔබේ සියලු අසුභනිමිති, ඔබේ සියලු අසුභදේ විනාශවෙත්වා / දුරුවෙත්වා

ආයු වඩ්ඪකෝ, ධන වඩ්ඪකෝ, සිරි වඩ්ඪකෝ, යස වඩ්ඪකෝ, බල වඩ්ඪකෝ, වණ්ණ වඩ්ඪකෝ, සුඛ වඩ්ඪකෝ හෝතු සබ්බදා.

★ සබ්බදා (සැමදා) ආයු වඩ්ඪකෝ (ආයුෂ වැඩෙන්නෙක්), ධන වඩ්ඪකෝ (ධනය වැඩෙන්නෙක්), සිරි වඩ්ඪකෝ (ශ්‍රීය වැඩෙන්නෙක්), යස වඩ්ඪකෝ (යසස වැඩෙන්නෙක්), බල වඩ්ඪකෝ (බලය වැඩෙන්නෙක්), වණ්ණ වඩ්ඪකෝ (වර්ණය වැඩෙන්නෙක්), සුඛ වඩ්ඪකෝ (සැප වැඩෙන්නෙක්) හෝතු (වේවා!)

☞ සැමදා ආයුෂයෙන් වැඩෙන්නෙක්, ධනයෙන් වැඩෙන්නෙක්, ශ්‍රීයෙන් වැඩෙන්නෙක්, යසසින් වැඩෙන්නෙක්, බලයෙන් වැඩෙන්නෙක්, වර්ණයෙන් වැඩෙන්නෙක්, සැපයෙන් වැඩෙන්නෙක් වේවා!

දුක්ඛ රෝග භයා වේරා - සෝකා සබ්බේ උපද්දවා
අනේකා අන්තරායාපි - විනස්සන්තු ච තේජසා

★ දුක්ඛ රෝග භයා (දුක් රෝග බිය) වේරා සෝකා (වෛරීඅය සෝක) සබ්බේ උපද්දවා (සියලු උපද්‍රව) අනේකා අන්තරායා-පි ච (නොයෙක් අනතුරු ද) තේජසා විනස්සන්තු (තේජසින් විනාශ වේවා/ දුරුව්වා)

ජය සිද්ධි ධනං ලාභං - සොත්ථි භග්‍යං සුඛං බලං
සිරි ආයු ච වණ්ණෝ ච - භෝගං වුද්ධී ච යසවා
සත වස්සා ච ආයූච - ජීව සිද්ධි භවන්තු තේ.

★ ජයසිද්ධි ධනං ලාභං (ජයග්‍රහන ධන ලාභ) සොත්ථි භග්‍යං (සුවපත්බව සෞභාග්‍යය) සුඛං බලං සිරි ආයූ ච (සුඛය බලය ශ්‍රීය ආයුෂ ද) වණ්ණෝ ච භෝගං වුද්ධී ච (වර්ණය ද භෝගයන්ගේ වැඩීම ද) යසවා (යසවත්බව) සතවස්සා ච ආයූච (සියවස් ආයුෂ ද) ජීව සිද්ධි (බොහෝකල් ජීවත්වීම ද) තේ භවන්තු (ඔබට ඉෂ්ඨවේවා!).

<u>චූල ජින පඤ්ජර පිරිත හෙවත් දසදිසා පිරිත</u>

1. දිසාසු දස භාගේසු - ඨිතා බුද්ධානු භාවතෝ
   වේරාදි අන්තරායාපි - විනස්සන්ති අසේසතෝ
   ඒවමාදි ගුනෝපේතං - පරිත්තං තං භණාමහේ

• දස දිසාසු භාගේසු ඨිතා [බුද්ධ+ආනුභාවතෝ] බුද්ධානුභාවතෝ [වේර+ආදි] වේරාදි අන්තරායා-පි අසේසතෝ විනස්සන්ති, ඒවමාදි [ගුන+උපේතං] ගුනෝපේතං තං පරිත්තං [මයං] භණාමහේ

★ දස දිසාසු භාගේසු (දස දිසා භාගයන්හි) ඨිතා (පිහිටි) [බුද්ධ+ආනුභාවතෝ] බුද්ධානුභාවතෝ (බුරුවරුන්ගේ ආනුභාවයෙන්) [වේර+ආදි] වේරාදි (වෛරී ඇත්තන්ගේ ආදි) අන්තරායා-පි (අනතුරු ද) අසේසතෝ විනස්සන්ති (ශේෂනොකරම විනාශවෙති), ඒවමාදි (මෙබඳුවූ) [ගුන+උපේතං] ගුනෝපේතං (ගුණයන්ගෙන් යුක්ත) තං පරිත්තං (ඒ පිරිත) [මයං] භණාමහේ (අපි දේශනාකරන්නෙමු)

☞ දස දිසා භාගයන්හි පිහිටි බුරුවරුන්ගේ ආනුභාවයෙන් වෛරී ඇත්තන්ගේ ආදි අනතුරු ශේෂනොකරම විනාශවෙති, මෙබඳුවූ ගුණයන්ගෙන් යුක්ත ඒ පිරිත අපි දේශනාකරන්නෙමු

2. පදුමුත්තරෝ පුරත්ථිමායං - අග්ගිම්හි චේව රේවතෝ
   දක්ඛිණේ කස්සපෝ බුද්ධෝ - නේරුතේ ච සුමංගලෝ

• [තේ] පුරත්ථිමායං පදුමුත්තරෝ බුද්ධෝ අග්ගිම්හි චේව රේවතෝ බුද්ධෝ දක්ඛිණේ කස්සපෝ බුද්ධෝ නේරුතේ ච සුමංගලෝ බුද්ධෝ

මෙම එක් එක් දිශාවන්හි ඒ ඒ බුදුවරු සිටියි යන්නෙන් අදහස් වන්නේ උන්වහන්සේලාගේ තේජෝබල පිහිටියේය යන්නයි

★ [තේ](ඔබගේ) පුරත්ථිමායං පදුමුත්තරෝ බුද්ධෝ (නැගෙනහිර දිශාවෙහි පදුමුත්තර බුදුන්ය) අග්ගිම්හි චේව රේවතෝ බුද්ධෝ (ගිනිකොන දිශාවෙහි රේවත බුදුන්ය) දක්ඛිණේ කස්සපෝ බුද්ධෝ (දකුණු දිශාවෙහි කාශ්‍යප බුදුන්ය) නේරුතේ ච සුමංගලෝ බුද්ධෝ (නිරිත දිශාවෙහි සුමංගල බුදුන්ය)

3. පච්ඡිමේ ච සිඛී බුද්ධෝ - වායව්‍යා මේධංකරෝ
   උත්තරේ පියදස්සී ච - ඊසානේ දීපංකරෝ
   පථව්‍යා කකුසන්ධෝ - ආකාසේ සරණංකරෝ

• පච්ඡිමේ ච සිඛී බුද්ධෝ වායව්‍යා මේධංකරෝ බුද්ධෝ උත්තරේ පියදස්සී ච බුද්ධෝ ඊසානේ දීපංකරෝ බුද්ධෝ පථව්‍යා කකුසන්ධෝ බුද්ධෝ ආකාසේ සරණංකරෝ බුද්ධෝ

★ පච්ඡිමේ ච සිඛී බුද්ධෝ (බටහිර දිශාවෙහි සිඛී බුදුන්ය) වායව්‍යා මේධංකරෝ බුද්ධෝ (වයඹ දිශාවෙහි මේධංකර බුදුන්ය) උත්තරේ පියදස්සී ච බුද්ධෝ (උතුරු දිශාවෙහි පියදස්සි බුදුන්ය) ඊසානේ දීපංකරෝ බුද්ධෝ (ඊසාන දිශාවෙහි දීපංකර බුදුන්ය) පථව්‍යා කකුසන්ධෝ බුද්ධෝ (පොළොවෙහි දීපංකර බුදුන්ය) ආකාසේ සරණංකරෝ බුද්ධෝ (අහසෙයි දීපංකර බුදුන්ය)

4. අච්චන්තරායා සබ්බේ තේ - සෝක රෝග භයාපි ච
   විනස්සන්තු සදා තුය්හං - සබ්බිරියා පථේසු ච

• [තේසං බුද්ධානුභාවතෝ] සදා තුය්හං [සබ්බ+ඉයාපථේසු] සබ්බිරියාපථේසු තේ සබ්බේ අච්චන්තරායා සෝක රෝග භයාපි ච විනස්සන්තු

★ [තේසං බුද්ධානුභාවතෝ (ඒ බුදුවරුන්ගේ ආනුභාවයෙන්)] සදා තුය්හං (සැමදා ඔබගේ) [සබ්බ+ඉයාපථේසු] සබ්බිරියාපථේසු (සියලු ඉරියව්වල) තේ සබ්බේ (ඔබගේ සියලු) අච්චන්තරායා (අනතුරු) සෝක රෝග භයාපි ච (සෝකයන් රෝගයන් බිය ද) විනස්සන්තු (විනාශවේවා/ දුරුවේවා!)

☞ ඒ බුදුවරුන්ගේ ආනුභාවයෙන් සැමදා ඔබගේ සියලු ඉරියව්වල සියලු අනතුරු සෝකයන් රෝගයන් ද බිය ද විනාශවේවා/ දුරුවේවා!

5. යක්ඛාදි දේවතාහි ච - රාජ චෝරාරි අග්ගිහි
   අමනුස්සේහි සබ්බේහි - තිරච්ඡාන ගතේහි ච
   ජාතා උපද්දවා සබ්බේ - විනස්සන්තු අසේසතෝ

• [යක්ඛ+ආදි] යක්ඛාදි දේවතාහි ච රාජ [චෝරා+අරි] චෝරාරි අග්ගිහි සබ්බේහි අමනුස්සේහි තිරච්ඡාන ගතේහි ච ජාතා සබ්බේ උපද්දවා අසේසතෝ විනස්සන්තු

★ [යක්ඛ+ආදිහි+දේවතාහි] යක්ඛාදිදේවතාහි ච (යක්ෂාදීන්ගෙන් ද දෙවියන්ගෙන් ද) රාජ (රජුගෙන් ද) [චෝරා+අරි] චෝරාරි (සොර සතුරන් ගෙන් ද) අග්ගිහි (ගින්නෙන් ද) සබ්බේහි අමනුස්සේහි (සියලු අමනුස්සයන්ගෙන් ද) තිරච්ඡාන ගතේහි ච (තිරිසන්ගත සතුන්ගෙන් ද) ජාතා සබ්බේ උපද්දවා (උපන්නාවූ සියලු උපද්‍රව) අසේසතෝ විනස්සන්තු (ඉතිරියක් නැතිව විනාශවෙත්වා / දුරුවෙත්වා!)

☞ යක්ෂාදීන්ගෙන් ද දෙවියන්ගෙන් ද රජුගෙන් ද සොර සතුරන්ගෙන් ද ගින්නෙන් ද සියලු අමනුස්සයන්ගෙන් ද තිරිසන්ගත සතුන්ගෙන් ද උපන්නාවූ සියලු උපද්‍රව ඉතිරියක් නැතිව විනාශවෙත්වා / දුරුවෙත්වා!

6. සිරස්මිං තේ බුද්ධ සෙට්ඨෝ - සාරිපුත්තෝ ච දක්ඛිණේ
   වාමංසේ මොග්ගල්ලානෝ තේ - පුරතෝ පිටකත්තයං

• සිරස්මිං තේ බුද්ධ සෙට්ඨෝ දක්ඛිණේ සාරිපුත්තෝ ච වාමංසේ මොග්ගල්ලානෝ තේ පුරතෝ පිටකත්තයං

★ සිරස්මිං තේ (ඔබගේ හිසෙහි) බුද්ධ සෙට්ඨෝ (බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේය) දක්ඛිණේ සාරිපුත්තෝ ච (දකුණින් සැරියුත් හිමි ද) වාමංසේ මොග්ගල්ලානෝ (වම්පසින් මුගලන් හිමි ද) තේ පුරතෝ පිටකත්තයං (ඔබගේ ඉදිරියෙන් තුන්පිටකය ද)

☞ ඔබගේ හිසෙහි බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේය, දකුණින් සැරියුත් හිමි ද වම්පසින් මුගලන් හිමි ද වැඩසිටියි, ඔබගේ ඉදිරියෙන් තුන්පිටකය ද වේ [ඔබගේ හිසෙහි බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේගේ බලය ද, දකුණින් සැරියුත් හිමිගේ බලය ද වම්පසින් මුගලන් හිමිගේ බලය ද , ඔබගේ ඉදිරියෙන් තුන්පිටකයේ බලය ද පවතීවා]

7. පච්ඡිමේ තව ආනන්දෝ - චතුද්දිසා ඛීණාසාවා
   සමන්තා ලෝක පාලා ච - ඉන්දදේවෝ ච බ්‍රහ්මා ච

• තව පච්ඡිමේ ආනන්දෝ චතුද්දිසා ඛීණාසාවා සමන්තා ලෝක පාලා ච ඉන්දදේවෝ ච බ්‍රහ්මා

★ තව (ඔබගේ) පච්ඡිමේ ආනන්දෝ (පිටුපසින් ආනන්ද හිමි ද) චතුද්දිසා ඛීණාසාවා (සිව්දිසාවේ ඛීණශ්‍රාවකයන් වහන්සේලා ද) සමන්තා ලෝක පාලා (හත්පසින් ලෝකපාලක) ඉන්දදේවෝ ච බ්‍රහ්මා ච (ඉන්ද්‍රදෙවිද බ්‍රක්මයා ද වේ)

8. ඒතේසං ආනුභාවේන - සබ්බූපද්දවුපද්දවා
   අනේකා අන්තරායාපි - විනස්සන්තු අසේසතෝ

• ඒතේසං ආනුභාවේන [සබ්බ+උපද්දව+උපද්දවා] සබ්බූපද්දවුපද්දවා අනේකා අන්තරායා-පි අසේසතෝ විනස්සන්තු

★ ඒතේසං ආනුභාවේන (ඔවුන්ගේ ආනුභාවයෙන්) [සබ්බ+උපද්දව+උපද්දවා] සබ්බූපද්දවූපද්දවා (සියලු උපද්‍රව) අනේකා අන්තරායා-පි (නොයෙක් අනතුරු ද) අසේසතෝ විනස්සන්තු (ඉතිරියක් නැතිව විනාශවෙත්වා / දුරුවෙත්වා!)

.

☞ ඔවුන්ගේ ආනුභාවයෙන් සියලු උපද්‍රව ද නොයෙක් අනතුරු ද ඉතිරියක් නැතිව විනාශවෙත්වා / දුරුවෙත්වා!

<u>වට්ටක පිරිත</u>

1. පූරෙන්තං බෝධි සම්භාරේ - නිබ්බත්තං වට්ටක ජාතියං
   යස්ස තේජේන දාවග්ගි - මහා සත්තං විවජ්ජයි

• මහා සත්තං බෝධි සම්භාරේ පූරෙන්තං වට්ටක ජාතියං නිබ්බත්තං යස්ස තේජේන දාවග්ගි විවජ්ජයි

★ මහා සත්තං (මහබෝසතුන්) බෝධි සම්භාරේ (බෝධිසම්බාර / පාරමී) පූරෙන්තං (පුරමින්) වට්ටක ජාතියං (වටුකුරුලු ජාතියෙහි) නිබ්බත්තං (ඉපිද) යස්ස තේජේන (යමකගේ තෙදින්) දාවග්ගි (ලැව්ගින්න) විවජ්ජයි (දුරුකලේ ද/ නවතාදැමුවේ ද)

☞ මහබෝසතුන් බෝධිසම්බාර පුරමින් වටුකුරුලු ජාතියෙහි ඉපිද යමකගේ [යම්පිරිතක] තෙදින් ලැව්ගින්න නවතාදැමුවේ ද

2. ථේරස්ස සාරිපුත්තස්ස - ලෝකනාථේන භාසිතං
   කප්පට්ඨායිං මහා තේජං - පරිත්තං තං භණාමහේ

• ලෝකනාථේන ථේරස්ස සාරිපුත්තස්ස භාසිතං මහා තේජං කප්පට්ඨායිං තං පරිත්තං භණාමහේ

★ ලෝකනාථේන (ලෝකනාථයානන් වහන්සේ විසින්) ථේරස්ස සාරිපුත්තස්ස (සැරියුත් තෙරුන්වහන්සේට) භාසිතං (දේශනාකල) මහා තේජං (මහා තෙදැති) කප්පට්ඨායිං (කල්පයක් පුරා බලය පවතින) තං පරිත්තං (ඒ පිරිත) භණාමහේ (දේශනාකරන්නෙමු)

☞ ලෝකනාථයානන් වහන්සේ විසින් සැරියුත් තෙරුන්වහන්සේට දේශනාකල මහා තෙදැති කල්පයක් පුරා බලය පවතින ඒ පිරිත දේශනාකරන්නෙමු

3. අත්ථි ලෝකේ සීලගුණෝ - සච්චං සෝචෙය්‍යානුද්දයා
   තේන සච්චේන කාහාමි - සච්ච කිරිය මුත්තමං

• ලෝකේ සීලගුණෝ අත්ථි සච්චං අත්ථි [සෝචෙය්‍යා+අනුද්දයා] සෝචෙය්‍යානුද්දයා අත්ථි තේන සච්චේන [සච්චකිරියං+උත්තමං] සච්චකිරියමුත්තමං කාහාමි

★ ලෝකේ (ලොවෙහි) සීලගුණෝ අත්ථි (සිල්ගුණ ඇත) සච්චං අත්ථි (සත්‍යය ඇත) සෝචෙය්‍යා අත්ථි (පිරිසිදුබව ඇත) අනුද්දයා අත්ථි (දයාකරුණාව ඇත) තේන සච්චේන (ඒ සත්‍යයේ බලයෙන්) උත්තමං සච්චකිරියං (උතුම් සත්‍යයක් ක්‍රියාව) කාහාමි (කරන්නෙමි)

☞ ලොවෙහි සිල්ගුණ ඇත සත්‍යය ඇත පිරිසිදුබව ඇත දයාකරුණාව ඇත ඒ සත්‍යයේ බලයෙන් උතුම් සත්‍යයක් ක්‍රියාව කරන්නෙමි

4. ආවජ්ජිත්වා ධම්මබලං - සරිත්වා පුබ්බකේ ජිනේ
සච්ච බලමවස්සාය - සච්චකිරිය මකාසහං

• ධම්මබලං ආවජ්ජිත්වා පුබ්බකේ ජිනේ සරිත්වා [සච්චබලං+අවස්සාය] සච්චබලමවස්සාය [සච්චකිරියං+අකාසි+අහං] සච්චකිරියමකාසහං

★ ධම්මබලං ආවජ්ජිත්වා (ධර්මයේ බලය සිතාබලා/ සිහිකර) පුබ්බකේ ජිනේ සරිත්වා (පෙර බුදුවරු සිහිකර) [සච්චබලං+අවස්සාය] සච්චබලමවස්සාය (සත්‍යයබලයේ පිහිට පිණිස) අහං සච්චකිරියං අකාසි (මම සත්‍යයක්ක්‍රියා කලෙමි.)

☞ ධර්මයේ බලය සිතාබලා, පෙර බුදුවරු සිහිකර, සත්‍යයබලයේ පිහිට පිණිස මම සත්‍යයක්ක්‍රියා කලෙමි

5. සන්තිපක්ඛා අපතනා - සන්තිපාදා අවඤ්චනා
මාතා පිතා ච නික්ඛන්තා - ජාතවේද පටික්කම

• [මය්හං] අපතනා පක්ඛා සන්ති, අවඤ්චනා පාදා සන්ති, මාතා පිතා ච [මං] නික්ඛන්තා, ජාතවේද පටික්කම

★ [මය්හං](මට) අපතනා පක්ඛා සන්ති (පියඹා යානොහැකි පියාපත් ඇත), අවඤ්චනා පාදා සන්ති (ඇවිද යානොහැකි පාද ඇත), මාතා පිතා ච (මව්පියෝ ද) [මං] නික්ඛන්තා (මා හැරගියේය), ජාතවේද පටික්කම (ගින්න ඉවත්වයන්න!)

☞ මට පියඹා යා නොහැකි පියාපත් ඇත, ඇවිද යා නොහැකි පාද ඇත, මව්පියෝ ද මා හැරගියේය, ඒ සත්‍යයේ බලයෙන් ගින්න ඉවත්වයන්න!

6. සහ සච්චේ කතේ මය්හං - මහා පජ්ජලිතෝ සිඛී
වජ්ජේසි සෝළස කරීසානි - උදකං පත්වා යථා සිඛී
සච්චේන මේ සමෝ නත්ථි - එසා මේ සච්ච පාරමීති.

• මය්හං සහ සච්චේ කතේ පජ්ජලිතෝ මහා සිඛී සෝළස කරීසානි වජ්ජේසි, උදකං පත්වා යථා සිඛී, සච්චේන මේ සමෝ නත්ථි, එසා මේ සච්ච පාරමී.

★ මය්හං (මගේ) සහ සච්චේ කතේ (සත්‍යයක් ක්‍රියාවත් සමග ම) පජ්ජලිතෝ මහා සිඛී (ඇවිලෙන මහා ගින්න) උදකං පත්වා යථා සිඛී (ජලට පැමිණි ගින්නක්සේ) සෝළස කරීසානි (අක්කර 160 ක ප්‍රමාණයක්) වජ්ජේසි (අතහැරියේය), සච්චේන (සත්‍යයක් ක්‍රියාකිරීමෙන්) මේ සමෝ නත්ථි (මා හා සමවූවෙක් නැත), එසා මේ සච්ච පාරමී (මේ මගේ සත්‍යය පාරමිතාවයි).
[අමුණක් 1 = අක්කර 2½ , කරීස 1 = අමුණු 4, කරිස 16 = අක්කර 160]

☞ මගේ සත්‍යයක් ක්‍රියාවත් සමග ම ඇවිලෙනන මහා ගින්න ජලට පැමිණි ගින්නක්සේ අක්කර 32ක ප්‍රමාණයක් අතහැරියේය, සත්‍යයක් ක්‍රියාකිරීමෙන් මා හා සමවූවෙක් නැත, මේ මගේ සත්‍යය පාරමිතාවයි.

<u>ආටානාටිය පිරිත</u>

1. විපස්සිස්ස නමත්ථු - චක්ඛුමන්තස්ස සිරීමතෝ
සිඛිස්සපි නමත්ථු - සබ්බ භූතානුකම්පිනෝ

#, චක්ඛුමන්තස්ස සිරීමතෝ විපස්සිස්ස නමත්ථු සබ්බභූතානුකම්පිනෝ [සබ්බ-භූතා+අනුකම්පිනෝ] සිඛිස්ස-පි නමත්ථු #
➔ චක්ඛුමන්තස්ස (ප්‍රඥා නැමති නේත්‍ර ඇත්තාවූ) සිරීමතෝ (ශ්‍රීමත්වූ) විපස්සිස්ස (විපස්සී භාග්‍යවතුන් වහන්සේට) නමත්ථු (නමස්කාර වේවා!) සබ්බභූතානුකම්පිනෝ [සබ්බ-භූතා+අනුකම්පිනෝ] (සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇත්තාවූ) සිඛිස්ස-පි (සිඛී භාග්‍යවතුන් වහන්සේට ද) නමත්ථු (නමස්කාර වේවා!)
☞ ප්‍රඥා නැමති නේත්‍ර ඇත්තාවූ ශ්‍රීමත්වූ විපස්සී භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා! සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇත්තාවූ සිඛී භාග්‍යවතුන් වහන්සේට ද නමස්කාර වේවා!

2. වෙස්සභුස්ස නමත්ථු - න්හාතකස්ස තපස්සිනෝ
නමත්ථු කකුසන්ධස්ස - මාරසේනා පමද්දිනෝ

න්හාතකස්ස තපස්සිනෝ වෙස්සභුස්ස නමත්ථු, මාරසේනා-පමද්දිනෝ කකුසන්ධස්ස නමත්ථු
➔ න්හාතකස්ස (කෙලෙස්මල සෝදාහල) තපස්සිනෝ (කෙලෙස්තවන වීර්ය ඇති මහා තාපසයානන්වූ) වෙස්සභුස්ස (වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට) නමත්ථු (නමස්කාර වේවා!), මාරසේනා-පමද්දිනෝ (පංච මාරසේනාවන් සිඳබිඳලූ) කකුසන්ධස්ස (කකුසඳ භාග්‍යවතුන් වහන්සේට) නමත්ථු (නමස්කාර වේවා!)
☞ කෙලෙස්මල සෝදාහල කෙලෙස්තවන වීර්ය ඇති මහා තාපසයානන්වූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා! පංච මාරසේනාවන් සිඳබිඳලූ කකුසඳ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා!

3. කෝණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතෝ
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධි

බ්‍රාහ්මණස්ස වුසීමතෝ කෝණාගමනස්ස නමත්ථු, විප්පමුත්තස්ස සබ්බධි කස්සපස්ස නමත්ථු
➔ බ්‍රාහ්මණස්ස (පිටමංකල කෙලෙස් ඇතිබැවින් බ්‍රාහ්මන නම්වූ) වුසීමතෝ (පිලිපැද නිමකරනලද මාර්ග බ්‍රහ්මචරියා ඇතිබැවින් වුසීමතෝ නම්වූ) කෝණාගමනස්ස (කෝණාගමන භාග්‍යවතුන් වහන්සේට) නමත්ථු (නමස්කාර වේවා!) , විප්පමුත්තස්ස සබ්බධි (සියලු කෙලෙස්වලින් සැමආකාරයෙන්ම සැමතැනින්ම මිදුනාවූ) කස්සපස්ස (කස්සප භාග්‍යවතුන් වහන්සේට) නමත්ථු (නමස්කාර වේවා!)
☞ පිටමංකල කෙලෙස් ඇතිබැවින් බ්‍රාහ්මන නම්වූ, පිලිපැද නිමකරනලද මාර්ග බ්‍රහ්මචරියා ඇතිබැවින් වුසීමතෝ නම්වූ කෝණාගමන භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා! සියලු කෙලෙස්වලින් සැමආකාරයෙන්ම සැමතැනින්ම මිදුනාවූ කස්සප භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා!

4. අඞ්ගීරසස්ස නමත්ථු, - සක්‍යපුත්තස්ස සිරීමතෝ
යෝ ඉමං ධම්මමදේසේසි - සබ්බදුක්ඛා පනූදනං

යෝ සබ්බදුක්ඛා පනූදනං ඉමං ධම්මමදේසේසි [ධම්මං+අදේසේසි], සෝ සිරීමතෝ අඞ්ගීරසස්ස සක්‍යපුත්තස්ස නමත්ථු

➔ යෝ (යම් භාග්‍යවතුන් වහන්සේනමක්) සබ්බදුක්ඛා (සියලු දුක්) පනූදනං (දුරුකරන්නාවූ) ඉමං (මේ) ධම්මමදේසේසි [ධම්මං+අදේසේසි] (ශ්‍රී සද්ධර්මය ද්ශනාකලේ ද), සෝ (ඒ) සිරීමතෝ (සිරිමත්වූ) අඞ්ගීරසස්ස (සිරුරෙන් රස්මිදහරා විහිදෙන) සක්‍යපුත්තස්ස (සාක්‍යපුත්‍රයානන් වහන්සේට) නමත්ථු (නමස්කාර වේවා!)

☞ යම් භාග්‍යවතුන් වහන්සේනමක් සියලු දුක් දුරුකරන්නාවූ මේ ශ්‍රී සද්ධර්මය ද්ශනාකලේ ද, ඒ සිරිමත්වූ සිරුරෙන් රස්මිදහරා විහිදෙන සාක්‍යපුත්‍රයානන් වහන්සේට නමස්කාර වේවා!

5. යේ චාපි නිබ්බුතා ලෝකේ - යථාභූතං විපස්සිසුං
තේ ජනා අපිසුණා - මහන්තා වීතසාරදා

ලෝකේ යථාභූතං විපස්සිසුං නිබ්බුතා යේ [ජනා] චාපි, අපිසුණා මහන්තා වීතසාරදා තේ ජනා [නමත්ථු]

➔ ලෝකේ (ලෝකයෙහි) යථාභූතං (ධර්මතා පවතින ආකාරයෙන්ම) විපස්සිසුං (විපස්සනාකල) නිබ්බුතා (පිරිනිවී/ කෙලෙස් ගින්න නිවාදැමුවා වූ) යේ [ජනා] චාපි (යම් රහතන්වහන්සේලා වේද), අපිසුණා (කේලාම්කිම් ආදී සියලු වාග් දුස්චරිතයන් ගෙන් මිදුනාවූ) මහන්තා (මහත්වූ සීලාදියෙන් සමන්විත) වීතසාරදා (දුරුකල බියසංකා ඇති) තේ ජනා (ඒ රහතන්වහන්සේලට) [නමත්ථු] (නමස්කාර වේවා!)

☞ ලෝකයෙහි, ධර්මතා පවතින ආකාරයෙන්ම විපස්සනාකර කෙලෙස් ගින්න නිවාදැමුවා වූ යම් රහතන්වහන්සේලා වේද, කේලාම්කිම් ආදී සියලු වාග් දුස්චරිතයන් ගෙන් මිදුනාවූ මහත්වූ සීලාදියෙන් සමන්විත දුරුකල බියසංකා ඇති ඒ රහතන්වහන්සේලට නමස්කාර වේවා!

6. හිතං දේවමනුස්සානං - යං නමස්සන්ති ගෝතමං
විජ්ජාචරණ සම්පන්නං - මහන්තං වීතසාරදං

විජ්ජාචරණ සම්පන්නං මහන්තං වීතසාරදං දේවමනුස්සානං හිතං යං ගෝතමං නමස්සන්ති

➔ විජ්ජාචරණ සම්පන්නං (අෂ්ඨ විද්‍යා පසොළොස් චරණ ධර්මයන්ගෙන් සමන්විතවූ) මහන්තං (සීලාදී සියලු ගුණයන්ගෙන් මහත්බවට පැමිණියාවූ) වීතසාරදං (සියලු බිය-සැක දුරුකලාවූ) දේවමනුස්සානං (දෙවිමිනිසුන්ට) හිතං (හිතසුව සලසන්නාවූ) යං ගෝතමං (ගෞතමයන් වහන්සේට) නමස්සන්ති (නමස්කාර වේවා!)

☞ අෂ්ඨ විද්‍යා පසොළොස් චරණ ධර්මයන්ගෙන් සමන්විතවූ සීලාදී සියලු ගුණයන්ගෙන් මහත්බවට පැමිණියාවූ සියලු බිය-සැක දුරුකලාවූ දෙවිමිනිසුන්ට හිතසුව සලසන්නාවූ ගෞතමයන් වහන්සේට නමස්කාර වේවා!

<u>නරසීහ ගාථා</u>

1. චක්කවරංකිත රත්තසුපාදෝ
ලක්ඛණ මණ්ඩිත ආයතපණ්හි
චාමර ඡත්ත විභූසිත පාදෝ
ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

• [චක්ක-වර+අංකිත] චක්කවරංකිත රත්ත-සුපාදෝ, ලක්ඛණ මණ්ඩිත ආයත-පණ්හි, චාමර ඡත්ත විභූසිත පාදෝ, ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ වර චක්ක අංකිත (උතුම් චක්‍රලකුණින් ලකුණුවූ) රත්ත-සුපාදෝ (රත්පැහැ මනා පාද), ලක්ඛණ මණ්ඩිත (පින් ලකුණින් සැරසුනු) ආයත-පණ්හි (දිගු විලුඹ), චාමර ඡත්ත විභූසිත පාදෝ (චාමර ඡත්‍රයන්ගෙන් අලංකාරවූ පාද), ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ උතුම් චක්‍රලකුණින් ලකුණුවූ රත්පැහැ මනා පාද ඇති, පින් ලකුණින් සැරසුනු දිගු විලුඹැති, චාමර ඡත්‍රයන්ගෙන් අලංකාරවූ පාද ඇති, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

*** නන් ලකුණින් සැරසූ රත් පා ඇති
පින් ලකුණින් සැරසූ දිගු විලුඹැති
වර ලකුණින් සැරසූ සොඳ පා ඇති
මේ වෙයි බුදුහිමි මගෙ පිය පින්ඇති

2. සාක්‍ය කුමාරවරෝ සුකුමාලෝ
ලක්ඛණ චිත්තිත පුණ්ණ සරීරෝ
ලෝක හිතාය ගතෝ නරවීරෝ
ඒස හි තුය්හ පිතා නරසීහෝ

• සුකුමාලෝ [සාක්‍යකුමාරෝ+වරෝ] සාක්‍යකුමාරවරෝ, ලක්ඛණ චිත්තිත පුණ්ණ සරීරෝ, ලෝක හිතාය ගතෝ නරවීරෝ, ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ සුකුමාලෝ (සුකුමාලවූ) වරෝ සාක්‍යකුමාරෝ (උතුම් සාක්‍යකුමාරයාය), ලක්ඛණ චිත්තිත (පින් ලකුණුවලින් විසිතුරුවූ) පුණ්ණ සරීරෝ (පිරුණු සිරුක් ඇති), ලෝක හිතාය ගතෝ (ලෝකයාගේ හිතසුව පිණිස ගියාවූ) නරවීරෝ (වීරපුරුෂයාය), ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ සුකුමාලවූ උතුම් සාක්‍යකුමාරයාවූ, පින් ලකුණුවලින් විසිතුරුවූ පිරුණු සිරුක් ඇත්තාවූ, ලෝකයාගේ හිතසුව පිණිස ගිය වීරපුරුෂයාවූ, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

3. පුණ්ණ සසංඛ නිභෝ මුඛ වණ්ණෝ
දේවනරාන පියෝ නර නාගෝ
මත්ත ගජින්ද විලාසිත ගාමී
ඒස හි තුය්හ පිතා නරසීහෝ

• පුණ්ණ සසංඛ නිභෝ මුඛ වන්ණෝ, දේව-නරාන පියෝ නරනාගෝ මත්ත ගජින්ද විලාසිත ගාමී, ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ පුණ්ණ සසංඛ නිභෝ (පිරුණු සඳට සමවූ) මුඛ වන්ණෝ (මුහුණක් ඇති), දේව-නරාන පියෝ (දෙව්මිනිසුන් විසින් ප්‍රියකරන ලද) නරනාගෝ (උතුම් මිනිසාවූ) මත්ත ගජින්ද විලාසිත ගාමී (මද ඇත්ජෙක් විලසින් ගමන්ඇති), ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ පිරුණු සඳට සමවූ මුහුණක් ඇති, දෙව්මිනිසුන් විසින් ප්‍රියකරන ලද උතුම් මිනිසාවූ, මද ඇත්ජෙක් විලසින් ගමන්ඇති, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

4. ඛත්තිය සම්භව අග්ගකුලීනෝ
   දේව මනුස්ස නමස්සිත පාදෝ
   සීල සමාධි පතිට්ඨිත චිත්තෝ
   ඒස හි තුය්හ පිතා නරසීහෝ

• ඛත්තිය සම්භව අග්ගකුලීනෝ දේව මනුස්ස නමස්සිත පාදෝ සීල සමාධි පතිට්ඨිත චිත්තෝ ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ ඛත්තිය සම්භව (රාජවංශයෙහි උපන්නාවූ) අග්ගකුලීනෝ (උතුම් කුලවතාවූ) දේව මනුස්ස නමස්සිත පාදෝ (දෙව්මිනිසුන් විසින් නමස්කාර කරණලද පා ඇති) සීල සමාධි (සීල සමාධීන්) පතිට්ඨිත චිත්තෝ (පිහිටියාවූ සිත් ඇති) ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

★ රාජවංශයෙහි උපන්නාවූ උතුම් කුලවතා වූ, දෙව්මිනිසුන් විසින් නමස්කාර කරණලද ශ්‍රී පාදයන් ඇති, සීල සමාධීන් පිහිටියාවූ සිත් ඇති, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

5. ආයත යුත්ත සුසණ්ඨිත නාසෝ
   ගෝපඛුමෝ අභිනීල සුනෙත්තෝ
   ඉන්දධනූ අභිනීල භමූකෝ
   ඒස හි තුය්හ පිතා නරසීහෝ

• ආයත යුත්ත සුසණ්ඨිත නාසෝ ගෝප-ඛුමෝ අභිනීල සුනෙත්තෝ ඉන්දධනූ අභිනීල භමූකෝ ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ ආයත යුත්ත සුසණ්ඨිත නාසෝ (දිගු මනාව පිහිටියාවූ නාසයක් ඇති) ගෝ-පඛුමෝ (වසුපැටවකුගේ ඇස් පිහාටු මෙන් ඇසිපිය ඇති) අභිනීල සුනෙත්තෝ (මනහර නිල්පැහැ මනා නෙත් ඇති) ඉන්දධනූ (දේදුන්නක් මෙන්) අභිනීල භමූකෝ (මනහර නිල්පැහැ ඇස්බැම් ඇති) ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ දිගු මනාව පිහිටියාවූ නාසයක් ඇති, වසුපැටවකුගේ ඇස් පිහාටු මෙන් ඇසිපිය ඇති, මනහර නිල්පැහැ මනා නෙත් ඇති, දේදුන්නක් මෙන් මනහර නිල්පැහැ ඇස්බැම් ඇති, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

6. වට්ට සුමට්ට සුසණ්ඨිත ගීවෝ
සීහහනූ මිගරාජ සරීරෝ
කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණෝ
ඒස හි තුය්හ පිතා නරසීහෝ

• වට්ට සුමට්ට සුසණ්ඨිත ගීවෝ, සීහහනූ මිගරාජ සරීරෝ, කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණෝ ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ වට්ට සුමට්ට (වට සුමට) සුසණ්ඨිත ගීවෝ (මනාව පිහිටි ගෙලක් ඇති), සීහහනූ (සිංහයකුගේ මේන් හණු ඇති) මිගරාජ සරීරෝ (සිංහරජෙකුමෙන් සිරුරැති), කඤ්චන සුච්ඡවි (රන්වන් පැහැ මනා සමක්ඇති) උත්තම වණ්ණෝ (උතුම් රූසපුවක් ඇත්තා) ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ වට සුමටව මනාව පිහිටි ගෙලක් ඇති, සිංහ හණු මෙන් රවුම් හණු ඇති, සිංහරජෙකුමෙන් සිරුරැති, රන්වන් පැහැ මනා සමක්ඇති, උතුම් රූසපුවක් ඇති, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

7. සිනිද්ධ සුගම්භිර මඤ්ජුසු සෝසෝ
හිංගුල බද්ධ සුරත්ත සුජිව්හෝ
වීසති වීසති සේත සුදන්තෝ
ඒස හි තුය්හ පිතා නරසීහෝ

• සිනිද්ධ සුගම්භිර මඤ්ජුසු සෝසෝ බද්ධ හිංගුල සුරත්ත සුජිව්හෝ වීසති වීසති සේත සුදන්තෝ ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ සිනිද්ධ සුගම්භිර (සිනිදුවූ ගුඹුරුවූ) මඤ්ජුසු සෝසෝ (රැව්දෙන හඬක් ඇති) බද්ධ හිංගුල (බැඳුනු රත්සිරියල් මෙන්) සුරත්ත සුජිව්හෝ (මනහර රත්පැපැ දිවක් ඇති) වීසති වීසති සේත සුදන්තෝ (විස්ස විස්ස බැගින්වූ සුදුවන් දත් ඇති) ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ සිනිදුවූ ගුඹුරුවූ රැව්දෙන හඬක් ඇති, බැඳුනු රත්සිරියල් මෙන් මනහර රත්පැපැ දිවක් ඇති, විස්ස විස්ස බැගින්වූ කිරිසුදුවන් පැහැ දත් ඇති, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

8. අඤ්ජනවණ්ණ සුනීල සුකේසෝ
කඤ්චන පට්ට විසුද්ධ ලලාටෝ
ඔසධි පණ්ඩර සුද්ධසු උණ්ණෝ
ඒස හි තුය්හ පිතා නරසීහෝ

• අඤ්ජනවණ්ණ සුනීල සුකේසෝ කඤ්චන පට්ට විසුද්ධ ලලාටෝ ඔසධි පණ්ඩර සුද්ධසු උණ්ණෝ ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ අඤ්ජනවණ්ණ (අඳුන් පැහැ) සුනීල සුකේසෝ (මනහර නිල්පැහැ මනා කෙස්ඇති) කඤ්චන පට්ට (රන් පටක් බඳු) විසුද්ධ ලලාටෝ (දැකුම්කලු නලල්තලයක් ඇති)

ඔසධි පණ්ඩර (ඉරබට තරුවේ සුදුපැහැය මෙන්) සුද්ධසු උණ්ණෝ (දිදුලන සුදුපැහැ ඌර්ණ රෝමයක් ඇති) ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ අඳුන් වන් මනහර නිල්පැහැ මනා කෙස්ඇති, රන් පටක් බඳු දැකුම්කලු නලල්තලයක් ඇති, ඉරබට තරුවේ සුදුපැහැය මෙන් දිදුලන සුදුපැහැති ඌර්ණ රෝමයක් ඇති, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

9. ගච්ඡති නීල පථේ විය චන්දෝ
තාරගණා පරිවේඨිත රූපෝ
සාවක මජ්ඣගතෝ සමණින්දෝ
ඒස හි තුය්හ පිතා නරසීහෝ.

• නීලපථේ තාරගණා පරිවේඨිත චන්දෝ රූපෝ විය සාවක මජ්ඣගතෝ සමණින්දෝ ගච්ඡති, ඒස හි තුය්හ [මය්හ] පිතා නරසීහෝ

★ නීලපථේ (නිල් අහසෙහි) තාරගණා පරිවේඨිත (තරුසමූහයා පිරිවරාගත්) චන්දෝ රූපෝ විය (සඳ මෙන්) සාවක මජ්ඣගතෝ (ශ්‍රාවකයන් මධ්‍යයේ) සමණින්දෝ ගච්ඡති (ශ්‍රේෂ්ට පැවිද්දා ගමන්කරයි / වඩියි), ඒස හි (මොහු වනාහි) තුය්හ(ඔබගේ) [මය්හ (මගේ)] නරසීහෝ පිතා (ශ්‍රේෂ්ට බුදුපියානන්ය)

☞ නිල් අහසෙහි තරුසමූහයා පිරිවරාගත් සඳ මෙන් ශ්‍රාවකයන් මධ්‍යයේ ශ්‍රේෂ්ට පැවිද්දා ගමන්කරයි, මොහු වනාහි ඔබගේ(මගේ) ශ්‍රේෂ්ට බුදුපියානන්ය

<u>පුණ්‍යානුමෝදනා හා ප්‍රාර්ථනා ගාථා</u>

1 ඉමිනා පුඤ්ඤකම්මේන - උපජ්ඣායා ගුණොත්තරා
ආචරියූපකාරා ච - මාතා පිතා පියා මමං

ඉමිනා පුඤ්ඤ-කම්මේන මමං ගුණොත්තරා උපජ්ඣායා ආචරියූපකාරාච [ආචරිය+උපකාරාච] පියා මාතා පිතා

➔ ඉමිනා (මේ) පුඤ්ඤ-කම්මේන (කුසලානුභාව බලයෙන්) මමං (මාගේ) ගුණොත්තරා (ගුණොත්තම) උපජ්ඣායා (උපාධ්‍යාය) ආචරියූපකාරාච [ආචරිය+උපකාරාච] (අචාර් උතුමෝද උපකාරකයෝ ද) පියා මාතා පිතා (ප්‍රිය මව් පිය දෙගුරුන්ද)

☞ මේ කුසලානුභාව බලයෙන් මාගේ ගුණොත්තම අචාර් උපාධ්‍යාය උතුමෝද, උපකාරකයෝ ද ප්‍රිය මව් පිය දෙගුරු ද,

2 සූරියෝ චන්දිමා රාජා - ගුණවන්තා නරාපි ච
බ්‍රහ්මා මාරා ච ඉන්දා ච - ලෝකපාලා ච දේවතා

➔ සූරියෝ චන්දිමා රාජා (සූර්යය චන්ද්‍ර දේව රාජයෝද) ගුණවන්තා නරා-පිච (ගුණවත් මනුස්සයෝද) බ්‍රහ්මා (බ්‍රහ්මයෝද) මාරාච (මාරයෝද) ඉන්දාච (ඉන්ද්‍රයෝද) ලෝකපාලාච දේවතා (ලෝකපාලක දෙවියෝද)

☞ චන්ද්‍ර සූර්යය දේව රාජයෝද, ගුණවත් මනුස්සයෝද, බ්‍රහ්මයෝද, මාරයෝද, ඉන්ද්‍රයෝද, ලෝකපාලක දෙවියෝද,

3 යමෝ මිත්තා මනුස්සා ච - මජ්ඣත්තා වේරිකාපි ච
සබ්බේ සත්තා සුඛී හොන්තු - පුඤ්ඤානි පකතානි මේ.

යමෝ මිත්තා මනුස්සාච මජ්ඣත්තා වේරිකා-පිච සබ්බේ සත්තා සුඛී හොන්තු ★පුඤ්ඤානි පකතානි මේ★[මෙම කොටස ඊලග ගාථාව හා සම්බන්ධවේ]
➔# යමෝ (යම දෙව් රජුද) මිත්තා (මිත්‍රයෝද) මනුස්සාච (මනුස්සයෝද) මජ්ඣත්තා (මධ්‍යස්ථයෝද) වේරිකා-පිච (වෛරීහුද) සබ්බේ සත්තා (සියලු සත්ත්වයෝද) සුඛී හොන්තු (සුවපත් වෙත්වා!)
☞ යම දෙව් රජුද, මිත්‍රයෝද මනුස්සයෝද, මධ්‍යස්ථයෝද, වෛරීහුද, සියලු සත්ත්වයෝද සුවපත් වෙත්වා!

4 සුඛං ච තිවිධං දෙන්තු - ඛිප්පං පාපේථ වෝමතං
ඉමිනා පුඤ්ඤ කම්මේන - ඉමිනා උද්දිසේන ච

පුඤ්ඤානි පකතානි මේ තිවිධං සුඛං ච දෙන්තු [වෝ+අමතං] වෝමතං ඛිප්පං පාපේථ, ★ඉමිනා පුඤ්ඤ කම්මේන ඉමිනා උද්දිසේනච ★[මෙම කොටස ඊලග ගාථාව හා සම්බන්ධවේ]
➔ මේ (මාවිසින්) පකතානි පුඤ්ඤානි (විශේෂයෙන් රැස්කරන ලද කුශලයෝ) තිවිධං සුඛං (ත්‍රිවිධ සම්පත්) දෙන්තු (දෙත්වා!), වෝ (භවත්හු/නුඹලා) අමතං (නිවනට) ඛිප්පං (වහා) පාපේථ (පමුණුවනු ලබත්වා!)
☞ මාවිසින් විශේෂයෙන් රැස්කරන ලද කුශලයෝ ත්‍රිවිධ සම්පත් දෙත්වා! භවත්හු/නුඹලා වහා නිවනට පමුණුවනු ලබත්වා!

5 ඛිප්පාහං සුලභේ චේව - තණ්හුපාදාන ඡේදනං
යේ සන්තානේ හීනා ධම්මා - යාව නිබ්බානතෝ මමං
6 නස්සන්තු සබ්බදායේව - යත්ථ ජාතෝ භවේ භවේ
උජු චිත්තෝ සතිපඤ්ඤෝ - සල්ලේඛෝ විරියවාමිනා.

ඉමිනා පුඤ්ඤ කම්මේන ඉමිනා උද්දිසේන-ච තණ්හුපාදාන ඡේදනං ඛිප්පාහං [ඛිප්පා + අහං] සුලභේ චේව යාව නිබ්බානතෝ මමං සන්තානේ යේ හීනා ධම්මා නස්සන්තු! යත්ථ ජාතෝ භවේ භවේ සබ්බදායේව උජු චිත්තෝ සතිපඤ්ඤෝ සල්ලේඛෝ විරියවාමිනා [විරියවා+ඉමිනා]
➔ ඉමිනා පුඤ්ඤ කම්මේන (මේ කුසළ කර්මයෙන්ද) ඉමිනා උද්දිසේන-ච (මේ උදේසීමෙන්ද) [අහං (මම)] තණ්හුපාදාන ඡේදනං (තෘෂ්ණා උපාදානයන් සිඳීම) ඛිප්පා සුලභේ (වහා ලබම්වා!) චේව (එමෙන්ම) යාව නිබ්බානතෝ (නිවන දක්වා) මමං (මාගේ) සන්තානේ (සන්තානයේ) යේ හීනා ධම්මා (යම් පාප ධර්මයන් වේද) [තේ (ඒවා)] නස්සන්තු! (නැසෙත්වා!) ඉමිනා (මෙයින්/ මේ පිනෙන්) යත්ථ ජාතෝ භවේ භවේ (උපනුපන් භවයක් භවයක් පාසා) සබ්බදායේව (සැමදාම) උජු චිත්තෝ (ඍජු සිත් ඇත්තෙක්) සතිපඤ්ඤෝ (සති-ප්‍රඥා ඇත්තෙක්) සල්ලේඛෝ (සල්ලේඛ ප්‍රතිපදා ඇත්තෙක්) විරියවාමිනා [විරියවා+] (වීර්යවන්තයෙක් වෙම්වා!)
☞ මේ කුසළයෙන්ද, මේ උදේසීමෙන්ද මම තෘෂ්ණා උපාදානයන් සිඳීම වහා ලබත්වා! එමෙන්ම නිවන දක්වා මාගේ සන්තානයේ යම් පාප ධර්මයන් වේද, ඒවා නැසෙත්වා! මේ පිනෙන් උපනුපන් භවයක් භවයක් පාසා සැමදාම ඍජු සිත් ඇත්තෙක් සති-ප්‍රඥා ඇත්තෙක් සල්ලේඛ ප්‍රතිපදා ඇත්තෙක් වීර්යවන්තයෙක් වෙම්වා!

7 මාරාලහන්තු නෝකාසං - කාතුඤ්ච විරියං මම
බුද්ධෝ දීපවරෝ නාථෝ - ධම්මෝ නාථෝ වරුත්තමෝ

8. නාථෝ පච්චේක සම්බුද්ධෝ - සංඝෝ නාථොත්තරෝ මමං
තේසොත්තමානුභාවේන - මාරෝකාසං ලහන්තු මා.

[ඉමිනා පුඤ්ඤකම්මේන] මාරා නෝකාසං [න+ඕකාසං] ලහන්තු විරියං මම කාතුඤ්ච දීපවරෝ බුද්ධෝ නාථෝ වරුත්තමෝ ධම්මෝ නාථෝ පච්චේක සම්බුද්ධෝ නාථෝ සංඝෝ මමං නාථොත්තරෝ [නාථෝ+උත්තරෝ] තේසොත්තමානුභාවේන [තේසං+උත්තමං +ආනුභාවේන] මාරෝකාසං [මාරා+ඕකාසං] මා ලහන්තු

➔[ඉමිනා පුඤ්ඤකම්මේන (මේ කුසලයෙන්)] මාරා (මාරයෝ) නෝකාසං [+ඕකාසං] (අවකාශ) න ලහන්තු (නොලබත්වා!) විරියං මම කාතුඤ්ච (මා හට වීර්යය කිරිම පිණිස) දීපවරෝ (උතුම් දීපයක් බඳුවූ) බුද්ධෝ නාථෝ (බුද්ධ රත්නය උතුම් පිහිටය) වරුත්ථමෝ ධම්මෝ නාථෝ (උතුම්ම ධර්ම රත්නයද උතුම් පිහිටය) පච්චේක සම්බුද්ධෝ නාථෝ (සසේබුද්ධ රත්නයද උතුම් පිහිටය) උත්තරෝ සංඝෝ (උතුම් ආර්ය මහා සංඝ රත්නයද) මමං නාථොත්තරෝ [නාථෝ+] (මාහට උතුම් පිහිටය) තේසොත්තමානුභාවේන [තේසං+උත්තමං +ආනුභාවේන] (ඒ උතුම් රත්නත්‍රයානුභාවයෙන්) මාරෝකාසං [මාරා+ඕකාසං] (මාරයෝ අවකාශ) මා ලහන්තු (නොලබත්වා!)

☞ මේ කුසලයෙන් මාරයෝ අවකාශ නොලබත්වා. මා හට වීර්යය කිරිම පිණිස උතුම් දීපයක් බඳුවූ බුද්ධ රත්නය උතුම් පිහිටය. උතුම්ම ධර්ම රත්නයද මට උතුම් පිහිටය. සසේබුද්ධ රත්නයද උතුම් පිහිටය. ආර්ය මහා සංඝ රත්නයද මාහට උතුම් පිහිටය. ඒ උතුම් රත්නත්‍රයානුභාවයෙන් මාරයෝ අවකාශ නොලබත්වා!

භවග්ගුපාදාය අවීචි හෙට්ඨතෝ
එත්තන්තරේ සත්තකායූපපන්නා
රූපී අරූපී ච අසඤ්ඤී සඤ්ඤිනෝ
දුක්ඛා පමුච්චන්තු ඵුසන්තු නිබ්බුතිං

භවග්ගුපාදාය [භවග්ග+උපාදාය] හෙට්ඨතෝ අවීචි එත්තන්තරේ [එත්ත+අන්තරේ] සත්තකායූපපන්නා [සත්තකාය+උපපන්නා] රූපී අරූපී ච අසඤ්ඤී සඤ්ඤිනෝ දුක්ඛා පමුච්චන්තු නිබ්බුතිං ඵුසන්තු

➔ භවග්ගුපාදාය [භවග්ග+උපාදාය] (භවාග්‍රයෙහි පටන්) හෙට්ඨතෝ (පහලින්) අවීචි (අවීචිය දක්වා) එත්තන්තරේ [එත්ත+අන්තරේ] (මේ අතරේ) සත්තකායූපපන්නා [සත්තකාය+උපපන්නා] (සත්ව ලෝකයට ඇතුළත් වූ) රූපී අරූපී ච (රූපි අරූපි ද) අසඤ්ඤී සඤ්ඤිනෝ (අසඤ්ඤී සඤ්ඤී සත්වයෝ) දුක්ඛා පමුච්චන්තු (දුකෙන් මිදෙත්වා!) නිබ්බුතිං ඵුසන්තු (නිවන් ලබත්වා!)

☞ භවාග්‍රයෙහි පටන් අවීචිය දක්වා මේ අතරේ සත්ව ලෝකයට ඇතුළත් වූ රූපි අරූපි සඤ්ඤී අසඤ්ඤී සියලු සත්වයෝ දුකෙන් මිදෙත්වා! නිවන් ලබත්වා!

දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හෝතු ච
ඵීතෝ භවතු ලෝකෝ ච - රාජා භවතු ධම්මිකෝ.

දේවෝ කාලේන වස්සතු සස්ස සම්පත්ති හෝතු-ච ලෝකෝච පීථෝ භවතු රාජා ධම්මිකෝ භවතු!
➔ කාලේන දේවෝ වස්සතු (කලට වැසි වසීවා) සස්ස ච (ගොවිතැන්ද) සම්පත්ති හෝතු (දියුණු වේවා) ලෝකෝච පීථෝ භවතු (රට සශ්‍රික වේවා) රාජා ධම්මිකෝ භවතු (රජු දැහැමි වේවා.)
☞ කලට වැසි වසීවා, ගොවිතැන් දියුණු වේවා, රට සශ්‍රික වේවා, රජු දැහැමි වේවා.

එත්තාවතා ච අම්මේහි - සම්භතං පුඤ්ඤ සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බේ භූතා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බේ සත්තා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා.

➔ එත්තාවතා (මෙතෙක්වේලා) ච අම්මේහි (අප විසින්) සම්භතං (රැස් කරණ ලද) පුඤ්ඤ සම්පදං (පුණ්‍ය සම්පත්තිය)
සබ්බ සම්පත්ති සිද්ධියා (සකළසම්පත් සිදුවීම පිණිස/ ලැබීම පිණිස) සබ්බේ දේවා අනුමෝදන්තු (සියළු දෙවියෝ අනුමෝදන් වෙත්වා!)
සබ්බ සම්පත්ති සිද්ධියා (සකළසම්පත් සිදුවීම පිණිස/ ලැබීම පිණිස) සබ්බේ භූතා අනුමෝදන්තු (සියළු භූතයේද අනුමෝදන් වෙත්වා!)
සබ්බ සම්පත්ති සිද්ධියා (සකළසම්පත් සිදුවීම පිණිස/ ලැබීම පිණිස) සබ්බේ සත්තා අනුමෝදන්තු (සියළු සත්වයෝද අනුමෝදන් වෙත්වා!)
☞ මෙතෙක්වේලා අප විසින් රැස් කරණ ලද පුණ්‍ය සම්පත්තිය සකළසම්පත් සිදුවීම පිණිස/ ලැබීම පිණිස සියළු දෙවියෝද , සියළු භූතයේද, සියළු සත්වයෝද අනුමෝදන් වෙත්වා!

අකාසට්ඨා ච භුම්මට්ඨා - දේවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සම්බුද්ධ සාසනං

අකාසට්ඨා ච භුම්මට්ඨා මහිද්ධිකා දේවා නාගා තං පුඤ්ඤං අනුමෝදිත්වා සම්බුද්ධ සාසනං චිරං රක්ඛන්තු
➔ අකාසට්ඨා ච (අහසෙහි වසන්නාවූද) භුම්මට්ඨා (පොළොවෙහි වසන්නාවූද) මහිද්ධිකා (මහත් සෘද්ධි ඇති) දේවා (විමාන දෙවියෝද බ්‍රක්මකායික දෙවියෝද) නාගා (නාගයෝද) තං පුඤ්ඤං (ඒ පින) අනුමෝදිත්වා (අනුමෝදන්වී) සම්බුද්ධ සාසනං (සම්බුද්ධ සාසනය) චිරං රක්ඛන්තු (බොහෝ කල් රකිත්වා)
☞ අහසෙහි වසන්නාවූද පොළොවෙහි වසන්නාවූද මහත් සෘද්ධි ඇති විමාන දෙවියෝද බ්‍රක්මකායික දෙවියෝද නාගයෝද ඒ පින අනුමෝදන්වී සම්බුද්ධ සාසනය බොහෝ කල් රකිත්වා

-පෙ- චිරං රක්ඛන්තු සම්බුද්ධ දේසනං (සම්බුද්ධ දේසනය/ධර්මයද බොහෝ කල් රකිත්වා)
-පෙ- චිරං රක්ඛන්තු සම්බුද්ධ සාවකං (සම්බුද්ධ ශ්‍රාවකයන්ද බොහෝ කල් රකිත්වා)
-පෙ- චිරං රක්ඛනතු මං පරං (මාද අනිත්අයද බොහෝ කල් රකිත්වා)

ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ
➔ ඉදං (මෙය/ මේ පින) වෝ ඤාතීනං (ඤාතීන්ට) හෝතු (අත්වේවා!) ඤාතයෝ (ඤාතීන්) සුඛිතා හොන්තු (සුවපත් වෙත්වා!)

ඉමස්මිං විහාරේ ච ආරාමේ - අධිවත්ථා ච දේවතා
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - රක්ඛන්තු ජිනසාසනං

ඉමස්මිං විහාරේ ච ආරාමේ අධිවත්ථා දේවතා ච ඉමං පුඤ්ඤං අනුමෝදිත්වා ජිනසාසනං රක්ඛන්තු
➔ ඉමස්මිං (මේ) විහාරේ ච ආරාමේ (විහාරයෙහි ද ආරාමයෙහිද) අධිවත්ථා දේවතා ච (අධිගෘහිත දෙවියෝ ද) ඉමං පුඤ්ඤං (මේ පින) අනුමෝදිත්වා (අනුමෝදන්ව) ජිනසාසනං (ජිනසාසනය) රක්ඛන්තු (රකිත්වා!)
☞ මේ විහාරයෙහි ද ආරාමයෙහිද අධිගෘහිත දෙවියෝ ද මේ පින අනුමෝදන්ව ජිනසාසනය රකිත්වා!

මෛත්‍රී බෝසතාණන් වහන්සේට පිංදීම.

කප්ප සත සහස්සානි - සෝලසාපි අසංඛයේ
සම්භරං බෝධි සම්භාරෙ - ආගතෝ ජාති ජාතිසු
නියතෝ බුද්ධ භාවාය - භද්දකප්පේ ඉධන්තිමේ
බෝධි සත්ථෝ ච මෙත්තෙයොා් - පුඤ්ඤං මේ අනුමෝදතු.

කප්ප සත සහස්සානි සෝලසාපි අසංඛයේ ජාති ජාතිසු බෝධි සම්භාරෙ සම්භරං ආගතෝ ඉධන්තිමේ [ඉධං+අන්තිමේ] භද්දකප්පේ බුද්ධ භාවාය නියතෝ මෙත්තෙයොා් බෝධි සත්ථෝච මේ පුඤ්ඤං අනුමෝදතු
➔ කප්ප සත සහස්සානි (කල්ප ලක්ෂයක් සහ) සෝලසාපි අසංඛයේ (කල්ප අසංඛ්‍යෙ දහසයක් මුලුල්ලේහි) ජාති ජාතිසු (ජාතියක් ජාතියක් පාසා) බෝධි සම්භාරෙ (බෝධි සම්භාර ධර්ම) සම්භරං (රැස් කරමින්) ආගතෝ (පැමිණියා වූ) ඉධන්තිමේ [ඉධං+] (මෙම) භද්දකප්පේ (භද්‍ර කල්පයේ) අන්තිමේ (අන්තිමට) බුද්ධ භාවාය (බුදු බව පිණිස) නියතෝ (නියත වූ) මෙත්තෙයොා් බෝධි සත්ථෝච (මෛත්‍රී බෝධි සත්වයන් වහන්සේද) මේ පුඤ්ඤං (මාගේ පින) අනුමෝදතු (අනුමෝදන් වෙත්වා!)
☞ කල්ප ලක්ෂයක් සහ කල්ප අසංඛ්‍යෙ දහසයක් මුලුල්ලේහි ජාතියක් ජාතියක් පාසා බෝධි සම්භාර ධර්ම රැස් කරමින් පැමිණියා වූ මෙම මහා භද්‍ර කල්පයේ අන්තිම බුද්ධාන්තරයෙහි බුදු බව පිණිස නියත වූ මෛත්‍රී බෝධි සත්වයන් වහන්සේද මාගේ පින අනුමෝදන් වෙත්වා!

සබ්බේ සත්තා ච මජ්ඣත්තා - හිතා ච අහිතා ච මේ
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - බුජ්ඣන්තු අමතං පදං

සබ්බේ සත්තාච මජ්ඣත්තා මේ හිතාච අහිතා ච ඉමං පුඤ්ඤං අනුමෝදිත්වා අමතං පදං බුජ්ඣන්තු
➔ සබ්බේ සත්තාච (සියලු සත්වයෝද) මජ්ඣත්තා (මධ්‍යස්තයෝද) මේ (මට) හිතාච (හිත ස්ත්වයෝද) අහිතා ච (අහිත සත්වයෝද) ඉමං පුඤ්ඤං (මේ පින්) අනුමෝදිත්වා (අනුමෝදන්ව) අමතං පදං (අමුර්ත නිවන) බුජ්ඣන්තු (අවබෝධ කරත්වා!)
☞ සියලු සත්වයෝද, මධ්‍යස්තයෝද, මට හිත ස්ත්වයෝද, අහිත සත්වයෝද, මේ පින් අනුමෝදන්ව අමුර්ත නිවන අවබෝධ කරත්වා!

ඉමිනා පුඤ්ඤ කම්මේන - මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා.

ඉමිනා පුඤ්ඤ කම්මේන යාව නිබ්බාන පත්තියා මේ මා බාල සමාගමෝ සතං සමාගමෝ හෝතු
➔ ඉමිනා පුඤ්ඤ කම්මේන (මෙම කුසලානුභාව බලයෙන්) යාව නිබ්බාන පත්තියා (නිවන් දක්නා තුරු) මේ (මාහට) මා බාල සමාගමෝ (පාපමිත්‍ර ඇසුරක් නොවේවා) සතං (කළ්‍යාණ මිත්‍ර/සත්පු ෂ) සමාගමෝ හෝතු (ඇසුරම ලැබේවා)
☞ මෙම කුසලානුභාව බලයෙන් නිවන් දක්නා තුරු මාහට පාපමිත්‍ර ඇසුරක් නොවේවා. කළ්‍යාණ මිත්‍ර ඇසුරම ලැබේවා.

ප්‍රතිපත්ති පූජාව
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා බුද්ධං පූජේමි
(මේ ධර්මයට අනුකූල ප්‍රතිපත්තියෙන් බුද්ධ රත්නය පුදමි)
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා ධම්මං පූජේමි
(මේ ධර්මයට අනුකූල ප්‍රතිපත්තියෙන් ධර්ම රත්නය පුදමි)
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා සංඝං පූජේමි
(මේ ධර්මයට අනුකූල ප්‍රතිපත්තියෙන් සංඝ රත්නය පුදමි)
අද්ධා ඉමාය පටිපත්තියා ජාති ජරා මරණම්හා පරිමුච්චිස්සාමි.
➔ අද්ධා (ඒකාන්තයෙන්) ඉමාය පටිපත්තියා (මෙම ප්‍රතිපත්තියෙන්) ජාති ජරා මරණම්හා (ජාති ජරා මරණයෙන්) පරිමුච්චිස්සාමි. (අත මිදෙන්නෙමි.)
☞ ඒකාන්තයෙන් මෙම ප්‍රතිපත්තියෙන් ජාති ජරා මරණයෙන් අත මිදෙන්නෙමි.

ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛායා වහං හෝතු! සබ්බදුක්ඛා පමුච්චතු!
➔ ඉදං මේ පුඤ්ඤං (මේ මගේ පින) ආසවක්ඛායා වහං හෝතු! (ආසව ක්ෂයකිරීම පිණිස වේවා!) සබ්බදුක්ඛා පමුච්චතු! (සියලු දුකෙන් මිදෙත්වා!)

තෙරුවන් සමා කරවීම
කායේන වචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ - භූරිපඤ්ඤ තථාගත.

භන්තේ භූරිපඤ්ඤ තථාගත කායේන වචා චිත්තේන පමාදේන මයා කතං අච්චයං මේ ඛම
➔ භන්තේ (ස්වාමීනි) භූරිපඤ්ඤ (මහා පඤ්ඤාවන්ත) තථාගත (තථාගතයන් වහන්ස!) කායේන වචා චිත්තේන (කය වචනය සිතෙහි) පමාදේන (ප්‍රමාදයකින්) මයා (මා විසින්) කතං (කරණ ලද) අච්චයං (වරදට) මේ ඛම (මට සමාවන සේක්වා !)
☞ ස්වාමීනි මහා පඤ්ඤාවන්ත තථාගතයන් වහන්ස! කය වචනය සිතෙහි ප්‍රමාදයකින් මා විසින් කරණ ලද පමාවරදට මට සමාවන සේක්වා !

කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික.

සන්දිට්ඨික අකාලික ධම්ම කායේන වචා චිත්තේන පමාදේන මයා කතං අච්චයං මේ ඛම
➔ සන්දිට්ඨික අකාලික ධම්ම (සාන්දිට්ඨික අකාලික ශ්‍රී සද්ධර්ම රත්නයනි!) කායේන වචා චිත්තේන (කය වචනය සිතෙහි) පමාදේන (ප්‍රමාදයකින්) මයා (මා විසින්) කතං (කරණ ලද) අච්චයං (වරදට) මේ ඛම (මට සමාවන සේක්වා !)
☞ සාන්දිට්ඨික අකාලික ශ්‍රී සද්ධර්ම රත්නයනි! කය වචනය සිතෙහි ප්‍රමාදයකින් මා විසින් කරණ ලද පමාවරදට මට සමාවන සේක්වා !

කයේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං කඛ මේ සංඝ - පුඤ්ඤක්ඛෙත්ත අනුත්තර.
අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත සංඝ, කායේන වචා චිත්තේන පමාදේන මයා කතං අච්චයං මේ ඛම
➔ අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත සංඝ (උතුම් පින්කෙතක් වූ සංඝ රත්නයනි!) කායේන වචා චිත්තේන (කය වචනය සිතෙහි) පමාදේන (ප්‍රමාදයකින්) මයා (මා විසින්) කතං (කරණ ලද) අච්චයං (වරදට) මේ ඛම (මට සමාවන සේක්වා !)
☞ උතුම් පින්කෙතක් වූ සංඝ රත්නයනි! කය වචනය සිතෙහි ප්‍රමාදයකින් මා විසින් කරණ ලද පමවරදට මට සමාවන සේක්වා !

අභිවාදන සීලස්ස - නිච්චං වද්ධාපචායිනෝ
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණෝ සුඛං බලං

අභිවාදන සීලස්ස නිච්චං [වද්ධ+අපචායිනෝ] වද්ධාපචායිනෝ ආයු වණ්ණෝ සුඛං බලං චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති
➔ අභිවාදන සීලස්ස (වන්දනාකරන ගතිපැවතුම් ඇති) නිච්චං (නිතර) වද්ධාපචායිනෝ [වද්ධ+අපචායිනෝ] (වැඩිහිටියන්ට ගරුකරන්නාගේ) ආයු වණ්ණෝ සුඛං බලං (ආයුෂ වර්ණය සැපය බලය යන) චත්තාරෝ ධම්මා (සතර ධර්මයෝ) වඩ්ඪන්ති (වැඩෙති)
☞ වන්දනාකරන ගතිපැවතුම් ඇති, නිතර වැඩිහිටියන්ට ගරුකරන්නාගේ, ආයුෂ වර්ණය සැපය බලය යන සතර ධර්මයෝ වැඩෙති.

★ **යං පත්තං කුසලං තස්ස - ආනුභාවේන පාණිනෝ**
සබ්බේ සද්ධම්මරාජස්ස - ඤත්වා ධම්මං සුඛාවහං

★ **පාපුණන්තු විසුද්ධාය - සුඛාය පටිපත්තියා**
අසෝකමනුපායාසං - නිබ්බානසුඛමුත්තමං

පත්තං යං කුසලං තස්ස ආනුභාවේන සබ්බේ පාණිනෝ සද්ධම්මරාජස්ස සුඛාවහං ධම්මං ඤත්වා සුඛාය පටිපත්තියා අසෝකමනුපායාසං [අසෝකං+අනුපායාසං] නිබ්බානසුඛමුත්තමං [නිබ්බානං+සුඛං+උත්තමං] විසුද්ධාය පාපුණන්තු
➔ පත්තං (රැස්කරගනු ලැබුවා වූ) යං කුසලං (යම් කුසළයක් වේ නම්) තස්ස ආනුභාවේන (එහි ආනුභාවයෙන්) සබ්බේ පාණිනෝ (සියළු සත්ත්වයෝ) සද්ධම්මරාජස්ස (ධර්මරාජයානන් වහන්සේගේ) සුඛාවහං (සැප ගෙනදෙන්නා වූ) ධම්මං (ශ්‍රී සද්ධර්මය) ඤත්වා (අසා-දැනගෙන) සුඛාය පටිපත්තියා (සැප ප්‍රතිපදාවෙන්) අසෝකමනුපායාසං [අසෝකං+අනුපායාසං] (සෝක නොකරන්නාවූ ද සිත්තැවිල් නැත්තාවූ ද) නිබ්බානසුඛමුත්තමං [+සුඛං+උත්තමං] (සැපවත් වූද උතුම් වූද) නිබ්බානං විසුද්ධාය (නිවන නම් විසුද්ධියට) පාපුණන්තු (පැමිණෙත්වා!)
☞ රැස්කරගනු ලැබුවා වූ යම් කුසළයක් වේ නම් , එහි ආනුභාවයෙන් සියළු සත්ත්වයෝ ධර්මරාජයානන් වහන්සේගේ සැප ගෙනදෙන්නා වූ ශ්‍රී සද්ධර්මය අසා-දැනගෙන සැප ප්‍රතිපදාවෙන් සෝක නොකරන්නාවූද සිත්තැවිල් නැත්තාවූද සැපවත් වූද උතුම් වූද නිවන නම් විසුද්ධියට පැමිණෙත්වා!

★ **චිරං තිට්ඨතු සද්ධම්මෝ - ධම්මේ හොන්තු සගාරවා**
සබ්බේපි සත්තා කාලේන - සම්මා දේවො පවස්සතු

සද්ධම්මෝ චිරං තිට්ඨතු සබ්බේපි සත්තා ධම්මේ සගාරවා හොන්තු කාලේන සම්මා දේවො පවස්සතු

➔ සද්ධම්මෝ (සද්ධර්මය) චිරං තිට්ඨතු (බොහෝ කාලයක් පවතීවා) සබ්බේපි සත්තා (සියළු සත්ත්වයෝද) ධම්මේ (ධර්මය කෙරෙහි) සගාරවා (ගරුබුහුමන් ඇත්තෝ) හොන්තු (වෙත්වා!) කාලේන සම්මා (කලට මනාසේ) දේවො පවස්සතු (වැසි වසීවා!)

☞ සද්ධර්මය බොහෝ කාලයක් ලොව පවතීවා, සියළු සත්ත්වයෝ ද බුද්ධ ධර්මය කෙරෙහි ගරුබුහුමන් ඇත්තෝ වෙත්වා! කලට මනාසේ වැසි වසීවා!

★ **යථා රක්ඛිංසු පෝරාණා - සුරාජානෝ තථේවිමං**
රාජා රක්ඛතු ධම්මේන - අත්තනෝව පජං පජං

යථා පෝරාණා සු-රාජානෝ පජං රක්ඛිංසු, තථේවිමං [තථා+ඒව+ඉමං] රාජා අත්තනෝව පජං ධම්මේන රක්ඛතු#

➔ යථා (යම්සේ) පෝරාණා (අතීත) සු-රාජානෝ (ධාර්මික රජවරු) පජං (ජනතාව) රක්ඛිංසු (රැක්කාද), තථේවිමං [තථා+ඒව+ඉමං] (එසේම මේ/වර්ථමාන) රාජා (රජතුමාද) අත්තනෝව (තමාගේ) පජං (ජනතාව) ධම්මේන (ධාර්මිකව) රක්ඛතු (රකීවා !)

☞ යම්සේ අතීත ධාර්මික රජවරු ජනතාව රැක්කාද, එසේම වර්ථමාන රජතුමාද තමාගේ ජනතාව ධාර්මිකව රකීවා !

★ **චිරං තිට්ඨතු ලෝකස්මිං - සම්මා සම්බුද්ධ සාසනං**
තස්මිං සගාරවා නිච්චං -හොන්තු සබ්බේපි පාණිනෝ

සම්මා සම්බුද්ධ සාසනං ලෝකස්මිං චිරං තිට්ඨතු! සබ්බේපි පාණිනෝ නිච්චං තස්මිං සගාරවා හොන්තු

➔ සම්මා සම්බුද්ධ සාසනං (සම්මා සම්බුද්ධ සාසනය) ලෝකස්මිං (ලොවතුල) චිරං තිට්ඨතු! (බොහෝ කාලයක් පවතීවා !) සබ්බේපි පාණිනෝ (සියලු සත්වයෝ) නිච්චං (නිරන්තරයෙන්) තස්මිං (එහි/ ශ්‍රී සද්ධර්මය කෙරෙහි) සගාරවා හොන්තු (ගෞරව ඇත්තෝ වෙත්වා!)

☞ සම්මා සම්බුද්ධ සාසනය ලොවතුල බොහෝ කාලයක් පවතීවා ! සියලු සත්වයෝ නිරන්තරයෙන් ශ්‍රී සද්ධර්මය කෙරෙහි ගෞරව ඇත්තෝ වෙත්වා!

★ **සම්මා වස්සතු කාලේන - දේවෝ ච ජගතී පතී**
සද්ධම්මනිරතෝ ලොකං - ධම්මේනේ ච පසාසතු

සම්මා කාලේන දේවෝ වස්සතු ජගතී පතී ච සද්ධම්මනිරතෝ ලොකං ධම්මේනේව පසාසතු

➔ සම්මා කාලේන (මනාලෙස කළට) දේවෝ වස්සතු (වැසි වසීවා!) ජගතිපතී ච (රජුද) සද්ධම්මනිරතෝ (ධර්මයෙහි නිරතවෙමින්) ලොකං (ලෝකය/ වැසියන්) ධම්මේනේව (ධාර්මික්ව) පසාසතු (රකිත්වා!)

☞ මනාලෙස කළට වැසි වසීවා!,රජුද ධර්මයෙහි නිරතවෙමින් ලෝකය/ වැසියන් ධාර්මික්ව රකිත්වා!

<u>**පින් අනුමෝදන් වීම සහ අනුමෝදන් කරවීම**</u>

බාලයා - ඕකාස වන්දාමි භන්තෙ! මයා කතං පුඤ්ඤං සාමිනා අනුමෝදිතබ්බං

➔ ඕකාස වන්දාමි භන්තෙ! (අවසරයි ස්වාමීන් වහන්ස වන්දනාකරමි!) මයා කතං (මා විසින් කරනලද) පුඤ්ඤං (පින) සාමිනා (ස්වාමින් වහන්සේ විසින්) අනුමෝදිතබ්බං (අනුමෝදන්වන සේක්වා!)

වැඩිහිටියා - සාධු ! සාධු! අනුමෝදාමි (හොඳයි අනුමෝදන් වෙමි!)

බාලයා - සාමිනා කතං පුඤ්ඤං මයිහං දාතබ්බං
➔ සාමිනා (ස්වාමින් වහන්සේ විසින්) කතං පුඤ්ඤං (කරනලද පින) මයිහං දාතබ්බං (මට අනුමෝදන්කරන සේක්වා!)

වැඩිහිටියා - සාධු! අනුමෝදාහි (හොඳයි අනුමෝදන්වන්න!)

බාලයා - සාධු! සාධු! අනුමොදාමි. ඕකාස ද්වාරත්තයේන කතං සබ්බං අච්චයං ඛමථ මේ භන්තෙ
➔ සාධු! සාධු! අනුමොදාමි. (හොඳයි අනුමෝදන් වෙමි!) ඕකාස (අවසරයි) ද්වාරත්තයේන (තුන්දොරින්) කතං (කරනලද) සබ්බං අච්චයං (සියලු පමාවරදට) ඛමථ මේ භන්තෙ (ස්වාමීනි මට සමාවන සේක්වා!)

වැඩිහිටියා - ඛමාමි ඛමිතබ්බං. (සමාවදෙමි, [මටද] සමාව දියයුතුය)

බාලයා - ඔකාස ඛමාමි භන්තෙ (අවසරයි ස්වාමින් වහන්ස සමාවදෙමි)

<u>ප්‍රත්‍යවේක්ෂාව</u>

(1). A. පටිසඞ්ඛා යෝනිසෝ චීවරං පටිසේවාමි, යාවදේව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතප- සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදේව හිරිකෝපීන පටිච්ඡාදනත්ථං

★ පටිසඞ්ඛා (විමසා බලා) යෝනිසෝ (නුවණින්) චීවරං පටිසේවාමි (සිවුරු පරිහරණය කරමි), යාවදේව (හුදෙක්ම) සීතස්ස පටිඝාතාය (සීතල දුරුකිරීම පිණිසය / සීතලෙන් ආරක්ෂාවීම පිණිසය), උණ්හස්ස පටිඝාතාය (උෂ්ණය දුරුකිරීම පිණිසය / උෂ්ණයෙන් ආරක්ෂාවීම පිණිසය), [ඩංස-මකස-වාත+ආතප] ඩංසමකසවාතාතප (සාප ලේ බොන හෝහපුටු ආදී ද - විද ලේ බොන මදුරු ආදී ද - සුලඟින් ද - හිරු රස්මියෙන් ද) සිරිංසප (පත්තෑ සර්පාදී දීර්ඝ ශරීර ඇත්තන්ගෙන් ද) සම්ඵස්සානං (ස්පර්ශය / ඇතිවන හානිය) පටිඝාතාය (දුරුකිරීම පිණිසය / ආරක්ෂාවීම පිණිසය) , යාවදේව (හුදෙක්ම) හිරිකෝපීන පටිච්ඡාදනත්ථං (විලි වසාගැනීම පිණිසය.)

☞ නුවණින් විමසා බලා සිවුරු පරිහරණය කරමි, හුදෙක්ම සීතලෙන් ආරක්ෂාවීම පිණිසය, උෂ්ණයෙන් ආරක්ෂාවීම පිණිසය, සාප ලේ බොන හෝහපුටු ආදී ද - විද ලේ බොන මදුරු ආදී ද - සුලඟින් ද - හිරු රස්මියෙන් ද පත්තෑ සර්පාදී දීර්ඝ ශරීර ඇත්තන්ගෙන් ද ඇතිවන හානියෙන් ආරක්ෂාවීම පිණිසය, හුදෙක්ම විලි වසාගැනීම පිණිසය.

B. යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමේව යදිදං චීවරං, තදුපභුඤ්ජකෝ (තං+ උපභුඤ්ජකෝ) පුග්ගලෝ ධාතුමත්තකෝ නිස්සත්තෝ නිජ්ජීවෝ සුඤ්ඤෝ, සබ්බානි පන ඉමානි චීවරනි අජිගුච්ඡනීයානි, ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයාන

★ යථා පච්චයං (විවිද හේතු කාරණාවන්ගෙන්) පවත්තමානං (පවත්නා වූ) [ධාතු-මත්තං+ඒව] ධාතුමත්තමේව (ධාතු මාත්‍රයක්මය) යදිදං (යම් මේ) චීවරං (සිවුර), තං (එය/ සිවුර) උපභුඤ්ජකෝ (පරිහරණය කරන්නාවූ) පුග්ගලෝ (පුද්ගලයා)
ධාතු-මත්තකෝ (ධාතු මාත්‍රයක්වූ) නිස්සත්තෝ (සත්වයෙක් නොවූ) නිජ්ජීවෝ (ජීවියෙක් නොවූ) සුඤ්ඤෝ (සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි.), සබ්බානි (සියලු) පන ඉමානි චීවරනි (මේ සිවුරු) [වනාහි] අජිගුච්ඡනීයානි (පිළිකුල් නොවේ), ඉමං පූතිකායං (මේ කුණප ශරීරයට) පත්වා (පැමිණ) අතිවිය (අතිශයින්) ජිගුච්ඡනීයානි (පිළිකුල් බවට) ජායන්ති (පත්වන්නාහ.)

☞ මේ සිවුර වනාහි විවිද හේතු කාරණාවන්ගෙන් පවත්නා වූ ධාතු මාත්‍රයක්මය, එය පරිහරණය කරන්නාවූ පුද්ගලයා ද ධාතු මාත්‍රයක්වූ සත්වයෙක් නොවූ ජීවියෙක් නොවූ සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි. මේ සියලු සිවුරු වනාහි පරිහරණයට පෙර පැහැයෙන් ගන්දයෙන් පිළිකුල් නොවේ, නමුත් මේ කුණපයන්ගෙන් පිරුණු ශරීරයට පැමිණ අතිශයින් පිළිකුල් බවට පත්වන්නාහ.

(02) A. පටිසඞ්ඛා යෝනිසෝ පිණ්ඩපාතං පටිසේවාමි, නේව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය, යාවදේව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වේදනං පටිහඞ්ඛාමි නවඤ්ච වේදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මේ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරෝ ච

★ පටිසඞ්ඛා (විමසා බලා) යෝනිසෝ (නුවණින්) පිණ්ඩපාතං (පිණ්ඩපාතය / ආහාරය) පටිසේවාමි (පරිභෝග කරමි), නේව දවාය (කෙළිසෙල්ලම් පිණිස නොවේ), න මදාය (කායික බල මදය පිණිස නොවේ), න මණ්ඩනාය (සිරුර පුෂ්ඨිමත් කිරීමට නොවේ), න විභූසනාය (සම පැහැපත් කරගැනීමට නොවේ), යාවදේව (හුදෙක්ම) ඉමස්ස කායස්ස (මේ ශරීරයේ) ඨිතියා (පැවැත්ම පිණිසය) යාපනාය (යැපීම පිණිසය), [විහිංසා+උපරතියා] විහිංසූපරතියා (බඩගින්න නිවීම පිණිස), [බ්‍රහ්මචරියා+අනුග්ගහාය] බ්‍රහ්මචරියානුග්ගහාය ([ශරීරය පවත්වා ගැනීමෙන්]බ්‍රහ්මචරිය වාසයට උපකාර පිණිස), ඉති (මෙසේ) පුරාණඤ්ච වේදනං ([බඩගින්න නිසා ඇතිවූ]පැරණි වේදනාද) පටිහඞ්ඛාමි (දුරුකරමි) නවඤ්ච වේදනං ([වැඩිපුර වැළඳිමෙන් ඇතිවිය හැකි] අළුත් වේදනාද) න උප්පාදෙස්සාමි (නොවුපදවමි), යාත්‍රා ච (ජීවිත පැවැත්ම ද) මේ භවිස්සති (මගේ වන්නේය) අනවජ්ජතා ච ([වැරදි ලෙස ආහාර සෙවීම්-පිළිගැනීම්-වැළඳීම් ආදියෙන් වෙන්වී] නිවැරදි ලෙස ද) ඵාසුවිහාරෝ ච ([පමන දැන වැළඳිම නිසා] පහසුවෙන් වාසයකිරිම ද) මේ භවිස්සති (මගේ වන්නේය)

☞ නුවණින් විමසා බලා පිණ්ඩපාතය / ආහාරය පරිභෝග කරමි, කෙළිසෙල්ලම් පිණිස හෝ කායික බල මදය පිණිස හෝ සිරුර පුෂ්ඨිමත් කිරීමට හෝ සම පැහැපත් කරගැනීමට හෝ ආහාර නොවළඳමි, හුදෙක්ම මේ ශරීරයේ පැවැත්ම පිණිස, යැපීම පිණිස, බඩගින්න නිවීම පිණිස, ශරීරය පවත්වා ගෙන බ්‍රහ්මචාරීව විසිම පිණිස ආහාර වළඳමි, මෙසේ බඩගින්න නිසා ඇතිවූ පැරණි වේදනාද දුරුකරමි, වැඩිපුර වැළඳිමෙන් ඇතිවිය හැකි අළුත් වේදනාද නොවුපදවමි, වැරදි ලෙස ආහාර සෙවීම් පිළිගැනීම් වැළඳීම් ආදියෙන් වෙන්වී නිවැරදි ආහාර පරිභෝජනය ද පමන දැන වැළඳිම නිසා පහසුවෙන් වාසයකිරිම ද සුවසේ මගේ ජීවිතය පවත්වා ගැනීම ද මෙසේ වන්නේය.

B. යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමේව යදිදං පිණ්ඩපාතං , තදුපභුඤ්ජකෝ (තං+ උපභුඤ්ජකෝ) පුග්ගලෝ ධාතුමත්තකෝ නිපස්සත්තෝ නිජ්ජීවෝ සුඤ්ඤෝ, සබ්බෝ පන අයං පිණ්ඩපාතෝ අජිගුච්ඡනීයෝ, ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයෝ ජායති.

★ යථා පච්චයං (විවිද හේතු කාරණාවන්ගෙන්) පවත්තමානං (පවත්නා වූ) [ධාතු-මත්තං+ඒව] ධාතුමත්තමේව (ධාතු මාත්‍රයක්මය) යදිදං (යම් මේ) පිණ්ඩපාතං (පිණ්ඩපාතය / ආහාරය), තං (එය/ ආහාර) උපභුඤ්ජකෝ (පරිහරණය කරන්නාවූ) පුග්ගලෝ (පුද්ගලයා)
ධාතු-මත්තකෝ (ධාතු මාත්‍රයක්වූ) නිස්සත්තෝ (සත්වයෙක් නොවූ) නිජ්ජීවෝ (ජීවියෙක් නොවූ) සුඤ්ඤෝ (සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි.), සබ්බෝ (සියලු) <u>පන</u> අයං පිණ්ඩපාතෝ (මේ පිණ්ඩපාතය / ආහාරය) [<u>වනාහි</u>] අජිගුච්ඡනීයානි (පිළිකුල් නොවේ), ඉමං පූතිකායං (මේ කුණපා ශරීරයට) පත්වා (පැමිණ) අතිවිය (අතිශයින්) ජිගුච්ඡනීයනි (පිළිකුල් බවට) ජායන්ති (පත්වන්නාහ.)

☞ මේ පිණ්ඩපාතය/ ආහාරය වනාහි විවිද හේතු කාරණාවන්ගෙන් පවත්නා වූ ධාතු මාත්‍රයක්මය, ආහාර පරිහරණය කරන්නාවූ පුද්ගලයා ද ධාතු මාත්‍රයක්වූ සත්වයෙක් නොවූ ජීවියෙක් නොවූ සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි. මේ සියලු පිණ්ඩපාතය/ ආහාරය වනාහි පරිහරණයට පෙර හැඩයෙන් පැහැයෙන් ගන්දයෙන් පිළිකුල් නොවේ, නමුත් මේ කුණපයන්ගෙන් පිරුණු ශරීරයට පැමිණ අතිශයින් පිළිකුල් බවට පත්වන්නේය.

(03) A. පටිසඞ්ඛා යෝනිසෝ සේනාසනං පටිසේවාමි, යාවදේව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතප- සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදේව උතුපරිස්සය - විනෝදනං පටිසල්ලානාරාමත්ථං

★ පටිසඞ්ඛා (විමසා බලා) යෝනිසෝ (නුවණින්) සේනාසනං පටිසේවාමි (සේනාසන පරිහරණය කරමි), යාවදේව (හුදෙක්ම) සීතස්ස පටිඝාතාය (සීතල දුරුකිරීම පිණිසය / සීතලෙන් ආරක්ෂාවීම පිණිසය), උණ්හස්ස පටිඝාතාය (උෂ්ණය දුරුකිරීම පිණිසය / උෂ්ණයෙන් ආරක්ෂාවීම පිණිසය), [ඩංස-මකස-වාත+ආතප] ඩංසමකසවාතාතප (සාප ලේ බොන හෝහපුටු ආදී ද - විද ලේ බොන මදුරු ආදී ද - සුලගින් ද - හිරු රස්මියෙන් ද) සිරිංසප (පත්තෑ සර්පාදී දීර්ඝ ශරීර ඇත්තන්ගෙන් ද) සම්ඵස්සානං (ස්පර්ශය / ඇතිවන හානිය) පටිඝාතාය (දුරුකිරීම පිණිසය / ආරක්ෂාවීම පිණිසය) , යාවදේව (හුදෙක්ම) උතු-පරිස්සය (ඍතුවෙන් හා දරුණු වන සතුන්ගෙන් වන කරදර බාදක) විනෝදනං (දුරුකිරීම පිණිස) [පටිසල්ලානාරාම+අත්ථං] පටිසල්ලානාරාමත්ථං (හුදකලා වාසය පිණිසය)

☞ නුවණින් විමසා බලා සේනාසන පරිහරණය කරමි, හුදෙක්ම සීතලෙන් ආරක්ෂාවීම පිණිසය, උෂ්ණයෙන් ආරක්ෂාවීම පිණිසය, සාප ලේ බොන හෝහපුටු ආදී ද - විද ලේ බොන මදුරු ආදී ද - සුලගින් ද - හිරු රස්මියෙන් ද පත්තෑ සර්පාදී දීර්ඝ ශරීර ඇත්තන්ගෙන් ද ඇතිවන හානියෙන් ආරක්ෂාවීම පිණිසය, හුදෙක්ම ඍතුවෙන් හා දරුණු වන සතුන්ගෙන් වන කරදර බාදක දුරුකිරීම පිණිසය, හුදකලා වාසය පිණිසය.

B. යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමේව යදිදං සේනාසනං , තදුපභුඤ්ජකෝ (තං+ උපභුඤ්ජකෝ) පුග්ගලෝ ධාතුමත්තකෝ නිස්සත්තෝ නිජ්ජීවෝ සුඤ්ඤෝ, සබ්බානි පන ඉමානි සේනාසනානි අජිගුච්ඡනීයානි, ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයනි ජායන්ති.

★ යථා පච්චයං (විවිද හේතු කාරණාවන්ගෙන්) පවත්තමානං (පවත්නා වූ) [ධාතු-මත්තං+ඒව] ධාතුමත්තමේව (ධාතු මාත්‍රයක්මය) යදිදං (යම් මේ) සේනාසනං (සේනාසනය), තං (එය/ සේනාසනය) උපභුඤ්ජකෝ (පරිහරණය කරන්නාවූ) පුග්ගලෝ (පුද්ගලයා) ධාතු-මත්තකෝ (ධාතු මාත්‍රයක්වූ) නිස්සත්තෝ (සත්වයෙක් නොවූ) නිජ්ජීවෝ (ජීවියෙක් නොවූ) සුඤ්ඤෝ (සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි.), සබ්බානි (සියලු) <u>පන</u> ඉමානි සේනාසනානි (මේ

සේනාසන) [වනාහි] අජිගුච්ඡනීයානි (පිළිකුල් නොවේ), ඉමං පූතිකායං (මේ කුණපප ශරීරයට) පත්වා (පැමිණ) අතිවිය (අතිශයින්) ජිගුච්ඡනීයනි (පිළිකුල් බවට) ජායන්ති (පත්වන්නාහ.)

☞ මේ සේනාසනය වනාහි විවිද හේතු කාරණාවන්ගෙන් පවත්නා වූ ධාතු මාත්‍රයක්මය, එය පරිහරණය කරන්නාවූ පුද්ගලයා ද ධාතු මාත්‍රයක්වූ සත්වයෙක් නොවූ ජීවියෙක් නොවූ සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි. මේ සියලු සේනාසන වනාහි පරිහරණයට පෙර පැහැයෙන් ගන්දයෙන් පිළිකුල් නොවේ, නමුත් මේ කුණපයන්ගෙන් පිරුණු ශරීරයට පැමිණ අතිශයින් පිළිකුල් බවට පත්වන්නාහ.

(04) A. පටිසඞ්ඛා යෝනිසෝ ගිලානපච්චය - භේසජ්ජපරික්ඛාරං පටිසේවාමි, යාවදේව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වේදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣපරමතාය

★ පටිසඞ්ඛා (විමසා බලා) යෝනිසෝ (නුවණින්) ගිලානපච්චය (ගිලනාට සුදුසු වූ) භේසජ්ජ-පරික්ඛාරං (බෙහෙත් සහ සෙසු පිරිකර) පටිසේවාමි (පරිභෝග කරමි), යාවදේව (හුදෙක්ම) උප්පන්නානං (උපන්නාවූ) වෙය්‍යාබාධිකානං (කර්මාදිය නිසා ඇතිවූ රෝග) වේදනානං (වේදනාවන්) පටිඝාතාය (දුරුකිරීම පිණිසය), අබ්‍යාපජ්ඣ-පරමතාය (නිරෝගිකම සඳහා පමණක්මය)

☞ නුවණින් විමසා බලා ගිලනාට සුදුසු වූ බෙහෙත් සහ සෙසු පිරිකර ආදිය පරිභෝග කරමි, හුදෙක්ම කර්මාදිය නිසා උපන්නාවූ රෝග වේදනාවන් දුරුකිරීම පිණිස පරිභෝග කරමි, නිරෝගිකම සඳහා පමණක්ම පරිභෝග කරමි.

B. යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමේව යදිදං ගිලානපච්චය - භේසජ්ජපරික්ඛාරං , තදුපභුඤ්ජකෝ (තං+ උපභුඤ්ජකෝ) පුග්ගලෝ ධාතුමත්තකෝ නිපස්සත්තෝ නිජ්ජීවෝ සුඤ්ඤෝ, සබ්බෝ පන අයං ගිලානපච්චය - භේසජ්ජපරික්ඛාරෝ අජිගුච්ඡනීයෝ, ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයෝ ජායති.

★ යථා පච්චයං (විවිද හේතු කාරණාවන්ගෙන්) පවත්තමානං (පවත්නා වූ) [ධාතු-මත්තං+ඒව] ධාතුමත්තමේව (ධාතු මාත්‍රයක්මය) යදිදං (යම් මේ) ගිලානපච්චය (ගිලනාට සුදුසු වූ) භේසජ්ජ-පරික්ඛාරෝ (බෙහෙත් සහ සෙසු පිරිකර), තං (එය/ බෙහෙත් පිරිකර) උපභුඤ්ජකෝ (පරිහරණය කරන්නාවූ) පුග්ගලෝ (පුද්ගලයා) ධාතු-මත්තකෝ (ධාතු මාත්‍රයක්වූ) නිස්සත්තෝ (සත්වයෙක් නොවූ) නිජ්ජීවෝ (ජීවියෙක් නොවූ) සුඤ්ඤෝ (සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි.), සබ්බෝ (සියලු) පන අයං ගිලානපච්චය (ගිලනාට සුදුසු වූ) භේසජ්ජ-පරික්ඛාරෝ (බෙහෙත් සහ සෙසු පිරිකර) [වනාහි] අජිගුච්ඡනීයෝ (පිළිකුල් නොවේ), ඉමං පූතිකායං (මේ කුණප ශරීරයට) පත්වා (පැමිණ) අතිවිය (අතිශයින්) ජිගුච්ඡනීයෝ (පිළිකුල් බවට) ජායති (පත්වන්නේය.)

☞ මේ ගිලනාට සුදුසු වූ බෙහෙත් සහ සෙසු පිරිකර වනාහි විවිද හේතු කාරණාවන්ගෙන් පවත්නා වූ ධාතු මාත්‍රයක්මය, එය පරිහරණය කරන්නාවූ පුද්ගලයා ද ධාතු මාත්‍රයක්වූ සත්වයෙක් නොවූ ජීවියෙක් නොවූ සත්ත්ව ස්වභාවයෙන් හිස්වූවෙකි. මේ සියලු ගිලනාට සුදුසු වූ බෙහෙත් සහ සෙසු පිරිකර වනාහි පරිහරණයට පෙර පැහැයෙන් ගන්දයෙන් පිළිකුල් නොවේ, නමුත් මේ කුණපයන්ගෙන් පිරුණු ශරීරයට පැමිණ අතිශයින් පිළිකුල් බවට පත්වන්නාහ.

<u>බුද්ධ වර්ෂය කීම</u>

අම්හාකං බෝ පන භගවා දීපංකර පාද මූලතෝ පට්ඨාය පඨමං දාන පාරමී, දුතියං සීල පාරමී, තතියං නෙක්ඛම්ම පාරමී, චතුත්ථං පඤ්ඤා පාරමී, පඤ්ඤමං විරිය පාරමී, ඡට්ඨමං ඛන්ති පාරමී, සත්තමං සච්ච පාරමී, අට්ඨමං අධිට්ඨාන පාරමී, නවමං මෙත්තා පාරමී, දසමං උපෙක්ඛා පාරමීති, දස පාරමියෝ දස උපපාරමියෝ, දස පරමත්ථ පාරමියෝති, සමතිංස පාරමියෝ පූරෙත්වා වෙස්සන්තරත්තභාවේ නිබ්බත්තිත්වා පඤ්ඤ මහා පරිච්චාගේ කත්වා තුසිතපුරේ නිබ්බත්තිත්වා චතුහී මහා දේවරාජූහි කතාරාධනං පටිච්ච පඤ්ඤ මහා විලෝකනේ විලෝකෙත්වා සුද්ධෝදන මහා රාජානං නිස්සාය මහාමායා දේවියා කුච්ඡිම්ං පටිසන්ධිං ගණ්හිත්වා, දසමාසච්චයේන මාතු කුච්ඡිතෝ නික්ඛමිත්වා, ඒකූන තිංසතිමේ සංවච්ඡරේ මහානිහික්ඛමනං නික්ඛමිත්වා ඡබ්බස්සාති මහා පදානං පදහිත්වා, පඤ්ච තිංසතිමේ සංවච්ඡරේ වේසාඛපුණ්ණමියං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣිත්වා පඤ්චචත්තාලීස සංවච්ඡරානි වසිත්වා සප්ප සංවච්ඡරේ වේසාඛ පුණ්ණමියං භුම්මවාරේ පරිනිබ්බායි.

★ අම්හාකං බෝ පන භගවා (අපගේ භාග්‍යවතුන් වහන්සේ වනාහි) දීපංකර පාද මූලතෝ පට්ඨාය (දීපඞ්කර බුදුන්ගේ ශ්‍රී පාමුල පටන්) පඨමං දාන පාරමී (පළමු දාන පාරමිතාව), දුතියං සීල පාරමී (දෙවන සීල පාරමිතාව), තතියං නෙක්ඛම්ම පාරමී (තුන්වන නෙක්ඛම්ම පාරමිතාව), චතුත්ථං පඤ්ඤා පාරම (සතරවන පඤ්ඤා පාරමිතාව), පඤ්ඤමං විරිය පාරමී (පස්වන විරිය පාරමිතාව), ඡට්ඨමං ඛන්ති පාරමී (සයවන ක්ෂාන්ති පාරමිතාව), සත්තමං සච්ච පාරමී (සත්වන සත්‍යය පාරමිතාව), අට්ඨමං අධිට්ඨාන පාරමී (අටවන අධිෂ්ඨාන පාරමිතාව), නවමං මෙත්තා පාරමී (නවවන මෛත්‍රී පාරමිතාව), දසමං උපෙක්ඛා පාරමීති (දසවන උපෙක්ෂා පාරමිතාව යැයි), දස පාරමියෝ දස උපපාරමියෝ දස පරමත්ථ පාරමියෝති (දස පාරමී දස උපපාරමී දස පරමත්ථ පාරමී යැයි), සමතිංස පාරමියෝ (සමතිස් පාරමී) පූරෙත්වා (පුරා) [වෙස්සන්තර+අත්තභාවේ] වෙස්සන්තරත්තභාවේ (වෙස්සන්තර ආත්තම භාවයේ) නිබ්බත්තිත්වා (ඉපිද) පඤ්ඤ මහා පරිච්චාගේ කත්වා (පස් හමා පරිත්‍යාගයන් කර) තුසිතපුරේ නිබ්බත්තිත්වා (තුසිත පුරයෙහි ඉපිද) චතුහී මහා දේවරාජූහි (සතරවරම් දෙවි රජවරු) [කත+ආරාධනං] කතාරාධනං පටිච්ච (කරනලද ආරාධනාව හේතුකරගෙන) පඤ්ඤ මහා විලෝකනේ විලෝකෙත්වා (පස්මහා බැලුම් බලා) සුද්ධෝදන මහා රාජානං නිස්සාය (සුද්ධෝදන මහාරජු නිසා) මහාමායා දේවියා කුච්ඡිම්ං (මහමායා දේවියගේ කුසෙහි) පටිසන්ධිං ගණ්හිත්වා (පිළිසිඳ ගෙන), [දසමාස+අච්චයේන] දසමාසච්චයේන (දසමස ඇවැමෙන්) මාතු කුච්ඡිතෝ නික්ඛමිත්වා (මව්කුසින් බිහිව), ඒකූන තිංසතිමේ සංවච්ඡරේ (විවසිනව වන වියෙහි) මහානිහික්ඛමනං නික්ඛමිත්වා (මහාභනිෂ්ක්‍රමණය කර) [ඡ+වස්සාති] ඡබ්බස්සාති (වර්ෂ හයක්) මහා පදානං පදහිත්වා (මහා ප්‍රධන්වීර්ය වඩා / දුෂ්කර ක්‍රියාකර), පඤ්ච තිංසතිමේ සංවච්ඡරේ (තිස්පස්වන වියේදී) වේසාඛ-පුණ්ණමියං (වෙසක් පොහෝදින) සම්මා සම්බොධිං (සම්මා සම්බුද්ධත්වය) අභිසම්බුජ්ඣිත්වා (අවබෝධකර) පඤ්චචත්තාලීස සංවච්ඡරාණි (හතලිස්පස් අවුරුද්දක්) වසිත්වා (වැඩවාසය කර) සප්ප සංවච්ඡරේ ("සප්ප" නම් වර්ෂයේ) වේසාඛ පුණ්ණමියං (වෙසක් පොහොය ලැබූ) භුම්මවාරේ (අඟහරුවාදා) පරිනිබ්බායි (පිරිනිවන් පෑවේය).

[ක්‍රි. ව. 2016 – 3 – 16 දින සඳහා බුද්ධවර්ෂ කීම. (බු: ව: 2559 හි– 11වන මස - 22 වන දින)]

• තස්ස බෝ පන භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස සාසනං පඤ්චවස්ස සහස්සානි පවත්තිස්සති

★ තස්ස බෝ පන භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස (ඒ භාග්‍යවත්වූ අර්හත්වූ සම්මා සම්බුදුන් වහන්සේගේ) සාසනං (සාසනය) පඤ්චවස්ස සහස්සානි (අවුරුදු 5000 ක්) පවත්තිස්සති (පවතින්නේය)

• ඉදානි බෝ පන ද්වේ සහස්ස පඤ්චසත අට්ඨපඤ්ඤාස සංවච්ඡරාණි ච දස මාසානි ච ද්වේවීසති දිවසානි අතික්ඛන්තානි. (2558 – 10 - 22)
★ ඉදානි බෝ පන (දැන් වනාහි) ද්වේ සහස්ස (දෙදහස්) පඤ්චසත (පන්සිය) අට්ඨපඤ්ඤාස (පනස් අටක්) සංවච්ඡරාණි ච (වර්ෂ ද) දස මාසානි ච (මාස දහයක් ද) ද්වේවීසති දිවසානි (දින විසිදෙකක්) අතික්ඛන්තානි (ඉක්මී ඇත්තේය).

• ද්වේ සහස්ස චතුසත ඒකචත්තාලීස සංවච්ඡරාණි චේව ද්වේ මාසානි ච ඡ දිවසානි අවසිට්ඨානි (2441 – 2 - 6)
★ ද්වේ සහස්ස (දෙදහස්) චතුසත (සාරසිය) ඒකචත්තාලීස (හතලිස් එකක්) සංවච්ඡරාණි චේව (අවුරුදු මෙන්ම) ද්වේ මාසානි ච (මාස දෙකක් ද) ඡ දිවසානි (දින හයක් ද) අවසිට්ඨානි (ශේෂව පවතින්නේය)

• අයං කපි සංවච්ඡරේ හේමන්ත උතු, අස්මිං උතුම්හි ඵග්ගුණ මාසස්ස සුක්ක පක්ඛෙ නවමං බුධවාරං [ඉධං+ඉති] ඉධන්ති දට්ඨබ්බං (බු: ව: 2559 හි– 11වන මස - 22 වන දින)
★ අයං කපි සංවච්ඡරේ (මේ කපි සංවස්සරයෙහි) හේමන්ත උතු (හේමන්ත ඍතුවයි), අස්මිං උතුම්හි (මේ ඍතුවෙහි) ඵග්ගුණ මාසස්ස (මැදින් මස) සුක්ක පක්ඛෙ (සඳුගේ පුර පක්ෂයේ) නවමං බුධවාරං (නවවන බදාදා) [ඉධං+ඉති] ඉධන්ති දට්ඨබ්බං (මේ යැයි දතයුතුය / අද යැයි දතයුතුය)

★★ සූර්ය වර්ෂයකට දිනගනන = 365 ¼
චන්ද්‍ර මාසයකට දිනගනන = දින 29 පැය 12 විනාඩි 44 තප්පර 3

සූර්යාගේ හා චන්ද්‍රයාගේ ගමන්වේග අසමාන නිසා මෙවැනි වෙනසක් පෙන්වයි, මේනිසා සමහර අවුරුදුවල අධික චන්ද්‍රමාසයක් පැමිණේ එය අධිඅසාල්හ මාසය ලෙස හැදින්වේ, එහි දිනගනන දින 30කි. මෙලෙස අධිඅසාල්හ මාසයක් ඇතිවිට, එම ගිම්හාන ඍතුවේ හත්වන පෝය චාතුද්දසී ලෙස නොගෙන ඒවෙනුවට නවවන හෝ දසවන පෝය චාතුද්දසී ලෙස ගතහැක.

ඍතුව	මාසෝ (මාසය)			දින
ගිම්හානය	1. චිත්තෝ	අප්‍රේල්	බක්	30
	2. වේසාඛෝ	මැයි	වෙසක්	29
	3. ජෙට්ඨෝ	ජූනි	පොසොන්	30
	4. අසාල්හෝ	ජූලි	ඇසළ	29
වස්සානය	5. සාවණෝ	අගෝස්තු	නිකිණි	30
	6. පොට්ඨපාදෝ	සැත්තැම්බර්	බිණර	29
	7. අස්සයුජෝ	ඔක්තෝම්බර්	වප්	30
	8. කත්තිකෝ	නොවැම්බර්	ඉල්	29
හේමන්තය	9. මාගසිරෝ	දෙසැම්බර්	උඳුවප්	30
	10. ඵුස්සෝ	ජනවාරි	දුරුතු	29
	11. මාඝෝ	පෙබරවාරි	නවම්	30
	12. ඵග්ගුනෝ	මාර්තු	මැදින්	29

වර්ෂ දොලස	දිවසෝ/ අහං/ දිනං (දවස)	
1. මුසික 2. වසභ 3. ව්‍යග්ස 4. සස 5. නාග 6. සප්ප 7. අස්ස 8. අජ 9. කපි 10. කුක්කුට 11. සෝණ 12. සූකර	රවි වාරෝ	ඉරිදා
	චන්ද වාරෝ	සඳුදා
	භුම්ම වාරෝ කුජ වාරෝ	අඟහරුවාදා
	බුධ වාරෝ	බදාදා
	ගුරු වාරෝ	බ්‍රහස්පතින්දා
	සුක්ක වාරෝ	සිකුරාදා
	සෝර වාරෝ සනි වාරෝ	සෙන සුරාදා

මේ පොත සැකසිමෙන් රුස්වූවාවූ පුණ්‍ය ශක්තිය සියලු සත්ත්වයනටම අනුමෝදන් කරමු, අනුමෝදන් වෙත්වා! අනුමෝදන්වීමෙන් තමතමාගේ සම්‍යක් ප්‍රාර්ථනා සඵලවේත්වා!

සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!

ශ්‍රී සද්ධර්මය ලොවතුල බොහෝකලක් බැබලේවා !